285 වන කාණ්ඩය - 9 වන කලාපය
தொகுதி 285 - இல. 9
Volume 285 - No. 9

2021 ඔක්තෝබර් 08 වන සිකුරාදා
2021 ஒக்ரோபர் 08, வெள்ளிக்கிழமை
Friday, 08th October, 2021

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
නොවිසඳුණු ගුරු - විදුහල්පති වැටුප් විෂමතා

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සිදු වන අක්‍රමිකතා:**
වාරිමාර්ග අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**වරප්‍රසාද යෝජනා:**
නාගානන්ද කොඩිතුවක්කු මහතා ඉදිරිපත් කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම

**කල්තැබීමේ යෝජනාව:**
වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2021

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු**

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சபாநாயகரது சான்றுரை

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
தீர்க்கப்படாத ஆசிரியர்-அதிபர் சம்பள முரண்பாடு

**குடிவரவு, குடியகல்வுத் திணைக்களத்தில் இடம்பெறும் முறைகேடுகள்:**
நீர்ப்பாசன அமைச்சரும் அரச பாதுகாப்பு மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும் உள்நாட்ட லுவல்கள் இராஜாங்க அமைச்சருமானவரினது கூற்று

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
திரு. நாகானந்த கொடிதுவக்குவினது அடிப்படை உரிமை மனு

**ஒத்திவைப்புப் பிரேரணை:**
அரையாண்டு நிதி நிலைமை அறிக்கை - 2021

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்**

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Unresolved Teacher-Principal Salary Anomalies

IRREGULARITIES IN DEPARTMENT OF IMMIGRATION AND EMIGRATION:
Statement by Minister of Irrigation, State Minister of National Security and Disaster Management and State Minister of Home Affairs

PRIVILEGE MOTIONS:
Fundamental Rights Petition by Mr. Nagananda Kodituwakku

ADJOURNMENT MOTION:
Mid-Year Fiscal Position Report - 2021

WRITTEN ANSWERS TO QUESTIONS

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2021 ඔක්තෝබර් 08 වන සිකුරාදා***
*2021 ஒக்ரோபர் 08, வெள்ளிக்கிழமை*
*Friday, 08th October, 2021*

**පූ. භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, 2021 ඔක්තෝබර් 08 දින ම'විසින් "ඛනිජතෙල් සම්පත්" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව-

- 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIX කොටස, තෙවැනි කාණ්ඩයේ XII කොටස සහ නවවැනි කාණ්ඩයේ XXI කොටස;
- 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXIV කොටස සහ නවවැනි කාණ්ඩයේ XXV සහ XXVI කොටස්;
- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIV, XXV සහ XXVI කොටස්, තෙවැනි කාණ්ඩයේ XII කොටස සහ නවවැනි කාණ්ඩයේ XVII සහ XVIII කොටස් ; සහ
- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ I හා II කොටස් සහ තෙවැනි කාණ්ඩයේ I කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේ ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා, පාර්ලිමේන්තුව හමුවේ තිබෙන මෙවැනි වාර්තා පදනම් කරගෙන, COPE එක හමුවේ රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් පිළිබඳ කරන ලද විමර්ශන ගැන විවාද කිරීම සඳහා ඊයේ පක්ෂ නායක කමිටුවේදී මේ මස 22වන දාට පාර්ලිමේන්තුවේ කාලය වෙන් කිරීම ගැන. අපේ රටේ මූල්‍ය පාලනයේ සිදු වී තිබෙන අක්‍රමිකතා හා මූල්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කරන අලුත් යෝජනා සම්බන්ධයෙන් ඉතා වැදගත් විවාදයක් එදින සිදුවෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ඉඩම් අමාත්‍යතුමා වෙනුවෙන් මම (460 අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2)(ඊ) වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 සැප්තැම්බර් 08 දිනැති අංක 2244/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந்தோட்ட அமைச்சர்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation)

ගරු කථානායකතුමනි, 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය-තලවාකැලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2)(ඩ) වගන්තිය යටතේ සංචාරක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 සැප්තැම්බර් 08 දිනැති අංක 2192/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)

ගරු කථානායකතුමනි, මීගමුව, කටුවපිටිය, අංක 249/2 දරන ස්ථානයෙහි පදිංචි ඒ.පී. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සනත් නිශාන්ත මහතා (ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனத் நிசாந்த - கிராமிய மற்றும் பிரதேச நீர்க் கருத்திட்ட அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Sanath Nishantha - State Minister of Rural and Divisional Drinking Water Supply Projects Development)

ගරු කථානායකතුමනි, දංකොටුව, හාල්දඬුවන, "බෝ සෙවණ" යන ලිපිනයෙහි පදිංචි එන්.ඒ.එම්.ඩී.එන්. නවරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සිසිර ජයකොඩි මහතා (දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிசிர ஜயகொடி - சுதேச வைத்திய முறைகளின் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும் சமூக சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody - State Minister of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health)

ගරු කථානායකතුමනි, කැලණිය, වෙදමුල්ල, ශ්‍රී බෝධිග්‍රාම පටුමග, අංක 590/82 දරන ස්ථානයෙහි පදිංචි බී.ඒ.ජී. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කොළඹ 05, ටොරින්ටන් මාවත, ටොරින්ටන් නිවාස ක්‍රමය, අංක පී 108 දරන ස්ථානයෙහි පදිංචි කේ. දුමිඳු කල්යාන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) හැටන්, ෆෞටිහිල්, ආරියගම, අංක 19 දරන ස්ථානයෙහි පදිංචි එම්. ෂන්මුගනාදන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, කඩුගන්නාව, මාලිගාතැන්න, අංක 441/5/1 දරන ස්ථානයෙහි පදිංචි ඩී.ඒ.එස්.ඩී. වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ලාක්ෂා කර්මාන්තය: විස්තර
### அரக்குச்சாய உற்பத்தி: விபரம்
### LACQUER INDUSTRY: DETAILS

292/2020

**1. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ලාක්ෂා නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අළෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ලාක්ෂා නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2019දී එමඟින් උපයාගන්නා ලද විදේශ ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ ලාක්ෂා නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ ලාක්ෂා නිෂ්පාදන සඳහා වෙළෙඳ පොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் அரக்குச்சாய உற்பத்திக் கைத்தொழிலாளர்கள் இன்றளவில் அக்கைத் தொழிலைவிட்டு ஒதுங்கிக் கொண்டிருக் கின்றார்கள் என்பதையும்;

(ii) மேற்படி கைத்தொழிலாளர்களுக்கு மூலப் பொருட்களைப் பெற்றுக்கொள்வதிலும் உற்பத் திகளைச் சந்தைப்படுத்துவதிலும் பிரச்சினைகள் காணப்படுகின்றன என்பதையும்;

(iii) மேற்படி கைத்தொழிலின்மூலம் பெருமளவு அந்நியச் செலாவணியை ஈட்ட முடியுமென் பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இலங்கையின் அரக்குச்சாய உற்பத்திகள் ஏற்றுமதி செய்யப்படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், 2019ஆம் ஆண்டில் அதன்மூலம் ஈட்டப்பட்ட வெளிநாட்டு வருமானம் யாதென்பதையும்;

(iii) இலங்கையின் அரக்குச்சாய உற்பத்திகள் ஏற்றுமதி செய்யப்படாத பட்சத்தில் அவற்றை ஏற்றுமதி செய்வதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், அது எப்போது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) இலங்கையில் அரக்குச்சாய உற்பத்திகளுக்கென சந்தையை விரிவுபடுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்நடவடிக்கை யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Industries:

(a) Is he aware that -

(i) Sri Lankan lacquer manufacturers are abandoning the industry by now;

(ii) the aforesaid manufacturers encounter issues regarding supply of raw materials and the sale of products; and

(iii) a huge amount of foreign exchange can be earned by the aforesaid industry?

(b) Will he state -

(i) whether Sri Lankan lacquer products are exported;

(ii) if so, the foreign income earned by the aforesaid exports in 2019;

(iii) whether measures will be taken to export Sri Lankan lacquer products, if export of lacquer products is not done by now; and

(iv) if so, of the dates on which such measures will be taken?

(c) Will he also inform this House -

(i) whether measures have been taken to expand the market for Sri Lankan lacquer products; and

(ii) if so, of the aforesaid measures?

(d) If not, why?

**ගරු ප්‍රසන්න රණවීර මහතා (වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணவீர - பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக் கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Prasanna Ranaweera - State Minister of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion)

ගරු කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) වර්තමානය වන විට ලාක්ෂා ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මෙම කර්මාන්තයෙන් ඉවත්වීමක් සිදු නොවේ.

(ii) • මෙම කර්මාන්තයට අදාළව පවතින අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටලුව විසඳා ගැනීම සඳහා පළාතකට එකක් බැගින් අමුද්‍රව්‍ය කළමනාකරණ ඒකක පිහිටුවීමට කටයුතු කරමින් පවතී.

ලාක්ෂා කර්මාන්තය ප්‍රධාන වශයෙන් මාතලේ දිස්ත්‍රික්කය මූලික කරගෙන පවතින අතර, ඊට අවශ්‍ය අමු ද්‍රව්‍ය පහසුකම් මහනුවර දිස්ත්‍රික්කයේ පොල්ගොල්ල අමු ද්‍රව්‍ය මධ්‍යස්ථානයෙන් ලබා දීමට කටයුතු කරනු ලබයි.

• පාස්කු ප්‍රහාරය හා කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඇති වූ සංචාරක කර්මාන්තය බිඳ වැටීමෙන් හා සංචරණ සීමා සහ නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක කිරීම වැනි ගැටලු නිසා අත්කම් භාණ්ඩ සඳහා වන පොදු අළෙවිකරණ ගැටලු මෙම නිෂ්පාදන සඳහා ද බලපා ඇත. අළෙවිකරණ ගැටලු විසඳීම සඳහා පහත ක්‍රියා මාර්ග ගෙන ඇත.

- ලක්ශිල්ප අළෙවි සැල් ආරම්භ කිරීම.
- විද්‍යුත් අළෙවිකරණ පද්ධතියක් ආරම්භ කිරීම.
- සුපිරි වෙළෙඳ සැල් ජාලය හා නිෂ්පාදකයන් සම්බන්ධ කිරීම.
- නිෂ්පාදන හා තාක්ෂණික ක්‍රියා මාර්ග වැඩිදියුණු කිරීම.

(iii) ඔව්.

(ආ) (i) ඔව්. (සුළු වශයෙන්)

(ii) ලාක්ෂා නිෂ්පාදන අපනයන කිරීමේදී ඒ සඳහා වෙන් වූ HS Code එකක් යටතේ අපනයනය සිදු නොකරන අතර, එම නිෂ්පාදන පොදු HS Code එකක් යටතේ අපනයනය කරනු ලැබේ. එබැවින්, ලාක්ෂා අපනයනයෙන් ලද ආදායම වෙනම හඳුනා ගත නොහැක.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) (i) ඔව්.

(ii) 1. වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ශිල්ප සභාව සහ අපනයන සංවර්ධන මණ්ඩලය මඟින් ලාක්ෂා නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ, දේශීය හා විදේශීය වෙළෙඳ පොළ අවස්ථා ලබා දීම, සංචාරකයන්ට ගැළපෙන පරිදි නව නිර්මාණ හඳුන්වා දීම, නවීන යන්ත්‍ර උපකරණ ලබා දීම සිදු කරයි

[ගරු ප්‍රසන්න රණවීර මහතා]

2. 2021 වසරේ අමාත්‍යාංශය මඟින් ජාතික ශිල්ප සභාව විසින් ක්‍රියාත්මක කරන ග්‍රාමීය හා සාම්ප්‍රදායික ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන යටතේ නිර්මාණ වැඩිදියුණු කිරීම, ප්‍රමිතිය වර්ධනය කිරීම, අළෙවිකරණ අවස්ථා පුළුල් කිරීම හා අවශ්‍ය තාක්ෂණික උපකරණ හා දැනුම වර්ධනය කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

3. ලක්ශිල්ප වෙළෙඳ නාමය ප්‍රවර්ධනය කර, දීප ව්‍යාප්තව ජාතික ශිල්ප සභාවේ ලක්ශිල්ප අළෙවිසැල් හරහා අළෙවි කිරීම සඳහා පහසුකම් සලසා දී ඇති අතර, විද්‍යුත් අළෙවිකරණ පද්ධතිය (www.lakshilpa.lk) මඟින් අළෙවියට අවස්ථා පුළුල් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම ගරු රාජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, දීර්ඝ පිළිතුරක් ලබා දීම පිළිබඳව. ලාක්ෂා කර්මාන්තය පටන් ගත්තේ ඉන්දියාවෙන්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, ලාක්ෂා නිෂ්පාදන සම්බන්ධයෙන් විශේෂයෙන්ම ඉන්දුනීසියාව, වියට්නාමය ඇතුළු රටවල් සමහත් අපේ රටට තරග කරන්න සිදු වෙලා තිබෙන බව. ඔබතුමා මාතලේ දිස්ත්‍රික්කය පිළිබඳව සඳහන් කළා. මා දන්නා පරිදි මාතලේ දිස්ත්‍රික්කයේ ආලෝකගම තමයි මුලින්ම ලංකාවේ ලාක්ෂා කර්මාන්තය ආරම්භ වන්නේ. මාතලේ දිස්ත්‍රික්කයේ ආලෝකගම වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත අඟුල්මඩුවේත් ලාක්ෂා කර්මාන්තය කෙරුණා. පසු කාලයක බෙලිඅත්ත අඟුල්මඩුව ප්‍රදේශයෙන් එම කර්මාන්තය නැති වෙලා ගිහින්, මාතලේ ආලෝකගම විතරක් එය කරගෙන ගියා. දැන් අඟුල්මඩුවේ ආයෙත් මේ කර්මාන්තය කෙරෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මාතලේ දිස්ත්‍රික්කය ගැන විතරක් කථා කළා. මාතලේ දිස්ත්‍රික්කයේ ආලෝකගමත්, ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත අඟුල්මඩුවේත් කෙරෙන ලාක්ෂා කර්මාන්තය තුළ නියැලී සිටින ශිල්පීන් අද මුහුණ දෙන ලොකුම ප්‍රශ්නයක් තිබෙනවා. ජාතික ශිල්ප සභාව ඒ ගොල්ලන්ට අවශ්‍ය උපකරණ ඇතුළු තවත් බොහෝ දේවල් දීලා තිබෙනවා. ලාක්ෂා අමු ද්‍රව්‍යයක් විධියට ඉන්දියාවෙන් ගෙනැල්ලා දේශීයව විකුණනවා. මේ අමු ද්‍රව්‍යවල තමයි බරපතළ හිඟයක් තිබෙන්නේ. ඒ අමු ද්‍රව්‍ය ලබා ගන්න තිබෙන ප්‍රධාන බාධාවලින් එකක් තමයි, මේ දවස්වල පවතින කොවිඩ් වසංගත තත්ත්වය. ඊට කලින් පාස්කු ඉරිදා ප්‍රහාරය ඇතුළු බොහෝ කාරණා නිසාත් අළෙවි කර ගැනීමේ ගැටලුවක් තිබුණා.

මේ ශිල්පීන් වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් නව නිර්මාණ බිහි කළොත් තමයි හොඳ වෙළෙඳ පොළක් හැදෙන්නේ. එසේ නව නිර්මාණ බිහි කිරීම සඳහාත්, ලාක්ෂා අමු ද්‍රව්‍ය වෙළෙඳ පොළෙන් ගැනීම සඳහාත් ජාතික ශිල්ප සභාව සහ ඔබතුමාගේ අමාත්‍යාංශය මොන වාගේ මැදිහත් වීමක් ද, මොන වාගේ දායකත්වයක් ද ලබා දෙන්නේ?

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

ගරු මන්ත්‍රීතුමනි, අපි ලාක්ෂා අමු ද්‍රව්‍ය ආනයනය කරනවා. මොකද, "ලාක්ෂා" කියන කෘමියා අපේ රටේ නැහැ. එම නිසා අපි එම අමු ද්‍රව්‍ය ආනයනය කළ යුතු වනවා. එම අමු ද්‍රව්‍ය ආනයනය කර ලබා දීමට අපි කටයුතු කරනවා. ඒ වාගේම, ජාතික ශිල්ප සභාව ක්‍රියාත්මක කරන ග්‍රාමීය හා සාම්ප්‍රදායික ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන යටතේ, ඒ ගම්මානවල යටිතල පහසුකම් දියුණු කරන්න, නවීන යන්ත්‍ර සූත්‍ර, තාක්ෂණය සහ නව දැනුම ආදිය ලබා දෙන්න අපි මේ වන කොටත් කටයුතු කරනවා. විශ්වවිද්‍යාලත් සම්බන්ධ කර ගෙන ප්‍රමිතිකරණය විතරක් නොවෙයි, නව්‍යකරණය විතරක් නොවෙයි, අවශ්‍ය කරන තාක්ෂණික දැනුම ලබා දෙන්නත් අපි කටයුතු කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කය පිළිබඳව පළමුවන අතුරු ප්‍රශ්නයෙන් අහපු නිසායි මා මේ කාරණය කියන්නේ. ඔබතුමා නියෝජනය කරන අමාත්‍යාංශයේ වැඩ බලන කැබිනට් ඇමතිවරයා විධියට වර්ෂ 2019 දී මා කටයුතු කළා. එවකට හම්බන්තොට දිසාපතිවරයා වශයෙන් කටයුතු කළ නිලධාරියා දැන් බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලේකම්වරයා. මම ඒ කාලයේ හම්බන්තොට "ශිල්ප අභිමානී" වැඩ මුළුවට ගිය වෙලාවේ ඔහු සඳහන් කළා, හම්බන්තොට වැවෙන "හම්බු" කියන පන් වර්ගය පිළිබඳව. ඔහු සඳහන් කළා, "හම්බු" කියන පන් වර්ගය ගැන සොයන්න, කුඩා කර්මාන්තවල යෙදෙන ශිල්පීන්ට එමඟින් විශාල ප්‍රයෝජනයක් ගන්න පුළුවන් කියලා. ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව සොයා බලන කොට "හම්බු" කියන පන් වර්ගය මාතර දිස්ත්‍රික්කයේත් තිබෙන බව දැනගන්න ලැබුණා. එය තිහගොඩ, කඹුරුපිටිය, කිරින්ද පුහුල්වැල්ල, මාලිම්බඩ ආදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුරන් කුඹුරුවල තිබුණා. මා තවදුරටත් සොයා බැලූ වෙලාවේ මට දැන ගන්න ලැබුණා, "හම්බු" කියන පන් වර්ගය අනුරාධපුර දිස්ත්‍රික්කයේත් තිබෙන බව. "හම්බු" කියන පන් වර්ගය යොදාගෙන කර්මාන්තකරුවන්ට විශාල වශයෙන් නිෂ්පාදන සිදු කරන්න පුළුවන්. එය නිකම්ම හැදෙන පන් වර්ගයක්. එය සමහර ප්‍රදේශවල ගොවීන්ට මහත් ව්‍යසනයක්.

ඒ අවස්ථාවේ ජාතික ශිල්ප සභාවට මම උපදෙස් දුන්නා, "හම්බු" කියන පන් වර්ගය යොදාගෙන ඒ තුළින් මේ ශිල්පීන්ට සහන දෙන වැඩ පිළිවෙළක්, පුහුණු වැඩසටහන් සහ ආධාර දෙන වැඩසටහන් ක්‍රියාත්මක කරන්න කියලා. මම දන්නේ නැහැ, දැනට ඒ කටයුත්ත කෙරෙනවාද කියලා. මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, "හම්බු" පන් වර්ගය මුල් කරගෙන එදා පටන් ගත්ත වැඩ පිළිවෙළ අඛණ්ඩව කරගෙන යනවාද, ඒකට සහයෝගය ලබා දෙනවාද කියලා.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

ඒ සඳහා සහයෝගය අපි ලබා දෙනවා. පන් වගා කිරීමේ වැඩ කටයුතු පන්තොටින් ආරම්භ කරලා, පන්තොට අපි පන් වගා කළා. ඒ එක්කම අපේ ජයන්ත සමරවීර රාජ්‍ය අමාත්‍යතුමාගේ ආසනයේත් මේ වන විට හඳුනාගත් ඉඩම්වල අවශ්‍ය කටයුතු විශාල ප්‍රමාණයක් අපි කරගෙන යනවා. අපේ අමාත්‍යාංශය හරහා පන් විතරක් නොවෙයි, හණ, පන්, වේවැල් ආදිය අක්කර හයසිය ගණනක් වගා කරන්න අපි කටයුතු කරනවා. ඒ එක්කම මහවැලි අධිකාරියත් එක්ක එකතු වෙලා පොළොන්නරුවේ අක්කර 360ක හණ වගා කිරීමට අවශ්‍ය වැඩ කටයුතු අපි ආරම්භ කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -312/2020- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මං එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සබරගමුව විශ්වවිද්‍යාලය: විස්තර
சப்ரகமுவ பல்கலைக்கழகம்: விபரம்
SABARAGAMUWA UNIVERSITY: DETAILS

672/2020

3. **ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඇති පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එම පීඨවල නම් කවරේද;

(iii) එම එක් එක් පීඨයේ පවත්වනු ලබන පාඨමාලාවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් පාඨමාලාව හදාරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මේ වනවිට එම විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව කොපමණද;

(vi) එම විශ්වවිද්‍යාලය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை சப்ரகமுவ பல்கலைக்கழகத்தில் காணப்படும் பீடங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி பீடங்களின் பெயர்கள் யாவை;

(iii) மேற்படி ஒவ்வொரு பீடத்திலும் நடத்தப்படும் பாடநெறிகளின் பெயர்கள் வெவ்வேறாக யாவை;

(iv) மேற்படி ஒவ்வொரு பாடநெறியையும் பயிலும் மாணவ, மாணவியர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(v) தற்போது இப்பல்கலைக்கழகத்தினால் விடுதி வசதிகள் வழங்கப்பட்டுள்ள மாணவ, மாணவியர்களின் எண்ணிக்கை யாது;

(vi) மேற்படி பல்கலைக்கழகத்தை மேலும் அபிவிருத்தி செய்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of -

(i) the number of faculties at Sabaragamuwa University of Sri Lanka;

(ii) the names of those faculties;

(iii) the names of the courses conducted at each of those faculties, separately;

(iv) the number of undergraduates following each of the said courses, separately;

(v) the number of undergraduates provided with hostel facilities by that university by now; and

(vi) the measures taken to further develop that university?

(b) If not, why?

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මං එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපාධි පීඨ 07ක් සහ පශ්චාත් උපාධි සිසුන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපන පීඨයක් ඇත.

(ii) එම උපාධි පීඨවල නම් පහත පරිදි වේ.

- සමාජ විද්‍යා හා භාෂා පීඨය
- කෘෂි විද්‍යා පීඨය
- ව්‍යවහාරික විද්‍යා පීඨය
- කළමනාකරණ අධ්‍යයන පීඨය
- භූ විද්‍යා පීඨය
- තාක්ෂණ පීඨය
- වෛද්‍ය පීඨය

(iii) එම එක් එක් පීඨයේ පවත්වනු ලබන පාඨමාලාවල නම් ඇමුණුම 01 යටතේ දක්වා ඇත.

ඔබතුමාට ඒ ලේඛනය ලබා දෙන්න පුළුවන්. විෂයයන් අනුව ඒ මොනවාද කියලා සඳහන් කර ඇති දීර්ඝ ලේඛනයක් තිබෙනවා.

(iv) එම එක් එක් පාඨමාලාව හදාරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 යටතේ දක්වා ඇත.

ඔබතුමාට ඒ තොරතුරුත් ලබා දෙන්න පුළුවන්. වෙන් වෙන් වශයෙන්, පීඨයෙන් පීඨයට ඉන්න සිසුන් සංඛ්‍යාව 2015, 2016, 2018, 2019, 2020 යනාදී වශයෙන් දීර්ඝ විස්තරයක් තිබෙනවා.

(v) මේ වන විට එම විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව ඇමුණුම 03 යටතේ දක්වා ඇත.

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ඒ අනුව සියලු පීඨවල ලියා පදිංචි සිසුන් සංඛ්‍යාව 5,005ක්. නේවාසිකාගාර පහසුකම් ලද ලියා පදිංචි සිසුන් සංඛ්‍යාවත් වෙන වෙනම දක්වා තිබෙනවා. ශිෂ්‍යයන් 1,485ක් ද, ශිෂ්‍යාවන් 3,062ක් ද යනාදී වශයෙන් මුළු එකතුව 4,547ක් ලෙස සඳහන් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

(vi) ඔව්. සංවර්ධනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගෙන ඇති පියවර පහත සඳහන් පරිදි වේ.

1. මේ වන විට එම විශ්වවිද්‍යාලය සඳහා නව පීඨ ඇති කිරීමට යෝජනා ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අනුව පහත සඳහන් පීඨ නුදුරු අනාගතයේදී ආරම්භ කිරීමට නියමිත ය.
   - පශු වෛද්‍ය විද්‍යා පීඨය
   - ඉංජිනේරු පීඨය
   - තොරතුරු තාක්ෂණ පීඨය
   - ව්‍යවහාරික ක්‍රීඩා විද්‍යා පීඨය
2. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ නව උපාධි පාඨමාලා වශයෙන් මෘදුකාංග ඉංජිනේරු උපාධිය ආරම්භ කරන ලද අතර ව්‍යවහාරික ක්‍රීඩා විද්‍යා පීඨය ළඟදීම ආරම්භ කිරීම සඳහා අදාළ කටයුතු සිදු කරමින් පවතී.
3. විශ්වවිද්‍යාලය තුළ ඉදිකිරීම් ව්‍යාපෘති ගණනාවක් අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ යටතේ වෛද්‍ය විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය සහ කෘෂිකාර්මික විද්‍යා පීඨය සඳහා නව ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
4. විශ්වවිද්‍යාලයේ පීඨ හා අධ්‍යයනාංශ මට්ටමින් විෂය මාලා සංශෝධනය වෙමින් පවතී.
5. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය තොරතුරු පද්ධතිය සහ මාණ්ඩලික තොරතුරු පද්ධතිය නව තාක්ෂණයේ ආධාරයෙන් යාවත්කාලීන කිරීම හා වෙනස් කිරීමට කටයුතු කිරීම.
6. විශ්වවිද්‍යාල සිසුන් සඳහා මාර්ගගත පුහුණුව සහ මාර්ගගත අධ්‍යාපන ක්‍රම සාර්ථකව ක්‍රියාත්මක වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, පිළිතුරට ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම සබරගමුව විශ්වවිද්‍යාලය රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ මැතිවරණ කොට්ඨාසය තුළ ඉදිකිරීම සම්බන්ධව සහ එම තීන්දු-තීරණ ගත් පිරිසට අපේ ගෞරවය පිරිනමනවා. මේ රටේ ඉතා අලංකාර භූමි ප්‍රදේශයක, ඒ ප්‍රදේශ ආවරණ වන විධියට විශ්වවිද්‍යාලයක් නිර්මාණය කර පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් අපි ඒ ගෞරවය පිරිනමනවා. මම මේ වෙලාවේ අපේ ගරු රාජ්‍ය ඇමතිතුමාගේ අවධානයට තවත් කාරණයක් යොමු කරන්න කැමැතියි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළට සහ පාසල් අධ්‍යාපනය තුළට දේශපාලනය රිංගා ගැනීම හරහා මේ රටේ බිහිවන ඉදිරි පරපුර ගන්නේ වැරදි ආදර්ශයක් කියලා මා සිතනවා. සබරගමුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව ශික්ෂණ රෝහලක් - Teaching Hospital එකක් - නිර්මාණය කිරීමට බලංගොඩ රෝහල වැඩිදියුණු කරලා ඒ අවස්ථාව ලබාදිය යුතුයි කියලා අපේ ආණ්ඩුව කාලයේ තීරණය කළා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපේ ආණ්ඩුවේ එවකට හිටපු පාලකයන්ගේ -මම මේ කරුණ ඔබතුමාට කියන්නේ ඔබතුමාට මේ ගැන අවබෝධයක් තිබෙන නිසා- ඔළමොට්ටළ තීන්දු එක්ක ඒ ශික්ෂණ රෝහල රත්නපුරයටම ගෙන ආවා. හැබැයි, එදා ඒ තීන්දුව නිසි ලෙස ගත්තා නම් බලංගොඩට ප්‍රදේශයේ ආදරණීය ජනතාවටත් වැඩක් වෙන අංග සම්පූර්ණ රෝහලක් හැදෙනවා. ඒ වාගේම විශ්වවිද්‍යාලයට ආසන්නව අවශ්‍ය විධියට වෛද්‍ය පීඨය නිර්මාණය වෙනවා.

වර්තමානයේදී තවත් යම් සිදුවීමකුත් මේ විශ්වවිද්‍යාලය ආශ්‍රිතව සිදු වෙනවා. සබරගමුව විශ්වවිද්‍යාලයට මහා සේවයක් කරපු මහාචාර්ය සුනිල් ශාන්ත මැතිතුමා එහි උපකුලපතිවරයා විධියට හිටියා. එතුමාගේ සේවා කාලය අවසන් වුණාට පස්සේ මෙවර උපකුලපතිවරයා පත් කිරීම දේශපාලනීකරණය වෙන අංක ගණන් ක්‍රමයක් හදලා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ කියන කාරණය ඔබතුමාත් දන්නවා ඇති. මේ වෙලාව මට මේක ගැන පැහැදිලි කරන්න පුළුවන් වෙලාවක් නොවෙයි. මම අහනවා, ඒක කොච්චර සාධාරණද, අසාධාරණද කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒක සාධාරණයි කියලා ඔබතුමා කියනවා නම් හරි. මොකද, වටේ ගොඩේ ඉන්න කණ්ඩායමක් ඒකට දමා ඒ අයගේ ලකුණු මත විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා නම් කිරීමේ හයිය දේශපාලනඥයන් අතට ගැනීම හරි නින්දිතයි. එම නිසා ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ ක්‍රමවේදයෙන් බැහැරව ගිහිල්ලා, ඒ සාධාරණය ඉටු කරලා, විශ්වවිද්‍යාලයට සේවාවක් කරපු උපකුලපතිවරු, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්ගෙන් විශ්වවිද්‍යාලයට පණ දෙන්න පුළුවන් චරිත ටිකක් විශ්වවිද්‍යාලයට ගෙනෙන්න අවශ්‍ය වැඩසටහනක් හදන්න ඕනෑ. ඒ ගැන ඔබතුමා දරන අදහස මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණු දෙකක් ඉදිරිපත් කළා. එකක් තමයි, සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ආරම්භ කිරීමේදී Professorial Unit එකක් සහිත ශික්ෂණ රෝහලක් තියෙන්න ඕනෑ කියන කාරණය. ඒ සඳහා බලංගොඩ රෝහල වෙනුවට රත්නපුර රෝහල තෝරාගෙන දැන් ඒ සංවර්ධන කටයුතු කරගෙන යනවා. එතකොට සබරගමුව විශ්වවිද්‍යාලය පිහිටා තිබෙන්නේ බලංගොඩ රෝහලටත් ටිකක් එහායින්. ඒ කියන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ එහා කෙළවරට කිට්ටු වෙන තැනක. ඔය ප්‍රශ්නය වයඹ විශ්වවිද්‍යාලය සම්බන්ධයෙනුත් ඇවිල්ලා තිබුණා. මොකද, කුලියාපිටිය මූලික රෝහලේ වෛද්‍ය පීඨය එතැන ක්‍රියාත්මක වෙනවා නම්, එම රෝහල ශික්ෂණ රෝහලක් කළ යුතුයි. හැබැයි, අනෙක් පැත්තෙන් එතැන ඉඳලා කුරුණෑගල රෝහලට කිලෝමීටර 30ක් පමණ දුරයි.

විශේෂයෙන්ම වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන්, වෛද්‍ය පීඨ සම්බන්ධයෙන් කථා කරනකොට professorial units අවශ්‍ය වෙනවා. ඒවා හදන රෝහල ශික්ෂණ රෝහලක් බවට පත් කිරීමේදී සාමාන්‍යයෙන් රෝග ගණනාවක් සඳහා ප්‍රතිකාර කරන රෝහලක් විය යුතුයි. මොකද, කුඩා රෝහලක ඒ කටයුත්ත කරන්න බැහැ. එහෙම නැත්නම් ඒ රෝහල upgrade කරන්න

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඕනෑ. වයඹ විශ්වවිද්‍යාලය දැන් ඒ ප්‍රශ්නය විසඳාගෙන තිබෙනවා. මෙතැනත් සෑහෙන දුර ප්‍රමාණයක් තිබෙනවා. එතකොට අනිවාර්යයෙන්ම වෙන්නේ වෛද්‍ය පීඨය රත්නපුර රෝහලට ආසන්න තැනකට ගේන්න වීමයි. සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍යයන්ට බලංගොඩිනුත් එහා ඉඳලා රත්නපුරයට දිනපතා යන්න එන්න අමාරුයි, ප්‍රායෝගික දුෂ්කරතා තිබෙනවා. නමුත්, ඒ වෙලාවේ තීන්දු ගැනීමේදී ඒ විධියට තීන්දු අරගෙන තිබෙනවා. අපට මේ වෙලාවේ ඒක වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒක ඉදිරියට යනවා. ඒ අනුව වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහලක් හැටියට රත්නපුර රෝහල සංවර්ධනය කරමින් යනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවන ප්‍රශ්නය විධියට ඇහුවේ උපකුලපති පත් කිරීම ගැන. උපකුලපති පත් කිරීමේදී තිබුණු ක්‍රමය අනුව අවසාන වශයෙන් යෝජනා කරන නම් තුනකින් එකක් තෝරා ගන්නේ ජනාධිපතිතුමා විසින්. ඒක හිටපු ජනාධිපතිවරු සියලුදෙනා අනුගමනය කරපු ක්‍රමයයි. 1977 වර්ෂයේ ඉඳලාම උපකුලපතිවරු පත් කළේ එහෙමයි. මෙතැනදී ඒ ක්‍රියාපටිපාටියේ වෙනසක් විතරයි සිදු කර තිබෙන්නේ. ක්‍රියාපටිපාටිය අනුව අවසාන වශයෙන් නම් තුනක් තෝරා ගන්නවා. හැබැයි, ඊට කලින් තව යෝජනා ඇවිල්ලා, ඒ යෝජනා panel එකකින් බලලා, ඊට පස්සේ තමයි ඒ නම් තුන එන්නේ. ඒ විධියට කාර්ය පටිපාටියේ වෙනසක් තමයි මෙහිදී සිදු කර තිබෙන්නේ. විශේෂයෙන්ම ඉදිරියේදී සිදුවීමට නියමිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සාමාන්‍ය අධ්‍යාපනයත්, වෘත්තීය අධ්‍යාපනයත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයත් ප්‍රතිසංස්කරණය වෙන්න නියමිතව තිබෙනවා. ඒ වාගේම මේ වෙනකොට Universities Act සහ විවිධ ක්‍රියාකාරකම් යාවත්කාලීන කිරීමත් අවශ්‍යව තිබෙනවා. ඒ නිසා ඒ අවස්ථාවේදී ඔය කියන කාරණය සලකා බලන්න පුළුවන්.

කොහොම වුණත්, ඒ අවස්ථාවේ සිටින ජනාධිපතිවරයාට අවසාන වශයෙන් නම් තුනක් ඉදිරිපත් වෙනවා. මොන ක්‍රමය යටතේ වුණත්, එයින් එක නමක් තෝරා ගැනීමේ බලය ජනාධිපතිවරයාට තිබෙනවා. ක්‍රම දෙකේදීම ඒක වෙනස් වෙලා නැහැ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයත් මම අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා නේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්න තිබුණේ පළමුවැනි අතුරු ප්‍රශ්නය ඇතුළේ. ගරු රාජ්‍ය ඇමතිතුමා උත්තර දුන්නේ ප්‍රශ්න දෙකක් විධියට. [බාධා කිරීමක්] එහෙම කරන්න එපා, ගරු කථානායකතුමනි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ වනවිට ඔබතුමන්ලා තීන්දු කර තිබෙනවා පාසල් පටන් ගන්න. අපොස උසස් පෙළ විභාගය සහ පහ වසර ශිෂ්‍යත්ව විභාගය පවත්වන දින යම්කිසි දින ගණනකින් ඉදිරියට ගෙන යන්න වෙනවා කියලා ඊයේ ප්‍රකාශයක් කර තිබුණා මම දැක්කා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම විශේෂයෙන්ම උසස් පෙළ විභාගය හා සම්බන්ධ කාරණා කිහිපයක් දැනගන්න කැමැතියි. මේ වනතෙක් -වසර දෙකක් තිස්සේ- අපේ දරුවන්ට උසස් පෙළ විෂය නිර්දේශය අනුව ඉගෙන ගැනීමේ අවකාශයක් තිබුණේ නැහැ. ඔබතුමන්ලා ඉදිරියේදී විභාගය පැවැත්වීමට තීන්දු කිරීමේදී නව විෂය නිර්දේශයක් ඉක්මනින් ළමයින්ට ලබා දෙනවාද, එහෙම නැත්නම් පැරණි විෂය නිර්දේශය තුළ දරුවන්ට ඒ අවස්ථාව ලබා දීමට මොනවා හෝ ක්‍රමවේදයක් තිබෙනවාද? මොකද, මේ වෙනකොට එම දරුවන්ට ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, "අපට වෙන්නේ මොකක්ද?" කියලා. ඒ කියන්නේ, සමහර දරුවන් උසස් පෙළට කලා විෂය ක්ෂේත්‍රය හදාරනවා කියා හෝ විද්‍යා විෂය ක්ෂේත්‍රය හදාරනවා කියා තෝරාගත්තා විතරයි. ඔවුන් එතැනින් එහාට ඉගෙන ගෙන නැහැ. එතකොට ඒ දරුවන් විභාගයට යනකොට, උසස් පෙළ වාගේ තරගකාරී විභාගයකදී ඔවුන්ට ලොකු අවස්ථාවක් අහිමි වෙන්න පුළුවන්. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද කියා මා දැනගන්න කැමැතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
ඇත්ත වශයෙන්ම වසර දෙකක අධ්‍යාපන කටයුතුවලින් පසුව තමයි උසස් පෙළ විභාගය පැවැත්වෙන්නේ. අපි හැමෝම දන්නවා, 2020 වර්ෂයේ මාර්තු මාසයේදී ආ කොවිඩ් පළමු රැල්ලෙන් පසුව මැතිවරණය පවා කල් දමා නැවතත් පාසල් පටන් ගත්තේ ඉන්පසුව බව. ඒ නිසා 2020 වර්ෂයේ පාසල් දින දර්ශනයේ දින 210න් පාසල් පවත්වා තිබෙන්නේ දින 65යි.

අද 2021 වර්ෂයේ ඔක්තෝබර් 8වැනි දා. බස්නාහිර පළාත හැර සෙසු පළාත්වල පළමුවැනි පාසල් වාරය පැවැත්වුණා. බස්නාහිර පළාතේ පළමුවැනි පාසල් වාරය පැවැත්වුයේ නැහැ. දින පහයි ඒ දරුවෝ පාසල් ගිහිල්ලා තිබෙන්නේ. දැන් අපට ගණනය කර ගන්න පුළුවන්. පාසල් දින දර්ශනයට අනුව දින 210 ඒවා දෙකක් කියලා හිතුවොත් කොච්චර ඒකක ප්‍රමාණයක් ආවරණය කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය එනවා. විභාගය සඳහා නොවැම්බර් මාසයට දින නියම කිරීමේදී කොරෝනා තත්ත්වය යටතේ දින 42ක් එක දිගට රට වසාගෙන ඉන්න වෙයි කියා උපකල්පනයක් තිබුණේ නැහැ. කෙසේ වෙතත්, ලබන 21වැනි දායින් ආරම්භ කරලා නොවැම්බර් මුල වන විට අදියර හතරක් යටතේ සියලු ම ශ්‍රේණි ආරම්භ වෙනවා. ඒක තමයි සැලැස්ම. විෂය නිර්දේශය ආවරණය කිරීමට සහ දරුවන්ට විභාගයට සූදානම් වීම සඳහා යම් කාලයක් අවශ්‍ය වෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, අපි උසස් පෙළ කරන කොට ඔබතුමා ඉපදිලාත් නැහැ. අපි උසස් පෙළ පටන් ගන්නකොට අවුරුදු දෙකේ විෂය මාලාව අවසන් කර revision කරන්නේ කවදාද, ප්‍රශ්න - උත්තර කරන්නේ කවදාද කියලා දරුවෝයි, ගුරුවරුයි අතර ඒ සඳහා යම් සූදානමක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, විභාග සඳහා සැලැස්මක් තිබෙනවා. මේ වන කොට ඒ සැලැස්ම ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තිබෙනවා. ඒක විශාල ප්‍රශ්නයක්. ඒක නිසා තමයි මම ඊයේ පිළිතුරු දුන්නේ. විභාග දෙපාර්තමේන්තුවත්, ගරු ඇමතිතුමාත්, අමාත්‍යාංශ ලේකම්තුමාත් සම්බන්ධ කරලා තමයි මම පිළිතුරු දුන්නේ. නුදුරේදීම අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඒ විස්තර කියයි. මේ වන විට පළාත් මට්ටමින් තක්සේරුවක් කරගෙන යනවා, පාසල විවෘත වී තිබූ කාල සීමාව තුළ කොයි තරම් දුරට විෂය මාලාව ආවරණය වුණාද කියලා. කොහොම වුණත් ගරු මන්ත්‍රීතුමනි, පැරණි විෂය නිර්දේශය සහ නව විෂය නිර්දේශය කියලා එන්නේ අවුරුදු අටකට වතාවක්, විෂය මාලා සංවර්ධනයේ ප්‍රතිඵලයක් හැටියට. හැබැයි, ඒක දැන් වලංගු වෙන්නේ නැහැ. හැබැයි, පැරණි විෂය නිර්දේශය තුන්වන වරටත් කරන ළමයි ඉන්නවා.

හැබැයි, මේ අවුරුද්දේදී first attempt and second attempt යන දෙකටම අලුත් විෂය නිර්දේශය අනුව තමයි එන්නේ. ප්‍රශ්නය

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

තිබෙන්නේ විෂය නිර්දේශයේ නොවෙයි. මෙතරම් පාඩම් ප්‍රමාණයක් ආවරණය කරලා නැති විට ප්‍රශ්න පත්‍රයේ ප්‍රමිතිය පිළිබඳ යමක් කරනවාද කියන කාරණය තමයි ඔබතුමා ඇහුවේ. ඒක කරන්න බැහැ. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන උසස් පෙළ විභාගයේ ප්‍රමිතිය වෙනස් කරන්න බැහැ. ඉගෙන ගැනීම ආවරණය සඳහා කාලයක් ලබා දීලා, ඒකෙන් සැහීමට පත් වෙන අවස්ථාවේ දරුවන්ට අසාධාරණයක් සිදු නොවන ලෙස විභාගය පවත්වනවා.

මම ඔබතුමාගේ දැන ගැනීම සඳහායි මේ කියන්නේ, ගරු මන්ත්‍රීතුමනි. මම සාමාන්‍ය පෙළ කරනකොට 1971 අප්‍රේල් කැරැල්ල ආවා. ඒක නිසා අපේ විභාගය කල් ගියා. ඒක උසස් පෙළ සඳහාත් බලපෑවා. ඒ කොවිඩ් හැදිලා නොවෙයි. ඒක අපේ රටට විතරයි වුණේ. නමුත් මේ වන විට කොවිඩ් -19 වසංගතය තුළ Cambridge O/L, A/L Exams දෙක පවා ඒ අය යම් ආකාරයකින් වෙනසකට භාජන කර තිබෙනවා. ලෝකයේම තත්ත්වය ඒකයි. මේ උද්ගත වී තිබෙන තත්ත්වය තුළ කොවිඩ් - 19 වසංගතයත් සැලකිල්ලට අරගෙන විෂය නිර්දේශය ආවරණය කිරීමට යම් කාලයක් ලබා දීලා, විභාගයට සූදානම් වීමටත් කාලයක් ලබා දීලා අපි මේ කටයුතු කරනවා. Second and third attempts සඳහා ඉදිරිපත් වන අයට මේ ප්‍රශ්නය නැහැ. ප්‍රධානම ප්‍රශ්නය එන්නේ first attempt එක කරන අයට. එහෙම නේද? Second and third attempts සඳහා ඉදිරිපත් වන අයට ප්‍රශ්නයක් නැහැ. කලින් විෂය මාලාව ආවරණය වෙලා නේ, විශේෂයෙන් third attempt එක කරන අයට. හැබැයි, Second attempt එක කරන අයගේත් ප්‍රශ්නයක් තිබෙන්න පුළුවන්. First attempt එක කරන අයට තමයි ප්‍රශ්නය එන්නේ. ප්‍රශ්න පත්‍රයේ ප්‍රමිතියේ වෙනසක් කරන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා විෂය මාලාව ආවරණය කරලා, විභාගයට සූදානම් වීමට කාලය ලබා දීලා, අසාධාරණයක් නොවන ලෙස ලබන වසරේ මුල් කාලයේ විභාගය පැවැත්වීමට අපි සැලසුම් කරගෙන යනවා. ඉදිරියේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ පිළිබඳ ප්‍රකාශයක් නිකුත් කරයි.

## රත්මල්ගහවැව හන්දියේ සිට කිවුලේකඩ හන්දිය දක්වා මාර්ගය: ප්‍රතිසංස්කරණය

### ரத்மல்கஹவெவ சந்தி தொடக்கம் கிவுலேகட சந்தி வரையான வீதி: புனரமைப்பு

### ROAD FROM RATHMALGAHAWEWA JUNCTION TO KIVULEKADA JUNCTION: RECONSTRUCTION

743/2020

**4. ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) අනුරාධපුර, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රත්මල්ගහවැව හන්දියේ සිට කිවුලේකඩ හන්දිය දක්වා වූ කිලෝමීටර 10ක් පමණ දිගින් යුතු මාර්ග කොටස ඉතා අබලන් තත්ත්වයේ පවතින බව එතුමා දන්නේද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එම මාර්ග කොටසේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) அநுராதபுரம், கெபித்திகொல்லாவ பிரதேச செயலகப் பிரிவிற்குட்பட்ட ரத்மல்கஹவெவ சந்தியிலிருந்து கிவுலேகட சந்தி வரையிலான சுமார் 10 கி.மீ. நீள முடைய வீதிப் பகுதி மிகவும் மோசமான நிலையில் உள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீதிப் பகுதியைப் புனரமைப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு ஏற்கனவே நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iii) மேற்படி வீதிப் பகுதியின் புனரமைப்புப் பணி களை நிறைவுசெய்வதற்கு எதிர்பார்க்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Highways:

(a) Is he aware that the road from Rathmalgahawewa Junction to Kivulekada Junction in the Kebithigollewa Divisional Secretary's Division in Anuradhapura, which is about 10 km in extent, is in a very dilapidated condition?

(b) Will he inform this House -

(i) whether steps will be taken to repair the aforesaid extent of road;

(ii) if so, whether provisions have been allocated for that by now; and

(iii) the date on which the renovation work of the aforesaid extent of road is expected to be completed?

(c) f not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කහටගස්දිගිලිය - රත්මල්ගහවැව - කිවුල්කඩ (B-538) කිලෝමීටර 24.64ක දුරින් යුතු වන අතර, එහි මුල් කිලෝමීටර 4.0ක් 2018 වර්ෂයේ ඇස්ෆොල්ට් අතුරා පිළිසකර කර ඇත. ඉතිරි මාර්ග කොටස කිලෝමීටර 100,000ක් පිළිසකර කිරීමේ වැඩසටහන යටතේ පිළිසකර කිරීමට අනුමත වී ඇත.

(ආ) (i) මාර්ග කිලෝමීටර 100,000ක් පිළිසකර කිරීමේ වැඩසටහන යටතේ පිළිසකර කිරීමට අනුමත වී ඇත. විස්තර ඇමුණුමෙහි දක්වා ඇත.

(ii) ඔව්. ඇමුණුමෙහි දක්වා ඇත.

(iii) ඇමුණුමෙහි දක්වා ඇත.

*ඇමුණුම:*

| | කොන්ත්‍රාත් සමාගම | කොන්ත්‍රාත් ප්‍රදානය කළ දිනය සහ අවසන් කළ යුතු දිනය | කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත් වටිනාකම (රුපියල් මිලියන) | දැනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 4+000 - 8+000 Km | DMC කොන්ත්‍රාත් සමාගම | 17.06.2020<br>30.11.2021 | NCP/ANP/2020/P03 (QA) | 205.11 | ඇස්ෆෝල්ට් අතුරා අවසන් කර ඇත. (83%) |
| 8+000 - 11+000 Km | Thudawe Brothers (පුද්) සමාගම | 17.06.2020<br>31.10.2021 | NCP/ANP/2020/P04 (QA) | 208.58 | ඇස්ෆෝල්ට් අතුරා අවසන් කර ඇත. (94%) |
| (11+000 - 12 +819)Km & (12+889 -14+750) Km | DMC කොන්ත්‍රාත් සමාගම | 02.04.2021<br>31.12.2021 | NCP/ANP/2020/P36 (QA) | 201.44 | මූලික වැඩ කොටස් ආරම්භ කර ඇත. (Surveying, clear-ing and grubbing completed) (12%) |
| 14+750-19+250 Km | CEC (පුද්) සමාගම | 02.04.2021<br>31.12.2021 | NCP/ANP/2020/P34 (QA) | 195.00 | මූලික වැඩ කොටස් ආරම්භ කර ඇත. (Surveying, clear-ing and grubbing completed) Cul-vert and embank-ment construction is in progress (14%) |
| 19+250-23+500 Km | CEC (පුද්) සමාගම | 02.04.2021<br>31.12.2021 | NCP/ANP/2020/P40 (QA) | 188.00 | මූලික වැඩ කොටස් ආරම්භ කර ඇත. (Surveying, clear-ing and grubbing completed) cul-vert and embank-ment construction is in progress (24%) |
| 23+500-24+640 Km | Sun කන්ස්ට්‍රක්ෂන් ආයතනය | 01.10.2021<br>15.03.2022 | NCP/ANP/2020/P42 (QA) | 205.00 | මූලික වැඩ කොටස් ආරම්භ කර ඇත. |

(ඇ) පැන නොනඟී.

ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා විමසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඇමුණුමෙහි සඳහන්ව තිබෙනවා. එම මාර්ග කොටස පිළිසකර කිරීම අපේ රජයෙන් ආරම්භ කර තිබෙනවා. හැකි ඉක්මනින් ඒ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු ඇමතිතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලා ඔය හරහා ඉදිකර ඇති පාලම් කිහිපයක සංවර්ධනය ගැන තමයි මගේ පළමුවන අතුරු ප්‍රශ්නය යටතේ මම ඔබතුමාගෙන් අහන්නේ.

ගරු ඇමතිතුමනි, පැන්නුම සිට අවුකන රජ මහා විහාරය දක්වා යන මාර්ගයේ පැති පාලමක් තිබෙන්නේ. පළමුවෙන්ම ඒක සංවර්ධනය කරන්න ඕනෑ. ඒ වාගේම, කලා වැවේ සිට සිරිමාගම දක්වා මාර්ගයේ තිබෙන පාලම හදන්න මා දන්නා විධියට මුල්ගල තබා තිබෙන්නේ 1994දී. මැති ඇමතිවරු හය දෙනෙක් විතර ගිහින් ඒකට මුල්ගල් තබා තිබෙනවා. ඒ පාලමත්, හිරිපිටියාගම සිට ගල්නෑව නගරය දක්වා තිබෙන මාර්ගයේ පාලමත් හදන්න ඕනෑ. හිටපු ඇමතිවරයෙක් වන ඒ.එම්.එස්. අධිකාරි මහතාගේ ගෙදර තිබෙන තැන ඉඳලා ඩී.එස්. සේනානායක මහතා ආරම්භ කරපු කාගම දක්වා යන මාර්ගයේ පාලමත් දැන් කැඩිලා තිබෙන්නේ. දැන් ඒ සඳහා තාවකාලික පාලමක් හදලා තිබෙනවා. ඒ වාගේම කලා ඔය හරහා යන අවසාන පාලම තමයි හුරිගස්වැව ඉඳලා කටියාව දක්වා යන මාර්ගයේ තිබෙන පාලම.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධනය කරන්න ඕනෑ පාලම්වල විස්තර සඳහන් කරලා ඔබතුමා ලියුමක් එවන්න. අපි ඒවා හදලා දෙන්නම්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

අනුරාධපුර දිස්ත්‍රික්කයේ RDA එකට අයත් මාර්ග 789ක් තිබෙනවා. දැනට ඒවායින් මාර්ග 182ක් ඔබතුමාගේ අමාත්‍යාංශය මඟින් ගිය අවුරුද්දේ සහ මේ අවුරුද්දේ හදලා ඉවරයි. ගරු

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

ඇමතිතුමනි, මැදවච්චියේ ඉඳලා මන්නාරමට යන මාර්ගයේ 10වන කිලෝමීටරයේ ඉඳලා 14වන කිලෝමීටරය දක්වා දැනට හදන්න ඉතිරිවෙලා තිබෙනවා. ඒ කොටසත් හදලා ඉවර කළොත් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ කරන්න කිසි වැඩක් ඉතිරි වෙන්නේ නැහැ. ඒකත් කරලා දුන්නොත් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපි ඒකත් කරලා දෙන්නම්, ගරු මන්ත්‍රීතුමා.

## මඩකලපුව දිස්ත්‍රික්කයේ පළාත් සභා පාසල්: සංවර්ධනය

மாகாண சபை நிர்வாகத்தின் கீழுள்ள மட்டக்களப்பு மாவட்ட பாடசாலைகள்: அபிவிருத்தி
SCHOOLS IN BATTICALOA DISTRICT COMING UNDER PROVINCIAL COUNCIL: DEVELOPMENT

756/2020

5. **ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ -
   (i) පළාත් සභා පාලනය යටතේ පවතින පාසල්වල ගොඩනැඟිලි සංවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම්;
   (ii) එම පාසල්වල ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மட்டக்களப்பு மாவட்டத்தில் -
   (i) மாகாண சபை நிர்வாகத்தின் கீழுள்ள பாடசாலைகளின் கட்டிடங்களை அபிவிருத்தி செய்வதற்காகத் தயாரிக்கப்பட்டுள்ள திட்டங்கள் யாவையென்பதையும்;
   (ii) மேற்படி பாடசாலைகளின் விளையாட்டு மைதானங்களை அபிவிருத்தி செய்வதற்குத் தயாரிக்கப்பட்டுள்ள திட்டங்கள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of -
   (i) the plans that have been made to develop the buildings of the schools in the Batticaloa District coming under the administration of the Provincial Council; and
   (ii) the plans that have been made to develop the playgrounds of those schools?

(b) If not, why?

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
You do not mind if I answer in Sinhala, do you, Hon. Member?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
It is okay.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පහත දක්වා ඇති පාසල්වල ගොඩනැඟිලි සංවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත.

- මඩ/ස්වාමි ආත්මකානන්තජී විද්‍යාලය
- මඩ/මහිලදිතෙයිවු සරස්වතී මහා විද්‍යාලය
- මඩ/කාකච්චඩිඩායි විශ්ණු මහා විද්‍යාලය
- මඩ/අයෙයන්කර්නි දෙමළ මහා විද්‍යාලය
- මඩ/කදිරවේලු විග්නේස්වර මහා විද්‍යාලය

(ii) ඔව්.

පහත සඳහන් පාසල්වල ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත.

- වාන්තමෝලායි මධ්‍ය මහා විද්‍යාලය, කල්කුඩා
- කන්නන්කුඩා මහා විද්‍යාලය, මඩකලපුව බටහිර
- ශාන්ත ජෝශප් විද්‍යාලය, මඩකලපුව
- තුරෛනීලවානයි මහා විද්‍යාලය, පදිරිප්පු. That is your area.

(ආ) අදාළ නොවේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, தேசியப் பாடசாலைகளை உருவாக்குதல் என்ற பெயரிலே எங்களுடைய மாவட்டத்திலுள்ள ஒருசில பாடசாலைகளை நீங்கள் தெரிந்தெடுத்திருக்கிறீர்கள். என்னுடைய பார்வையில் இச்செயற்பாடானது, மாகாண சபை முறைமையைப் பலவீனமாக்குவதற்கு நீங்கள் எடுக்கின்ற ஒரு முயற்சியாகும். இன்று எங்களுடைய மாகாணத்திலே எத்தனையோ தேசியப் பாடசாலைகள் தேவைகள் பூர்த்தி செய்யப்படாத நிலையில் இருக்கின்றன. உதாரணமாக, 3,000 மாணவர்கள் கல்வி கற்கும் பட்டிருப்பு மத்திய மகா வித்தியாலயத்திலே 250 பேர் இருக்கக்கூடிய auditorium ஒன்றுதான் இருக்கிறதே ஒழிய, போதுமான இடவசதி கொண்ட auditorium ஒன்று இல்லை. கடந்த வருடம் நாங்கள் இவ்வருடத்துக்கான நிதியொதுக் கீட்டில் இதற்கான நிதியைப் பெற்றுத்தருமாறு கேட்டபொழுது, புதிய வேலைத்திட்டங்களுக்கு நிதியொதுக்கீடு செய்வதில்லை என்று சொல்லப்பட்டது. இனிவருகின்ற வரவு செலவுத்திட்டத்தின் மூலமாவது, நான் குறிப்பிடும் ஒருசில விடயங்களுக்கு நிதியை ஒதுக்கீடு செய்து தருமாறு கேட்டுக்கொள்கின்றேன்.

தேசியப் பாடசாலைகளை உருவாக்குதல் என்ற பெயரிலே மட்டக்களப்பு மாவட்டத்திலுள்ள ஒருசில பாடசாலைகளைத் தேர்ந்தெடுத்திருப்பது ஓர் அரசியல் நாடகம்! ஏனென்றால், அங்குள்ள 300 பாடசாலைகளிலே 05 பாடசாலைகளைத் தெரிவுசெய்து, அவற்றை அபிவிருத்தி செய்தால் மட்டும் போதாது. அதைவிட, நீங்கள் மாகாண சபைக்கு முழுமையான நிதியை வழங்குவீர்களானால், எங்களால் அந்த வேலைத்திட்டங்களைச் செய்ய முடியும். உதாரணத்துக்கு பட்டிருப்பு மத்திய மகா வித்தியாலயத்தை எடுத்துக் கொண்டால், அங்குள்ள மாணவர்களின் எண்ணிக்கைக்கு ஏற்ப போதுமான இடவசதி கொண்ட auditorium ஒன்று இல்லை. அப்பாடசாலையில் மூன்று மாடிக் கட்டிடமொன்று கட்டப்பட்டிருக்கின்றது. அதன் கூரையிலே இன்றும் வெளவால்களுடைய பிரச்சினை இருந்துகொண்டிருக்கின்றது. அத்துடன், அங்கு technical துறை சார்ந்த பாடங்களுக்கு ஆசிரியர்கள் இல்லாத பிரச்சினையும் இருந்து கொண்டிருக்கின்றது. களுதாவளை மகா வித்தியாலயத்தை எடுத்துக்கொண்டால், கௌரவ மனோ கணேசன் அவர்கள் தேசிய ஒருமைப்பாடு, நல்லிணக்கம் மற்றும் அரசகரும மொழிகள் அமைச்சராகப் பதவி வகித்த காலத்தில் அவ்வமைச்சினூடாக அங்கு மூன்று மாடிக் கட்டிடமொன்று அமைப்பதற்கு நிதி ஒதுக்கீடு செய்யப்பட்டு, நிர்மாண வேலைகளும் ஆரம்பிக்கப்பட்டன. ஒப்பந்தக்காரருடன் ஏற்பட்ட பிரச்சினையின் காரணமாக, ஒரு மாடி கட்டிய நிலையில் தற்பொழுது அதன் நிர்மாணப் பணிகள் இடைநிறுத்தப்பட்டிருக்கின்றன. அத்துடன், அந்தப் பாடசாலையில் non-academic staff எவரும் இல்லை. இதுவும் ஒரு பிரச்சினையாக இருக்கிறது.

அதேபோல், வாழைச்சேனை இந்துக்கல்லூரி தேசியப் பாடசாலையிலே technology, ஆங்கிலம் போன்ற விடயங்களுக்குப் பாரிய தேவைப்பாடுகள் இருக்கின்றன. எங்களுடைய மாவட்டத்திலே 50 வருடங்கள் பழைமைவாய்ந்த நிலையில் சில தேசியப் பாடசாலைகளிலே இவ்வாறான குறைபாடுகள் இருக்கும்பொழுது, அரசியல் நாடகத்துக்காக இவ்வாறு செய்வதைக் கைவிடுங்கள்! நீங்கள் செய்ததை நான் தவறென்று சொல்லவில்லை. அந்தப் பிரதேச மக்கள் அதனை விரும்புகின்றார்கள் என்றால், அதில் எங்களுக்குப் பிரச்சினை இல்லை. அரசாங்கம் என்ற வகையில், பாடசாலைகளுக்கு நிதியொதுக்கீடு செய்கின்றபோது, அனைத்துப் பாடசாலை களுக்கும் சமமாக ஒதுக்குவதற்குரிய வேலைத்திட்டமொன்றை ஆரம்பிக்க முடியுமா? என நான் கேட்கின்றேன்.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

Now, may I answer you Supplementary Question. The Hon. Member referred to certain schools, including some schools which I mentioned in my Answer. - [*Interruption.*] No, it is okay, but all those schools mentioned in my Answer are under the provincial administration. The allocation of money is done with the concurrence of the Finance Commission, not only in this particular year, but every year. - [*Interruption.*] Yes. Normally, there is an allocation made by the provincial Ministry of Finance in consultation with the provincial Finance Commission. That is the normal procedure. I know that because I was the Chief Minister of the Western Province for five years. So like that, the provincial schools are given an allocation out of their annual Budget. Apart from that, as you said, there are 1000 National Schools proposed in the Policy Statement "Saubhagyaye Dekma" and we have already started that. Even if you say it is a political drama, to my knowledge, it is not a political drama.

There were two Circulars issued long ago, in January, 2020.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, that is not what I asked.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

Wait. I know how to answer a question. - [Interruption.]

**ගරු නිමල් ලාන්සා මහතා (ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் லான்சா - கிராமிய வீதிகள் மற்றும் ஏனைய உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Nimal Lanza - State Minister of Rural Roads and Other Infrastructure)

He will give the answer. You wait.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

You mind your own business. I am talking about the National Schools. - [*Interruption.*]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඕකෙන් වෙන්නේ සභාවේ කාලය නාස්ති වීමක්. කාලය නිරපරාදේ නාස්ති වෙනවා. [බාධා කිරීම්] ගරු රාජ්‍ය ඇමතිතුමා. [බාධා කිරීම්]

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

I will answer that particular Supplementary Question.

When selecting National Schools, there is a criteria and it is the provincial administration which ultimately proposes certain schools to be converted to National Schools. All the National Schools are given funds by the Line Ministry and the allocations for schools under provincial administrations are made by the respective Provincial Councils. If you go through the draft Appropriation Bill for 2022, of course, you will find that it is proposed to increase the amount allocated for education in 2022. So, certainly, this will be taken into consideration and funds will be allocated through the provincial administration for 2022.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම කියනව හැදුවේ මේකයි. මම mention කළ ඉස්කෝල ඔක්කෝම provincial ඉස්කෝල නොවෙයි. මම දැන් mention කළ ඔක්කෝම ජාතික පාසල්. Paddiruppu Madya Maha Vidyalayam is a National School.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

Kaluthavalai Maha Vidyalayam is a National School. ඒ ඉස්කෝලවලට Central Government එකෙන් තමයි directly funds allocate කරන්නේ; Provincial Council එක හරහා නොවෙයි. මම අමාත්‍යාංශයට ගිහිල්ලා ඇහුවා. ඒවාට Central Government එකේ Budget එකෙන් මුදල් එන්නේ. Provincial Council එකෙන් නොවෙයි. Anyway, you can look into that. මගේ request එක මේකයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම මේ කියපු ඉස්කෝල අවුරුදු 30ක ඉඳලා තිබෙන National Schools.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමයි වෙන්නේ. මේ පාසල් select කරලායි තිබෙන්නේ. මේවා දැන් තමයි Line Ministry එකට එන්නේ. ඒ වනතුරු තිබුණේ Provincial Council එක යටතේ. ඒ නිසා ඒ වෙලාව වන කොටත් යම් Budget එකක් හදලා තිබුණා. හැබැයි, මේ අවුරුද්දේ fundsවලින් Line Ministry එකෙන් දෙන්න පුළුවන් ප්‍රමාණය දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, පුළුවන් තරම් කෙටි උත්තර දුන්නා නම් හොඳයි.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
හොඳයි, ගරු කථානායකතුමනි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I want to ask my second Supplementary Question.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You have already asked your three Supplementary Questions. Is that not so?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
පළමුවැනි අතුරු ප්‍රශ්නය විතරයි ඇහුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, you go ahead with it.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ප්‍රශ්නය පළාත් පාසල් සම්බන්ධ ප්‍රශ්නයක්. පළමුවැනි ප්‍රශ්නය National Schools සම්බන්ධ ප්‍රශ්නයක්. ගිය අවුරුද්දේ, නැඟෙනහිර පළාතේ ගුරුවරුන්ගේ දවසක පඩිය කපන්න කියලා නැඟෙනහිර පළාතට විතරක් Circular එකක් එවලා තිබුණා. නැඟෙනහිර පළාතේ ආණ්ඩුකාරතුමිය විතරක් ඒක කරලා තිබුණා. ඒකට විරුද්ධව නැඟෙනහිර පළාතේ ගුරුවරු Supreme Court එකේ නඩුවක් දැම්මා. ඒ නඩුව දැන් අහගෙන යනවා. ඒකට කැමැත්ත ප්‍රකාශ කළ අයගේ වැටුපෙන් විතරක් නොවෙයි, කැමැත්ත නැති අයගේත් දවසක පඩිය කපලා තිබුණා. ඒ වාගේම දැන් ආපසු මේ සම්බන්ධයෙන් ඔක්තෝබර් මාසයට අලුතෙන් - නැඟෙනහිර පළාතේ විතරයි- Circular එකක් issue කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඊයේ පෙරේදාත් උද්ඝෝෂණයක් කළා. ඒ උද්ඝෝෂණය කරපු Teachers' Union එකේ presidentට මරණ තර්ජන එල්ල කරලා තිබෙනවා, TMVP එකේ කට්ටිය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔය කාරණය වෙනම විවාදයට ගන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවාද?

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
මේ කාරණය සම්බන්ධයෙන් උසාවියේ නඩුවක් තිබෙන නිසා එම ප්‍රශ්නයට පාර්ලිමේන්තු සභා ගර්භයේදී පිළිතුරක් දෙන්න බැහැ. නමුත් ඔබතුමා කියපු කාරණය ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට යොමු කරලා, අපි ඒ ගැන provincial administration එකත් එක්ක කථා කරන්නම්.

## මුල්ලියාවලයි ප්‍රා.ලේ. කොට්ඨාසයට අයත් තැපැල් කාර්යාලය: ස්ථිර ගොඩනැඟිල්ලක්

முள்ளியவளைப் பிரதேச செயலகப் பிரிவிலுள்ள அஞ்சல் அலுவலகம்: நிரந்தரக் கட்டிடம்

POST OFFICE BELONGING TO MULLLIYAWALAI DS DIVISION: PERMANENT BUILDING

934/2020

**6. ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, මුල්ලියාවලයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරි වසම් 22ක් ආවරණය වන තැපැල් කාර්යාලය තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වා ගෙන යනු ලබන බවත්;

(ii) ඒ සඳහා රු. 20,000ක මාසික කුලියක් ගෙවන බවත්;

(iii) එම තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදිකර දෙන ලෙස ජනතාව සහ පොදු සංවිධාන විසින් ඉල්ලීම් කර ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මුල්ලියාවලයි ප්‍රදේශයේ ජීවත් වන ජනතාව වෙනුවෙන් ගුණාත්මක තැපැල් සේවයක් ලබා දීම සඳහා ඉහත තැපැල් කාර්යාලය වෙනුවෙන් ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදි කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ගොඩනැඟිල්ල ඉදි කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மாவட்டத்தின் முள்ளியவளைப் பிரதேச செயலகப் பிரிவிலுள்ள 22 கிராம அலுவலர் பிரிவுகளை உள்ளடக்கும் அஞ்சல் அலுவலகம் தற்காலிகக் கட்டிடமொன்றில் இயங்கி வருகின்றதென்பதையும்;

(ii) இதற்கென 20,000/- ரூபா மாதாந்த வாடகை செலுத்தப்படுகின்றதென்பதையும்;

(iii) மேற்படி அஞ்சல் அலுவலகத்திற்கு நிரந்தரக் கட்டிடமொன்றை நிர்மாணித்துத் தருமாறு மக்களும் பொது அமைப்புக்களும் கோரிக்கை விடுத்துள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) முள்ளியவளைப் பிரதேசத்தில் வசிக்கும் மக்களுக்காகத் தரமான அஞ்சல் சேவையை வழங்குவதற்கு மேற்படி அஞ்சல் அலுவலகத்திற்கென நிரந்தரக் கட்டிடமொன்று நிர்மாணிக்கப்படுமா என்பதையும்;

(ii) அவ்வாறாயின், மேற்படி கட்டிடம் எப்போது நிர்மாணிக்கப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media:

(a) Is he aware that -

(i) the post office which covers 22 Grama Niladhari Divisions belonging to the Mulliyawalai Divisional Secretary's Division in the Mullaitivu District is run in a temporary building;

(ii) a monthly rental of Rs. 20,000 is paid for that building; and

(iii) the people in the area and public organizations have submitted requests for constructing a permanent building for the aforesaid post office?

(b) Will he inform this House -

(i) whether a permanent building will be constructed to house the aforesaid post office in order to provide a quality postal service for the people living in the Mulliyawalai area; and

(ii) if so, of the time frame within which the aforesaid building will be constructed?

(c) If not, why?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும - வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Mass Media)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මුල්ලියාවලයි තැපැල් කාර්යාලය මුලතිව්-මාන්කුලම මාර්ගයේ පිහිටි ගොඩනැඟිල්ලක පවත්වාගෙන යනු ලැබේ.

(ii) අංක MU/RP/146 හා 2018.09.04 දිනැති රජයේ තක්සේරු වාර්තාව අනුව රුපියල් 20,000ක මුදලක් මාසිකව ගෙවමින් පවත්වාගෙන යනු ලබයි. තවද, 2018.09.01 දින සිට ඉදිරි වසර තුනක කාලයක් සඳහා එම ගොඩනැඟිල්ලේම තැපැල් කාර්යාලය පවත්වාගෙන යැම වෙනුවෙන් බදු ගිවිසුම් අත්සන් කර ඇත.

(iii) උතුරු පළාත් ආණ්ඩුකාරතුමා විසින් උක්ත තැපැල් කාර්යාලය සඳහා ගොඩනැඟිල්ලක් ඉදි කර දෙන ලෙස එවකට තැපැල් සේවා හා මුස්ලිම් ආගමික ගරු අමාත්‍යතුමා වෙත G/NPC/A9/PO/Land/Mull/125 හා 2019.03.29 දිනැතිව ලිපි යොමු කර තිබූ නමුත් 2019 වර්ෂය සඳහා නව ගොඩනැඟිලි ඉදි කිරීමට ප්‍රතිපාදන වෙන් වී නොතිබුණු බැවින්, 2019 වර්ෂයේ ඉදි කිරීම් සිදු කිරීමට නොහැකි වී ඇත.

(ආ) (i) දැනට ප්‍රතිපත්තිමය වශයෙන් -මේ වසර ඇතුළත- නව ගොඩනැඟිලි ඉදි කිරීම නතර කර ඇති හෙයින් එම තත්ත්වය වෙනස් වී ප්‍රතිපාදන ලදහොත් එම කාර්යාලය ඉදිකිරීමේ හැකියාවක් ඇත.

ගරු මන්ත්‍රීතුමනි, මම මීට කලින් ඔබතුමන්ලාගේ පක්ෂයේම මන්ත්‍රීවරයෙකු මතු කළ ප්‍රශ්නයකට මේ උත්තරය දී තිබෙනවා. මුලතිව් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 6ක් වාගේම ග්‍රාම නිලධාරි කොට්ඨාස 136ක් තිබෙනවා. හැබැයි, එහි ප්‍රධාන තැපැල් කාර්යාල තිබෙන්නේ 5යි. උපතැපැල් කාර්යාල 12ක් තිබෙනවා; ලියුම් නොබෙදන කාර්යාල 5ක් තිබෙනවා. ප්‍රධාන තැපැල් කාර්යාල, උපතැපැල් කාර්යාල, ලියුම් නොබෙදන කාර්යාල වශයෙන් 22ක් තිබෙනවා කියා සැලකුවොත්, මුළු දිස්ත්‍රික්කය තුළ ග්‍රාම නිලධාරි වසම් 6ක් ආවරණය කරන්න තිබෙන්නේ එක තැපැල් කාර්යාලයයි, ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ප්‍රදේශවාසීන් මුහුණ දෙන ගැටලු, පීඩනය, දුෂ්කරතාව අපි තේරුම් ගෙන තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව වෙනුවෙන් මම ඔබතුමාට වගකීමෙන් පිළිතුරක් දෙනවා.

මේ රටේ ආර්ථික තත්ත්වය යහපත් වෙලා නැවත ඉදිකිරීම් ආරම්භ කරන අවස්ථාවේදී, තැපැල් දෙපාර්තමේන්තුවේ සේවාවන්ට අදාළව වඩාත් පීඩාකාරී තත්ත්වයන් මැද ජනතාව වඩාත් පීඩාකාරීව සිටින පළාත් දෙකෙන් එකක් වන උතුර පළාතේ පුරවැසියන්ට ප්‍රමුඛත්වය ලබා දෙන්න අපි කටයුතු කරනවා. ආණ්ඩුවක් හැටියට අපේ ප්‍රතිපත්තිය ඒකයි, ගරු කථානායකතුමනි,

(ii) නිශ්චිත කාල වකවානු ප්‍රකාශ කළ නොහැක.

ගරු මන්ත්‍රීතුමනි, මේ වසරේ එය ඉදිකරන්න බැහැ. මොකද, මේ වසරේ ලංකාවේ කොහේවත් නව ඉදිකිරීමක් සිදු වන්නේ නැහැ. නමුත්, නව ඉදිකිරීම්වලට ඉඩ ලැබෙන පළමුවැනි අවස්ථාවේදීම ඒ කටයුත්ත ඉෂ්ට වෙනවා ඇති.

(ඇ) අදාළ නොවේ.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! நான் 2018ஆம் ஆண்டு முதல் முள்ளியவளை தபால் நிலையத்துக்கு நிரந்தரக் கட்டிடமொன்றை அமைத்துத் தருமாறு கோரிக்கை விடுத்து வருகின்றேன். முன்பு இவ்விடயத்துக்குப் பொறுப்பாக இருந்த

[ගරු චාල්ස් නිර්මලනාදන් මහතා]

அமைச்சரிடமும் கோரிக்கை விடுத்திருந்தேன். உண்மையிலேயே அதற்கான தேவை இருக்கின்றது என்பதை நீங்களும் உணர்கிறீர்கள். எதிர்வரும் 2022ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத்திட்டத்தில் அதற்கென சிறியதொரு தொகையைத்தான் ஒதுக்கவேண்டி ஏற்படும். ஆகையால், நீங்கள் முன்னுரிமை அடிப்படையில் அதற்கான நிதியை ஒதுக்கீடு செய்து, நிரந்தரக் கட்டிடமொன்றை 2022ஆம் ஆண்டில் அமைத்துத் தருவீர்கள் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது.

அடுத்து, 120,000இற்கும் மேற்பட்ட மக்களைக் கொண்ட முல்லைத்தீவு மாவட்ட அஞ்சல் அத்தியட்சகர் காரியாலய மானது, 2009ஆம் ஆண்டுக்குப் பிறகு வவுனியாவில்தான் இயங்கி வருகிறது. இதனை முல்லைத்தீவுக்கு மாற்றித் தருமாறு முன்பிருந்த அமைச்சர்களிடம் பலமுறை கேட்டிருந்தும், அவர்கள் அதற்குரிய நடவடிக்கைகளை எடுக்கவில்லை. எனவே, இந்த அஞ்சல் அத்தியட்சகர் காரியாலயத்தை முல்லைத்தீவுக்கு மாற்றித்தர முடியுமா? என நான் உங்களிடம் கேட்கின்றேன்.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, යුද්ධයෙන් පසුව මුලතිව් ප්‍රධාන තැපැල් කාර්යාලය වව්නියාවේ තමයි ස්ථානගත වෙලා තිබෙන්නේ. ඒක සාධාරණ නොවන බව විෂය භාර අමාත්‍යවරයා විධියට මම පිළිගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේවා නිවැරදි කරන්න ලැබෙන ප්‍රථම අවස්ථාවේදීම මෙම ඉල්ලීම ඉෂ්ට වන බව මම ඉතා වගකීමෙන් නැවතත් ඔබතුමාට කියනවා.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

ගරු කථානායකතුමනි, මට තව එක ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒක කවදා විතර කරන්න පුළුවන් වෙයි ද?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු මන්ත්‍රීතුමනි, ඉදිකිරීම් වැනි දේවල් ගැන මේ මොහොතේ ක්ෂණිකව උත්තරයක් දීමේ හැකියාව අපට නැහැ. [බාධා කිරීමක්] මීළඟ පාර්ලිමේන්තු සතියේ අපේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පැවැත්වෙනවා. වව්නියාවේ දැනට තාවකාලිකව ස්ථානගත වෙලා තිබෙන මුලතිව් ප්‍රධාන තැපැල් අධිකාරි කාර්යාලය කුමන වකවානුවක නැවත ස්ථාපනය කරන්න අපට පුළුවන් වෙයි ද කියන එක හරියටම දින වකවානුත් එක්ක ඊළඟ උපදේශක කාරක සභා රැස්වීමේදී ඔබතුමාට දැනුම් දෙන්නම්.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

ගරු ඇමතිතුමනි, මන්නාරමේ නරුවිලිකුලම් කියලා ගම්මානයක් තිබෙනවා. ඔබතුමා ඉස්සෙල්ලා කියපු විධියට මන්නාරමේ GN කොට්ඨාස 6ක් ඇතුළේ sub-post office එකක්වත් නැහැ. ඒ සම්බන්ධයෙන් මම මේ වෙලාවේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවටත් මම ඒ සම්බන්ධයෙන් ලියුමක් දෙන්නම්. ඒ ගැනත් ඔබතුමා පොඩ්ඩක් සොයා බලන්න ඕනෑ. මොකද, ඒ ප්‍රදේශයට අනිවාර්යයෙන්ම sub-post office එකක් ඕනෑ. මන්නාරමේ නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඇතුළේ නරුවිලිකුලම් කියලා ගම්මානයක් තිබෙනවා. ඒ ගම්මානය වටේ GN කොට්ඨාස 6ක් තිබෙනවා, ගරු ඇමතිතුමා. ඒ ගැනත් සලකා බලන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, මන්නාරමේ ග්‍රාම නිලධාරි වසම් 4කට එක තැපැල් කාර්යාලයක් බැගින් තිබෙනවා. මන්නාරමේ ප්‍රධාන තැපැල් කාර්යාල 8ක් තිබෙනවා; ලියුම් බෙදා හරින උපතැපැල් කාර්යාල 17ක් තිබෙනවා; ලියුම් බෙදන්නේ නැති කාර්යාල 19කුත් තිබෙනවා. ඔබතුමා ඒවායේ එකතුව බලන්න, මුලතිව්වලට සාපේක්ෂව මන්නාරම ටිකක් ඉදිරියෙන් ඉන්නේ. උතුර පළාතේ මුලතිව්වල තමයි මේ අර්බුදය බරපතළ විධියටම තිබෙන්නේ. මන්නාරම ගැන මේ මතු කරන ප්‍රශ්නයෙහි ඇතුළාන්තයට ගිහින් උත්තරයක් දෙන්න තරම් දැනුමක් මට මේ මොහොතේ නැහැ. මොකද, ඒ ගැන ඔබතුමා අහපු මුල් ප්‍රශ්නයේ සඳහන්ව තිබුණේ නැහැ.

ඒ පිළිබඳවත් ඔබතුමාට කථා කරන්න පුළුවන් අපේ උපදේශක කාරක සභාවේ දී.

## කල්පිටිය අර්ධද්වීපයේ දෙළුම් වගාකරුවන්: මුහුණ දෙන ගැටලු
### கற்பிட்டி குடாநாட்டு மாதுளைப் பயிர்ச்செய்கையாளர்கள்: எதிர்கொள்ளும் பிரச்சினைகள்
### POMEGRANATE CULTIVATORS IN KALPITIYA PENINSULA: ISSUES ENCOUNTERED

1064/2020

**7. ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයට අයත් කල්පිටිය අර්ධද්වීපය තුළ දෙළුම් වගා කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට එහි දෙළුම් වගා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එහි දෙළුම් වගාවේ නිරතවන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) නිසි පරිදි තාක්ෂණික දැනුම නොලැබීම හා නිෂ්පාදන අළෙවි කර ගැනීමට අපහසු වීම වැනි ගැටලු එම ගොවීන්ට ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்திற்கான கற்பிட்டி குடா நாட்டில் மாதுளைப் பயிர்ச்செய்கை மேற்கொள் ளப்படுவதனை அவர் அறிவாரா;

(ii) ஆமெனில், தற்போது அங்கு மாதுளைப் பயிர்ச் செய்கை மேற்கொள்ளப்பட்டுள்ள நிலப்பரப்பு யாது;

(iii) அங்கு மாதுளைப் பயிர்ச்செய்கையில் ஈடுபட்டுள்ள விவசாயிகளின் எண்ணிக்கை எத்தனை;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) அவ்விவசாயிகளுக்கு உரிய தொழில்நுட்ப அறிவுரைகள் கிடைக்கப்படாமை மற்றும் உற்பத்திகளைச் சந்தைப்படுத்துவது தொடர்பான பிரச்சினைகள் உள்ளதென்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், மேற்படி பிரச்சினைகளைத் தீர்ப்பதற்கு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) whether he is aware of the fact that pomegranate is cultivated in the Kalpitiya Peninsula which belongs to the Puttalam District;

(ii) if so, the extent of land in which pomegranate has been cultivated by now; and

(iii) the number of farmers who engage in cultivation of pomegranate there?

(b) Will he also inform this House -

(i) whether he is aware of the fact that the aforesaid farmers encounter problems such as the lack of proper technological knowledge and difficulty in marketing their produce; and

(ii) if so, the action that will be taken to solve the aforesaid problems?

(c) If not, why?

**ගරු ඩී.බී. හේරත් මහතා (පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.பி. ஹேரத் - கால்நடை வளங்கள், பண்ணைகள் மேம்பாடு, பால் மற்றும் முட்டை சார்ந்த கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. D.B. Herath - State Minister of Livestock, Farm Promotion and Dairy and Egg Related Industries)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයට අයත් කල්පිටිය අර්ධද්වීපය තුළ දෙළුම් වගා කරනු ලැබේ.

(ii) මේ වනවිට හෙක්ටෙයාර 55ක පමණ දෙළුම් වගා කර ඇත.

(iii) දෙළුම් වගාවේ නිරත වන ගොවීන් ගණන 145ක් පමණ වේ.

(ආ) (i) දැනට දේශීය වෙළඳ පොළෙහි ඉල්ලුමක් පවතින බැවින්, ගොවීන්ට අලෙවිය පිළිබඳව ගැටලුවක් නොමැත. දැනට පවතින ඇඩි නිලධාරි හිඟය හේතුවෙන් ගොවි ක්ෂේත්‍ර ආශ්‍රිතව සිදු කළ යුතු ව්‍යාප්ති කටයුතු නිසි පරිදි ඉටු කිරීමට නොහැකි වී ඇති බැවින්, තාක්ෂණය ක්ෂේත්‍රයේදීම ලබා දීම ගැටලුවක් වී ඇත.

(ii) * දැනට ගොවීන්හට කල්පිටිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ ස්ථානභාර නිලධාරි අමතා/ හමුවී අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාගත හැකිය.

* දැනට බොහෝ දෙනෙකු වගා කරන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් කලකට පෙර නිර්දේශ කළ "නිමාලි" යන ප්‍රභේදයයි. මෑතකදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් "කල්පිටිය දෙමුහුම" නැමැති දෙමුහුම් ප්‍රභේදය නිදහස් කර ඇති අතර, එය තවදුරටත් ගොවීන් අතර ප්‍රචලිත කිරීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා පිළිතුරු දීම ගැන. දෙළුම් කියන්නේ අපේ රටේ වාගේම ලෝකයේත් ඉතාම වැදගත් පලතුරක්. ඒ වාගේම, කෘෂිකර්ම අමාත්‍යාංශයේ විශේෂ අවධානයකට ලක් නොවුණු පලතුරක්. Cancer රෝගීන් ගත්තත්, පුංචි දරුවන් ගත්තත්, විවිධ රෝගී තත්ත්වයන්ට පත් වෙන හැම අවස්ථාවකදීමත් දෙළුම් භාවිත කරනවා. ලෙඩෙක් බලන්න යන අවස්ථාවකදීත් හැමෝම දෙළුම් ගෙඩියක් හොයන අවස්ථා තිබෙනවා.

ගරු කථානායකතුමනි, හැම ග්‍රාම නිලධාරි වසමකම කෘෂිකර්ම සංවර්ධන නිලධාරියෙක් ඉන්නවා; පරික්ෂණ නිලධාරියෙක් ඉන්නවා. පුත්තලම, කල්පිටියේ පමණක් නෙවෙයි, ලංකාවේ දෙළුම් වගා කළ හැකි අනෙකුත් ප්‍රදේශ පිළිබඳව සොයා බලා දෙළුම් වගාව ප්‍රචලිත කරලා, ගුණාත්මක දෙළුම් ගෙඩියක් නිෂ්පාදන කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය පියවර ගත යුතුව තිබෙනවා. වෙළඳ පොළට එන විදේශීය දෙළුම් ගෙඩිය නම් ඉදිරියේදී ඒවිද, නැද්ද මම දන්නේ නැහැ. නමුත්, මීට පෙර පැමිණියා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ දෙළුම් ගෙඩියත් එක්ක තරග කරන්න පුළුවන් දේශීය දෙළුම් ගෙඩියක් නිර්මාණය කරන්න කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අරගෙන තිබෙන පියවර මොකක්ද, ගන්න බලාපොරොත්තුවෙන් ඉන්න පියවර මොකක්ද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பி. ஹேரத்)
(The Hon. D.B. Herath)

ගරු කථානායකතුමනි, "කල්පිටිය දෙමුහුම" දෙළුම් වර්ගය දැනට අලුතින් සොයා ගෙන තිබෙන එකක්. දෙළුම් ලංකාවේ ඕනෑම තැනක, ඕනෑම පාංශු පරාසයකට සහ දේශගුණික පරාසවලට ඔරොත්තු දෙන පලතුරක්. ඒ නිසා "කල්පිටිය දෙමුහුම" නැමැති දෙළුම් වර්ගය වගා කිරීම ප්‍රචලිත කරන්න පුළුවන්. පළාත් සභාවේ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහාත් ඉදිරියේදී මේ කටයුතු කරන්න හැකියාවක් තිබෙනවා.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දීර්ඝ ලෙස සහ පැහැදිලි ලෙස ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව, කාබනික පොහොර වගාව ප්‍රචලිත කිරීමට සහ කාබනික වගාවට ගොවියා හුරු කරන්න රජයක් විධියට මේ වන විට අපි විශාල වැයමක්

[ගරු අශෝක ප්‍රියන්ත මහතා]

දරනවා. එහි ප්‍රශ්න සහ ගැටලු අඩු වැඩි වශයෙන් තිබෙනවා. නමුත්, මේ පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානයට යොමු කරලා, ඒ ගැන යම් සැලසුමක් තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි. මා දන්නා විධියට දෙළුම් වගා කරන බහුතරයක් -වැඩි සංඛ්‍යාවක්- ඉන්නේ මේ දිස්ත්‍රික්කයේ. වැඩි ප්‍රමාණයක් කාබනික පොහොර යොදවා, එයට යම් පුංචි මිශ්‍රණයක් තමයි රසායනික පොහොර යොදවන්නේ. හැබැයි, දෙළුම් ගොවියාට තිබෙන ගැටලුව තමයි, හොඳ නීරෝගී පැළයක් ලබාගැනීම සහ ඒ පැළය ඉන්දවලා ඉදිරියට මොනවාද කරන්න ඕනෑ කියන එක. මම හිතන හැටියට, ඒ වෙනුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යම් වැඩ පිළිවෙළක් හදනවා නම් හොඳයි. මොකද, පොහොරවලින් සිදු වන හානියත් අවම වන නිසා ගොවීන් ප්‍රමාණය වැඩි කරලා අපට පුළුවන් ඒ කටයුත්ත කරන්න. හැබැයි, දෙළුම් පැළ කල්පිටිය පර්යේෂණ ස්ථානයේ තිබෙනවා කිව්වාට ඒවා මිල අධිකයි. මම අද උදේත් ඒ ගැන ඇහුවා. සාමාන්‍ය වෙළෙඳ පොළේ තිබෙන පැළයට වඩා මිල අධිකයි. එතකොට ඒ දෙක අතර වෙනසක් ඇති. නමුත්, ඒක අවබෝධ කරලා කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට දෙළුම් ගොවියාට සහනයක් දෙන වැඩ පිළිවෙළක් ඉදිරියේදී හදන්න බලාපොරොත්තු වෙනවා ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු ඩී.බී.හේරත් මහතා**
(மாண்புமிகு டீ.பி. ஹேரத்)
(The Hon. D.B. Herath)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට මම පිළිතුරක් දෙන්නම්. විශේෂයෙන් දෙළුම් ප්‍රභේද 3ක් අපේ රටේ තිබෙනවා. මේ දෙළුම් බීජවලින් රෝපණය කරනවාට වඩා දෙළුම් අතු බද්ධ කිරීමේ ක්‍රමවේදයට ගිහින් පැළ හදා ගන්න පුළුවන්.

ඊළඟට, එතුමාගේ ප්‍රශ්නය වුණේ කාබනික වගාව පිළිබඳව. විශේෂයෙන් කාබනික පොහොර පොළොවට, ගොවිබිමට එකතු කිරීමේ ස්වභාවය තුළ එහි පාරිසරික පද්ධතිය නිවැරදි කිරීමත්, මෙතෙක් විකෘති වී ඇති පස නිවැරදි කිරීමත් තමයි අපේක්ෂා කරන්නේ. එවන් පරිසරයක කාබනික පොහොර දමා පැළය රෝපණය කළාම, ඒ පරිසරයේ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වයක් තුළ ශාකයට අවශ්‍ය නයිට්‍රජන්, පොටෑසියම්, පොස්පරස් වාගේ දේවල් උරාගැනීමේ හැකියාවත්, පසේ pH අගය යහපත් කිරීමත් සිද්ධ වනවා.

ඒ නිසා කාබනික පොහොර, රසායනික පොහොර කියන කාරණාවට වඩා, විශේෂයෙන්ම පස සුවපත් කිරීම තුළින් දෙළුම් වගාවෙන් සාර්ථක අස්වැන්නක් කරා ළඟා කර ගන්න පුළුවන් කියලා බොහෝ කෘෂිකර්ම විශේෂඥයන් අපට උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ අනුව මේ ව්‍යාපෘතිය සමස්ත රටේම ක්‍රියාත්මක කරන්න පුළුවන්.

## ඉයෝන් ලංකා මූල්‍ය ආයතනය: තැන්පත්කරුවන්
## இயோன் லங்கா நிதி நிறுவனம்: வைப்பாளர்கள்
## IYON LANKA FINANCIAL INSTITUTION: DEPOSITORS

1109/2020

**8.** **ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කුරුණෑගල, පැල්ලන්දෙණිය ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ඉයෝන් ලංකා මූල්‍ය ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය යටතට පත්කර තිබේද;

(ii) එම ආයතනයේ මුදල් තැන්පත්කරුවන් අතරින් වැඩි ප්‍රමාණයක් විශ්‍රාමික රණවිරුවන් බව දන්නේද;

(iii) එම ආයතනයේ මුදල් තැන්පත් කර ඇති තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම තැන්පත්කරුවන්ගේ තැන්පත් මුදල්, නැවත ඔවුන් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல், பெல்லன்தெனிய பிரதேசத்தில் நடாத்திச்செல்லப்படுகின்ற இயோன் லங்கா நிதி நிறுவனமானது இலங்கை மத்திய வங்கியின் கட்டுப்பாட்டின்கீழ் கொண்டுவரப்பட்டுள்ளதா;

(ii) அந்நிறுவனத்தில் வைப்புச் செய்தவர்களில் பெரும்பாலானவர்கள் ஓய்வுபெற்ற படை வீரர்கள் என்பதை அறிவாரா;

(iii) அந்நிறுவனத்தில் பணத்தை வைப்புச் செய்துள்ள வைப்பாளர்களின் எண்ணிக்கை எத்தனை;

(iv) அவ்வைப்பாளர்களின் வைப்புத் தொகையை மீளவும் அவர்களுக்கு வழங்க நடவடிக்கை எடுக்கப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House -

(i) whether Iyon Lanka Financial Institution, which is operated in Pallandeniya in Kurunegala, has been brought under the purview of the Central Bank of Sri Lanka;

(ii) whether he is aware of the fact that most of the depositors of the aforesaid financial institution are retired war heroes;

(iii) the number of persons who have deposited money in the aforesaid financial institution; and

(iv) whether action will be taken to pay back the deposits of the aforesaid depositors?

(b) If not, why?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) නැත.

(ii) තැන්පත්කරුවන්ගේ රැකියාව සම්බන්ධ තොරතුරු ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මන්ට් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටර්නැෂනල් කොම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය හෝ දම්මික කුමාර අතපත්තු මහතා විසින් පවත්වා ගෙන නොමැත.

(iii) දම්මික කුමාර අතපත්තු මහතා විසින් ඉදිරිපත් කරන ලද ආපසු ගෙවීමේ සැලැස්මට අනුව, 2020 ඔක්තෝබර් 02 දින වන විට එම ආයතනයේ තැන්පත්කරුවන් ප්‍රමාණය 9,449ක් වේ.

(iv) මෙම ව්‍යාපාරය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් නීති විරෝධීව මහ ජනතාවගෙන් තැන්පතු රැස්කර ඇති බැවින් එහි සියලු වත්කම් සහ බැංකු ගනුදෙනු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තහනමට ලක් කර ඇත. කෙසේ වුවද, පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව තැන්පත්කරුවන්හට තැන්පතු ආපසු ගෙවීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීම සඳහා දම්මික කුමාර අතපත්තු මහතාට අවස්ථාවක් ලබා දෙන ලදී. එසේ වුවද, ඉදිරිපත් කරන ලද තැන්පතු ආපසු ගෙවීමේ සැලැස්ම පිළිගත හැකි මට්ටමක නොතිබූ බැවින් එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. තවද, මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන ප්‍රකාර නීති විරෝධී මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් නිසි අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපතිතුමා වෙත මෙම කරුණ යොමු කර ඇත. ඒ අනුව, තැන්පත්කරුවන්ගේ තැන්පතු ආපසු ගෙවීම පිළිබඳ කටයුතු අධිකරණමය ක්‍රියාවලියක දී තීරණය විය යුතුය. එසේ වුවද, දම්මික කුමාර අතපත්තු මහතා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පසුව ඉදිරිපත් කළ සංශෝධිත සැලැස්මෙහි සඳහන් පරිදි වෙනත් මූලාශ්‍රවලින් අරමුදල් ලබා ගෙන තැන්පත්කරුවන්හට මුදල් ආපසු ගෙවීම සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ විරෝධතාවයක් නොපවතින බව අතපත්තු මහතා වෙත දැනුම් දී ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, මම රාජ්‍ය ඇමතිතුමාගෙන් කරුණක් දැන ගන්න කැමතියි. තැන්පත්කරුවන් 9,449 දෙනෙක් එම ආයතනයේ මුදල් තැන්පත් කර තිබෙනවා.

ඉන් වැඩි දෙනෙක් ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ සේවය කර විශ්‍රාම ගිය අය. ගෙවීම් සැලැස්මක් ඉදිරිපත් කළා කිව්වාට, මේ 9,449න් වැඩි කොටසකට -ඒ කියන්නේ සියයට 99කටම- ගෙවීම් කරලා නැහැ. මේ අයට ඉක්මනින් මේ මුදල් ලබා ගැනීම සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු මන්ත්‍රීතුමනි, දැනට මේ සම්බන්ධව අධිකරණමය ක්‍රියාවලියක් සිදු වෙනවා. ඊළඟට ගෙවීම් කිරීම සඳහා සැලැස්මක් ඉදිරිපත් වුණා. ඒක ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි සැලැස්මක් වුණේ නැහැ. ඒ වාගේම දැනට අපි ඔහුට අවකාශය ලබා දීලා තිබෙනවා, නැවත සැලැස්මක් ඉදිරිපත් කරන්න. ඒ සඳහා කටයුතු කරනවා කියලා ඔහු දැනුම් දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, තැන්පතු ප්‍රමාණය ගත්තොත්, නීතිවිරෝධීව පවත්වාගෙන ගිය මේ ආයතනයේ රුපියල් බිලියන 10.3ක තැන්පතු තිබෙනවා. ඒ වාගේම, ඔහු විසින් හෙළිදරව් කළ කරුණු අනුව රුපියල් බිලියන 1.7ක වත්කම් තිබෙනවා. දැන් අපි ඒ දේවල් තහනම් කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් 2018 අවුරුද්දේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේදී කුරුණෑගල පොලිසියට පැමිණිල්ලක් ලැබිලා තිබෙන බවත් මම ඔබතුමාට මතක් කරන්න ඕනෑ. හැබැයි, ඒ පැමිණිල්ල අනුව ක්‍රියාත්මක වෙලා නැහැ කියා තමයි අපට හැඟී යන්නේ. 2019 අවුරුද්දේ නැවත මහ බැංකුවට පැමිණිල්ලක් ලැබී තිබීමත්, 2018 අවුරුද්දේ ඔබතුමන්ලාගේ රජය කාලයේදී කුරුණෑගල පොලිසියට පැමිණිල්ලක් ලැබී තිබීමත්, 2019 අවුරුද්දේ පැමිණිල්ලක් ලැබී තිබීමත් තමයි ඒකට හේතුව. 2020 අවුරුද්දේ අපේ රජය පත් වූ පසු මේ සඳහා ක්‍රියාත්මක වෙලා මේ වත්කම් තහනම් කිරීම සහ අනෙකුත් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඉතාම අහිංසක ජනතාව තමයි මේ මුදල් තැන්පත් කර තිබෙන්නේ. ඒ කියන්නේ, විවිධ ක්ෂේත්‍රවල වැඩ කළ අය තමන්ගේ විශ්‍රාම වැටුප අරගෙන මේ ආයතනයේ තැන්පත් කර තිබෙනවා. 2018 අවුරුද්දේ පැවැති රජය මේ සම්බන්ධයෙන් යම් ක්‍රියා මාර්ගයක් ගත්තා නම් මේ ප්‍රශ්නය මේ තරම් දුරට යන්නේ නැහැ කියා මම හිතනවා. එහෙනම් මේ ප්‍රශ්නය එතැනින් නවතිනවා. 2020 අවුරුද්ද වෙනකොට අපේ ආණ්ඩුව පත්වෙලා මේ සමාගමේ කටයුතු නතර කර තිබෙනවා. මේ සම්බන්ධව අධිකරණමය කටයුත්තක් සිදුවන නිසා අධිකරණය විසින් ලබාදෙන තීන්දුව අනුව කටයුතු කරන්න අපි සූදානමින් සිටිනවා. නමුත්, ඔවුන්ට අපි උපදෙස් ලබා දීලා තිබෙනවා, ගෙවීම් වැඩ පිළිවෙළක් සඳහා කඩිනමින් කටයුතු කරන්න කියලා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය වැරදියට තේරුම් ගන්න එපා. ඔබතුමන්ලා 2015 අවුරුද්දේ බලයට ආ පසු මහ බැංකු බැඳුම්කර වංචාව -පළමුවැනි වංචාව, දෙවැනි වංචාව- හරහා ලබාගත් ප්‍රතිලාභ පරිභෝජනය කරද්දි, FCID එකක් ස්ථාපිත කර එදා විපක්ෂයේ හිටපු මැති ඇමතිවරු අරගෙන ගිහිල්ලා, සිරගත කරලා, දඬුවම් ලබා දෙන්න කටයුතු කරද්දි ඔබතුමාට තිබුණා නේ 2018 අවුරුද්දේ මේ සිද්ධිය සම්බන්ධව පොලිසිය මෙහෙයවන්න. ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කය නේ, කුරුණෑගල කියන්නේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, අපි ඇමතිවරුන්ගෙන් ප්‍රශ්නයක් ඇහුවාම අදාළ ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැතුව නිකම් වැල්වටාරම් කියනවා. මේ ප්‍රශ්නයේදී ජෝකර්ලා වාගේ වෙන්න එපා. අදාළ ප්‍රශ්නයට උත්තර දෙන්න.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 2018 වර්ෂයේ පැමිණිල්ලක් දැමුවාට, ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවුණු එක වෙනත් කථාවක්. නමුත්, මේ පුද්ගලයාට යම් යම් දේශපාලන රැකවරණ ලැබෙනවා. ඒකයි, මේ ප්‍රශ්නය. 2020-2021 වෙනකොට තමයි මේ ප්‍රශ්නය උද්ගත වෙලා තිබෙන්නේ. මම කියන්නේ මෙච්චරයි. මෙම ආයතනයේ මුදල් තැන්පත් කළ විශාල පිරිසක් ඉන්නවා. නවදහස් ගණනක් කියන්නේ විශාල පිරිසක්. ඒ අයට සාධාරණයක් ඉෂ්ට කරන්න වැඩ කටයුතු කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, මේ අහිංසක ජනතාවට සාධාරණයක් ඉෂ්ට කිරීම සඳහා අපි කටයුතු කරනවා. නීත්‍යානුකූල නොවන

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

ආයතනයක් පවත්වාගෙන ගිහිල්ලා එම ආයතනයට අහු වෙලා අසරණ වෙලා ඉන්න එම ජනතාව කෙරෙහි රජයක් හැටියට අපි අවධානය යොමු කරනවා. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට කියන්න එපා, අදාළ නැති ප්‍රශ්නයකට මම උත්තරය දුන්නා කියලා. ඔබතුමාගෙන් මම අහන්නේ- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ. අහගන්නකෝ. ඔබතුමා කියද්දි මම අහගෙන හිටියා නේ. ගරු කථානායකතුමනි, ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා 2018දී කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරපු හිටපු රාජ්‍ය ඇමතිවරයෙක්. එහෙම නම් 2018දී එම පුද්ගලයාට දේශපාලන රැකවරණය දීලා තිබෙන්නේ කවුද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒවා මේ ප්‍රශ්නයට අදාළ නැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඒ පුද්ගලයාට දේශපාලන රැකවරණය දීලා තිබෙන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා ඔය කථාව ඕතැනින් නතර කරන්න. අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, එහෙම කරන්න එපා. මේක අහිංසක ජනතාවගේ තැන්පතු සම්බන්ධ ප්‍රශ්නයක්. ඒ දේශපාලන රැකවරණය දීපු අයගේ ආණ්ඩුව ගෙදර යැව්වාට පස්සේ අද මේ පිළිබඳව ප්‍රශ්න කිරීම තුළින්ම පැහැදිලි වෙනවා, මෙතුමන්ලාගේ ආණ්ඩුව මේ දේශපාලන රැකවරණය ලබා දී තිබෙන බව. ගරු කථානායකතුමනි, එම නිසා මහ බැංකු බැඳුම්කර වංචාවේදී ඒකට සහයෝගය දීපු අය මේ වාගේ අහිංසක තැන්පතුකරුවන් පිළිබඳ අවධානය යොමු - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක අනවශ්‍ය ප්‍රශ්නයක්. ඔය කථාව ඕතැනින් නතර කරන්න .

ප්‍රශ්න අංක 9 -1281/2020- (2), ගරු කුමාරසිරි රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -1336/2020- (2), ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 9 -1281/2020- (2), ගරු කුමාරසිරි රත්නායක මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු කුමාරසිරි රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ඉඩම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සමෘද්ධි සංවර්ධන නිලධාරින්/සමෘද්ධි ප්‍රතිලාභීන්: අනුරාධපුර දිස්ත්‍රික්කය

சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்கள்/ சமுர்த்திப் பயனாளிகள்: அநுராதபுர மாவட்டம்
SAMURDHI DEVELOPMENT OFFICERS/ SAMURDHI BENEFICIARIES: ANURADHAPURA DISTRICT

1336/2020

**10.ගරු බුද්ධික පතිරණ මහතා (ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. K.P.S. Kumarasiri)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත සමෘද්ධි සංවර්ධන නිලධාරින්;

(ii) එම දිස්ත්‍රික්කයේ මේ වනවිට සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරින්;

(iii) ඒ අනුව පවතින පුරප්පාඩු;

(iv) එම දිස්ත්‍රික්කයේ මුළු සමෘද්ධි ප්‍රතිලාභීන්;

(v) එම දිස්ත්‍රික්කයේ පසුගිය රජය විසින් සමෘද්ධි සහනාධාර ලබා දෙන ලද නව සමෘද්ධි ප්‍රතිලාභීන්;

සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලබන නිර්ණායක කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுர மாவட்டத்திற்கென அங்கீகரிக்கப்பட்ட சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்களின் எண்ணிக்கை;

(ii) அம்மாவட்டத்தில் தற்போது பணிபுரியும் சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்களின் எண்ணிக்கை;

(iii) அதற்கமைவாக நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை;

(iv) அம்மாவட்டத்திலுள்ள மொத்த சமுர்த்திப் பயனாளிகளின் எண்ணிக்கை;

(v) அம்மாவட்டத்தில் கடந்த அரசாங்கத்தினால் சமுர்த்தி நிவாரணம் வழங்கப்பட்டுள்ள புதிய சமுர்த்திப் பயனாளிகளின் எண்ணிக்கை;

எத்தனை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) சமுர்த்திப் பயனாளிகளைத் தெரிவு செய்யும்போது பின்பற்றப்படும் அளவுகோல்கள் யாவை என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance :

(a) Will he inform this House -

(i) the approved number of Samurdhi Development Officers for Anuradhapura District;

(ii) the number of Samurdhi Development Officers serving in that district by now;

(iii) the number of vacancies that exists accordingly;

(iv) the total number of Samurdhi beneficiaries in that district; and

(v) the number of new Samurdhi beneficiaries in that district who were provided with Samurdhi assistance by the former Government?

(b) Will he also inform this House the criteria used in selecting Samurdhi beneficiaries?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
*** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :**
** Answer tabled:*

(අ) (i) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 1,189ක් අනුමත කර ඇත.

(ii) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 1,072ක් දැනට සේවය කරනු ලබයි.

(iii) පුරප්පාඩු 117ක් පවතී. මේ වන විට මු.රෙ. 71 යටතේ මෙම දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ප්‍රශස්ථ කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති බැවින්, පවතින සියලුම පුරප්පාඩු තනතුරු සඳහා ඉදිරියේදී විධිමත් බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කෙරේ.

(iv) 2021 මාර්තු 01 දිනට මුළු සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 71,594කි.

එය සහනාධාර වර්ගීකරණය අනුව පහත පරිදි වේ.

| වර්ගීකරණය | පවුල් සංඛ්‍යාව |
|---|---|
| රු. 420 සහනාධාර | 2,110 |
| රු. 1,500 සහනාධාර | 31,700 |
| රු. 2,500 සහනාධාර | 13,900 |
| රු. 3,500 සහනාධාර | 23,794 |
| **එකතුව** | **71,594** |

(v) 2019 වර්ෂයේ ලබා දුන් නව සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 12,281කි. එය සහනාධාර වර්ගීකරණය අනුව පහත පරිදි වේ.

| වර්ගීකරණය | පවුල් සංඛ්‍යාව |
|---|---|
| රු. 420 සහනාධාර | - |
| රු. 1,500 සහනාධාර | 4,602 |
| රු. 2,500 සහනාධාර | 3,291 |
| රු. 3,500 සහනාධාර | 4,388 |
| **එකතුව** | **12,281** |

(ආ) සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී සලකා බලනු ලබන ප්‍රධාන නිර්ණායක ලෙස පහත කරුණු දක්වා ඇත.

- පවුලේ සාමාජිකයන්ගේ අධ්‍යාපන තත්ත්වය
- පවුලේ සාමාජිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය
- පවුලේ ආර්ථික තත්ත්වය
- පවුල සතු වත්කම්
- නිවසේ තත්ත්වය
- සලකා බැලිය යුතු වෙනත් කරුණු (පවුලේ සාමාජික සංඛ්‍යාව/ කමිටුව විසින් හඳුනා ගනු ලබන වෙනත් නිර්ණායක)

(ඇ) පැන නොනඟී.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයක් ඇහුවාම පැහැදිලිව ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න ඕනෑ කොහොමද කියන කාරණය ඔබතුමාත් දන්නවා. ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා කියන්නේ වෙන කතන්දරයක්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට සැක හිතෙනවා, කුරුණෑගල මේ හොරාව තියාගෙන ඉන්නේ ඔබතුමාද කියලා. ඒ පුද්ගලයා ඔබතුමාට කප්පම් දීලා තිබෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන රීති ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, 2018 අවුරුද්දේ පැමිණිල්ලක් ලැබුණාම, ඒ පැමිණිල්ල විමර්ශනය නොකිරීම කියන කාරණය කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිටපු ඇමතිවරුන්ගේ වගකීමටයි අයත් වන්නේ. ඒ නිසා ගිය ආණ්ඩුව ඔවුන්ට රැකවරණය දීලා අද මෙතැනට ඇවිල්ලා අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් ජනතාව නොමඟ යවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ගැන වෙනම විවාදයක් අරගෙන කථා කරන්න.

මීළඟට ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### නොවිසඳුනු ගුරු-විදුහල්පති වැටුප් විෂමතා
### *தீர்க்கப்படாத ஆசிரியர்-அதிபர் சம்பள முரண்பாடு*
### UNRESOLVED TEACHER-PRINCIPAL SALARY ANOMALIES

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු සභානායකතුමා මේ ප්‍රශ්නයට ඉතාම යහපත් පිළිතුරක් ලබාදීමේ අපේක්ෂාවෙන් ඉන්නා බවත් මට පෙනෙනවා.

ගරු කථානායකතුමනි, පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධානම වෘත්තීය කොටස් දෙක වන ගුරුවරුන්ගේ සහ විදුහල්පති වරුන්ගේ නොවිසඳී පවතින වැටුප් විෂමතා ගැටලුව හේතුවෙන් පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනය වෙමින් ඇති අර්බුදකාරී තත්ත්වය මෙම සභාවේ අවධානයට යොමු කරනු කැමැත්තෙමි.

වසර 24ක් පුරා නොවිසඳී පවතින ගුරු-විදුහල්පති වැටුප් විෂමතා ගැටලුව විසඳන ලෙස බල කරමින් ගුරුවරු හා විදුහල්පතිවරු විසින් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ආරම්භ කර මේ වන විට මාස තුනක කාලයක් ගත වෙමින් තිබෙනවා. කෙසේ වුවද, මේ සඳහා ඔවුන්ට පිළිගත හැකි විසඳුම් ලබාදීමට රජය මෙතෙක් සමත් වී නැහැ. ඒ හේතුවෙන් මෙම වෘත්තීය සමිති ක්‍රියාමාර්ග දිග්ගැස්සෙමින් ඇති අතර, ලක්ෂ හතළිහකට වැඩි පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට එය සෘජුවම බලපෑම් එල්ල කරමින් තිබෙනවා.

1995 වසරේදී ශ්‍රී ලංකා ගුරු සේවය සහ 1997 වසරේදී ශ්‍රී ලංකා විදුහල්පති සේවය ස්ථාපිත කරනු ලැබීමෙන් පසු ඊට අදාළ දීප ව්‍යාප්ත වැටුප් තල ලබාදී තිබුණා. මෙමඟින් පාසල් පන්ති කාමරයේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ මූලික වගකීම් දරන දක්ෂ නිර්මාණශීලී ගුරු හා විදුහල්පති වෘත්තිකයන් මෙම සේවාවන්ට ආකර්ෂණය කර ගැනීමට සමත් වුණා. ගරු ඇමතිතුමනි, ඒ සේවාව පිහිටුවීම අපේ පාසල් අධ්‍යාපනයේදී ඉතාම වැදගත් කාර්ය භාරයක් ඉටු කළ බව ඔබතුමාත් දන්නවා. ඒ වාගේම ගුරුවරු රඳවා ගැනීමත් එයින් අපේක්ෂා කෙරුණා. මෙහි අරමුණ වූයේ මෙම අධ්‍යාපන වෘත්තිකයන්ගේ ශාස්ත්‍රීය නිදහස ආරක්ෂා කරමින් ඔවුන්ට යහපත් ජීවන තත්ත්වයක් ළඟා කර දීමයි. ඒ ගුරු සේවාව ස්ථාපිත කිරීමෙන් ගුරු විදුහල්පති වෘත්තිකයන්ට පමණක් නොව, පොදුවේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව පිබිදීමක් පිළිබඳ බලාපොරොත්තු ද ඇති කළා.

පසුව 1997දී සමස්ත රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කිරීම සඳහා බී.සී. පෙරේරා වැටුප් කොමිෂන් සභාව පත් කරන ලද අතර එම නිර්දේශ මත නිකුත් කළ 2/97 රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛයේ 3.10 වගන්තිය මඟින් "ගුරු හා විදුහල්පති සේවාවන් සඳහා වන වැටුප් සංශෝධන පසුව දන්වනු ලැබේ" යනුවෙන් සඳහන් කර තිබුණා. 1997 සිට මේ දක්වා ගත වූ වසර 24 තුළ බලයේ සිටි කිසිම ආණ්ඩුවක් ඒ අනුව කටයුතු කර නැහැ. නමුත්, ගුරු හා විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා ඉක්මනින්ම ඉවත්කොට විසඳුම් ඉදිරිපත් කරන බව එහි ඉතා පැහැදිලිව සඳහන් කර තිබුණා. නමුත් අවුරුදු 24ක් ගතවී තිබෙනවා, තවම එය ඉටු වී නැහැ.

කෙසේ වුවද, ඒ කිසිදු චක්‍රලේඛයක් හෝ ගුරු හා විදුහල්පති සේවා වැටුප් සංශෝධන කවරේ දැයි ප්‍රකාශයට පත් කිරීමට අසමත් වුණා. ඒ අනුව වැටුප් විෂමතා ගැටලුව විසඳීමට මෙම වැටුප් කොමිෂන් සභා හෝ බලයට පත් කිසිදු ආණ්ඩුවක් කටයුතු කළේ නැහැ. එමෙන්ම ගත වූ වසර 24ක කාලය තුළ ගුරු හා විදුහල්පති සේවාවලට අදාළව සේවා ව්‍යවස්ථා දෙකක් හඳුන්වා දී ඇතත්, ඒවා මෙතෙක් විධිමත්ව ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර නැහැ. මේ අනුව ගුරු හා විදුහල්පති සේවාවලට හිමි විය යුතු වෘත්තීයමය ගරුත්වය නොලැබීම නිසා එම සේවා ස්ථාපිත කිරීමේ අපේක්ෂිත අරමුණු ඉටු වී නැහැ.

මෙම තත්ත්වයට එරෙහිව ගුරු හා විදුහල්පති වෘත්තිකයන් විසින් ආණ්ඩුවලට විවිධ බලපෑම් කරන ලද අතර, විවිධ අවස්ථාවලදී වෘත්තීයමය ක්‍රියාමාර්ග ගනු ලැබුවා. 2007 හා 2008 වසරවලදී උසස් පෙළ පිළිතුරු පත්‍ර ඇගයීම් වර්ජන සිදු වී තිබුණේ ඒ අනුවයි. එසේම නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 2008දී ශ්‍රේෂ්ඨාධිකරණය මෙම වැටුප් විෂමතා ගැටලුව විසඳීමට අදාළ නියෝග කිහිපයක් ලබා දුන් අතර, වැටුප් විෂමතාව විසඳන තෙක් වැටුප් වර්ධක දෙකක් ලබා දීමට නියෝග කර තිබුණා. ඒ අනුව වර්තමාන අගමැති, එවක ජනාධිපති හා මුදල් අමාත්‍යවරයා ලෙස මහින්ද රාජපක්ෂ මහතා 2009 අය වැය ඉදිරිපත් කරමින් මෙම වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කළ බව ප්‍රකාශ කළා. කෙසේ නමුත් අවසානයේදී මෙම වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා කිසිදු මුදලක් වෙන් නොවුණු අතර, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට අනුව තාවකාලිකව ගෙවීමට නියෝග කළ වැටුප් වර්ධක දෙක නොගෙවීමට කටයුතු කිරීමත් හේතුවෙන් ඔවුන් බරපතළ රැවටීමකට ලක් වුණා. ඒ කියන්නේ ගුරු සේවා ව්‍යවස්ථාවෙන් මේක ලැබුණේ නැහැ, වැටුප් සංශෝධනයෙන් ලැබුණේ නැහැ. අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාවෙන් ලැබුණේත් නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දෙන ලද නියෝගය ක්‍රියාත්මක වුණේත් නැහැ, ගරු ඇමතිතුමනි.

එමෙන්ම, ගත වූ කාලය පුරාම ගුරුවරුන් හා විදුහල්පතිවරුන් මෙම වැටුප් ගැටලුව සම්බන්ධව සාකච්ඡා, උද්ඝෝෂණ, පා ගමන්, අසනීප නිවාඩු වාර්තා කිරීම හා වැඩ වර්ජන සිදු කර ඇතත්, කිසිදු ආණ්ඩුවක් මේ ගැටලුවට විසඳුම් ලබා නොදුන් බවට ඔවුන් චෝදනා කරනවා. ඇමති, අගමැති සාකච්ඡා, ඇමති අනුකමිටු පත් කිරීම්, සාකච්ඡා හා විවිධ අමාත්‍ය අනුකමිටු තීරණ ඉදිරිපත් කරමින් ඔවුන් රැවටීමකට සහ වෘත්තීයමය ක්‍රියාමාර්ග මර්දනය කිරීමට පමණක් කටයුතු කරන බවට දැන් ප්‍රකාශ කරනවා.

මම දැක්කා, විශේෂයෙන්ම පොලීසිය භාර අමාත්‍යවරයා විටින් විට කරන ප්‍රකාශ. එතුමාගේ ප්‍රකාශ කිසි සේත්ම ගුරුවරුන්ගේ වෘත්තීයමය ගරුත්වය රැකෙන අයුරින් හෝ ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක සිදු වුණේ නැහැ. පොලීසිය භාර අමාත්‍යවරයා විටින් විට ගුරුවරුන් ගැන ප්‍රකාශ කරනවා. මම දන්නේ නැහැ, එය ආණ්ඩුවේ මතයද කියා. නමුත් පොලිස් අමාත්‍යවරයා දිගින් දිගටම කරන ප්‍රකාශ, මෙම අරගළයට, මෙම සාධාරණ ගැටලුවට විසඳුම් ලබා දෙනවා වෙනුවට එය ඉතාම නරක ආකාරයේ දිශාවකට වර්ධනයවීමට තමයි හේතු සාධක වී තිබෙන්නේ. වෘත්තීයමය ක්‍රියාමාර්ග මර්දනය කිරීමට පමණක් කටයුතු කරන බව ප්‍රකාශ කර තිබෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුව මෑතකදී වැටුප් විෂමතා ගැටලුව විසඳීම වෙනුවට වෘත්තීයමය ක්‍රියාමාර්ග අත්හරින්නේ නම් රුපියල් 5,000ක් දෙන බවට බලපෑම් කිරීමද, විවිධ කණ්ඩායම් භාවිත කරමින් වෘත්තීය ක්‍රියාමාර්ග මර්දනය කිරීමට උත්සාහ කිරීමද ගුරුවරු හා විදුහල්පතිවරු හෙළා දකිනවා.

කොවිඩ් වසංගතය හේතුකොටගෙන අපේ රටේ ලක්ෂ 40ක් වන දූවා දරුවන්ගේ අධ්‍යාපනය සැලකිය යුතු කාලයක් කඩා වැටිලා තිබෙනවා. සමහර දරුවන් දෙවන වසරට ඇතුළත් වෙලා තිබෙනවා, පළමුවැනි පන්තියට එක දවසක්වත් ගමන් කරන්නේ නැතුව. සමහර දරුවන් විභාගවලට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා, උසස් පෙළ, සාමාන්‍ය පෙළ මාස දෙක, තුනක්වත් එම විෂයයන්වලට අනුව ඉගැන්වීමට ලක් කරන්නේ නැතිව. ඒක

නිසා කොවිඩ් වසංගත තත්ත්වය අපේ දූවා දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටීම සඳහා විශාල හේතුවක් වී තිබෙනවා.

අමාත්‍යතුමා මෑතකදී ප්‍රකාශයට පත් කළා, ක්‍රමානුකූලව පාසල් විවෘත කිරීම සඳහා යම් සැලැස්මක් තිබෙන බව. ඒක හොඳයි. අපි කවුරුත් පාසල් යළි විවෘත කිරීම සඳහා සහාය ලබා දෙන්න සූදානම්. මොකද අපි හිතනවා, අපේ දූවා දරුවන්ගේ අධ්‍යාපනයේ විශාල කාලයක් කඩා වැටී තිබීම අපේ අනාගතයට විශාල ගැටලු ගණනාවක් නිර්මාණය කරන බව. ඒක නිසා පාසල් විවෘත කිරීම සඳහා ඔබතුමා ගන්නා ප්‍රයත්නයට අපේ සහාය ලබා දෙනවා. හැබැයි, විවෘත කරන පාසල් නිසි පරිදි පැවැත්වෙන්නට නම් ගුරුවරුන්ගේ මෙම ගැටලුව විසඳිය යුතුව තිබෙනවා. එසේ නැතිව පාසල් විවෘත කිරීමෙන් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ කියන එක තමයි ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නේ.

මෙම තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

01. රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛ අංක 2/97(III)හි 3.10 වගන්තියට අනුව ගුරු හා විදුහල්පති සේවාවන්ට 1997 වසරේ සිට වසර 24ක් පුරා බරපතළ වැටුප් විෂමතාවක් සිදු වෙමින් පවතින බව පිළිගන්නවාද? පළමුකොටම මෙවැනි ගැටලුවක් තිබෙන බව ආණ්ඩුව විසින් පිළිගනු ලබනවාද කියලා මා දැන ගන්න කැමැතියි.

02. 2008 වසරේදී වැටුප් විෂමතා විසඳීමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් SCFR 282/2008 දරන නඩු තීන්දුවට අනුව මෙතෙක් කටයුතු කිරීමට අදාළ ආයතන පියවර ගත්තේ නැත්තේ ඇයි? අඩුම තරමේ 2008 අවුරුද්දේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දුන් තීන්දුව ක්‍රියාත්මක කළේ නැහැ. අවුරුදු 13ක් ගත වෙලා තිබෙනවා. තවමත් ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්න පියවර නොගත්තේ ඇයි?

03. වර්තමාන අගමැතිවරයා එවකට ජනාධිපති හා මුදල් අමාත්‍යවරයා ලෙස 2009 අය වැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් ගුරු - විදුහල්පති වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කළ බව ප්‍රකාශ කළා. මන්ත්‍රීවරු මේසයට තට්ටු කළා. අපිත් මේසය යටින් චුට්ටක් තට්ටු කළා, ඒ සතුටට. මම අවංකවයි කියන්නේ. රුපියල් මිලියන තුන්දාහක් වෙන් කළ බව ප්‍රකාශ කළද ඊට අදාළ කිසිදු මුදලක් අය වැය ප්‍රතිපාදන මඟින් ලබා දීමට කටයුතු නොකළේ ඇයි? එමඟින් ගුරුවරුන් හා විදුහල්පතිවරුන් බරපතළ රැවටීමකට ලක් වුණා. අය වැය ලේඛනයට අත් පොළොසන් දුන්නාට ඒ අදාළ වසර ඇතුළත ඒක ක්‍රියාත්මක වුණේත් නැහැ.

04. වර්තමාන ජනාධිපතිවරයා ඉදිරිපත් කළ "සෞභාග්‍යයේ දැක්ම" මැතිවරණ ප්‍රකාශය තුළ මෙම සේවාවන් සංවෘත සේවාවක් බවට පත් කර වැටුප් විෂමතා ඉවත් කරන බවට වූ පොරොන්දුව ආණ්ඩුව ප්‍රතිපත්තිමය ලෙස පිළිගන්නේද? එය සිදු කරන්නේ කොහොමද?

මේ සඳහා සුබෝධනී කමිටුව කියලා කමිටුවක් පත් කළ බව ඔබතුමා දන්නවා. ඒ කමිටුව පත් කළේත් මේ ආණ්ඩුව විසින්මයි. ඒ වාර්තාව ඔබතුමන්ලාගේම අමාත්‍යවරයාට ලබා දුන් වාර්තාව. ඔවුන් විසින්ම පත් කළ කමිටුවක් ඔවුන්ටම වාර්තාවක් ලබා දී තිබෙනවා. හැබැයි, ඒකත් හමස් පෙට්ටියට යන තත්ත්වයක් තමයි මතු වී තිබෙන්නේ.

05. නැවත පාසල් ආරම්භ කිරීමට පෙර මෙම වැටුප් විෂමතා ගැටලුව විසඳීම සඳහා ගුරු-විදුහල්පති වෘත්තීය සමිතිවලට පිළිගත හැකි විසඳුමක් ලබා දීමට සූදානම්ද? එසේ නම් ඒ සඳහා වන කාලරාමුව කවරේද?

මෙම ප්‍රශ්නවලට ගරු ඇමතිතුමාගෙන් මම පිළිතුරු බලාපොරොත්තු වෙනවා. ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අද පවතින වැටුප් අර්බුදය, ගුරුවරු හා විදුහල්පතිවරුන්ගේ ඉල්ලීම් මාලාව සම්බන්ධව ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නයක් නඟනු ලැබුවා. අපේ රටේ ලක්ෂ 43ක් වූ දරුවන්ගේ යහපත පිණිස පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය යළි කලින් පැවැති තත්ත්වයට පරිවර්තනය කිරීම අපේ රජයේ ප්‍රධානතම ක්‍රියාමාර්ගය ලෙස අපි සලකනවා. ඒ වාගේම ලක්ෂ 43ක් වූ දරුවන්ගේ අධ්‍යාපනය සඳහාම බිහි වී ඇති පාසල් යළි ක්‍රියාත්මක කරවා ගැනීමට තිබුණු එක බාධාවක් තමයි, කොවිඩ් වසංගතය. ඊයේ ගරු සුසිල් ප්‍රේමජයන්ත රාජ්‍ය ඇමතිතුමා මේ සම්බන්ධව පිළිතුරු දුන්නා. ගුරුවරුන් සියල්ලට -220,000දෙනෙකුට- සැප්තැම්බර් මාසයේ මුල් සතිය වෙනකොට රජයෙන් එන්නත ලබා දී තිබෙනවා. ඒ අනුව පළමුවැනි පියවර වශයෙන් සෑම ගුරුවරයෙකුටම සෞඛ්‍ය රීතිවලට අනුව වැඩ කටයුතු කිරීමට හැකි තත්ත්වයක් ඇතිකොට, පාසල් විවෘත කිරීමට අවශ්‍ය පියවර එකින් එක ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අතරතුර වැටුප් ප්‍රශ්නය නැඟූ නිසා මම ගරු මන්ත්‍රීතුමාට කෙටියෙන් පිළිතුරු ලබා දෙන්න කැමැතියි.

01. ඔව්.

ගුරු විදුහල්පති වෘත්තීය සමිති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/97 (iii)ට අනුව ගුරු විදුහල්පති සේවාවල වැටුප් විෂමතාවක් සිදු වූ බව නිරන්තරයෙන් ප්‍රකාශ කරමින් එම විෂමතා ඉවත් කරන ලෙසට ඉල්ලුම් කරන ලද බැවින්, ඒ පිළිබඳව සලකා ගුරු විදුහල්පති සේවාවන්හි වැටුප් විෂමතා ඉවත් කිරීම සම්බන්ධයෙන් අංක 21/1415/302/023 හා 2021.08.02 දිනැතිව ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ ඒකාබද්ධව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අදාළව, 2021.08.09 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මේ පිළිබඳව අධ්‍යයනය කර විසඳුම් හා නිර්දේශ ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුකමිටුව පත් කරන ලදී. එම අනුකමිටුවේ 2021.08.20 වැනි දිනැති වාර්තාව සම්බන්ධයෙන් වූ, -එම එකඟතාව පරිදි- අධ්‍යාපනය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද, -අවිශ්වාසයක් තිබෙනවා නම්- අංක අමප/21/1563/302/023-1 හා 2021.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එමඟින් යෝජිත විසඳුම් හා නිර්දේශ ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන ඇත.

කෙසේ වෙතත් මීට පෙර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/97 (iii) ට, -ඇමුණුම 01 ලෙස **සභාගත*** කරමි.- පසු කාලීනව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 මඟින් සමස්ත රාජ්‍ය සේවයේම වැටුප් විෂමතා ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කරන ලද අතර, එමඟින් සියලු සේවා වර්ගීකරණය කර වැටුප් සංශෝධනය කර ඇති බව නිරීක්ෂණය වේ.

මෙතැන තමයි ඔබතුමන්ලා, අපි -හැමදෙනාමත්- කථා කරන විෂමතාව පවතින්නේ. 1994දී අධ්‍යාපන ඇමතිතුමා විධියට ගරු රිචර්ඩ් පතිරණ මැතිතුමා ඉදිරිය ගැන බලා ගුරු වෘත්තීයට විශාල සේවාවක් සිදු කළා. ඒ හරහා ඒ සේවාව ශක්තිමත් වුණා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා ඊට පස්සේ මුළු මහත් රාජ්‍ය සේවයේම පවතින විෂමතා පිළිබඳව බී.සී. පෙරේරා වැටුප් කොමිසම පත් කරන්න සිද්ධ වුණ බව. ඊට පස්සේ ප්‍රසිද්ධ, ගෞරවාන්විත රාජ්‍ය සේවකයෙකු වූ වනසිංහ මහතාගේ සභාපතිත්වයෙන් කොමිසමක් පත් කළා. ඊටත් පසු ඒ ගෞරවයම හිමි කර ගත් දේවේන්ද්‍ර මහතාගේ

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාපතිත්වයෙන් පත් කළ කොමිසමෙන් දේවේන්ද්‍ර වැටුප් වාර්තාව නිකුත් කළා. ඒ වාගේම අවසානයේදී හිටපු අගමැතිතුමාගේ කාලයේ, රනුග්ගේ -ලේකම්තුමාගේ- වාර්තාව නිකුත් කළා. That also went to the Cabinet, but no action was taken. මේ විධියේ වාර්තා රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපේ අධ්‍යාපන සේවයේ ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා තවදුරටත් ඇති වීම වැළැක්වීමට කටයුතු කරන්න කියලා බී.සී. පෙරේරා වාර්තාවේ ගුරුවරු ගැන පේළි දෙකක් ලියලා තිබෙනවා. ඒ නිසා එය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා හැම ආණ්ඩුවක්ම උත්සාහ දැරුවා.

දැන් එය නිවැරැදි කිරීම සඳහා ස්ථාවර ක්‍රියා මාර්ගයක් ගැනීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබෙනවා. ඔක්කෝම වෘත්තීය සමිති ඇවිල්ලා අගමැතිතුමා එක්ක සාකච්ඡා කළා. අපි අනුකමිටුවක් පත් කරලා ඒ යෝජනා සලකා බලලා තීරණයක් දුන්නා.

02. ඔබතුමා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නඩු තීන්දුවක් ගැන කිව්වා. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SCFR 282/2008ට අදාළ නඩු තීන්දු ඇමුණුම 02 හා 03 ලෙස මා **සභාගත*** කරනවා.

එම නඩු තීන්දුව මඟින් ලබා දීමට නියම කර තිබූ වැටුප් වර්ධකයට වඩා වැඩි වැටුප් වැඩි වීමක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (xii) මඟින් ලබා දී ඇත. එම චක්‍රලේඛය ඇමුණුම 04 ලෙස මා **සභාගත*** කරනවා. මේ පිළිබඳව පැහැදිලි කිරීමක් ඇතුළත් ජාතික වැටුප් කොමිෂන් සභා ලේකම්ගේ ලිපිය ඇමුණුම 05 ලෙස මා **සභාගත*** කරනවා.

03. වර්තමාන අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, එවකට ජනාධිපති සහ අග්‍රාමාත්‍යවරයා ලෙස 2009 අය වැයෙන් රුපියල් මිලියන 3,000ක් වෙන් කරන ලද්දේ ගුරුවරුන් හා විදුහල්පතිවරුන්හට පමණක් නොව, අධිකරණ ක්ෂේත්‍රයේ නිලධාරින්, ගුරුවරුන් හා විදුහල්පතිවරු වැනි සේවාවල වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා වේ. එම ලේඛනය ඇමුණුම 06 ලෙස මා **සභාගත*** කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව ඔබතුමා කියපු කාරණය නිවැරැදි කරන්න ඕනෑ. අපේ අධ්‍යාපන අමාත්‍යාංශයට රුපියල් මිලියන 850ක ප්‍රතිපාදන වෙන් කර දුන්නා. මේ අනුව එක් එක් පියවර අරගෙන තිබෙනවා. තවද 2010.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (viii) මඟින් ගුරු-විදුහල්පති වැටුප් සංශෝධනය වී තිබෙනවා.

04. අංක අමප/21/1563/302/123-I හා 2021.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, 2018 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැටුප් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති යෝජනාවලිය පදනම් කරගෙන ගුරු-විදුහල්පති වැටුප් විෂමතා ඉවත් කිරීම පිණිස ගරු මුදල් ඇමතිතුමා 2022 අය වැය මඟින් යෝජනාව ඉදිරිපත් කර අදියර කිහිපයකදී එකී යෝජනාව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවා.

05. අමාත්‍ය මණ්ඩලයේ 2021.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගන්නා ලද තීරණ පිළිබඳව වාචිකව හා ලිඛිතව අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් සියලු වෘත්තීය සමිති වෙත දන්වා තිබෙනවා.

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

වැඩ වර්ජනය පවතිද්දී මේ තීරණයෙන් පසුවත් ඒ වැඩ වර්ජනයේ යෙදී සිටි වෘත්තීය සමිති අමාත්‍යාංශයට පැමිණ මමත්, රාජ්‍ය ඇමතිතුමාත්, ලේකම්තුමාත් සමඟ සාකච්ඡාවලට සහභාගි වුණා. අමාත්‍ය මණ්ඩලය ගත්ත මේ තීරණ හතරටම, එම අයගේ එකඟතාවට අමාත්‍යාංශ ලේකම්වරයෙක් පළමුවරට අත්සන් කර දී තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අත්සන් කර ලබා දුන් එම ලිපිය මම **සභාගත*** කරනවා.

පසුගිය ආණ්ඩුව කැබිනට් තීරණ අරගෙන තිබෙනවා. නමුත්, ලේකම් අත්සන් කර දුන්නේ නැහැ. අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ අත්සනින් නීත්‍යනුකූලභාවයට දැන් පත් කර මෙම අමාත්‍ය මණ්ඩල තීරණ ලබා දීලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමාත් අග්‍රාමාත්‍යතුමාත් එකඟතාවෙන් මෙම තීරණ ගෙන තිබෙනවා. රටේ පවතින මුදල් අර්බුදය සහ ජාත්‍යන්තරව පවතින අර්බුදකාරී තත්ත්වයද සැලකිල්ලට ගෙන එය නොදී සිටීමට පුළුවන්කම තිබුණා. නමුත්, එසේ නොකර, මේ වැටුප් වැඩි වීම පිළිගෙන එය ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා 2022 අය වැය ලබන නොවැම්බර් මාසයේ දෙවැනි සතියේ ඉදිරිපත් කරනකොට ගරු කථානායකතුමනි, එම කටයුත්ත ඉෂ්ට කිරීමේ ක්‍රියා මාර්ගය ආරම්භ වනවා. එය කොටස් වශයෙන් ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබෙනවා.

ගුරුවරුන්ගේ වැඩ වර්ජනය නිසා අපි ප්‍රශ්න කීපයකට මුහුණ දුන්නා. එයට ඔබතුමාත් එකඟ වනවා ඇති. එය ඔබතුමන්ලාට මතක් කිරීම මගේ යුතුකමක්. මෙම වැඩ වර්ජනය නිසා දරුවන්ගේ අධ්‍යාපනය බිඳ වැටී, අපොස (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල පවා විභාග දෙපාර්තමේන්තුවට දීමට බැරි තත්ත්වයක් ඇති වුණා.

නමුත්, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ආණ්ඩුව තීරණයක් අරගෙන, විභාග කොමසාරිස්තුමාත් විශාල කැප කිරීමක් කර අපොස(සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල නිකුත් කරන්න පුළුවන් වුණා. සෞන්දර්ය විෂයය වෙනුවෙන් තිබෙන ප්‍රායෝගික පරීක්ෂණය පවත්වන්නට බැරි වීම නිසා, ඒ සඳහා බාධාවක් තිබුණු නිසා විභාග කොමසාරිස්වරයාගේ බලතල අනුව ප්‍රතිඵල නිකුත් කොට ශිෂ්‍යයන් හයලක්ෂයකට අපොස (උසස් පෙළ) දක්වා ගමන් කරන්න අපේ රජය අවස්ථාව ලබා දුන්නා. ඒ අවස්ථාව ලැබුණේ, අපේ පාක්ෂිකයන්ට විතරක් නොවෙයි, මුළු මහත් රටේම දරුවන්ට ඒ අවස්ථාව ලබා දුන්නා, මෙය බාධාවක් කර ගැනීමෙන් තොරව ජාතික වශයෙන් වැඩ කරමු කියන ස්ථාවරය තුළ. අපි කවුරුත් ඒක අගය කළ යුතුයි. වැඩ වර්ජනයේ යෙදී සිටින ගුරු සංගම් පැමිණ අපව හමු වූ අවස්ථාවලදී මේ ගත් ක්‍රියාමාර්ගය අගය කළා. ඔවුන් පසුව හෝ එය අගය කළා.

ගරු කථානායකතුමනි, දෙවැනි කාරණය තමයි, අපොස (උසස් පෙළ) විභාගය සඳහා ඉල්ලුම් පත් කැඳවීම යළිත් සති දෙකකින් දීර්ඝ කිරීම. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කළා. විභාගය සඳහා ඉල්ලුම් කිරීමේදී සාමාන්‍යයෙන් විදුහල්පතිවරු විසින් ශිෂ්‍යයාගේ විස්තර සඳහන් කර විභාග කොමසාරිස්තුමා වෙත එවන්න ඕනෑ. ඒ සමඟම 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා ඉල්ලුම්ත් කැඳවීමේ කාලයත් අපි දීර්ඝ කළා.

අපේ මේ සියලු කටයුතුවලට උදව් වූ ආණ්ඩුකාරතුමන්ලාටත්, ඒ වාගේම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්ටත්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒ සියලුදෙනා සාකච්ඡා කර, උපදෙස් දෙමින් එම විස්තර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු සහ විදුහල් සම්බන්ධ කරගෙන නීත්‍යනුකූලව ඉදිරිපත් කොට තිබෙනවා. අපි චේතනා සහගතව

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

විභාග කඩාකප්පල් කළ යුතු නැහැ. විභාගය කියන්නේ දරුවන්ගේ අනාගතය. අපි ගමන් කරන්නේ අනාගතය වෙතයි. ජාතියේ අනාගත දියුණුවේ වර්ධනය තිබෙන්නේ ශිෂ්‍ය පරම්පරාවගේ අතේයි. විභාග පැවැත්වීම පිළිබඳව ඊයේත් අපේ රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා සඳහන් කළා. ලබන අවුරුද්දේ පළමු මාස තුන තුළ අපොස (උසස් පෙළ) විභාගය පවත්වන්න සාකච්ඡා කරමින් තිබෙනවා. එය ළඟදීම ප්‍රකාශයට පත් කරනවා. එම විභාගය හදිසියේ පවත්වන්න බැරි බව විභාග කොමසාරිස්තුමාත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් පිළිගන්නවා. ඒ වාගේම, 5 වසර ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීම සඳහා දැනට නියමිතව තිබෙන දිනය වෙන්නේ නොවැම්බර් 14වැනි දායි. එයද, එලෙස වෙනස් කර ප්‍රකාශයට පත්කරනවා.

මේවා ක්‍රියාත්මක කරන කාල සීමාව -කාල රාමුව- පැහැදිලි කරන්න කියන එකයි ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ අන්තිම ප්‍රශ්නයෙන් කියැවෙන්නේ. ආණ්ඩුකාරවරුත්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් සාකච්ඡා කරලා, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කර තිබෙන සෞඛ්‍ය රෙගුලාසි අනුව පාසල් 3,000ක් -ඒ කියන්නේ ශිෂ්‍ය සංඛ්‍යාව 200ට අඩු පාසල්- ඔක්තෝබර් මාසයේ 21වැනි දා විවෘත කරන්න තීරණයක් අරගෙන වැඩ කරගෙන යනවා. ඒ පිළිබඳ පැහැදිලි ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර තිබෙනවා. ඉන් පසුව අපේ රටේ හතළිස් තුන්ලක්ෂයක් වූ දරුවන් සහ දෙලක්ෂ විසිපන්දහසකට වැඩි ගුරුවරුන්ගේ යහපත උදෙසා සෞඛ්‍ය රෙගුලාසි අනුව ශ්‍රේණියෙන් ශ්‍රේණිය විවෘත කිරීමේ ඉලක්කය වෙත යෑමට ගත් තීරණය ක්‍රියාත්මක කරන්න පාර්ලිමේන්තුවේ සෑම දේශපාලන පක්ෂයකම නායක නායිකාවන්ගේ සහයෝගය අපි අපේක්ෂා කරනවා. මේ කාලයේදී වැටුපට අතිරේකව ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා විසින් ගුරුවරුන්ට මාසයකට රුපියල් 5,000ක දීමනාවක් ලබා දී තිබෙනවා. ගරු මන්ත්‍රීවරුනි, අවුරුදු එකහමාරක් තුළ සේවයේ කඩින් කඩ නැවතීමක් තිබුණද, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිළිගනිමින් සියලුම ගුරුවරුන්ට -වැඩ වර්ජනයේ සිටින අයටත්- රජය මඟින් වැටුප් ගෙවනවා.

ඒ නිසා කිසිම කෙනෙකුගෙන් තෝරා බේරා පළිගැනීමක් කරලා නැහැ. ඊට අතිරේකව රුපියල් 5,000ක දීමනාව ලබා ගැනීමට හැකි ලෙස -විදුහල් හෝ- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ළඟ තිබෙනවා. මේ වන කොට විශාල පිරිසක් එය ලබාගෙන තිබෙනවා. අපි ඔක්තෝබර් මස 21 වැනිදාට ප්‍රාථමික පාසැල් විවෘත කිරීම ක්‍රියාත්මක කරනවා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මා එක්ක එකඟ වෙනවා ඇති. මා දැන් පිළිතුර ලබා දීම අවසන් කරන්න කැමැතියි. අරගෙන තිබෙන මේ තීරණ පරිදි අපි කටයුතු කරනවා. ඒ තීරණ සියල්ල යළිත් වරක් ප්‍රකාශයට පත් කරන්න මා කාල වේලාව ගන්නේ නැහැ.

2018 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැටුප් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනාවලිය පදනම් කරගෙන ගුරු-විදුහල්පති වැටුප් විෂමතා ඉවත් කිරීම පිණිස 2022 වර්ෂයේ අය වැය ලේඛනය මඟින්, නොවැම්බර් මාසයේදී ගරු මුදල් ඇමතිතුමා විසින් සුදුසු යෝජනාව ඉදිරිපත් කර, එය අදියර වශයෙන් ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු කරනවා.

ගුරු සේවය, ගුරු උපදේශක සේවය සහ විදුහල්පති සේවය යන සේවාවන් සංවෘත සේවාවක් බවට පත් කිරීමට අවශ්‍ය විධිවිධාන හඳුන්වා දෙමින්, එකඟ වූ හා තීරණය කළ පරිදි 2021.11.20 වැනි දිනට පෙර ගැසට් නිවේදනයක් ප්‍රකාශයට පත් කිරීමේ තීරණය ක්‍රියාත්මක වනවා.2021 සැප්තැම්බර් මස හා ඔක්තෝබර් මස සඳහා රුපියල් 5,000 බැගින් වන විශේෂ දීමනාවක්, භාණ්ඩාගාර ලේකම් විසින් අපට ලබා දී තිබෙන උපදෙස් පරිදි ගෙවීමට යවා තිබෙනවා.

ඒ වාගේම, 2021.08.09 දින අමප අංක 21/1415/302/023 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පත් කරන ලද අනුකමිටුවක් තිබෙනවා. ගුරුවරු හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අය මුහුණ දෙන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා පළාත් සභාව අභ්‍යන්තරයේ විසඳා ගත හැකි ප්‍රශ්නවලට විසඳුම් හා නිර්දේශ ලබා දීම සඳහා පත් කළ එම විශේෂ කමිටුවේ 2021.08.21 දිනැති වාර්තාවේ 07 ඡේදයෙහි සඳහන් සෙසු නිර්දේශ හය මසක් ඇතුළත ක්‍රියාත්මක කිරීමට ගත් තීරණය ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා අප සියල්ලන්ම ප්‍රාර්ථනා කරන විධියට සෞඛ්‍ය රෙගුලාසිවලට අනුව නැවත පාසල් ආරම්භ කිරීම සඳහා සියලු ගුරුවරු අපට සහයෝගය ලබා දෙන්න, තම යුතුකම හා වගකීම යන දෙකම ඉෂ්ට කරන්න කියා අපි ඉල්ලා සිටිනවා. මෙය, අපේ රටේ අධ්‍යාපනයේ අනාගත දියුණුව පිණිස කටයුතු කරන්න සියලුදෙනාගේ සහයෝගය ලබා දිය යුතු වැදගත් අවස්ථාවක්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට අවශ්‍ය සියලු පිළිතුරු ලබා දුන්නා කියා මා හිතනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා නොවැම්බර් මාසයේ ඉදිරිපත් කරන අය වැය ලේඛනයේදී මේ සඳහා නිශ්චිත පිළිතුරක් ලබා දෙන බව. ඒ දිනය නොවැම්බර් 12 වෙන්න ඕනෑ. එතකොට ගුරුවරු සහ අප එය දැන ගන්නේ නොවැම්බර් මාසයේ 12 වැනි දා නේ; අය වැය ලේඛනය ඉදිරිපත් කළාට පසුව නේ. ඔබතුමාත්, විශේෂයෙන්ම ගරු අගමැතිතුමාත් ඒ වෘත්තිය සමිති එක්ක සාකච්ඡා කරලා, නොවැම්බර් මාසයේ 12වැනි දාට අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරන නිශ්චිත යෝජනාව මේකයි කියලා කියන්න බැරිද? මොකද, නොවැම්බර් 12වැනි දායින් පසුව නේ ගුරුවරුන් එය දැන ගන්නේ. ඊට වඩා හොඳයි, ඒ වෘත්තිය සමිතිවලට සාකච්ඡාවක් ලබා දෙන්න ඔබතුමන්ලාට පුළුවන් නම්. සාකච්ඡාවක් ලබා දීලා, 'මෙන්න මේක තමයි නොවැම්බර් මාසයේ 12වැනි දා ඉදිරිපත් කරන අය වැය ලේඛනයට ඇතුළත් කරලා තිබෙන යෝජනාව' කියලා යම් එකඟතාවකට එන්න පුළුවන් නම් හොඳයි. ඊට පසුව, ඕනෑ නම් ඒ වෘත්තිය සමිතිවලට පුළුවන්, 'මෙන්න මෙහෙම වුණොත් හොඳයි' කියලා එම යෝජනාවට යම් සංශෝධනයක් කරන්න. මොකද, දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් කිරීමේ වුවමනාවෙන් කවුරුවත් මෙහෙම කරන්නේ නැහැ. අපි ඒක හොඳින් තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා ඒ ප්‍රශ්නය විසඳීම සඳහා අය වැය ලේඛනයෙන් නිශ්චිත යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර ඔබතුමන්ලා එක්ක යම් සාකච්ඡාවකට එන්න අවස්ථාව ලබා දෙනවා නම් හොඳයි. එහෙම කරලා 'මේක තමයි යෝජනාව' කියලා යෝජනාව සඳහන් කරලා, ඒ යෝජනාවට 'මෙන්න මේ වාගේ සංශෝධනයක් ආවොත් එකඟයි' කියා වෘත්තීය සමිති පැත්තෙන් කියලා -ඒක පිළිගැනීම, නොපිළිගැනීම වෙනම දෙයක්.- යම් එකඟතාවකට ආවොත්, ඉතා ඉක්මනින් මේ ප්‍රශ්නය අවසන් කර ගන්න පුළුවන් වෙයි කියා මට හිතෙනවා. ඒ නිසා ගරු අගමැතිතුමාටත්, විශේෂයෙන්ම ගරු අධ්‍යාපන ඇමතිතුමාටත් පුළුවන් නම් අපට දැන් දිනයක් කියන්න, මෙන්න මේ දිනයේදී හෝ සාකච්ඡාව කරනවා කියලා. එතකොට මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වෙයි. එතකොට ගුරුවරුන් සාමාන්‍ය පරිදි රාජකාරිවල නිරත වෙයි කියලා මම හිතනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමාගේ එකඟතාව අනුව වෙලාවක් ලබාගෙන, ඒ අවස්ථාවේදී අපට සාකච්ඡා කරන්න පුළුවන්. හැබැයි ඒ, අදාළ වෘත්තිය සමිති සියල්ල සමඟ. [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

කමක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ කාරණය සම්බන්ධයෙන් ගත් තීරණය, ලබන අවුරුද්දේ ගන්නා ක්‍රියා මාර්ග පිළිබඳව අය වැය ඉදිරිපත් කිරීමේදී ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශයට පත් කරනවා. අය වැය රහස් ගැන වැඩිපුර අහන්න එපා, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඒවා එහෙම කියන්න බැහැ. එහෙම කියන එක සාමාන්‍ය සිරිත නොවෙයි. අපි අගමැතිතුමා එක්ක සාකච්ඡාවක් පවත්වමු. සැලසුම් කළ පරිදි පාසල් විවෘත කරන්න කටයුතු කරමු.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා (අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - பிரதம அமைச்சரும் பொருளாதாரக் கொள்கைகள் மற்றும் திட்டச் செயற் படுத்துகை அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும்)
(The Hon. Mahinda Rajapaksa - Prime Minister, Minister of Economic Policies and Plan Implementation, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing)

අපි ඕනෑම වෙලාවක ලැහැස්තියි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්න අහන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

අතුරු ප්‍රශ්න නොවෙයි මම අහන්නේ. Point of Order එක මොකක්ද කියලා ඔබතුමා මගෙන් අහන්නකෝ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද, ඔබතුමාගේ Point of Order එක?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 71 සහ 73 යටතේ මම ඔබතුමාට දැන් ලියමනක් ඉදිරිපත් කළා. එම ලියමන මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

පාර්ලිමේන්තුවේ සභානායකතුමාට, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට, විපක්ෂ නායකතුමාට මම කියනවා, අය වැය පිළිබඳ සාකච්ඡාවලදී ඔබතුමන්ලා එය සැලකිල්ලට අරගෙන ඒ ගැන ගැඹුරින් කථා කරලා තීන්දුවක් ගන්න කියලා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි ඒ ගැන කථා කරලා තීරණය කරන්නම්. දැන් ඒ කාරණය ගන්න ඕනෑ නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

මා කියන්නේ, දැන් නොවෙයි. ඔබතුමන්ලා ඒ ගැන සාකච්ඡා කරන්න. දැන් තීන්දුවක් ගන්න ඕනෑ නැහැ. ඔබතුමා එය ඒ වෙලාවේදී දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක දැන දැන කාලය නාස්ති කරන්න එපා.

මීළඟට, අමාත්‍යාංශ නිවේදනය, ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා.

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සිදු වන අක්‍රමිකතා: වාරිමාර්ග අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## குடிவரவு, குடியகல்வுத் திணைக்களத்தில் இடம்பெறும் முறைகேடுகள்: நீர்ப்பாசன அமைச்சரும் அரச பாதுகாப்பு மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும் உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சருமானவரினது கூற்று

## IRREGULARITIES IN DEPARTMENT OF IMMIGRATION AND EMIGRATION: STATEMENT BY MINISTER OF IRRIGATION, STATE MINISTER OF NATIONAL SECURITY AND DISASTER MANAGEMENT AND STATE MINISTER OF HOME AFFAIRS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ විසින් 2021.10.05 දින අසන ලද, ස්ථාවර නියෝග 27(2) යටතේ වූ ප්‍රශ්නයට පිළිතුර වාරිමාර්ග අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මහතා වෙනුවෙන් මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

01. ඔව්. ආගාමික හා විගාමික පනත අනුව අනුමත තොටුපොළවලින් නිත්‍යානුකූලව පැමිණෙන හා පිටවන පුද්ගලයන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දැනුවත් භාවය මත සිදු වේ.

02. සඳහන් කර ඇති නම්වලින් අදාළ අය අනුමත තොටුපළකින් රටින් පිටව ගියාද යන්න නිශ්චිතව කිව නොහැක. මන්ද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය, ජාතික හැඳුනුම්පත් අංකය හා විදේශ ගමන් බලපත්‍ර අංකය පාදක කරගෙන පුද්ගලයා හඳුනා ගන්නා බැවිනි. ඇඟිලි සලකුණු මඟින් පුද්ගලයා හඳුනා ගැනීමට ගුවන් තොටුපළේ වර්තමානයේ පහසුකම් නොමැත. නමුත් ඉදිරියේදී හඳුන්වා දීමට නියමිත ඊ - විදේශ ගුවන් බලපත්‍රය තුළ මෙම පහසුකම ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත.

03. ඔව්.

2016ට පෙර ජාතික හැඳුනුම්පතෙහි පළමුවැනි අංක 5 වෙන් වී තිබුණේ උපන් දිනය පදනම් කරගෙන වේ. එසේම මුල් ඉලක්කම් 5න් පසුව එන ඉලක්කම් තුන, අදාළ දිනයේදී ඉපිද ලියාපදිංචිය සඳහා දෙපාර්තමේන්තුව වෙත යොමු වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාවට සාපේක්ෂවය. **(ඇමුණුම 01**)**

04. ඉහත 03 ප්‍රශ්නයට පිළිතුර ලෙස සඳහන් කළ පරිදි අංක ලබා දිය හැකිව තිබුණේ 999 දෙනෙකු සඳහා පමණි.

05. මුල් ඉලක්කම් 7න් පසුව එන ඉලක්කම් 4 යොදා ඇත්තේ විද්‍යාත්මක සොයා බැලීමකින් පසුවය. **(ඇමුණුම 02**)** එසේම එක් දිනකදී 9,999 දෙනෙකුට පමණක් අංක ලබා දිය හැක.

06. නොදනී.

සැක කටයුතු ලේඛන පරීක්ෂණ නිලධාරින්ගේ සහාය අදාළ පරීක්ෂණය කරනු ලබන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් ලබා ගන්නවාද යන්න නොදන්නා අතර, ඇතැම් විට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහාය මෙවැනි කාරණා සඳහා ඉල්ලූ විට ලබා දෙනු ලැබේ.

07. විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛන සියල්ලම පරිලෝකනය කර එම දත්ත ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රත්‍යන්ත පාලන පරිගණක පද්ධතියේ ගබඩා කරනු ලබයි. එම ලේඛන ගබඩා කිරීම සඳහා විශාල ඉඩ ප්‍රමාණයක් වැය වන බැවින් ඒ සඳහා නීතිපතිතුමාගේ අනුමැතිය මත ඉහත පියවරගෙන ඇත.

08. 2010 වසරෙන් පසුව දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන සෑම විදේශ ගමන් බලපත්‍රයකටම අදාළ ලියකියවිලිවල පරිලෝකන වාර්තා දෙපාර්තමේන්තුව සතු වේ. (පරිලෝකනය නොකර කිසිදු විදේශ ගුවන් ගමන් බලපත්‍රයක් පද්ධතියෙන් මුද්‍රණය කළ නොහැක.) භෞතිකව ලිපි ගොනු තබා ගැනීමට වඩා පරිලෝකනය කර තබා ගැනීම වඩා ආරක්ෂාකාරී හා විශ්වාසදායී වේ.

09. එසේ සිදු කරනු ලැබුවේ නීතිපතිගේ "විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍රවල ඉලෙක්ට්‍රොනික් පිටපත් පවත්වාගෙන යෑම සඳහා ලිපි ගොනු හා අනෙකුත් කඩදාසි වාර්තා විනාශ කිරීම" යන මැයෙන් 2010 ජූලි මස 20 දින ආගමන විගමන පාලක ජනරාල් අමතමින් යොමු කරන ලද උපදෙස්වලට අනුකූලවය. **(ඇමුණුම 03**)**

10. 2015 අංක 7 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත අනුව විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා ජෛවමිතික දත්ත මඟින් පුද්ගලයා නිශ්චිත කර ගැනීම සඳහා ඇඟිලි සලකුණු දත්ත පද්ධතියට ලබා ගන්නා බැවින් මහ ජනතාවට පහසු ලෙස අයදුම් පත ඉදිරිපත් කිරීම සඳහා පරිපාලනමය තීරණයක් වශයෙන් මෙය ඉවත් කරන ලදී.

11. විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත පදනම් කර ගන්නා අතර, එම ලේඛනය (ජාතික හැඳුනුම්පත) ලබා දීම ග්‍රාම නිලධාරින් සහතික කිරීම මත සිදු වන බැවින්, නැවත විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා එම නිලධාරියාගේ සහතිකය ලබා ගැනීම මහ ජනතාව අපහසුතාවට පත් කිරීමකි. (මූලික ලේඛනය ග්‍රාම නිලධාරි සහතිකය මත ලබා දී ඇති බැවින් ද්විතීය ලේඛනය සඳහා නැවත එම නිලධාරියාගේ සහතික කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ.)

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා පිළිබඳ දැනුම් දීම, ගරු සභානායකතුමා.

---

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

# පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2021 ඔක්තෝබර් 21 බ්‍රහස්පතින්දා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 3.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2021 ඔක්තෝබර් 21 බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### නාගානන්ද කොඩිතුවක්කු මහතා ඉදිරිපත් කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම
### திரு. நாகானந்த கொடிதுவக்குவினது அடிப்படை உரிமை மனு
### FUNDAMENTAL RIGHTS PETITION BY MR. NAGANANDA KODITUWAKKU

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2021 සැප්තැම්බර් 07 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදායට ගරු කරමින් තමයි එතුමා මේ වරප්‍රසාද ප්‍රශ්නය යොමු කර තිබෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සටහන් කිරීම සඳහා පමණක් මම මෙය කියන්නම්. ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතින නඩු විභාගයක් සම්බන්ධව සාමාන්‍ය සම්ප්‍රදායය, සාකච්ඡා කිරීම සිදු වන්නේ නැති එකයි. මා හිතන විධියට ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා මතු කරන්නේ එවකට සිටි ගරු කථානායකතුමා පිළිබඳ කළ ප්‍රකාශය ගැනයි, the reference that had been made by whoever petitioner.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
යෝජනා කළේ ඒකයි. විභාග වීමක් සිදු වෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නඩුව අවසන් වනතුරු ඒ ගැන කථා කරන්න බැහැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
හිටපු කථානායකතුමා ගැන. ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු රනිල් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු අගමැතිතුමා මේ සභාවේ ඉන්න නිසා මගේ තව එක ඉල්ලීමක් තිබෙනවා. කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිතුමාත්, ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ඉන්න නගර සභිකයනුත් මේ සහන ලබාදීම සම්බන්ධයෙන් නාගරික කොමසාරිස් සමඟ විශාල ප්‍රශ්නයක් ඇති කරගෙන තිබෙනවා. සහන ලබා දෙන එකට හැම එක්කෙනාම එකඟ නිසා මම අගමැතිතුමාට යෝජනා කරනවා, මේ කණ්ඩායම් කැඳවලා සාකච්ඡා කරලා විසඳුමක් ලබා දෙන්න කියලා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்துவிடப்பட்டது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

### වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2021
### அரையாண்டு நிதி நிலைமை அறிக்கை - 2021
### MID-YEAR FISCAL POSITION REPORT - 2021

[පූ.භා. 11.42]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "රජයේ මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අර්ධ වාර්ෂික වාර්තාව මේ මොහොතේ රටේ ආර්ථිකයේ පවතින තත්ත්වය පිළිබඳව මහජනතාවගේ අවබෝධය සඳහා වන පිළිබිඹුවකි. මුදල්

අමාත්‍යාංශය විසින් හෙළිදරව් කරනු ලබන ආර්ථික දත්ත පිළිබඳව ගැඹුරින් සලකා බැලිය යුතුව තිබෙන්නේ ඒවා හුදු ඉලක්කම් පමණක් නොවන නිසාය. ඒවා රටේ මේ මොහොතේ තිබෙන ආර්ථික අර්බුදයත්, රටේ අනාගත අර්බුදයන් සම්බන්ධයෙනුත් අවදානම් සහගත පුරෝකථනයක් ලබා දෙයි. වේගයෙන් ඉහළ යමින් ඇති ණයබර, ඉහළ නගිමින් ඇති උද්ධමනය, පහළ යමින් ඇති රාජ්‍ය ආදායම්, විදේශ සංචිත රටේ හෙට දවස කෙබඳු වනු ඇත් ද යන්න පිළිබඳව පෙන්වා දෙන මාර්ග සලකුණුය. මෙම තත්ත්වය තුළ එම දත්ත විසින් පෙන්වා දෙනු ලබන ආර්ථිකයේ අවදානම් සහගත නැඹුරුව බරපතළ ලෙස සැලකිල්ලට ගෙන ඒ පිළිබඳව ගැඹුරු සාකච්ඡාවක් සිදු කළ යුතුව ඇතැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු කථානායකතුමනි, අපි දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේදී, අය වැය ලේඛන තුළ ද, මහ බැංකු වාර්තාව තුළ ද, මුදල් අමාත්‍යාංශයේ වාර්තා තුළ ද අඩංගු වී තිබෙන සංඛ්‍යා, දත්ත විශ්ලේෂණය කරමින් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. අපට අදත් අවශ්‍ය නම් ඒ සංඛ්‍යා දත්ත විශ්ලේෂණයකට යන්න පුළුවන් වේවි. හැබැයි, අද අපට වැදගත් වෙන්නේ සංඛ්‍යා දත්ත විශ්ලේෂණයකින් ඔබ්බට ගිහිල්ලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! Will an Hon. Member propose the Hon. Weerasumana Weerasinghe to the Chair?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I propose that the Hon. Weerasumana Weerasinghe do now take the Chair.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* THE HON. WEERASUMANA WEERASINGHE *took the Chair.*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සංඛ්‍යා දත්තවලින් ඔබ්බට ගිහිල්ලා, මේ ආර්ථික අර්බුදය අද ජන ජීවිතයට බලපෑම් කරමින් තිබෙන්නේ කොහොමද කියලා අපට පෙනෙනවා. පසු ගිය දවස්වල අපි දැක්කා, කිරිපිටි මිලදී ගැනීම සඳහා දීර්ඝ පෝලිම්, ගෑස් මිලදී ගැනීම සඳහා දීර්ඝ පෝලිම්, සීනි කිලෝග්‍රෑම් එකක් සතොසෙන් මිලදී ගැනීම සඳහා දීර්ඝ පෝලිම් තිබෙන ආකාරය. කන්ටේනර් 800කට වැඩි ප්‍රමාණයක් වරායේ හිරවෙලා, සාමාන්‍ය ජනතාවට එදිනෙදා වගා කටයුතු කිරීම සඳහා අවශ්‍ය පොහොර ටික ලබා දෙන්න හැකියාවක් ලැබිලා නැහැ. එදිනෙදා ජනතාව මිලදී ගන්නා භාණ්ඩවල මිල ඉතා ඉහළ යමින් තිබෙනවා. ආණ්ඩුව මේ භාණ්ඩ පාලනය කිරීම සඳහා විවිධ ගැසට් නිවේදන නිකුත් කළා. ඊට අමතරව හදිසි නීතිය ප්‍රකාශයට පත් කළා. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්වරයෙක් පත් කළා. හැබැයි, හදිසි නීතිය, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්, ගැසට් නිවේදන වැනි නීති ඉක්මවා යන අර්බුදයක් අපේ රටේ තිබෙනවා. ඒ නිසා ඒ කිසිදු නීතියක්, කිසිදු ගැසට් නිවේදනයක්, අත්‍යවශ්‍ය කොමසාරිස්වරයාගේ බලයක් අද කිසිසේත්ම වලංගු නොවන බලයක් බවට පත්වී තිබෙනවා. ඇයි ඒ? ඒ තරමටම මේ අර්බුදය දෝර ගලමින්, මේ අර්බුදය පිටාර ගලමින් තිබෙනවා. ඒ නිසා පසු ගිය සඳුදා කැබිනට් මණ්ඩලයට සිද්ධ වුණා හාල් මිල පාලනය ඉවත් කරන්න. පසුවදා මෝල් හිමියන් විසින් හාල් මිල ප්‍රකාශයට පත් කළා. ඉතා හොඳින් බැලුවොත්, මේක කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරු සහ හාල් මෝල් හිමියන් අතර යම් එකඟතාවක් ද කියලා සැකයක් මතු වෙනවා. මොකද, සඳුදා හාල් මිල පාලනය ඉවත් කරනවා. අඟහරුවාදා උදේ 10.00ට හාල් මිල ප්‍රකාශයට පත් කරනවා. ඒ වාගේම ඊයේ හදිසියේ කැබිනට් මණ්ඩලය රැස්වෙලා කිරිපිටි, ගෑස්, සිමෙන්ති, පාන්පිටි ආදී භාණ්ඩ ගණනාවක පාලන මිල ඉවත් කළා. අද උදේ වෙනකොට මොකක්ද ඇතිවී තිබෙන ප්‍රතිඵලය? කිරිපිටි කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 350කින් ඉහළ දැමීමට අද කිරිපිටි සමාගම් තීරණය කොට තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත් රුපියල් 380ක් වුණු ග්‍රෑම් 400 කිරි පැකට් එක රුපියල් 520 දක්වා වර්ධනය වෙමින් තිබෙනවා. අද හවසට ගෑස් සමාගම් ලසන්ත අලගියවන්න රාජ්‍ය අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට අයත් පාරිභෝගික අධිකාරිය සමඟ සාකච්ඡාවක් පවත්වනවා.

ඒ ගෑස් සමාගම් විසින් විශේෂයෙන්ම ලිට්රෝ ගෑස් සමාගම, ලාභ අලාභ තත්ත්වයෙන් පවත්වා ගෙන යන්න නම්, අවම වශයෙන් ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,200කින් වැඩි කළ යුතු යැයි කියන යෝජනාව ඉදිරිපත් කරන්න සූදානම් වී තිබෙනවා. එම නිසා අද හවස් වෙනකොට බොහෝ දුරට ගෑස් සිලින්ඩරයක් රුපියල් 1,000කින්වත් මිල ඉහළ යෑමේ අනතුරකට මුහුණ දී තිබෙනවා. අද උදේ අපට ප්‍රවෘත්ති වාර්තා කරනවා, තිරිඟු පිටි කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 10කින් ඉහළ ගිය බව. හෙට වෙනකොට අපට වාර්තා වේවි සිමෙන්ති කොට්ටයක මිල කොච්චරද කියන කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියල්ලන්ගෙන්ම පෙන්නුම් කරන්නේ කුමක්ද? දත්ත, වාර්තා, නියෝගවලින් පාලනය කරන්න බැරි ගැඹුරු ආර්ථික අර්බුදයකින් අද අපේ රට පෙළී තිබෙන බව තමයි පෙන්නුම් කරන්නේ. මේ ගමන් කරමින් තිබෙන ආර්ථික දිශානතිය පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ අපි මේ පාර්ලිමේන්තුවේ කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මේ අනුගමනය කරමින් තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රමානුකූලව වර්ධනය වෙමින් තිබුණු අර්බුදය, මෙවැනි ආර්ථිකයක්, මෙවැනි කඩාවැටීමක් අපේ රටට හිමි වෙන බව දශක ගණනාවක් මුළුල්ලේ අපි මේ පාර්ලිමේන්තුවේත්, පාර්ලිමේන්තුවෙන් පිටතත් සාකච්ඡා කරමින් තිබුණා. දිගින් දිගටම අපි පෙන්වා දෙනු ලැබුවේ, ණය මත ගොඩ නැඟෙන, මහා කොන්ක්‍රීට් වනාන්තර ගොඩ නැඟෙන, ජනතාවගේ ජන ජීවිතයත් එක්ක සම්බන්ධ නොවෙන ආර්ථික මාර්ගයක් කවදාවත් රටට හෝ රටේ ජනතාවගේ ජන ජීවිතය උසස් නොකරන බව. අද අපේ ඇස් ඉදිරිපිට මේ අර්බුදය පෙන්නුම් කරමින් තිබෙනවා. මේ අර්බුදයේ ආර්ථික උපාය මාර්ග විතරක් නොවෙයි වැදගත්.

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආර්ථික උපාය මාර්ගත් එක්ක අතහරින්න බැරි -බැඳුණු- මහා පරිමාණ වංචා, දූෂණ තිබෙනවා. අපි දන්නවා, සමහර ව්‍යාපෘති තිබෙනවා. ඒ ව්‍යාපෘති ආරම්භ කරන්නේම වංචා, දූෂණ හේතු කොටගෙන. තමන්ට ලැබෙන commission එක මත තමයි එම ව්‍යාපෘති ආරම්භ වෙන්නේ. එම නිසා ව්‍යාපෘතියේ වංචාව පමණක් නොවෙයි, දීර්ඝ කාලයක් තිස්සේ එම ව්‍යාපෘති අපට අත්පත් කර දී තිබෙන බර මේ අර්බුදයට විශාල හේතු සාධක බවට පත් වී තිබෙනවා. අපි උදාහරණයක් හැටියට නෙළුම් කුලුන ගත්තොත්, බැලූ බැල්මට එහි අලෝකය දුඹුරු වර්ණයෙන් -කුරහන් පාට වර්ණයෙන්- බැබළෙනවා. හැබැයි, කුරහන් පාට වර්ණයෙන් කොළඹ නගර මධ්‍යයේ තිබෙන කුලුනක් බැබළුණාට සාමාන්‍ය ජනතාවගේ ජීවිතය ඉතා කලු වර්ණයෙන් ඇඳිරි බවට පත් වී තිබෙනවා. ඒ කුලුන සඳහා ඩොලර් මිලියන 88.6ක් වැයකොට තිබෙනවා. එහි වාර්ෂික පොලිය 4.152යි. ඒ කියන්නේ ඩොලර් සඳහා 4.52ක පොලියක් අරගෙන තිබෙනවා. 2019දී එය විවෘත කර තිබෙනවා. අපි 2021 වෙනකම් එහි වාරික ගෙවනවා. එයින් අපට ඇති වී තිබෙන ඵලය කුමක්ද? ඒක අපේ රටේ ආර්ථිකයට බරක් නොවෙයිද? කවදා හරි ඔය නෙලුම් කුලුනේ shopping malls

[ගරු අනුර දිසානායක මහතා]

දාන්න පුළුවන්. හැබැයි, කවදාහරි දමන එකේ නොවෙයි වැදගත්කම තිබෙන්නේ. අපි විශාල ආර්ථික අතිරික්තයක් තිබෙන රටක් නොවෙයි. අපට ප්‍රශ්න මල්ලක් තිබෙනවා; අපට සල්ලි මල්ලක් තිබෙනවා කියලා හිතමු. හැබැයි ප්‍රශ්න මල්ලේ ප්‍රශ්න ගැන ප්‍රමුඛතාවක් හැදිය යුතුව තිබුණා. ප්‍රශ්නවල ප්‍රමුඛතාව අනුව තමයි අපට සල්ලි මල්ල වියදම් කළ හැකිව තිබුණේ. හැබැයි සිදුවී තිබෙන්නේ මොකක්ද? සල්ලි මල්ල තිබෙනවා. ප්‍රශ්න මල්ලේ ප්‍රශ්නවලට අපි ප්‍රමුඛතාවක් නැතුව වියදම් කරන්න පටන් ගත්තා. ඒවා අධික බරක් සහිතව අපේ රටේ ආර්ථිකයට අද එකතු කර තිබෙනවා.

ඒ වාගේම, මත්තල ගුවන් තොටුපොළට වියදම් කර තිබෙනවා ඩොලර් මිලියන 243.7ක්. සියයට දෙකේ පොලියට ඒ මුදල් අරගෙන තිබෙන්නේ. 2013 අපි ඒක විවෘත කරනු ලැබුවා. දැන් අවුරුදු 9කට ආසන්න කාලයක් වෙනවා. අපට මොකක්ද ලැබිලා තිබෙන ප්‍රතිඵලය? පසු ගිය දා කැබිනට් මණ්ඩලයට සංචාරක අමාත්‍යතුමා විසින් කැබිනට් පත්‍රිකාවක් දැම්මා. ඒ පත්‍රිකාවෙන් මොකක්ද කියන්නේ? මත්තල ගුවන් තොටුපොළෙහි යම් යම් ගුවන් යානා ගොඩ බැසීම සඳහා එකඟතාවකට එනවා නම්, අවුරුද්දක කාලයක් නිකම් භාණ්ඩ දෙන බව කිව්වා. ඒක ගිය අවුරුද්දේත් දුන්නා. තවත් අවුරුද්දකින් දීර්ඝ කළා. ඒ විතරක් නෙවෙයි සතියකට එකක් වාගේ එකඟතාවකට එනවා නම්, මත්තල ගුවන් තොටුපොළ touch කරලා එනවා නම්, බණ්ඩාරනායක ගුවන් තොටුපොළේ අය කිරීම සියයට 50ට අඩු කරන්නම් කිව්වා. මෙන්න මෙහෙමයි තමුන්නාන්සේලාගේ කැබිනට් පත්‍රිකාවේ තිබෙන්නේ. ගරු ප්‍රසන්න රණතුංග සංචාරක අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද ඒ කැබිනට් පත්‍රිකාව මා ළඟ තිබෙනවා. මොකක්ද සිදු වී තිබෙන්නේ? මත්තල ගුවන් තොටුපොළට ගුවන් යානා ගෙන්වා ගැනීම වෙනුවෙන් බණ්ඩාරනායක ගුවන් තොටුපොළේ අය කිරීමත් සියයට 50ක් කරන්නම් කියන එක තමයි තමුන්නාන්සේලාගේ යෝජනාව. මේවා බරක් බවට පත් වුණේ නැද්ද? මේවා කොන්ක්‍රීට් වනාන්තර. මේක අපේ රටේ ආර්ථිකයටත්, අපේ රටේ ජනතාවගේ ජන ජීවිතයත් එක්ක සම්බන්ධ වෙච්ච සංවර්ධන මාවතක්ද? ඒවායේ ප්‍රතිවිපාකවලට අපි දැන් මුහුණ දී තිබෙනවා.

ඊළඟට සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය ගත්තොත්, ඒ සඳහා රුපියල් බිලියන 4.3ක් වැයකොට තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොඳට හොයලා බලන්න අපි එහි ක්‍රීඩා කළේ තරග කීයද කියලා. අධික කොන්ක්‍රීට් වනාන්තර ඉදිකරමින් ගිය මේ ඊනියා සංවර්ධන මාවත අද මේ රටේ අර්බුදයක් බවට පත් කර තිබෙනවා. එහි ප්‍රතිඵල බවට පත් වී තිබෙන්නේ කුමක්ද? එක එක වර්ගයේ ණය ගන්න සිදුවී තිබෙනවා. ඔබතුමා දන්නවා ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, රාජ්‍යයන් අතර එකඟතා, එහෙම නැත්නම් ස්වෛරී බැඳුම්කර විකුණලා යම් ණය ප්‍රමාණයක් අපි ලබා ගන්න ඇති. හැබැයි, දැන් ඒවාට යන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ වාගේම අපි blacklist වෙලා ණය නොදෙන තත්ත්වයකට පත් වී තිබෙනවා. අද තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? ඛනිජතෙල් නීතිගත සංස්ථාවට කාලීන ඇමෙරිකානු ඩොලර් ප්‍රතිමූල්‍යකරණ පහසුකම් ලබා ගැනීම සඳහා ඩොලර් බිලියන 2.5ක කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා ගරු උදය ගම්මන්පිල අමාත්‍යවරයා විසින් 2021.08.24වන දා.

ඒ කැබිනට් පත්‍රිකාව මා ළඟ තිබෙනවා. ඒ කැබිනට් පත්‍රිකාවෙන් මොකක්ද කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලර් බිලියනයක ණය මුදලක් ලබා ගැනීම වෙනුවෙන් ආරම්භයේදී කම්ටුවක් පත් කරනවා. හැබැයි, ඩොලර් බිලියනයක ණයක් ගන්න බලය දුන් කැබිනට් පත්‍රිකාවට අවසානයේදී ඩොලර් බිලියන දෙකහමාරක ණය මුදලක් ලබාගැනීම සඳහා කැබිනට් මණ්ඩලය එකඟතාව පළ කරනවා. ඒ කියන්නේ ඩොලර් බිලියන දෙකහමාරක් ණයට ගන්න යනවා. ණය ලබා ගැනීම සඳහා අවසානයේදී මොකක්ද කියන්නේ? මේ ණය ලබා ගැනීම සඳහා Concept Globalහි මූල්‍ය ආයතනය වන PSL of America, Inc. වෙත සිය ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ අභිප්‍රාය දැක්වීමේ ලිපියක් නිකුත් කරන්න ඕනෑ. ඒ වාගේම ඒ ණය මුදල ලබාගැනීම වෙනුවෙන් කොමිස් මුදල ලෙස සියයට 7ක් දෙන්නත් ඕනෑ. ඩොලර් බිලියන දෙකහමාරට -ඒ කියන්නේ ඩොලර් මිලියන 2,500ට- සියයට 7ක කොමිස් මුදලක් කියන්නේ, ඩොලර් මිලියන 175ක්. එතකොට ඩොලර් මිලියන 175ක කොමිස් මුදලක් දෙන්න යනවා. ඒ මොකටද? සියයට තුනේ පොලියට ණයක් ගන්න. ඔබතුමන්ලා දන්නවාද, අපේ රටට ඩොලර් මිලියන 2,500ක ණය මුදලක් ගන්නකොට සියයට 7ක commission එකක් දෙන්න ඕනෑ බව? සියයට 7ක commission එකක් කියන්නේ, ඩොලර් මිලියන 175ක්. ඒක රුපියල්වලින් බලන්න. බැංකුවෙන් බලනවා නම් රුපියල් 203ට බලන්න. කළුකඩෙන් බලනවා නම් රුපියල් 255ට බලන්න. එතකොට හිතාගන්න පුළුවන්, මේ මොන තරම් ධනයක්ද කියලා. ඇයි, අපේ රට මේ තැනට පත් වුණේ? මේවා නිකම් සිදුවූ දේවල් නොවෙයි. විශාල දූෂිත ගනුදෙනු විසින් අපේ රටේ ආර්ථිකය විශාල ප්‍රපාතයකට ඇද දමා තිබෙනවා. අද ලෝකයේ කොතැනක හෝ වංචාව, දූෂණය පිළිබඳ යම් කරුණක් හෙළිදරව් වෙනවා නම්, බොහෝදුරට ඒකට ලංකාවත් සම්බන්ධයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක ජනගහනය බිලියන 8ක් පමණ වෙනවා. අපේ රටේ ජනගහනය මිලියන 20ත්, 22ත් අතර ප්‍රමාණයක්. එතකොට ලෝක ජනගහනයත් එක්ක සංසන්දනය කර බලන විට අපේ රටේ සිටින්නේ කුඩා ජනගහනයක්. හැබැයි, ලෝක ජනගහනයෙන් 335කගේ විතර නාමලේඛනයක් එනකොට අපේ රටේ දෙන්නෙකුත් ඒ නාමලේඛනයේ ඉන්නවා. එතකොට හිතාගන්න පුළුවන්, අපේ රටේ තත්ත්වය. ලෝකයම ගත්තොත් විශාල ජනගහනයක් සිටිනවා. හැබැයි, කුඩා ජනගහනයක් සිටින අපේ රටේ දූෂණ, වංචාත් ඒ පරීක්ෂණ හරහා හෙළිදරව් වෙන්න පටන් ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දා එංගලන්තයත්, ඇමෙරිකා එක්සත් ජනපදයත්, ප්‍රංශයත් එකතු වෙලා ප්‍රංශ එයාර් බස් සමාගම පිළිබඳ පරීක්ෂණයක් කළ බව ඔබතුමාත් දන්නවා ඇති. මොකද, ප්‍රංශ එයාර් බස් සමාගම ලෝකයේ බොහෝ රටවලට commission ලබාදීලා, එහෙම නැත්නම් අල්ලස් ලබාදීලා වැඩිපුර ගුවන්යානා මිලදී ගැනීම සඳහා කටයුතු කර තිබෙනවා. ඒ ගැන එංගලන්තයත්, ප්‍රංශයත්, ඇමෙරිකා එක්සත් ජනපදයත් සාමූහික පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණයෙන් හෙළිදරව් වුණේ මොකක්ද? ඒ වකවානුවේ එයාර්ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි කපිල චන්ද්‍රසේනගේ බිරිඳගේ account එකට බෲනායිවල පිහිටි ෂෙල් ගෑස් සමාගම හරහා ඩොලර් මිලියන 2ක් බැර වී ඇති බව එහිදී හෙළිදරව් වුණා. එම පරීක්ෂණයෙන් හෙළිදරව් වූ අනෙක් දේවල් මොනවාද? මුළු අල්ලස් මුදල ඩොලර් මිලියන 16ක් බවත්, ඩොලර් මිලියන 2ක් ලබා දුන් බවත් එහිදී හෙළිදරව් වුණා. එතකොට මේ ගුවන්යානා මිලදී ගැනීමේ ගනුදෙනුවේ අවසන් ප්‍රතිඵලය මොකක්ද? අවසානයේදී ගුවන්යානා මිලදී ගැනීම අහෝසි කිරීම සඳහා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තීරණයක් ගත්තා. ඒ තීරණය ගැනීම හරහා මොකක්ද වුණේ? ඒ ගුවන්යානා සඳහා අපි ඩොලර් මිලියන 108ක වන්දියක් ගෙව්වා. අපට ගුවන්යානාත් නැහැ, ඩොලර් මිලියන 108කුත් අහිමි වුණා, ඩොලර් මිලියන 2ක් කපිල චන්ද්‍රසේනගේ ගිණුමටත් ගියා. තව ඩොලර් මිලියන 14ක් ලැබිය යුතුව තිබුණා. හැබැයි, ඒ ඩොලර් මිලියන 14 ලැබුණේ නැහැ. ඒ මොකක් නිසාද? ගුවන්යානා ගිවිසුම සම්පූර්ණ වශයෙන් අවසන් නොවුණු නිසා. එතකොට ඒ ඩොලර් මිලියන 2 ඕස්ට්‍රේලියාවේ තිබෙන කපිල චන්ද්‍රසේනගේ account එකට යනවා. කපිල

චන්ද්‍රසේනගේ account එකෙන් ඒ මුදල් ලංකාවේ නිමල් පෙරේරාගේ account එකට යනවා. එතකොට මේ ධනය තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට දුප්පත්භාවයට, මේ රටේ ආර්ථිකය කඩා වැටීමට හේතු වූ මේ ධනය සැරිසරන්නේත්, සැරිසරලා තිබෙන්නේත් ඒ විධියටයි.

තමුන්නාන්සේලා දන්නවා, පසුගියදා එක්සත් ජනපදයේ ඉමාඩ් සුබේරි කියන CIA නියෝජිත අත්අඩංගුවට ගත් බව. ඔහු අත්අඩංගුවට ගත්තේ ඇයි? ප්‍රධාන කරුණු කිහිපයකට. ඉමාඩ් සුබේරි නැමැත්තා බදු මුදල් වංචා කිරීම, විදේශීය බලපෑම් සිදු කිරීම, මැතිවරණ ප්‍රචාරක මුදල් අයථා ලෙස පරිහරණය කිරීම වැනි චෝදනාවලට ඇමෙරිකානු අධිකරණයෙන් අවුරුදු 12කට හිරේ දැම්මා. ඒ කියන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ CIA නිලධාරියෙක් මුදල් වංචා කිරීම හේතුකොටගෙන අවුරුදු 12කට හිරේ දැම්මා. හැබැයි, අවසානයේදී වාර්තා වුණේ මොකක්ද? 2013 -2014 අතර කාලයේදී එම ඉමාඩ් සුබේරි වෙත මහ බැංකුව ඩොලර් මිලියන 6.5ක් ලබාදී තිබෙනවා. ඒ මොකක් වෙනුවෙන්ද? ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වර්ධනය කිරීම වෙනුවෙන්. එම මුදල ඩොලර් මිලියන 6.5ක්. ඩොලර් මිලියන 6.5ක් කියන්නේ, ආසන්න වශයෙන් ඩොලරයක් රුපියල් 200 ගණනේ ගණන් හදලා බැලුවොත් රුපියල් මිලියන 1,300ක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ප්‍රතිරූපය නැංවීම සඳහා ඩොලර් මිලියන 6.5ක් ඉමාඩ් සුබේරිට ලබාදී තිබෙනවා. හැබැයි, ඇමෙරිකන් පරීක්ෂණවලදී හෙළිදරව් වෙනවා, ඉමාඩ් සුබේරි ඒ කටයුත්ත වෙනුවෙන් වියදම් කර තිබෙන්නේ ඩොලර් ලක්ෂ අටහමාරයි කියලා. ඩොලර් මිලියන 5.65ක්ම ඔහු පෞද්ගලික පරිහරණයට අරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ මුදල දුන්නේ ඔහුගේ පෞද්ගලික පරිහරණයට නොවෙයි. ඩොලර් මිලියන 6.5ක් දුන්නාට දෙන අයට commission එකක් නම් ලැබෙනවා. මටත් වඩා හොඳට මේ ක්‍රියාවලිය ගැන අගමැතිතුමා දන්නවා.

එදා සිටි මහ බැංකු අධිපතිවරයා කවුද? එදා සිටි මහ බැංකු අධිපතිවරයා අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා. තමුන්නාන්සේලා මෙවරත් එතුමා මහ බැංකුවේ අධිපතිවරයා කරන්න කලින් අඩුම වශයෙන් හෝ විමසීමක් කළ යුතුව තිබුණා. ලංකාවේ ප්‍රතිරූපය වර්ධනය කිරීම වෙනුවෙන් ඉමාඩ් සුබේරිට ඇමෙරිකානු ඩොලර් මිලියන 6.5ක් ලබා දී තිබෙනවා. ඔහු ඇමෙරිකා එක්සත් ජනපදයේදී සිරගතකොට තිබෙනවා. ඒ අනුව, ඔහු අවුරුදු 10ක, 12ක සිර දඬුවමකට ලක්වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වර්ධනය කිරීම සඳහා ඔහු වියදම් කර තිබෙන්නේ ඩොලර් ලක්ෂ අටහමාරයි. ඇමෙරිකන් ඩොලර් මිලියන 5.65ක්ම ඔහු වංචා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි වංචා නවත්වන්නේ නැතිව ඇයි මේ පුටුවල නැවත ඔවුන් වාඩි කරවන්නේ කියලා මම දැන ගන්න කැමැතියි. මෙවැනි ගනුදෙනු හරහා, වංචා හරහා, කොමිස් හරහා, අල්ලස් හරහා මේ රට ගොඩනඟන්න හැකි වෙයි කියලා තමුන්නාන්සේලා කල්පනා කරනවාද දන්නේ නැහැ. ඒ නිසා හොඳම කොමිස්කාරයා, හොඳම අල්ලස්කාරයා, හොඳම පගාකාරයා, හොඳම ඩීල්කාරයා මහ බැංකු අධිපතිවරයා ලෙස පත් කළාට පසු තමුන්නාන්සේලා හිතනවාද දන්නේ නැහැ, ඩීල්වලින්, අල්ලස්වලින්, කොමිස්වලින් රට ගොඩනඟන්න පුළුවන් වෙයි කියලා. එවැනි ඒජන්තයෝ තමයි මහ බැංකුවේ අධිපති ධුරයට පත් වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව තමයි පසුගිය දා තිරුකුමාර් නඩේසන්ගේ ප්‍රශ්නය ආවේ. මේක පාර්ලිමේන්තුවේ විවිධ අවස්ථාවල කියලා තිබුණත් මම නැවත නැවත මෙම කරුණ කියනවා.

අපේ රටේ ආර්ථිකයේ තිබෙන කළු පැත්ත ගැන මම කියන්නම්. අද ඉස්පිරිතාලයේ බෙහෙත් පෙත්තක් නැතිව වේදනාවෙන් මියැදෙන ගැමි ජනතාව මුහුණ දෙන අර්බුදය, තමන්ගේ අස්වැන්න සාධාරණ මිලකට විකුණා ගන්න බැරිව හූල්ලන ගොවි ජනතාවගේ දුක්ඛ වේදනාව, මේ රට පිළිබඳ අපේක්ෂා භංගත්වයට පත් වෙලා මේ රට අත් හැර යෑම සඳහා තානාපති කාර්යාල ඉදිරිපිට, පාස්පෝර්ට් කාර්යාලය ඉදිරිපිට, වීසා කාර්යාලය ඉදිරිපිට පොර බදමින් පෝලිම් ගැහිලා ඉන්න තරුණයන්ගේ හදවතේ වේදනාව, අපේ රටේ ධීවර ජනතාවගේ හදවතේ වේදනාව දිහා බලන්න. හැබැයි, මොකක්ද සිදු වී තිබෙන්නේ? මේ හූල්ලන ජනයාගේ ධනය කොතැනද එක්රැස් වෙලා තිබෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමන්ලාට මේ ගැනත් කියන්න කැමැතියි. විශේෂයෙන්ම ඔබතුමාත් දන්නවා ඇති, ගිං-නිල්වලා යෝජනා ක්‍රමය පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන්නේත් මාතර දිස්ත්‍රික්කය. ඒ, ගිං-නිල්වලා යෝජනා ක්‍රමය වෙනුවෙන් 2014.12.24වන දා රුපියල් මිලියන 1,000ක් ගෙවනවා. 2015.01.01වන දා රුපියල් මිලියන 2,009ක් ගෙවනවා. 2015.01.06වන දා රුපියල් මිලියන 1,003ක් ගෙවනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දින බලන්න. 2015.01.06වන දා ගෙවීම කළා, ජනවාරි 08වන දා ජනාධිපතිවරණය පැවැත්වුණා. 2015.01.01වන දා ගෙවීම කළා, ජනවාරි 08වන දා ජනාධිපතිවරණය පැවැත්වුණා. 2014.12.24වන දා ගෙවීම් කළා, 2015 ජනවාරි 08වන දා ජනාධිපතිවරණය පැවැත්වුණා. ඒ කියන්නේ සති තුනක් ඇතුළත වාගේ කාලයක තමයි මේ ගෙවීම් කළේ. ජනවාරි 08වන දා ජනාධිපතිවරණය නම්, 06වන දා මේ සමාගමට රුපියල් මිලියන 4,011ක් ගෙවනවා. මේ සමාගම මොකක්ද? මේ සමාගම තමයි, China CAMC Engineering Co., Ltd. මේ සමාගමට තමයි, මේ රුපියල් මිලියන 4,011 ගෙවා තිබෙන්නේ. හැබැයි, ඒ සමාගම විසින් කරලා තිබෙන්නේ මොකක්ද? ඒ සමාගම විසින් Red Ruth Investments Limited එකට මුදල් බැර කරලා තිබෙනවා. Red Ruth Investments Limited කියන්නේ මොකක්ද? ඒ සමාගම වෙන කාගේවත් නොවෙයි. ඒ සමාගමේ හිමිකරු තමයි, තිරුකුමාර් නඩේසන්. ඒ තිරුකුමාර් නඩේසන්ගේ හොංකොංවල තිබෙන ගිණුමකට ඇමෙරිකානු ඩොලර් මිලියන 5.9ක් -ආසන්න වශයෙන් ගත්තොත් ඇමෙරිකානු ඩොලර් මිලියන 6ක්- මේ සමාගම විසින් දෙනවා. ඒ අනුව, ගිං-නිල්වලා ව්‍යාපෘතිය පටන් ගන්නවා. ජනාධිපතිවරණයට දවස් දෙකක් තිබියදී ඒ ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් මිලියන 4,011ක් එම සමාගම වෙත ගෙවනවා. එම සමාගම හොංකොංවල තිබෙන තිරුකුමාර් නඩේසන්ගේ account එකකට ඇමෙරිකානු ඩොලර් මිලියන 6ක් -ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 60ක්- ගෙවනවා. ඊට පස්සේ තිරුකුමාර් නඩේසන් ලංකාවෙන් ඉඩමක් මිලදී ගන්නවා. ඒ, ගම්පහ -මල්වාන ප්‍රදේශයේ ඉඩමක්. ඒ, අංක 111/3, ගඟබඩ පාර, මහවත්ත, මල්වාන ලිපිනයේ අක්කර 17ක ඉඩම. ඒ ඉඩම අයිති කාටද? ඒ ඉඩම අයිති අය විසින් මේ ඉඩම තිරුකුමාර් නඩේසන්ට විකුණා දමනවා. හැබැයි, එහි සත්‍ය වටිනාකම රුපියල් මිලියන 64යි. විකුණන්නේ රුපියල් මිලියන 30කට. ඒක තමයි සාමාන්‍යයෙන් අපි දන්නා දෙය. ඒක අලුත් දෙයක් නොවෙයි. සත්‍ය තක්සේරුවට නොවෙයි, අඩු තක්සේරුවක් දාලා තමයි මුද්දර ගාස්තු ගෙවන්නේ. ඒකට කමක් නැහැ. හැබැයි, ඔහු ඒ රුපියල් මිලියන 30 ගෙවන්න එක්තරා බැංකුවකින් රුපියල් මිලියන 20ක් ණයට ගත්තා. තවත් රුපියල් මිලියන 10ක් තව පුද්ගලයෙකුගෙන් ණයට ගත්තා. එහෙම තමයි තිරුකුමාර් නඩේසන් මේ රුපියල් මිලියන 30 ගෙව්වේ කියලා කියනවා. ඊළඟට ඉතිරි රුපියල් මිලියන 34 ගිහිල්ලා දීලා තිබෙන්නේ මුදිත ජයකොඩිට. මුදිත ජයකොඩි තමන්ගේ සාක්ෂියේදී සටහන් කරනවා, ඒ රුපියල් මිලියන 34 ඉඩම ගත්ත කෙනාට ලබා දෙන්න කටයුතු කළා, ඒ කියන්නේ තිරුකුමාර් නඩේසන් තමයි සල්ලි දුන්නේ කියලා. මේ අක්කර 17ක පොල්වත්ත මිලදී ගැනීම වෙනුවෙන් තිරුකුමාර් නඩේසන් රුපියල් මිලියන 64ක් වියදම් කළා. තිරුකුමාර් නඩේසන්ට කුරුඳු වත්ත Nations Trust Bank එකේ අංක 11220000091 දරන ගිණුම තිබෙනවා.

[ගරු අනුර දිසානායක මහතා]

අන්න ඒ ගිණුමෙන් අර ණය මුදල හිලව් කරනවා. ඒ ගිණුමට ඔහුගේ හොංකොංවල තිබෙන Red Ruth Investments Limited කියන සමාගමෙන් සල්ලි එනවා. හොංකොංවල ඔහුගේ ගිණුමට අර ගිං-නිල්වලා යෝජනා ක්‍රමයේ ගිණුමෙන් සල්ලි එනවා. අපි මුල ඉඳලා පටන් ගත්තොත්-,

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, මම එක කාරණාවක් ගැන පමණක් අවධානය යොමු කරවනවා. ඔබතුමා කලින් කියපු කාරණාව සම්බන්ධයෙන් අධිකරණයේ දැනට නඩුවක් පවතිනවා නේද? [බාධා කිරීමක්] ඔය කාරණාව නොවෙයි, ඔබතුමා කලින් කියපු කාරණාව ගැන.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

මල්වානේ ඉඩම ගැන නඩුවක් තිබෙනවා. ඔව්, බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යවරයාත් වගඋත්තරකරු වන නඩුවක් තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ කාරණය සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් තිබෙනවා. ඒක හරි ද, වැරදි ද, මොකක්ද කියලා තවම තීරණය වෙලා නැහැ. ඔබතුමා මන්ත්‍රීවරයෙක් හැටියට ඒ ගැන සඳහන් කළාට කමක් නැහැ. නමුත්, රටේ ඕනෑම පුද්ගලයෙක් සම්බන්ධව -රාජ්‍ය නීතිඥතුමාත් නැඟිටලා ඉන්නවා.- අධිකරණයේ තිබෙන කාරණයක් ගැන මෙහෙම සඳහන් කිරීම සුදුසු නැහැ කියා මම සිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් එකඟ වෙයි, ඒ කියපු කොටස ඉවත් කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයේ විනිශ්චයට භාජන වෙමින් තිබෙන කාරණාවක් සම්බන්ධව කරුණු දැක්වීමෙන් වැළකී සිටින ලෙස සඳහන් කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නඩුව අයිතිය පිළිබඳවයි තිබෙන්නේ. මා මේ කියන්නේ ඊට වඩා වෙනස් කථාවක්. මේ ගැන කථා කරන එක හරි නැහැ තමයි. හැබැයි, ඊට වඩා හරි නැහැ නේද, මේ වාගේ වැඩ කරන එක? [බාධා කිරීමක්] නැහැ, මම අහන්නේ කැතයි නේද? ඒක ඊට වඩා හරි නැහැ නේ. ඒ නිසා මම මේ කියන්න හදන්නේ තිරුකුමාර් නඩේසන්ගේ accountsවල සල්ලි ඒකට ගලාගෙන ආ විධියත්, ඒ සල්ලි බෙදා හැරුණු ආකාරයත්, ඒවායෙන් දේපළ ගත් ආකාරය ගැනයි. මම කියන්නේ වෙන කිසිවක් ගැන නොවෙයි. ජනාධිපතිවරණයට දවස් දෙකක් තිබියදී ගිං-නිල්වලා යෝජනා ක්‍රමයට මිලියන 4,011ක් දුන් සමාගම, තිරුකුමාර් නඩේසන්ගේ හොංකොංවල accountsවලට සල්ලි එවනවා. ඒ accountsවලින් සල්ලි එනවා මෙහෙට. ඒ සල්ලිවලින් ගෙවල් ගත්-,

**ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා**
(மாண்புமிகு (சனாதிபதி சட்டத்தரணி) ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)

Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක සම්පූර්ණයෙන් වැරදියි. මේක දැනට අධිකරණයේ පවතින නඩුවක්. ගරු අනුර කුමාර දිසානායක මැතිතුමනි, ඒ ගැන කථා කරන්න එපා. මොකද, මම ඒකට පෙනී සිටින නීතිඥවරයෙක්. ඔබතුමා තිරුකුමාර් නඩේසන් ගැන ඔහොම කියනකොට, ඔහු වෙනුවෙන් පෙනී සිටින්න කිසිම කෙනෙක් මේ ගරු සභාවේ නැහැ. ඔහු ඒ නඩුවේ විත්තිකාරයෙක්. ඒක අසාධාරණයි. කරුණාකර ඕක නවත්වන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

කවුරුත් නැහැ කිව්වාට තිරුකුමාර් නඩේසන් වෙනුවෙන් ගොඩක් අය ඉන්නවා වාගේ මට නම් පෙනෙන්නේ. [බාධා කිරීමක්] කෙළින් කියන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, මට පෙනෙන විධියට බොහෝ අය තිරුකුමාර් නඩේසන් වෙනුවෙන් ඉන්නවා. [බාධා කිරීමක්] කවුද, ලේකම්තුමා ද කථා කරන්නේ? [බාධා කිරීමක්] මම ලේකම්තුමා ගැන ඊළඟ පරිච්ඡේදයේ වෙනම කියන්නම්. [බාධා කිරීමක්] තවම ඒ පරිච්ඡේදය ලොකු නැහැ. තවම ඒ පරිච්ඡේදයේ තොරතුරු එකතු වෙමින් තිබෙනවා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහෝ අය කියනවා මේවා කිව්වාට කරපු දෙයක් නැහැ කියලා. මම දන්නවා, හෙටත් කිසිවක් වෙන්නේ නැහැ කියා. අපේ රටේ පරීක්ෂණ යනු මොනවාද? දැන් ජනාධිපතිවරයා මේ ගැන පරීක්ෂණයක් කරන්න යනවා. අපේ රටේ පරීක්ෂණ යනු, සත්‍යය වසන් කිරීම සහ අපරාධකරුවන් නිදහස් කිරීමයි. ඕක තමයි අපේ පරීක්ෂණය, සත්‍යය වසන් කිරීම සහ අපරාධකරුවන් නිදොස් කොට නිදහස් කිරීම. ඒ වාගේම මම හිතන විධියට, විශේෂයෙන්ම China Harbour Engineering Company ගැන ඔබතුමාත් දන්නවා. China Harbour Engineering Company එකට තමයි හම්බන්තොට වරාය ඉදිකරන්න දුන්නේ. එදා හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ඩොලර් බිලියන 1.3ක් වැය වී තිබෙනවා. හැබැයි ගරු අගමැතිතුමනි, 2015.01.08 දින පැවති ජනාධිපතිවරණයේදී ඔබතුමාගේ මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් China Harbour Engineering Company එක ඩොලර් මිලියන 7.6ක් වැය කරලා තිබෙන බව ඔබතුමා දන්නවා. චෙක්පත් එක්ක මම ඒවා ඉදිරිපත් කරලා තිබෙනවා. මම දැනගන්න කැමැතියි, ලංකාවේ මැතිවරණයකට, එහි එක අපේක්ෂකයෙකුට China Harbour Engineering Company එක සල්ලි දෙන්නේ ඇයි කියලා. ඒ China Harbour Engineering Company එක හම්බන්තොට වරාය ගන්නවා. එතකොට හම්බන්තොට වරායේ ඉදිකිරීම සඳහා අපි කොන්ත්‍රාත් එක ලබා දෙනවා. හැබැයි, ඒ වෙලාවේ සිටි ජනාධිපතිවරයාගේ මැතිවරණ ව්‍යාපාරවලට China Harbour Engineering Company එක වියදම් කරනවා.

මම මේ කියන්න හදන්නේ වෙන කිසිවක් නොවෙයි, ආර්ථිකයේ කඩා වැටීමට ප්‍රධාන වශයෙන් මේ වංචා, දූෂණ සැලකිය යුතු ප්‍රමාණයකට ඉවහල් වී තිබෙන බව තමයි මට කියන්න ඕනෑකම තිබුණේ. ඊළඟට බලන්න, China Merchants Holdings (International) Company Limited එකේ CICT සමාගම. ඒ CICT සමාගම රුපියල් එක් කෝටි අනූපන් ලක්ෂයක මුදලක් පුෂ්පා රාජපක්ෂ පදනමට දමනවා. මා ළඟ ඒ චෙක්පත් තිබෙනවා, එම චෙක්පත් අංකත් තිබෙනවා, චෙක්පත්වල photocopies තිබෙනවා. හැබැයි, අපි ඒ ගොල්ලන්ට වරායේ දකුණු ජැටිය හදන්න දෙනවා. දැන් වරාය ඇතුළෙන් අක්කර 13ක් දෙනවා, සේවා මධ්‍යස්ථාන හදන්න. මේ ව්‍යාපෘති සහ මේ මුදල් අතර ගනුදෙනුවක් තිබෙන බව සිහි බුද්ධිය තිබෙන ඕනෑම කෙනෙක් දන්නවා. ඒ නිසා මට කියන්න තිබෙන්නේ වෙන කිසිවක් නොවෙයි. ආර්ථිකයේ මේ අර්බුදය පිළිබඳව මුදල් වාර්තාවෙන් අපට පෙන්වන්නේ එක් පැතිකඩක් විතරයි.

අපට මුදල් වාර්තාවෙන් පෙන්වනවා, ධන, ඍණ, එකතු කිරීම, අඩු කිරීම, වෙළෙඳ ශේෂය හා වෙළෙඳ හිඟය. හැබැයි මුදල් වාර්තාවෙන් නොපෙන්වන කළු ආර්ථික කථාවක් අපේ රටේ තිබෙනවා. එම කළු ආර්ථික කථාවට අපි විසඳුම් ගන්නේ නැත්නම් තමුන්නාන්සේලා මොන අය වැය ලේඛන ඉදිරිපත් කළත්, මොන ආර්ථික සැලසුම් හැදුවත් වැඩක් නැහැ. කළු ආර්ථික කථාවට වේගවත් ප්‍රවේශයක් ගත යුතුව තිබෙනවා. එම නිසා අද රටේ ඇති වී තිබෙන ණය අර්බුදය, ආර්ථිකය කඩා වැටීමේ අර්බුදය පිටුපස තිබෙන්නේ දැවැන්ත වංචා, දූෂණවලට උදවු දෙන - උපකාර කරන - දේශපාලනය කියා මා විශ්වාස කරනවා. ඒ දේශපාලනයට තිත තියන්න, ඒ දේශපාලනය වෙනස් කරන්න අපි තමුන්නාන්සේලා සූදානම් නැත්නම් මොකක්ද වෙන්නේ? ව්‍යාපෘතිය තීරණය වෙන්නේ ව්‍යාපෘතියේ ශක්‍යතාව මත නොවෙයි, අදාළ අමාත්‍යවරයාට හෝ ආණ්ඩුවේ අදාළ නියෝජිතවරයාට හෝ ලැබෙන මුදල් ප්‍රමාණය මතයි. ව්‍යාපෘතියක් සිදු විය යුතු වන්නේ, ඒක අපේ රටට, ජනතාවගේ ආර්ථික වර්ධනයට මොන තරම් හිතකර වෙනවාද නැද්ද කියන සාධකය මතයි. හැබැයි අද තීරණය වන්නේ එහෙම නොවෙයි. අද ව්‍යාපෘතියක් තීරණය වන්නේ ලැබෙන අල්ලස් හා කොමිස් ප්‍රමාණය මතයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, අද මා විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, පොහොර ප්‍රශ්නය පිළිබඳව. අපි දන්නවා, ශ්‍රම බලකායෙන් සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ යෙදෙන සියයට 27ක් විතර ඉන්න බව. රටේ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 7 1/2ක් විතර කෘෂිකර්මාන්තයේ දෙනවා. රටේ කර්මාන්තවලින් සියයට 25ක් කෘෂිකර්මාන්තය පදනම් කරගත් කර්මාන්ත. අපේ අපනයනයෙන් සියයට 25ක් කෘෂි කාර්මික අපනයන. ඉඩම්වලින් සියයට 11ක් කෘෂිකාර්මික බිම්. එම නිසා කෘෂි කර්මාන්තය කියන්නේ ඉතා වැදගත් ක්ෂේත්‍රයක්. මෙවැනි ඉතා වැදගත් ක්ෂේත්‍රයක් පිළිබඳ තීන්දු ගත යුත්තේ කොහොමද? ජොන්ස්ටන් අමාත්‍යතුමා පොල්ගහවෙල ගියා නේ. මිලියන 100 ව්‍යාපෘතිය සඳහා යෝජනා ගන්න දිස්ත්‍රික් සංවර්ධන කමිටුව එතැන රැස් වුණා නේද? අන්න ඒ යෝජනා ගන්න රැස් වුණු කමිටුවේදී වුණු සාකච්ඡාවේ හඬපටයක් මට ලැබිලා තිබෙනවා. එම සාකච්ඡාවේදී 'ගුණේ' කියන පුද්ගලයා ඔබතුමාගෙන් පොහොර ගැන කොච්චර අහනවාද? ඔබතුමා දකින්න ඇති නේ? 'ගුණේ' ඔබතුමාගෙන් අහනවා අහනවා, "පොහොරවලට මොකද කරන්නේ. ඇයි මේ තීන්දුව ගන්නේ නැත්තේ. සියයට 50ක්වත් නතර කරලා තිබුණා නේද?" කියා. එතැනදී ඔබතුමා පත් වුණු අසරණතාවය එම හඬපටය හරහා මට පෙනුණා. අසරණ වුණාද, නැද්ද දන්නේ නැහැ. ඔබතුමා වේගයෙන් උත්තර දුන්නා. [බාධා කිරීමක්]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම කියපු නිසායි මා මේ කථා කරන්නේ. හඬපටයක් ආවාට මට නම් ගැටලුවක් නැහැ. ඒක විවෘතව තිබුණු රැස්වීමක්. එතැනදී මම නම් කිසිදු අසරණතාවකට පත් වුණේ නැහැ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වෙලාව මම ගන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වෙලාවෙන් මේ කාලය අඩු කරන්න. මම ඔවුන්ට කෙළින්ම කිව්වා, "අපේ ජනාධිපතිතුමා තීන්දුවක් අරගෙන තිබෙනවා. අපේ ජනාධිපතිතුමාගේ රට හදන "සෞභාග්‍යයේ දැක්ම" නේ අපි ජයග්‍රහණය කළේ. අවුරුදු 10කින් විටින් විට මේ තීන්දුව ගන්නවා" කියලා. මිනිස්සු මැරෙනවා දකින්න අකැමැති ජනාධිපති කෙනෙකු හැටියට එතුමා වහාම තීන්දුවක් ගත්තා. අපි කෙළින් හිටගෙන ඒ වෙනුවෙන් අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා කියලා එතුමාට කිව්වා. ඒක වැරදුණොත්, ඒක ආපහු හරවන්න අපි පසුබට වෙන්නේත් නැහැ කියලාත් අපි කිව්වා. ඒක තමයි අපි අදත් කියන්නේ. ඒ නිසා අපි අසරණ වෙන්නේ නැහැ. කොහොම වුණත් මම කවදාවත් අසරණ වෙන්නේ නැහැ. මාව සිරභාරයට ගන්නකොටත් මතකයි නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
මම මේ කියන්න හැදුවේ ඔය දේවල් නොවෙයි, පොල්ගහවෙල පැවති රැස්වීම ගැනයි. එතැනදී 'ගුණේ' කියන ඔබතුමාගේ සංවිධායකයකු හෝ මන්ත්‍රීවරයකු හෝ ඉදිරිපත් කරපු අදහස් ගැනයි මා මේ කියන්නේ. ගොඩක් මන්ත්‍රීවරුන් ඔය වාගේ තත්ත්වයකට මුහුණ දෙන බව මම දැන් දන්නවා. අද ඒකයි මේ කියන්නේ. එතුමන්ලාත් මට කියනවා මේ කාරණය ගැන කියන්න කියලා. ඒකයි අවසන් විනාඩි තුනේදී මම මේ ගැන කියන්න පටන් ගත්තේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, "වැරදුණොත්, අපි මේක හදනවා" කියලා. හැබැයි ගරු ඇමතිතුමනි, මේ ක්ෂේත්‍රය එවැනි අත්හදා බැලීමක් සඳහා බිලි දිය යුතු නැහැ. අත්හදා බලනවා නම්, දිස්ත්‍රික්කයක යම් භූමි ප්‍රමාණයක් තෝරාගෙන එහෙම නැත්නම්, කලාප වශයෙන් යම් භූමි ප්‍රමාණයක් තෝරාගෙන, එම භූමි ප්‍රමාණය අත්හදා බලලා, රමේෂ් පතිරණ වැවිලි ඇමතිතුමා නියෝජනය කරන ගාල්ල, හිනිදුම පැත්තේ තේ වගාව ගැන ටිකක් අත්හදා බලලා, ගාල්ල, කරන්දෙනියේ කුරුඳු වගාව ගැන අත්හදා බලලා, එහෙම නැත්නම් යටිනුවර ගම්මිරිස් වගාව ගැන අත්හදා බලලා ඒ ආකාරයට විවිධ අත්හදා බැලීම් කරලා තමයි මෙම තීන්දුවට යා යුතුව තිබෙන්නේ. ඔබතුමා දැන් කිව්වා, වැරදි නම් නිවැරදි කරනවා කියලා. හැබැයි වැරදි නම් නිවැරදි කරන්න, අත්හදා බලන්න කොච්චර පංගුවක් ගෙවනවාද? අහගන්න, මම ඔබතුමාට කියන්නම්.

සාමාන්‍යයෙන් අපේ රටේ බඩඉරිඟු බීජ අවශ්‍ය තරම් නිෂ්පාදනය කරන්නේ නැහැ. වගා කිරීම වෙනුවෙන් පසුගිය අවුරුද්දේ බඩඉරිඟු බීජ මෙට්‍රික්ටොන් 1,500ක් ආනයනය කරලා තිබුණා. මේ අවුරුද්දේ ආනයනය කරලා තිබෙන්නේ බඩඉරිඟු බීජ මෙට්‍රික්ටොන් 600යි. ඒකෙන් විකිණිලා තිබෙන්නේ බඩඉරිඟු බීජ මෙට්‍රික්ටොන් 150යි. ඒ කියන්නේ පසුගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ බඩඉරිඟු බීජ විකිණිලා තිබෙන්නේ දහයෙන් එකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, දඹුල්ල පැත්තේ මිරිස්ගෝනියා ඔය දෙපැත්ත බැලුවොත්, මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉරිදා එම ප්‍රදේශයට ගියොත්, ලූනු වගා කරන ගොවීන් ඇවිල්ලා ඔබතුමාට මේ ප්‍රශ්න ගැන කියනවා. ඔබතුමා මේ දවස් ටිකේ යනවා අඩුයිද මන්දා. යනවා නේ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඊයෙත් ගියා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඔවුන් මේ ප්‍රශ්න ගැන ඔබතුමාට කියනවා. එම නිසා මම කියන්නේ මෙච්චරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම පොහොර පිළිබඳ ප්‍රශ්නයටත්, පළිබෝධනාශක සහ වල්නාශක පිළිබඳව ඇති වී තිබෙන ගැටලුවටත් වේගවත්

[ගරු අනුර දිසානායක මහතා]

විසඳුමක් ගත්තේ නැත්නම් හැම දෙයක්ම අවුල් වෙයි. මේ ඔක්තෝබර් මාසයේ 15වැනි දා නැඟෙනහිර පළාතේ බිම්වල අල වගා කරන්න පටන් ගන්නවා.

නොවැම්බර් මාසයේ මුල වෙන කොට රජරට මහවැලි ව්‍යාපාරයේ වතුර දෙන්න පටන් ගන්නවා. මම අවසාන වශයෙන් කියන්නේ, මේ ප්‍රශ්නය පිළිබඳ අවධානය යොමු නොකළොත් ඇති වන තත්ත්වය පිළිබඳවයි. කිරිපිටි මිල ඉහළ යනවා; අපි ඒවා ගේන්නේ ඩොලර්වලින්. ගෑස් මිල ඉහළ යනවා; ඒවාත් ගේන්නේ ඩොලර්වලින්. පිටි මිල ඉහළ යනවා; ඒවා ගේන්නේත් ඩොලර්වලින්. හැබැයි, අපේ හාල් කිලෝවක මිල, එළවලු මිල මේ ප්‍රමාණයෙන් හෝ ආරක්ෂා වෙලා තිබෙන්නේ අපේ රටේ ආහාර නිෂ්පාදනය කරන නිසායි. මේ ආහාර නිෂ්පාදනය කඩා වැටුණොත්, අද කිරි පිටි මිල ඉහළ දමනවා වාගේ, හෙට ගෑස් මිල ඉහළ දමනවා වාගේ, අනිද්දා සිමෙන්ති මිල ඉහළ දමනවා වාගේ සහතික වශයෙන් අපේ එළවලු සහ සහල්වල මිලත් අපට දරා ගන්න බැරි තරමේ ඉහළ යාමකට ලක් වෙනවා. ඒ නිසා මේ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු සරත් ෆොන්සේකා මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.12]

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
බොහොම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

ප්‍රථමයෙන්ම, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව මම ස්ථිර කරනවා. එතුමාගේ යෝජනාව අනුව අපි අද විවාද කරන්නේ මුදල් අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර තිබෙන වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ගැනයි. පසුගිය කාලය පුරාවටම රාජ්‍ය මූල්‍ය තත්ත්වය ගැන රජය දිගින් දිගටම ඉතා සුබවාදීව කථා කළා අපි දැක්කා. ඇමතිවරු දිගින් දිගටම කිව්වේ, "අපට මුදල් තිබෙනවා; අපට ප්‍රශ්නයක් නැහැ; අපි සෞභාග්‍යයේ දැක්මේ දුන්න පොරොන්දු සියල්ලම ඉෂ්ට කරනවා" කියලායි. නමුත් මේ වෙනකොට ඒ පොරොන්දු ඉෂ්ට කරන ක්‍රමවේදයක් අපට දකින්න නැහැ. ඇත්ත වශයෙන්ම ඒ පොරොන්දු ඉෂ්ට වෙනවා නම්, අපිත් ආසයි; කැමැතියි. මොකද, එහෙම වුණොත් අනිවාර්යයෙන්ම තමුන්නාන්සේලාට සහ අපට දිව්‍ය ලෝකයක් වාගේ රටක ජීවත් වෙන්න පුළුවන්. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ පොරොන්දු කථාවට පමණක් සීමා වීමයි.

අද අපි දකින්නේ බංකොලොත් රටක්. රටේ සල්ලි නැහැ. මේ රටේ ජනතාව හිඟන්නෝ කියලායි තමුන්නාන්සේලාගේ රජය හිතාගෙන ඉන්නේ. ජනතාවට සලකන්නේ හිඟන්නන්ට වාගේයි. ජනතාවට තමුන්නාන්සේලා දෙනවා, මාසයකට රුපියල් 2,000ක ආධාරයක්. රුපියල් 2,000කින් මේ රටේ හතරදෙනෙක් ඉන්න පවුලකට දවස් දෙකයි කන්න පුළුවන්. ඒ වාගේම ඒ රුපියල් 2,000 ගන්නත් ජනතාව පෝලිම්වල පොරකන, රණ්ඩු වෙන ආකාරය අපි දකිනවා. රජයේ නිලධාරින් ඒකවත් හරියට කරන්නේ නැහැ.

කැලණිය ආසනයේ දානපතියෙක් පසුගිය දවස්වල පෞද්ගලික පරිත්‍යාගයක් කළා. එතුමා එක්කෙනෙකුට රුපියල් 1,000 ගණනේ දුන්නා. ඒ රුපියල් 1,000 ගන්න විනාඩි 5ක් යනකොට 300ක විතර පෝලිමක් හැදිලා තිබුණා. අද රට ඒ තත්ත්වයට ඇද වැටිලා තිබෙනවා. ඒක ඉතා කනගාටුදායක තත්ත්වයක්. අපේ ජනතාව හිඟන්නන් ගානට දමා වැඩ කරන ගමන්ම තමුන්නාන්සේලා මුදල් නාස්ති කරන එකත් කරනවා. තමුන්නාන්සේලා ඇවිදින මං තීරු හදනවා. ඒවා හදන්න කියලා බිලියන දෙකක් -කෝටි 200ක්- වෙන් කරලා තිබෙනවා. ඒ අතර මම දැක්කා, තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරයෙක්ම පසුගිය කාලයේ කියා තිබෙනවා, තුන්වේල කන්න බැරි නම් වේල් දෙකක් කන්න කියලා. එතකොට මේ කාලයේ ඇහේ තෙල අඩු කර ගන්න ඇවිදින මං තීරු අවශ්‍ය නැහැ. මොකද, වේලක් අඩුවෙන් කෑවාම ඒක නිකම්ම රටේ හැමෝටම සිද්ධ වෙනවා. ඒ නිසා මේවාට සල්ලි නාස්ති කරන්නේ අනිවාර්යයෙන්ම කොමිස් ගැහීමේ අරමුණෙන්.

ඊළඟට, මම තව කාරණයක් කියන්න ඕනෑ. දේශීය වෙදකම් ප්‍රවර්ධන රාජ්‍ය ඇමතිතුමා මගේ හොඳ මිත්‍රයෙක්. එතුමාට හොඳක් වෙනවා නම් මම හරි කැමැතියි. අපි දකිනවා, තමුන්නාන්සේලා මේ කාලයේ දේශීය වෛද්‍ය මංජුසාවක් දෙනවා. ලංකාවේ සංස්කෘතිය අනුව, ඕනෑම ගෙදරක පොල්පලා ටිකක්, කොත්තමල්ලි ටිකක්, පත්පාඩගම් ටිකක් තිබෙනවා. ඒ නිසා ඒවා මංජුසා හද හදා දෙන්න ඕනෑ නැහැ. දේශීය වෛද්‍ය මංජුසාවට තමුන්නාන්සේලා රුපියල් කෝටි 600ක් -රුපියල් බිලියන 6ක්- වෙන් කරනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේක ඔබතුමන්ලා සද්භාවයෙන් කරන දෙයක් නම් අපි ආශීර්වාද කරනවා. නමුත් මේ කටයුතුවලදී සිද්ධ වෙන්නේ මොකක්ද කියා අපි දන්නවා. ඊයේ පාර්ලිමේන්තුවෙන් පිටවී යන්න හදනකොට මටත් එම මංජුසාවක් ලැබුණා. ඒක මට දුන් මහත්මියට මම කිව්වා, "මගේ ගණනේ මේක තියා ගන්න" කියලා. ඉතින් මේ දේවල් හරහා සිද්ධ වෙන්නේ මොකක්ද කියන එක අපි දන්නවා. මේ රටේ තිබෙන සංස්කෘතිය අනුව මේවායේ අවසාන ප්‍රතිඵලය මොකක්ද කියලා අපි දන්නවා. මේ රුපියල් කෝටි 600න් කෝටි 200ක් අනිවාර්යයෙන්ම කවුරු හරි දේශපාලනඥයෙකුගේ සාක්කුවට යනවා.

අද අපේ රට ගැන කථා කරනකොට අපට කනගාටුවක් ඇති වෙනවා. මම විශ්වාස කරනවා, 1994න් පසුව අපේ රට දිගටම පල්ලම් බැස්සා කියන කාරණය. ආණ්ඩු මාරු වුණා; නමුත් රට පල්ලම් බැස්සා. රටේ නිෂ්පාදන හෝ අපනයන වැඩි කරන්න කිසිම රජයක් ඇහට දැනෙන විධියට කිසිම දෙයක් කරලා නැහැ. ණය අරගෙන ප්‍රතිලාභ නැති ව්‍යාපෘති කරලා තිබෙනවා. ඒවායින් කොමිස් ගහලා තිබෙනවා. විශාල ව්‍යාපෘතිවලින් කොමිස් ගහලා රට ණය වෙලා තිබෙනවා. ඒ ණය ගෙවා ගන්න බැරුව අද අපි කෙඳිරි ගානවා; අඬනවා; පිස්සු හැදිලා වාගේ දඟලනවා.

මේ රටට විදේශ විනිමය ලැබුණේ රටවිරුවන්ගෙන්, සංචාරකයන්ගෙන්, සුද්දා හදා දුන් තේ, පොල්, රබර් ටිකෙන්, රණසිංහ ප්‍රේමදාස මහත්මයා හදා දුන් ඇඟලුම් කර්මාන්තශාලා - garment factories - ටිකෙන්. ඒවායෙන් විතරයි විදේශ විනිමය ලැබුණේ. නමුත් අද වනවිට පැවති රජයන්වල දක්ෂතාව අපට පෙනෙනවා. තේ, පොල්, රබර් කර්මාන්ත දැන් පිරිහිලා කඩා වැටීගෙන යනවා. තමුන්නාන්සේලා ඒවාට අවශ්‍ය පොහොර ටික දෙන්නේත් නැහැ.

ඊළඟට, සංචාරක කර්මාන්තය දිහා බලන්න. මේ රටට සංචාරකයන් කියලා එන්නේ හිඟන්නෝ. අපි දන්නවා, චීනයෙන් එන අයගෙන් සියයට 80ක් මාලදිවයිනට යන බව. පොහොසතුන් ටික එහාට යනවා. මෙහෙට එනවා හිඟන්නෝ ටික. එහෙම ඇවිල්ලා මොනවා හෝ දෙයක් කාලා, කුරුම්බා ගෙඩියක් බීලා, ප්ලේන්ටියක් ගහලා, අරහේ මෙහේ කැරකිලා, කුලී වැඩක් කරලා

සල්ලි ටිකක් හම්බ කරගෙන යනවා. ඒ නිසා එම කර්මාන්ත අපි නිසි අයුරින් දියුණු කරන්න ඕනෑ. අපි ලෝකයේ රටවලට ගිහිල්ලා තිබෙනවා. අපේ රටේ සංචාරක කර්මාන්තය දියුණු වෙනවා කියා අපට විශ්වාසයක් නැහැ. ඒක කවදාවත් සිද්ධ වෙලා නැහැ. කිසිම රජයක් ඒ සම්බන්ධව සුබවාදීව ක්‍රියා කර නැහැ. පොදුවේ අපි මේ කියන්නේ.

ඊළඟට, දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩි කරගන්න කිසිම රජයක් නිසි ආකාරයට පියවරක් අරගෙන නැහැ. අපනයන වැඩි කර ගැනීමට කිසිම රජයක් ඇහට දැනෙන විධියට අවශ්‍ය පියවර ගෙන නැහැ. මමත් රජයේ ආයතනයක ප්‍රධානියෙක් ලෙස කටයුතු කළා. මේ රටේ හැම දාම සිද්ධ වෙන්නේ මොකක්ද? අය වැයක් එනවා; "අපට දරන්න තිබෙන වියදම් මේවා" කියලා රජයේ ආයතන අමාත්‍යාංශවලට ඉදිරිපත් කරනවා; අලුතින් යෝජනාත් දෙනවා, capital එක ලබා ගැනීම සඳහා. එසේ දුන්නාම, අමාත්‍යාංශ ලේකම්වරු ඒවා එකතු කරලා මුදල් අමාත්‍යාංශයට එවනවා. ඊට පස්සේ අය වැය හදනවා. නමුත් ඒවා ආවාට පසුව ඒ තිබෙන දේවල් අපට දරා ගන්න බැරි බව අපි දකිනවා. ඊට පසුව අපිට තිබෙන එකම විකල්පය තමයි ණය ගන්න එක. රජයන් මාරු වුණාට පසුගිය වසර ගණනාවටම අපි ලෝකයට ණය වෙලා ණය අරගෙන තිබෙනවා. ඒවායින් අපි මොනවා හෝ ව්‍යාපෘති කරන්න හදනවා, ඊළඟ ඡන්දය දිනන්න ඕනෑ නිසා. ව්‍යාපෘති කරලා ඒකෙනුත් වැඩියෙන් කොමිස් ගහනවා. දේශපාලනඥයෝ ටික කෝටිපතියෝ වෙනවා. රට තවත් ලෝකයට ණය වෙනවා. රටට සිද්ධ වෙනවා, ලෝකය පුරා හිඟා කමින් ගමන් කරන්න. මේක තමයි මේ රටේ හැම දාම සිද්ධ වෙලා තිබෙන්නේ. මේකේ වෙනසක් වෙලා නැහැ. මේ ක්‍රමයේ වෙනසක් කරන්න නම් කවුරු හරි පක්ෂයක් රජ කරලා, බලය අරගෙන, මේක වෙනස් කරන්න කටයුතු කරන්න ඕනෑ. යහ පාලන රජයත් ඒක කරනවා කියලා බලයට ආවා. නමුත් අපට සිටියේ අන්ත දූර්වල නායකයෝ දෙදෙනෙක්. ඒ දෙදෙනා මේ රටේ හිටපු දූර්වලම නායකයෝ දෙදෙනා. ඒ ගොල්ලන් මේ රට කාලා ඉවර කළා. අපේ බලාපොරොත්තු සියල්ල සුන් වුණා. ඒ රජය බලයට ගෙනෙන්න අපි විශාල කැප කිරීමක් කළා. නමුත්, අපේ බලාපොරොත්තු සුන් වුණා.

අද අපේ රට බංකොලොත් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. බංකොලොත් රටවල ලක්ෂණ අපේ රටේ අපට පෙනෙනවා. උදාහරණයක් හැටියට මේ රටේ ප්‍රමිතිය කියන එක නැති වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් විතර දෙන්න.

පසුගිය දවස්වල ජනතාව කිව්වා, ගෑස් පාච්ච් කරලා විනාඩි තිහෙන් හදපු කෑමක් හදන්න දැන් විනාඩි හතළිහක් ගත වෙනවා කියලා. මේ රටේ ඉස්සර තිබුණේ යුරෝපයෙන් ගෙන් වූ භාණ්ඩ. දැන් තිබෙන්නේ ඉන්දියාවෙන්, චීනයෙන් එන ප්‍රමිතියක් නැති භාණ්ඩ. රට අද පිරිහෙමින් පවතිනවා.

ඒ වාගේම අපි දකිනවා මේ දවස්වල රටේ ආයතනවල දත්ත මැකී යන බව. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ එවැනි දෙයක් සිද්ධ වුණා. ඊට පසුව දත්ත ආපසු හදනවා. මේවා ලෝකයේ දූර්වල රටවල සිද්ධ වෙන දේවල්. ප්‍රමිතියක් නැහැ, විගණනයක් නැහැ. රටේ හැම අංශයක්ම කඩා වැටෙමින් පවතිනවා.

ඊළඟට තමුන්නාන්සේලා කියනවා, අපි කොරෝනාවෙන් "ආතල්" ගන්නවා කියලා. අපිට කොරෝනාවෙන් ආතල් ගන්න වැඩක් නැහැ. තමුන්නාන්සේලා කොරෝනා වසංගතය අවසන් කරනවා නම් අපි සම්පූර්ණ සහයෝගය දෙනවා. හැබැයි, අපි දැක්කා තමුන්නාන්සේලා පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් නම් පුදුම ආතල් එකක් ගත් බව. ඒ මළ මිනී උඩින් ඇවිත් තමුන්නාන්සේලා ජයග්‍රහණය කළා. දැන් තමුන්නාන්සේලාට ඒක කැරකිලා වදිනවා, "පාස්කු ඉරිදා ප්‍රහාරකයෝ අල්ලන්නේ නැහැ" කියලා. නමුත් අපිට ඒ වාගේ කාලකණ්ණි හැඟීමක් නැහැ.

මේ දවස්වලත් ජනතාව භය කරන්න, දේශපාලන බලය රැක ගන්න ත්‍රස්තවාදය ගැන නැවත කථා කරනවා අපි දකිනවා. මම හොඳ සිංහල බෞද්ධයෙක්. පසුගිය දවස්වල ඥානසාර හාමුදුරුවෝ මාධ්‍යයට ඇවිල්ලා ත්‍රස්තවාදය ගැන කථා කළ ආකාරය අපි දැක්කා. මම උන්වහන්සේට වැඳ නමස්කාර කර ඉල්ලා සිටිනවා, "හාමුදුරුවනේ, අපි වීවරයට වදිනවා. නමුත්, අර දර්ගා නගරයේ ප්‍රශ්න ඇති කළා වාගේ සිද්ධි මේ රටට ගෙනැල්ලා රටේ භීෂණය ඇති කරලා රට විනාශ කරන්න එපා" කියලා. මහජන ආරක්ෂක ඇමතිවරයා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ දොඩවනවා. තමුන්නාන්සේලාට ඒ අමාත්‍යාංශය භාර දෙන්න ඊට වඩා හොඳ කෙනෙක් සොයා ගන්න බැරිද? අඩු ගණනේ ඔය අමාත්‍යාංශය දයාසිරි ජයසේකර මැතිතුමාට දෙන්න කෝ. නැත්නම් ඔබතුමන්ලාගේ පක්ෂයේ වෙන කවුරු හරි එය භාර ගන්න.

එක එක කථා කිය කියා එතුමා යන්නේත් ඥානසාර හාමුදුරුවෝ යන ලයින් එකේමයි. මේක හරියට වඳුරාට දැළි පිහිය දුන්නා වාගේ වැඩක්. එතුමා ගහනවා, හතර වටේටම; අතැන කැපෙනවා, මෙතැන කැපෙනවා, ඔක්කෝම විනාශ වෙනවා.

කොරෝනා වසංගතය ගැන මම වචන කිහිපයක් කියන්න ඕනෑ. කාලය සීමිත නිසා මම ඉක්මනට කථා කරනවා. පසු ගිය දවස්වල එංගලන්තයේ කිංග්ස් කොලේජ් විශ්වවිද්‍යාලය, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය පර්යේෂණ කරලා ඔප්පු කර කියා තිබෙනවා ෆයිසර් දෙවැනි එන්නතෙන් පස්සේ එහි තිබෙන ශක්තිය සියයට 88 ඉඳලා මාස පහක්, හයක් යන කොට සියයට 78 දක්වා පහළ බහිනවා කියලා. ඇස්ට්‍රාසෙනෙකා දෙවැනි එන්නතෙන් පස්සේ ඒකේ තිබෙන ශක්තිය මාස හතරක්, පහක් යන කොට සියයට 77 ඉඳලා සියයට 67ට බහිනවා ලු. අවුරුදු 50ට වැඩි අය සම්බන්ධයෙන් එම ශක්තිය සියයට 50කට විතර බහිනවා ලු. එහෙම නම්, මේකෙන් අනිවාර්ය පණිවුඩයක් හම්බ වෙනවා. ඒකෙන් අපට කියන්නේ තුන්වන එන්නතක අවශ්‍යතාව. අපි දැන් පම්පෝරි ගහමින් ඉඳලා හරියන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. අනිවාර්යයෙන්ම තුන්වැනි එන්නත වේගයෙන් ගහන්න වෙනවා. ගිය මාසයේ ඉඳලා ඇමෙරිකාව වාගේ රටවල ඒ කටයුත්ත පටන් ගත්තා. Dr. Simon Clarke, Associate Professor in Cellular Microbiology කියා තිබෙනවා, "vaccinationවලින් විතරක් කොරෝනා පාලනය කරගන්න බැහැ. අනිවාර්යයෙන්ම ජනතාවගේ විනයක් තිබෙන්න ඕනෑ. රටේ ජනතාවත් එක්ක යම්කිසි පියවරක් අරගෙන මෙය පාලනය කරගන්න වැඩ කරන්න ඕනෑ" කියලා. පසු ගිය දවස්වල අපි කළා වාගේ කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මම තව විනාඩියක් ගන්නවා. මට විනාඩියක් දෙන්න, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අත් හිටුවන්න තිබෙන නිසා කාලය කළමනාකරණය කරගන්න වෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

රටේ ශෝකාලාපය ගැන මට විනාඩියක් කථා කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටේ ආහාර මිල වැඩි වෙලා. මිනිස්සු පෝලිම්වල ඉන්නවා. සීනි වංචාව එක් පැත්තකින් සිදු වුණා. එය රුපියල් බිලියන 16යි. සුදු ලූනු කිලෝව රුපියල් 130ට ගෙනැල්ලා පිටට රුපියල් 135ට විකුණලා රුපියල් 435ට ආපසු ගන්නවා. මේ වාගේ වංචා සිදු කරනවා. කුරුඳු වංචාවකුත් වුණා කියා ආරංචියක් තිබෙනවා. මේවායේ බර දරන්න වෙන්නේ මේ රටේ අහිංසක ජනතාවටයි. ඒක හින්දා තමුන්නාන්සේලා මේවාට අවශ්‍ය පියවර ගන්න. අද ගෑස් පෝලිම් තිබෙනවා; කිරි පිටි පෝලිම් තිබෙනවා. ඒවා දකින කොට අපි මහත් සේ කම්පාවට පත් වෙනවා. ඊට අමතරව, කැලෑ කපනවා. කෝමාරිකා වවන්න කියලා අක්කර ලක්ෂයක කැලෑ කපනවා. කොම්පෝස්ට් පොහොර හදන්න කියලාත් කැලෑ කපනවා. මේවා නවත්වන්න තමුන්නාන්සේලා පියවර ගන්න. හාල් මිල පාලනය කර ගන්න බැහැ. වී ගොවියාට වීවලට හොඳ මිලක් හම්බ වෙන්නේ නැහැ. ඒ වාගේ දේවල් වෙනවා කියන්නේ රජයේ ඉන්න මැති ඇමතිවරුන් අකාර්යක්ෂමයි කියන එක. පොහොර හිඟය නිසා මේ රටේ ගොවියාගේ වගාවට කණ කොකා හඬලා. ඒ ගැන තමුන්නාන්සේලා සුදුසු පියවරක් ගන්න.

රසායනික පොහොර නැතිව කවදාවත් ගොවිතැන කරන්න බැහැ. ඒක තමයි අපේ මතය; අපේ පක්ෂයේ මතය. තමුන්නාන්සේලා ගුරුවරුන්ට සාධාරණය ඉෂ්ට කරන්න. තමුන්නාන්සේලා ගුරුවරුන්ට මෙවර අය වැයෙන් වැඩියෙන් රුපියල් බිලියන එකක් වෙන් කරනවා. [බාධා කිරීමක්] ඒ බිලියනය වෙන් කළාට ඒකෙන් තමුන්නාන්සේලාට රුපියල් 5,000 වත් දෙන්න බැහැ. [බාධා කිරීමක්] නිකම් බොරුවට කෑ ගහන්න එපා. අහගන්න. [බාධා කිරීමක්] ගුරුවරුන්ට රුපියල් 5,000 දෙන්නත් අවුරුද්දකට රුපියල් බිලියන 15ක් ඕනෑ.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
අධ්‍යාපනයට දෙන මුදල් ප්‍රමාණය වැඩි කර තිබෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
බිලියන එකක් වැඩි කරලා තමුන්නාන්සේ කොරයි! තමුන්නාන්සේ ඉස්කෝලේ ගියාද? ඉස්කෝලේ වත් ගිහින් නැති කෙනෙක් මෙතැන කෑ ගහනවා. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
ලොහාන් රත්වත්තේලා වාගේ අය දමාගෙන හිර ගෙවල්වලට යනවා, පිස්තෝලය අරගෙන. එක්කෙනෙක් ගියා, හංසමාලි එක්ක. තව කෙනෙක් යනවා, පුෂ්පිකා එක්ක. මේවා නවත්වන්න. මේවා තමුන්නාන්සේලාගේ රජයට හොඳ නැහැ; අපේ රටේ ගෞරවයට, අභිමානයට හොඳ නැහැ. [බාධා කිරීමක්] පුළුවන් නම් ඔබතුමාත් කවුරු හරි අරගෙන කොහේ හරි යන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. ඔබතුමාට අතිරේක විනාඩි 4ක කාලයක් ලබා දී තිබෙනවා, විපක්ෂය පැත්තෙන්.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
පැන්ඩෝරා පත්‍රිකාවල සඳහන් කරුණු ගැන අපි කනගාටු වෙනවා. පැන්ඩෝරා පත්‍රිකාවලින් ඔප්පු වෙනවා, කවුද හොරකම් කරන්නේ, කවුද ඒවාට හයිය දෙන්නේ, කවුද ඒවා පිටුපස ඉන්නේ කියලා. නැවතත් මම ඉල්ලා සිටිනවා, ඖෂධ මිල වැඩි කරන්න එපා කියලා. තොග ආරක්ෂා කරන්න කියලා ඖෂධ මිල වැඩි කරනවා. ඒවා හරියට, "යන්නේ කොහේද මල්ලේ පොල්" වාගේ වැඩ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.25]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිටපු යුද්ධ හමුදාපතිතුමා නොවෙයි, සරත් ෆොන්සේකා මහත්මයා කථාවක් කළා. එතුමාගේ කථාවේදී කළේ, යම් යම් සිද්ධි අරගෙන ඒ සිද්ධි පිළිබඳ ප්‍රහාරයක් එල්ල කිරීම පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශ්වාස කරන පරිදි, අධ්‍යතන ලෝකය මුහුණ පා තිබෙන අර්බුදය තුළ අපේ මාතෘ භූමිය මුහුණ පා තිබෙන අර්බුදය පිළිබඳව ජාතික වශයෙන් සංවාදයක් ඇති විය යුතු අවස්ථාවකයි මේ උත්තරීතර සභාව නියෝජනය කරන අප ඉන්නේ. මක්නිසාද යත්, අපට වඩා ධන බලය, අපට වඩා යුද ශක්තිය, අපට වඩා සියලු පර්යේෂණ ශක්තීන් තිබෙන, ලෝකයේ මහා බලවත් රට ලෙස සැලකෙන ඇමෙරිකා එක්සත් ජනපදයේ මනුෂ්‍ය ජීවිත හත්ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් කොවිඩ් වසංගතය නිසා අහිමි වෙලා තිබෙනවා. මුළු ලෝකයම පාහේ සංචරණ සීමා පනවලා තිබෙන්නේ. අද රොකට්ටුවක වේගයෙන් භාණ්ඩවල මිල එකට එකක් වැඩි වෙලා; කන්ටේනර් ගාස්තු වැඩි වෙලා; නැව් ගාස්තු වැඩි වෙලා.

ගිය සතියේ ලෝක වෙළෙඳ පොළේ ගෑස් මිල පමණක් සියයට 130කින් වැඩි වුණු තත්ත්වයක් තුළ තමයි මේ රට මේ විධියට කටයුතු කරන්නේ. මේ වෙලාවේදී අපේ රටේ ජනතාවගේ ජීවිත හා දේපළ බේරා ගැනීම සඳහා මේ රජයත් ලෝකයේ

අනෙක් රටවල් වාගේම කටයුතු කරනවා. අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව විශාල ප්‍රයත්නයක් දරලා අද වන විට ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් එන්නත්කරණයට ලක් කර තිබෙනවා. ලෝකයේ විශිෂ්ටතම ලෙස එම කාර්යය කළ රටවල් 10න් එකක් බවට ලංකාව මේ වන විට පරිවර්තනය වී තිබීම ගැන ලාංකියන් වශයෙන් අප සතුටු විය යුතුයි කියා මම ප්‍රථමයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

ඊළඟට මම කැමැතියි, අපේ ගරු සරත් ෆොන්සේකා මැතිතුමා සඳහන් කළ කරුණු ගැන යමක් කියන්න. 1977 නොවැම්බර් මස 15වැනි දින ගරු රොනී ද මැල් මුදල් ඇමතිතුමා සිදු කළ අය වැය කථාවේ මෙසේ සඳහන් කර තිබෙනවා:

> "ගරු කථානායකතුමනි, පුරා අවුරුදු විස්සකටත් වැඩි දීර්ඝ කාලයක් තිස්සේ නා නා ප්‍රකාරයේ ආර්ථික බැඳීම් හා සීමා කිරීම් නිසා ආර්ථික වෘද්ධියත්, ආර්ථික සංවර්ධනයත්, අවහිර තත්ත්වයටත්, අබලං තත්ත්වයටත් වැටුණයින් පසුව, නිදහස් නිවහල් ආර්ථිකයක් ගොඩනැංවීම එතරම් සුළුපටු වැඩක් නම් නොවෙයි. ..... අපේ ආර්ථිකය නිදහස් කර ගැනීම සඳහා මිළ මුදල් හා දුක් කම්කටොලු වශයෙනුත් සෑහෙන කාලයක් අපේ මහජනතාවට දැරීමට සිදුවන බරද මම අඩුවෙන් තක්සේරු නොකරමි...."

එතුමා තවදුරටත් මෙසේ සඳහන් කරනවා:

> "...ආර්ථික පරිහාණියේ ඝනාංධකාරයක මඩ වගුරක් තුළ සදාකාලිකව ගත කිරීමට අපට පුළුවන් කමක් නැහැ. ජාත්‍යන්තර හිඟන්නන් වගේ සදාකාලිකව ම ලෝකය වටා හිඟමනේ යන්න අපට බැහැ. දේශීය හා විදේශීය වශයෙන් මහ මෙර උසට ණයතුරුස් ඉහළ යද්දී, එකම තැන පල් වෙවී ඇති දුප්පත්කමේ විසම කවය තුළින් අප වහා ඉවතට පැනිය යුතුයි...."

සරත් ෆොන්සේකා මහත්මයා කියපු දෙයම මීට අවුරුදු 44කට ඉස්සෙල්ලා රොනී ද මැල් මැතිතුමාත් කියා තිබෙනවා. "හිඟමනේ යනවා", "හිඟන්නෝ" කියලා කියනවා.

එදා රොනී ද මැල් මැතිතුමා ණය බර ගැන කියමින් මෙහෙම කිව්වා:

> "...මේ රටේ ප්‍රධාන ආර්ථික අංශවල නිෂ්පාදනය වේගයෙන් පහළ වැටුණි. සාමාන්‍ය ජනතාවගේ ජීවන වියදම රොකට්ටුවක වේගයෙන් ඉහළ ගියා. ...."

මීට අවුරුදු 44කට ඉස්සෙල්ලාත් කියා තිබෙන්නේ, රොකට්ටුවක වේගයෙන් ජීවන වියදම ඉහළ ගියා කියලා.

රොනී ද මැල් මුදල් ඇමතිවරයා 1977.11.15වැනි දින සිදු කළ අය වැය කථාවෙන් මම මේ කියවන්නේ. එතුමා එහි තවදුරටත් මෙසේ කියනවා:

> "විදේශ ණයවලින් කොටසක් වෙනුවෙන් ගෙවීමට සිදුව ඇති අධික පොළී ප්‍රමාණය දෙස බලන විට, අපේ තේ වල අනාගත ඵලදාව පවා විදේශ රටවලට උකස් කර තිබේ. .....ණය ආපසු ගෙවීමත්, ණය වෙනුවෙන් ගෙවිය යුතු පොළී ප්‍රමාණයත් ඉතා අධික එකක් පමණක් නොව, මේ නිසා අපේ භාණ්ඩාගාරයේ සම්පත් නිරතුරුව ම පිටට ඇදී යනු ඇත."

මීට අවුරුදු 44කට ඉස්සෙල්ලාත් කියනවා, විදේශ ණය අරගෙන කරන්න විධියක් නැහැ, අපේ රටේ සම්පත් අපේ රටින් පිටට යනවා කියලා. 1978 වර්ෂයේ අය වැය කථාවේ කියා තිබෙන්නේත් අද සරත් ෆොන්සේකා මහත්මයා කියපු ටිකම බව අපේ ගරු ගයන්ත කරුණාතිලක හිටපු ඇමතිතුමාට මම කියන්න කැමැතියි. ඊට වඩා කිසි දෙයක් කියලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු සභානායකතුමනි, ගරු ඇමතිතුමාගේ කථාව අවසන් වූ පසු දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු තාවකාලිකව අත් හිටුවීමට සභාවේ අවසරය ගත යුතුයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන්නේ එතුමාගේ කථාවට තව විනාඩි කිහිපයයි තිබෙන්නේ. තව විනාඩි 5ක් හෝ 6ක් තමයි ඇත්තේ. එතුමාගේ කථාව අවසන් වුණාම දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අත් හිටුවමු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු කථා කරන කොට කාලය දීර්ඝ කරනවා. අපි විවාදයට දිවා ආහාර විවේකයට අදාළ කාලය ඉල්ලුවාම දෙන්නේ නැහැ. එහෙම හරි නැහැ නේ. ඒක හැම දාම කරනවා. ඒක හවස හතරහමාරටත් කරනවා. ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙකු කථා කරනවා නම්, කථානායකතුමා වෙලාව ගන්නවා, කාලය දීර්ඝ කරන්න. අපි දිවා ආහාර විවේක කාලයෙන් පැය භාගයක් ඉල්ලුවාම දෙන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගේ කථාව අවසන් වීමට තව විනාඩි කිහිපයයි තිබෙන්නේ. සභාවේ කටයුතු දිවා ආහාර විවේකය සඳහා මේ මොහොතේ නතර කළොත්, එතුමාගේ කථාව ඛණ්ඩනය වෙනවා. තව විනාඩි දෙක තුනකින් එතුමා කථාව අවසන් කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒකට ඉඩ දෙන්න බැහැ කියලා නේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කියන්නේ. අපි දිවා විවේකය සඳහා සභාවේ කටයුතු දැන් අත්හිටුවමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය මේ විවාදය ඉල්ලුවා. අපි ඒ සඳහා අද මුළු දවසම විපක්ෂයට දුන්නා.

අද ගන්නේ Adjournment Motion එකක්. Adjournment Motion එකට අදාළව, යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා සහ එය ස්ථිර කළ මන්ත්‍රීතුමා විතරයි තවම කථා කරලා තිබෙන්නේ. අපේ රජය වෙනුවෙන් මේ විවාදයේදී කථා කරන පළමුවැනි කථිකයාගේ කථාව නවත්වන්න ඕනෑ නම්, එය නවත්වා සභාවේ කටයුතු අත්හිටුවා දිවා ආහාර විවේකයෙන් පසුව නැවත පවත්වමු. බොරුවට පැමිණිලි කරන්න එපා වෙලාව දුන්නේ නැහැ කියලා. [බාධා කිරීමක්] ඕනෑ තරම් වෙලාව දීලා තිබෙනවා. [බාධා කිරීමක්] නිකම් නැඟිටලා බොරුවට පැමිණිලි කරනවා. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දිවා ආහාර විවේකය සඳහා පස්වරු 1.30 වන තෙක් සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப.1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කරුණාකර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
"ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු අබ්දුල් හලීම් මහතා**
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. AJITH RAJAPAKSE took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 10ක් ලබා දෙන්න.

අපි දන්නවා, රාජ්‍ය මූල්‍යයට අයත් වන ප්‍රධාන කොටස් 4ක් තිබෙන බව. ඒ තමයි, රජයේ ආදායම, රජයේ වියදම, රාජ්‍ය අය වැය හිඟය සහ එම හිඟය පියවන ආකාරය. මේ ගරු සභාව විසින් සලකා බැලිය යුතුව තිබූ කරුණ මේකයි. පසු ගිය කාල පරිච්ඡේදය පුරාවටම දශකයෙන් දශකයට මේ තිබෙන තත්ත්වය එන්න එන්නම උග්‍ර වෙලා තිබෙනවා. මක් නිසාද යත්, 1977 විවෘත ආර්ථිකය හඳුන්වා දෙන අවස්ථාවේදී මේ රටේ ආදායම රුපියල් බිලියන 6.5යි; වියදම 8.8යි; දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අය වැය පරතරය සෘණ 4.5යි. ඊට අවුරුදු 10කට පසු, 1987දී ආදායම බිලියන 42.1යි; වියදම 63.8යි; අය වැය පරතරය 8.7යි. ඊට අවුරුදු 10කට පසුව 1997දී, රජයේ ආදායම බිලියන 185යි; වියදම 235යි; අය වැය පරතරය සියයට 7යි. ඊටත් අවුරුදු 10කට පස්සේ 2007දී, රජයේ ආදායම බිලියන 565යි; වියදම 841යි; අය වැය පරතරය සියයට සෘණ 6.9යි. 2017 වෙනකොට රජයේ ආදායම බිලියන 1,031යි; වියදම 2,573යි; අය වැය පරතරය සියයට සෘණ 5.5යි. 2020දී ආදායම බිලියන 1,357යි; වියදම 3,041යි; අය වැය පරතරය සියයට 11.1යි.

මේ ගරු සභාව මේ ප්‍රශ්නය තේරුම් ගත යුතු වෙනවා. මේ ආණ්ඩුව ලබා ගන්නා වූ මුළු ආදායම, ආණ්ඩුවක් එදිනෙදා පවත්වාගෙන යෑමේ කටයුතුවලදී දරනු ලබන වියදමේ ප්‍රතිඵලය, වියදම දරන කාලයට පමණක් සීමා වෙන නැවත නැවතත් දැරිය යුතු ස්වරූපයේ වන පුනරාවර්තන වියදම් දරන්නවත් ප්‍රමාණවත් නැහැ. මම පැහැදිලිව කිව්වා, අපට අත්වෙලා තිබෙන ඉරණම පිළිබඳව මේ ගරු සභාවේ ප්‍රබුද්ධ සංවාදයක් ඇති වෙන්න ඕනෑ, සිද්ධි කථා කරන්නේ නැතිව. 2020 වර්ෂයේ ලැබුණු බදු ආදායම රුපියල් බිලියන 1,216යි. එයින් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් සඳහා ගියා 1,050ක්. බදු වශයෙන් සමස්ත ලාංකීය ජනතාව මත පටවා ලබා ගන්නා මුළු ආදායමින් සියයට 86ක් වැටුප් හා වේතන වශයෙන් ගෙවන ලෝකයේ වෙනත් රටක් ගැන මම දන්නේ නැහැ. මෙහෙම කළාට පස්සේ, ඉතිරි වන වියදම දරන්නේ කොහොමද කාගේ ආණ්ඩුවක් තිබුණත්? ආණ්ඩුව කාගේ හරි වෙන්න පුළුවන්. නමුත් ලැබෙන ආදායම රුපියල් බිලියන 1,216යි නම්, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් සඳහා එයින් බිලියන 1,050ක් යනවා නම් ඉතිරි වෙන බිලියන 163න් කොහොමද ගත්ත ණයවල වාරික හා පොලී ගෙවන්නේ? මොකද, ඒ වර්ෂයේ පොලී ලෙස ගෙවන්න තිබුණා බිලියන 908ක්. ඒ වාගේම, අනෙක් සංවර්ධන වියදම් දරන්නේ කොහොමද?

ඒ නිසා හැම රජයක්ම අය වැය පරතරය පියවා ගන්න ණය අරගෙන තිබෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එදා ආණ්ඩුව භාර ගන්න විට ණය තිබුණේ ට්‍රිලියන 2යි. එතුමා ඒ අවුරුදු 10 තුළ විවිධ අභියෝගවලට මුහුණ දෙමින් මුඩු බිමක් වශයෙන් තිබුණු රට වැඩ බිමක් බවට පත් කරලා, ඌන සංවර්ධිත රට මධ්‍යම ආදායම් ලබන රටක් බවට පත් කළා. මේ සියල්ල කරලා ඉවර වනකොට, රටේ ණය ප්‍රමාණය ට්‍රිලියන 7යි. මහින්ද රාජපක්ෂ යුගයේ ඒ අවුරුදු 10ටම ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙන්නේ ට්‍රිලියන 5කින් පමණයි. එම ආණ්ඩුව වඩා කාර්යක්ෂම ලෙස මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය සිද්ධ කරපු නිසා තමයි ණය ප්‍රමාණය ට්‍රිලියන 5ක් වුණේ.

පසු ගිය යහ පාලන රජය යටතේ රටේ කිසිම දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කළේ නැහැ. රටේ යුද්ධයක් තිබුණේ නැහැ. ඛනිජ තෙල් අර්බුදයක් තිබුණේ නැහැ. ආහාර අර්බුදයක් තිබුණේ නැහැ. මූල්‍ය අර්බුදයක් තිබුණේ නැහැ. හැබැයි, කොපමණ ණය අරගෙන තිබෙනවාද? යහ පාලන රජය අපට මේ රට භාර දෙනකොට තිබූ ණය ප්‍රමාණය ට්‍රිලියන 13යි. ට්‍රිලියන 7 සිට ට්‍රිලියන 13 දක්වා ණය ප්‍රමාණය වැඩි වෙලා, ඒ අවුරුදු 5දී ණය අරගෙන තිබෙනවා, ට්‍රිලියන 6ක්. අපි අවුරුදු 10ටම අරගෙන තිබෙන්නේ ට්‍රිලියන 5යි. එතුමන්ලා අවුරුදු 5ට අරගෙන තිබෙනවා ට්‍රිලියන 6ක්. අන්තිම මාස 18දී විතරක් ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරලා ලංකා ඉතිහාසයේ වාර්තාවක් තියලා තිබෙනවා. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - International Sovereign Bonds - නිකුත් කරලා අපේ රට 2029 වනතෙක් ණය කර තිබෙනවා. 2019දී අවුරුදු 10කට ගත්ත බැඳුම්කරය කල් පිරෙන්නේ 2029දී. 2029දී මේ රටේ සිටින මුදල් ඇමතිවරයාට ඒ සංවර්ධන බැඳුම්කරවල මුදල් එකවර ගෙවන්න වනවා. ඒ නිසා අද අපේ රටේ දැවැන්ත විදේශ විනිමය අර්බුදයක් ඇති වෙලායි තිබෙන්නේ.

පසු ගිය රජය විසින් ඉතා වාසිදායක තත්ත්වයක් තිබියදී ඩොලර් පිළිස්සීමක් කළා. කොහොමද ඩොලර් පිච්චුවේ? ලෝක ඉතිහාසයේ කිසිම රජයකට නොලැබුණු වාසි ප්‍රමාණයක් 2015 වර්ෂයේ එතුමන්ලාට ලැබුණා. ලෝකයේ ඛනිජ තෙල් මිල අසාමාන්‍ය ලෙස අඩු වුණා. යකඩ මිල අඩු වුණා. රත්‍රන් මිල අඩු වුණා. සියලු ආහාර පානවල මිල අඩු වුණා. තෙල්වලින් විතරක් 2015 වර්ෂයේදී ඉතුරු වුණා, ඇමෙරිකානු ඩොලර් බිලියන 1.9ක්. ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා හොඳටම දන්නවා, රුපියල බේරා ගැනීම සඳහා 2019 වර්ෂයේදී පමණක් වෙළෙඳ පොළේ ඩොලර් බිලියන 1.9ක් අළෙවි කළ බව. 2016 වර්ෂයේදී අළෙවි කළා ඩොලර් බිලියන 3.4ක්. මේ අවුරුදු දෙකේ විතරක් බිලියන 5කට වැඩි ඩොලර් ප්‍රමාණයක් පිච්චුවා නේ. ඒක වෙළෙඳ පොළට දැම්මාම, වාෂ්ප වෙලා යනවා. රුපියලේ අගය ආරක්ෂා කර ගැනීම සඳහා කියලා තමයි එදා වෙළෙඳ පොළට ඩොලර් දැම්මේ. 2015දී ඩොලර් බිලියන 1.9ක් දැම්මා. 2016දී දැම්මා ඩොලර් බිලියන 3.4ක්. ඒ අවුරුදු දෙකේ බිලියන 5කට වැඩි ඩොලර් ප්‍රමාණයක් වෙළෙඳ පොළේ අළෙවි කළා. එහෙම මුදල්

ප්‍රමාණයක් විනාශ කළාට පස්සේ, තිබුණු සංචිත අඩු වුණා. කොවිඩ් 19 වසංගතය නිසා ලෝකයේ ඇති වෙච්ච අර්බුදය තුළ සංචාරක සීමා පැනවීම නිසා එකම සංචාරකයෙක්වත් එන්නේ නැති තත්ත්වයක් ඇති වුණා. 2018දී අපේ රටට සංචාරකයෝ ලක්ෂ 23ක් පැමිණියා. ඒ පැමිණි සංචාරකයන්ගෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 4.3ක් රටට ලැබුණා. අද ඒ ඩොලර් බිලියන 4.3 ලැබෙන්නේ නැහැ. ඩොලර් බිලියන 4.3ක් කියන්නේ ඉතා විශාල මුදලක්. හම්බන්තොට වරාය, උපනූපන් පරම්පරාවට හිමි වෙන්න තිබුණු ලොකුම වත්කමක්. හම්බන්තොට වරාය විකුණලා එතුමන්ලා ගත්තේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4යි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇමෙරිකානු ඩොලර් බිලියන 1යි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ආ, එහෙම නම් ඩොලර් බිලියන දශම 4ක් අඩු කරමු.

ඊළඟට Port City Project එක තමයි අපට ලැබුණු ලොකුම ආයෝජනය. එය ඩොලර් බිලියන 1.4යි. දෙකෙන්ම ලැබුණු ඩොලර් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.8යි. සංචාරක ව්‍යාපාරයෙන් ලැබුණු ආදායමත් නැති වුණාම, නිදහස් කර ගන්න බැරිව වරායේ කන්ටේනර් හිර වෙනවා තමයි. ඩොලර් අච්චු ගහන්න බැහැ. අද විදේශ විනිමය පිළිබඳව අර්බුදයක් තිබෙනවා. ඒකට අපට උත්තර තිබෙන්නේ එකයි. ඒ තමයි, අපනයන ආදායම වැඩි කර ගැනීම. පසු ගිය කාල පරිච්ඡේදය තුළ ආනයන වියදම් වැඩිවීමට සාපේක්ෂව අපනයන ආදායම වැඩි වුණේ නැහැ. අපනයන ආදායම වැඩි කර ගන්න ඕනෑ. ඒකට භාණ්ඩ විවිධාංගීකරණයක් කරන්න ඕනෑ; අලුත් දේවල් නිපදවන්න ඕනෑ; වෙළෙඳ පොළ විවිධාංගීකරණයක් කරන්න ඕනෑ. කෙසේ හෝ අපනයන වර්ධනය කර ගන්න ඕනෑ. අපි කැමැති වුණත් නැතත්, සෘජු විදේශ ආයෝජන ලබා ගන්න ඕනෑ. අපට විකුණන්න මහලොකු දෙයක් නැහැ. තිබුණු ලොකුම සම්පත තමයි වික්කේ. ඒ, හම්බන්තොට වරාය. ඒ නිසා රාජ්‍ය මූල්‍ය අර්බුදය හා විදේශ විනිමය අර්බුදය පිළිබඳව, අපේ රටේ ආර්ථිකය කඩා වැටීම පිළිබඳව දේශපාලන මඩ ගැසීම්වලින් තොරව අපි සාකච්ඡා කළ යුතුයි. එක එක සිද්ධි අරගෙන සාකච්ඡා කරන්නේ නැතුව, 1977 ඉඳන් මේ වනතෙක් ඇති වෙලා තිබෙන මේ දරුණු අර්බුදයෙන් මේ රට කොහොමද ගොඩ ගන්නේ කියන එක ගැන හිතලා, ඒ සඳහා අලුත් මාවතක් සොයා ගැනීමට එකතු වෙලා වැඩ කරන්න කියන ආරාධනය ඇතිව, මගේ වචන කීපය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.39]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව සම්බන්ධයෙන් තමයි මෙම කල් තැබීමේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. අද ගරු මුදල් ඇමතිතුමාත් සභාවේ ඉන්නවා. හැබැයි, මෙම වාර්තාව තුළ තිබෙන තීන්දු තීරණවලට වගකිව යුත්තේ මේ මුදල් ඇමතිතුමා නොවෙයි. මොකද, එතුමා එන්න කලින් තමයි මේ තීරණ ගන්න ඇත්තේ. හැබැයි, අද එතුමාට මම යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

ශ්‍රී ලංකාව නොවෙයි, ඕනෑම රටකට ඒ රට ගෙනයන්න අනිවාර්යයෙන්ම රටේ ආදායම ඉතා වැදගත්. රටක් ගෙනයන්න නම්, රටේ ආදායම වැඩි වී රටේ වියදම අඩු වෙන්න ඕනෑ. සරල බසින් කියනවා නම්, එතකොට තමයි ඒ රටට වැඩිපුර සල්ලි ඉතිරි වෙන්නේ. ලෝකයේ millionairesලා, billionairesලා විශාල ප්‍රමාණයක් ඉන්නවා. ස්ටීව් ජොබ්ස්, බිල් ගේට්ස්, අලි බාබා සමාගමේ ජැක් මා වාගේ අය තමන්ගේ හැකියාවෙන්, තමන්ගේ උනන්දුවෙන් ඉදිරියට ආ අය. හැබැයි, ලංකාව තුළත් billionairesලා ඕනෑ තරම් ඉන්නවා. හොරකම්වලින් billionairesලා වූ අය අද ඕනෑ තරම් ඉන්නවා. ඒ හොරකම්වලට අනිවාර්යයෙන්ම උදව් කරලා තිබෙන්නේ දේශපාලනඥයන් කියන එක අපි කියනවා. ඒ වාගේම, තමන්ගේ හැකියාවෙන් දියුණු වූ අයත් ඉන්නවා. හැබැයි, අද වැඩි කණ්ඩායමක් බිහිවෙලා තිබෙන්නේ දේශපාලනඥයන්ගේ උදව්වලින්. ඒක නිසා ඇත්තටම රජයක් විධියට අපි බලන්න ඕනෑ මොකක්ද? පසු ගිය වසර ගත්තාම සමහර සමාගම් තිබෙනවා, පසු ගිය වසර තුළ බිලියන ගණනින් ලාභ ලබාගෙන තිබෙන. මම ඒ සමාගම්වල නම් කියන්නේ නැහැ. ඔවුන් බිලියන ගණනින් ලාභ ලබනකොට ශ්‍රී ලංකා රජයේ ආදායම අඩු වෙන්නේ ඇයි කියන එක අපි සොයා බලන්න ඕනෑ. ශ්‍රී ලංකා රජයේ ආදායම අඩුයි.

ඒ වාගේම තමයි, මේ වෙනකොට කිරි පිටි, සිමෙන්ති, ගෑස් වැනි භාණ්ඩවල පාලන මිල අයින් කරනවා කියලා තිබුණා. මේ විධියට සාමාන්‍ය ජනතාවට වඩා ව්‍යාපාරිකයාට බදු සහන දුන්නාම, ඒවායෙන් ජනතාවට වඩා ව්‍යාපාරිකයන් ලාභ ලැබුවා කියලා තමයි කියන්නේ. සීනි වංචාව වෙන්න පුළුවන්, සුදු ලූනු වංචාව වෙන්න පුළුවන්, වංචා ගැන කියනවා නම් තව දේවල් කියන්න පුළුවන්. නමුත්, විවේචනාත්මකව නැතිව මට proposals කිහිපයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

ඇත්තටම ගත්තොත්, මේ වාර්තාවේ 18වැනි පිටුවේ තිබෙනවා, පසු ගිය අවුරුද්ද තුළ -2020යි, 2021යි අතර- අපේ revenue from Income Tax රුපියල් මිලියන 81,000 සිට රුපියල් මිලියන 55,000 දක්වා අඩුවෙලා තිබෙන බව. එතකොට, ආදායම අතින් සියයට 32ක පමණ ප්‍රමාණයක් රජයට අහිමිවෙලා තිබෙනවා. ඒ වාගේම තමයි, Corporate and Non-Corporate Taxesවල සියයට 18.7ක අඩු වීමක් තිබෙනවා. PAYE Tax ගත්තාම, ඒකත් රුපියල් මිලියන 5,556 සිට 4,396 දක්වා අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම, Tax on Interest Income එකත් අඩුවෙලා තිබෙනවා. ඇත්තටම මේ රටේ Income Tax threshold එක ගත්තොත්, අවුරුද්දකට Rs. 3 millionවලට වඩා වැඩියෙන් හම්බ කරන අය තමයි සියයට 6ක පොලියක් ගෙවන්න ඕනෑ. අවුරුද්දකට Rs. 3 millionවලට වඩා ආදායම වැඩියි කියන්නේ, මාසික ආදායම රුපියල් ලක්ෂ දෙකහමාරක්. ලංකාවේ කීයෙන් කීදෙනාටද මාසයකට රුපියල් ලක්ෂ දෙකහමාරකට වැඩි ආදායමක් තිබෙන්නේ? බදු වැඩි කිරීමෙන් රුපියල් 35,000ක, රුපියල් 50,000ක, රුපියල් 100,000ක පඩි අරගෙන එදිනෙදා ජීවිතය ගැටගහගන්න අයට නොවෙයි, රුපියල් ලක්ෂ දෙකහමාරකට වඩා වැඩියෙන් පඩි ගන්න අයට තමයි සියයට 6ක බදු ගහන්නේ. ඊළඟ threshold එක ගත්තාම Rs. 6 millionවලට වැඩියෙන් ගන්න අයට තමයි, සියයට 12ක බද්දක් ගහන්නේ. Rs. 9 millionවලට වැඩියෙන් උපයන අයට තමයි, සියයට 18ක බද්දක් ගහන්නේ. ඕස්ට්‍රේලියාවට, සිංගප්පූරුවට වඩා බදු සහන, දියුණු වන රටක් වන ලංකාවේ ලබා දීලා තිබෙනවා. මේ විධියට බදු සහන දෙන්න දෙන්න පහළ මට්ටමේ සිටින දෛනිකව අඩු ආදායම් ලබන අයට තමයි ඒකෙන් පහර වදින්නේ. Corporate sector එකට, ලොකු මුදලාලිලාට, එහෙම නැත්නම් ලොකු බිස්නස්කාරයන්ට මේකෙන් පහර වදින්නේ නැහැ. අපි දිගින් දිගටම කියන්නේ, මේ ආණ්ඩුව මේ රටේ සිටින සාමාන්‍ය

[ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ජනතාවට බදු සහන දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළ යුතු බවයි. මුදල් ඇමතිතුමා එය ඉදිරි Budget එකෙන්වත් ඉදිරිපත් කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ඊට අමතරව අපි VAT සහනය ගත්තොත්, ඇත්තටම එය සියයට 15 සිට සියයට 8 දක්වා අඩු කර තිබෙනවා. ඒ වාගේම, threshold එක රුපියල් මිලියන 12 සිට රුපියල් මිලියන 300 දක්වා වැඩිවෙලා තිබෙනවා. එතකොට, දැන් රුපියල් මිලියන 300ට වඩා වැඩිපුර හොයන අය තමයි රජයට VAT ගෙවන්න ඕනෑ. මේ තරම් ලොකු පරතරයක් තිබුණාම ලංකා රජයට බදු ගෙවිය යුතු බොහෝ අය බදු ගෙවීම්වලට අයිති වන්නේ නැහැ. ඒ කියන්නේ, ලංකා රජයට ආදායමක් ලැබෙන්නේ නැහැ. ඒක නිසා VAT එක වුණත් අපි නැවත consider කරන්න වෙනවා. මෙම වාර්තාවේ පිටු අංක 19 තුළ තිබෙනවා, ලංකාවේ බදු ගෙවන්නේ නැතිව හැංගෙන මිනිස්සුම ගිහිල්ලා Inland Revenue Department එකේ register වෙයි කියලා බලාපොරොත්තු වෙනවා කියලා. ලංකාවේ තමන්ට ගෙයක් තිබෙනවා නම්, ඒක wifeගේ නමට දීලා rental income එකෙන් Withholding Tax විධියට සියයට 10ක බදු මුදල ගෙවන්නේ නැති මිනිස්සු ගිහිල්ලා තමන්ගේ tax එක ගෙවන්න register වෙයි කියලා අපි කොහොමද බලාපොරොත්තු වෙන්නේ? ඒක නිසා ඒ tax එක source එකේදීම අය කරන්න පුළුවන් විධියේ ක්‍රමවේදයක් සකස් කරන්න අවශ්‍යයි කියන කාරණයත් මම කියන්න ඕනෑ.

ඊට අමතරව මට තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා. ප්‍රතිපත්තියක් හැටියට ගත්තාම යුද්ධයෙන් පස්සේ ලංකාවට ආයෝජන ගෙන ඒම සඳහා අපි incentives ලබා දීලා තිබෙනවා. සාමාන්‍යයෙන් ආයෝජකයෙක් රටකට එනවා නම්, එහෙම එන්න තිබෙන හේතුවලට අදාළ percentage එක තවත් report එකක සඳහන්ව තිබෙනවා.

එම report එක අනුව economic stability, 3.8 per cent; political stability, 3.8 per cent; ඒ වාගේම, quality of life, 3.3 per cent. මේ report එකේ අටවැනි හෝ නවවැනි තැන තමයි incentive package කියන එක තිබෙන්නේ. ඒ කියන්නේ, රටකට ආයෝජකයෙක් එනකොට ඒ incentives හොයාගෙන තමයි එන්නේ. ඒක අටවැනි තැන තමයි තිබෙන්නේ. ඊට වඩා උඩින් තිබෙන්නේ, quality of life, economic stability, political stability. ඒ, අපේ රටේ නැති දේවල් ටික. මේ වාගේ ප්‍රශ්න තිබෙන රටක කොහේද political stability එකක් තිබෙන්නේ? ඕනෑම වෙලාවක බෝම්බයක් පුපුරයි කියලා කියන රටක economic stability එකක් තිබෙන්නේ කොහොමද? Construction industry එකට apartments හදන්න බදු සහන දෙනවා. Apartment buildings කියන්නේ developing industry එකක්. Apartments හදන්න බදු සහන දෙන්න ඕනෑ කියලා මා පිළිගන්නේ නැහැ. රැකියා ලක්ෂයක්, රැකියා දසදහසක් ඇති කරන company එකකට බදු සහන දෙනවා නම්, ඒක වෙනම දෙයක්. නමුත් අපි apartment projectsවලට බදු සහන දෙනවා. ඒ බදු සහන අරගෙන, ඒ ගොල්ලන්ගේ project එක ඉවර වුණාට පසු ඒ ගොල්ලන්ගේ සල්ලිත් අරගෙන ලංකාවෙන් යනවා. ඒ වාගේ ප්‍රතිපත්ති නිසා තමයි අද අපේ රටට මෙහෙම වෙලා තිබෙන්නේ. ඒ නිසා අපේ ආදායම වැඩි කරන්න පුළුවන් යම් යම් proposals අපේ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඇත්තටම ආණ්ඩු පක්ෂයේ සමහර ඇමතිවරුන්ටත්, මන්ත්‍රීවරුන්ටත් මා කියනවා, මුදල් ඇමතිතුමා අපහසුතාවට පත් කරන්න එපා කියලා. "ඇමතිතුමාට මොළ හතක් තිබෙනවා, ඇමතිතුමා අරුම පුදුම package එකක් දෙනවා." කියලා සමහරු කියනවා. මේ මන්ත්‍රීවරු රටේ තිබෙන තත්ත්වය, ලෝකයේ තිබෙන තත්ත්වය දැනගෙන, තේරුම් අරගෙන කථා කරන්න ඕනෑ. එහෙම කළේ නැත්නම් ජනතාව ලොකු බලාපොරොත්තු තියාගෙන ඉන්නවා. එතකොට මේ වතාවේ මිනිස්සු සතුටු කරන්න ඇමතිතුමාටත් අමාරු වෙනවා.

අතුරුදහන් වුණු පුද්ගලයන් -victims of enforced disappearances - පිළිබඳවත් මා කාරණයක් කියන්න කැමැතියි. 2019 අප්‍රේල් මාසයේ ඉදිරිපත් කළ Budget එකෙන් ඒ අය වෙනුවෙන් මාසිකව රුපියල් 6,000 බැගින් ගෙවීමක් කරන්න මුදල් pass වෙලා තිබෙනවා. අද වනතුරු ඒ ගෙවීම කරලා තිබෙන්නේ පවුල් 153කට පමණයි. 2019.12.31වන දායින් පසු ඒ ගෙවීම කරලා නැහැ. අපේ ස්ථාවරය නම් අතුරුදහන් වූ පුද්ගලයන්ට මොකක්ද වුණේ කියලා හොයා ගන්න ඕනෑ කියන එකයි. We want to know what happened to those victims of enforced disappearances. At the same time, we want their families to get a relief. මරණ සහතික දෙන එක අපි පිළිගන්නේ නැහැ. ඒ ගොල්ලන්ට මොකක්ද වුණේ කියලා හොයා බලනකල් ඒ රුපියල් 6,000 දීමනාව දෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ. ඉදිරියේදී Budget එක එන නිසායි මා මේ කරුණු කියන්නේ. ගරු මුදල් ඇමතිතුමනි, උතුරු-නැඟෙනහිර තිබෙන සම්පත්වලින් ඒ පළාත් සංවර්ධනය කිරීම තුළින් මේ රටේ ආර්ථිකය හදන්න පුළුවන් ක්‍රමවේද දෙමළ ජාතික සන්ධානය සතුව තිබෙනවා. පසු ගිය කාලයේ -2015 වසරට කලිනුත්- උතුරු-නැඟෙනහිර පළාත්වල ඔබතුමන්ලා ළං කරගෙන හිටපු, හොරකම් කළ පුද්ගලයන් නිසා තමයි ඒ පළාත්වල තිබෙන මැතිවරණ බලප්‍රදේශවලින් ඔබතුමන්ලාගේ පක්ෂය අන්ත පරාජයට පත් වුණේ. අදටත් වෙන්න යන්නේ ඒ විධියටයි. මම දැන් ගරු මුදල් ඇමතිතුමාට මේ පිටු තුන එවන්නම්. ඒ පිටු තුනේ තිබෙනවා, ගරු මුදල් ඇමතිතුමාගේ පක්ෂය නියෝජනය කරන, වැලි පර්මිට් තිබෙන පුද්ගලයන්ගේ නම්. ඒත් මඩකලපුවේ වැලි හොරකම් කරනවා කියලා අපි කියද්දී "නැහැ" කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මේ නම් තුන කියලා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

AL/A/BT/309/LR/04, Mr. P. Santhirakumar. බැසිල් රාජපක්ෂ ඇමතිතුමා දන්නවා, ඔහු තමයි මඩකලපුව දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සංවිධායක. ඊළඟට, IML/C/HO/N/14459, S. Mayuran, වියාලේන්ද්‍රන් රාජ්‍ය ඇමතිතුමාගේ මල්ලී. ගරු ඇමතිතුමනි, එතුමන්ලා භය නැතුව මෙහෙම කරනවා කියන්නේ, මේ රටට මොකක්ද වෙන්න යන්නේ? අන්තිම නමත් කියලා මා කථාව අවසන් කරනවා. AL/A/BT/1068, Mr. Sivanesathurai Chandrakanthan. ඒ කියන්නේ පිල්ලෙයාන්, දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිතුමා. ගරු මුදල් ඇමතිතුමනි, මා මේ පිටු තුන ඔබතුමාට එවන්නම්. මා මේ වාර්තා ගත්තේ හොරෙන් නොවෙයි. Parliament Research Unit එකෙන් ගත්තේ. ඒ ගොල්ලන් ඒක කියාවි.

ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමන්ලා එක්ක එකතු වෙලා වැඩ කරන්න, අපේ උතුරු-නැඟෙනහිර පළාත් සංවර්ධනය කරන්න අපි කැමැතියි. අපේ ළඟ ප්‍රගතිශීලී අදහස් ගොඩක් තිබෙනවා. අපට දිස්ත්‍රික්ක මට්ටමින් proposal එකක්වත් embassy එකකට දෙන්න

එපා කියලා තිබෙන්නේ. සමහර තානාපතිවරුන්ට කථා කරලා උදව් ඉල්ලන්න පුළුවන්. නමුත්, අපට අවස්ථාව දෙන්නේ නැහැ. ගරු මුදල් ඇමතිතුමනි, ඒ නිසා අපට ඒ අවස්ථාව උදා කරලා දෙන්න. ලංකාවේ සියලු ජනතාවට බදු සහන ලබා දෙන්න, ව්‍යාපාරිකයන්ට බදු සහන ලබා දෙන්නේ නැතිව. ඒ ඉල්ලීම කරමින්, මා කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.48]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරමින්, මේ මොහොතේ රටේ ආර්ථිකය පවතින තත්ත්වය පිළිබඳව මහ ජනතාවගේ අවබෝධය සඳහා මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කර තිබෙන අර්ධ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් කළ කථාවට අපි ඇහුම්කන් දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කථාවට ඇහුම්කන් දෙනකොට මට හැඟී ගියේ මොකක්ද දන්නවාද?

අඩු ගණනේ රහසින්වත් පව් කරලා නැති කෙනෙකු විධියට තමයි එතුමා අද පාර්ලිමේන්තුවේදී කථා කළේ. එතුමා කරපු සම්පූර්ණ කථාවට මම ඇහුම්කන් දුන්නා. ඉතිහාසයේ පැවති හැම ආණ්ඩුවක්ම කරපු වැරැදි නිසා අපේ ණය බර වැඩිවෙලා, ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා කියලා එතුමා චෝදනා කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට පුළුවන් නම් පෙන්වන්න, එතුමාගේ කථාවේ කොතැනක හෝ 2015 සහ 2020 රජය ගැන මොනවා හෝ කියලා තිබෙනවාද කියලා? ආර්ථිකය කඩා වැටීමට බලපෑ හේතුවක් තිබෙනවා නම්, ඒ හේතුවට 2015 සහ 2020 ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණ සහයෝගය ඇතිව හදා ගත් යහපාලන ආණ්ඩුවෙන් වරදක් සිදුවෙලා නැද්ද? මහ බැංකු බැඳුම්කර කොල්ලය වුණා. බැඳුම්කර කොල්ලය සිදු වූ කාලයේ රටේ වසංගතයක් තිබුණේ නැහැ. ආර්ථික අර්බුදයක් තිබුණේත් නැහැ. ඒ කිසිම දෙයක් නැතිව ආණ්ඩුව අරගෙන හරියටම මාසයයි දවස් 12කදී මහ බැංකු බැඳුම්කර කොල්ලය සිදු වුණා. හැබැයි, අඩු ගණනේ ඒ සිද්ධිය ගැනවත් අපේ මිත්‍ර අනුර දිසානායක මන්ත්‍රීතුමාගෙන් යම් දෙයක් කියැවෙයි කියලා මම බලාපොරොත්තු වුණා. නමුත් එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ. මම දන්නේ නැහැ, මොකක්ද ඒකට හේතුව කියලා.

දැන් කිරිපිටි මිල පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවාය කියන කාරණය අපි පිළිගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සිමෙන්ති මිල පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන බව අපි පිළිගන්නවා. ඒ වාගේම අත්‍යවශ්‍ය භාණ්ඩ මිල පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. අපි විපක්ෂයේ හිටියත්, ආණ්ඩු පක්ෂයේ හිටියත් පොළොවේ පය ගහලා ජීවත් වෙන්න ඕනෑ; ඇත්ත ඇති සැටියෙන් දකින්න ඕනෑ. විශේෂයෙන්ම දිවයිනක ජීවත් වන මිනිස්සු හැටියට සංචාරක ක්ෂේත්‍රය තුළින් ලැබෙන්න තිබුණු ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක, 5ක වාගේ ප්‍රමාණයක මුදලක් අපට අහිමිවෙලා තිබෙනවාය කියන කාරණය විශ්වාස කරන්න වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, ඒ මුදල අහිමි වන ගමන්ම අපි වෙනදාට තෙල්, අත්‍යවශ්‍ය භාණ්ඩවලට ගෙවපු ඩොලර්වලට වැඩි ඩොලර් ප්‍රමාණයක් මේ වනකොට නොහිතපු දෙයකට අපට වියදම් කරන්න සිදුවෙලා තිබෙනවා. ඒ මොකක් වෙනුවෙන්ද? කොවිඩ් වසංගතයට ලෝකයේ තිබෙන සම්මතය මොකක්ද? කොවිඩ් වසංගතය වෙනුවෙන් ලෝකය පිළිගෙන තිබෙන එකම විසඳුම එන්නත් ලබා දීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් වසංගතය එක්ක තමයි අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට රට භාර ගන්න සිදු වුණේ. එතුමා ඒ වෙනුවෙන් සෘජුවම මැදිහත්වෙලා, අද වනකොට එන්නත් ලබා දීම ක්‍රියාත්මක කරලා තිබෙනවා. එන්නත් ලබා දීම සම්බන්ධයෙන් ලෝකයේ රටවල් අතුරින් අපේ රට පස්වැනි, හයවැනි ස්ථානයේ ඉන්නවා. තුන්වැනි මාත්‍රාව ලබා දීම කෙරෙහිත් අවධානය යොමු කරලා, ඒ කටයුතු ක්‍රියාත්මක කරන්නත් අපි බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිරිපිටි ගැනත් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අනිකුත් ආනයන භාණ්ඩ සම්බන්ධයෙනුත් මම කථා කරනවා. ලෝකයේ නැව් ගාස්තු විශාල වශයෙන් -සියයට 150කින්, සියයට 200කින්- ඉහළ ගිහිල්ලා තිබෙනවා. එදා සාමාන්‍යයෙන් කන්ටේනර් එකකට ගෙවපු ඩොලර් 1,800ක නැව් ගාස්තුව වෙනුවට අද මිනිසුන්ට ඩොලර් 6,500ක් ගෙවන්න සිදුවෙලා තිබෙනවා. ඒක, අතිවිශාල මුදලක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සියල්ල එකතු වෙන්නේ කොතැනටද? මේ සියල්ලම මේ මුදලට එකතු වනවා. ඩොලරයේ වටිනාකම ඉහළ ගිහිල්ලා තිබෙනවා. මේ අභියෝගවලට අපට මුහුණ දෙන්න සිදු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අභියෝගයත් එක්ක තමයි අපි කටයුතු කරගෙන යන්නේ කියන කාරණය මම පැහැදිලිව කියන්න ඕනෑ. මේ අර්බුදය අපි කළමනාකරණය කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි අභියෝගය භාරගෙන තිබෙනවා. අපේ නව මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා බොහොම වගකීමකින් ඒ කටයුත්ත ඉටු කරන්න ලැහැස්තියි. අපේ රටට ඩොලර් ගෙන්වා ගැනීමට තිබෙන එකම විසඳුම වන අපනයන ක්ෂේත්‍රය මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසය වනකොට අපි බලාපොරොත්තු වුණාට වඩා ලොකු වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒක තමයි, කාර්යක්ෂමතාව -වැඩ පිළිවෙළ- කියන්නේ. හැම ක්ෂේත්‍රයකම ඉන්න අය දිහා බලලා -ඒක කෘෂි ක්ෂේත්‍රය වෙන්න පුළුවන්. භාණ්ඩ වෙන්න පුළුවන්- අපි ඒ තත්ත්වය ඉහළට ගෙනැල්ලා තිබෙනවා. මොකද, ආදායම් ලැබෙන එක දොරටුවක් වැහෙනවා නම් අපි අනික් දොරටු විවෘත කර ගන්න ඕනෑ. අපි ඒ අභියෝගය භාර ගන්න ඕනෑ. අපි ආයෝජන ගෙනෙනවා. අපි ආයෝජන ගෙනෙනකොට විපක්ෂය ඒ ආයෝජන දිහා බලලා, කෑ ගහන හැටි අපට පෙනෙනවා. දැන් මොකක්ද කරන්න ඕනෑ? දැන් ජාත්‍යන්තර වෙළෙඳ පොළේ කිරිපිටි මිල ඉහළ ගිහිල්ලා නම්, ගෑස් මිල ඉහළ ගිහිල්ලා කියලා ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා හොඳටම දන්නවා නම් මොකක්ද කරන්න ඕනෑ? ගෑස් පෝලිමක් හදනවාද, මිල ඉහළ දාලා හෝ මිනිසුන්ට ගෑස් ලබා දෙනවාද?

ප්‍රශ්න දෙකක් තිබෙනවා. මොකක්ද සොයා ගන්නා උත්තරය? මොකක්ද අපි හොයා ගන්නේ? අපි පෝලිම් හදනවා ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හුඟක් වෙලාවට විපක්ෂය කැමැතියි පෝලිම් හැදෙනවාට. පෝලිම හැදිච්ච වෙලාවට තමයි මාතෘකාව ගොඩ නැඟෙන්නේ. පෝලිම හැදිච්ච වෙලාවට තමයි මාතෘකාව රටට ගෙනියන්න පුළුවන් වෙන්නේ. එතකොට තමයි ආණ්ඩුව විවේචනයට අවශ්‍ය ඉතා හොඳ පදනමක් හැදෙන්නේ; හොඳ වේදිකාවක් හැදෙන්නේ. අපි ඒ වේදිකාව හැදෙන්න දෙන්නේ නැහැ. අපි ජනතාවගේ අත්‍යවශ්‍ය භාණ්ඩ වෙනුවෙන් තීන්දු තීරණ ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් මේ කථාවලට සවන් දෙමින් සිටියදී මට ඇහුණා, අපේ රටට කොන්ක්‍රීට් වනාන්තර මොකටද කියලා අහනවා. දකුණු අධිවේගී මාර්ගය එදා කොට්ටාවෙන් පටන් අරගෙන ගාල්ල දක්වා

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ගිහිල්ලා, අද හම්බන්තොට දක්වා ගිහින් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කොන්ක්‍රීට් වනාන්තරයක්. ඔව්. වනාන්තරය මැද්දෙන් කොන්ක්‍රීට් අධිවේගී මාර්ගයක් යනවා. මේක එලදායී නැද්ද? අධිවේගී මාර්ගයේ කවුරුවත් ගිහිල්ලා නැද්ද? මේක රටට අවශ්‍යතාවක් නොවෙයි ද? රටක දියුණුවට විශේෂයෙන්ම හොඳ මාර්ග පද්ධතියක්, හොඳ සන්නිවේදනයක්, හොඳ ප්‍රවාහන ක්ෂේත්‍රයක් අවශ්‍යයි. අධිවේගී මාර්ගය අපට අවශ්‍ය නැති දෙයක් ද? අධිවේගී මාර්ගය අපට අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක අවශ්‍ය දෙයක්. ඒ වාගේම, සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාපිටිය. මේවා අවශ්‍ය නැද්ද? අපි තවම ගෝත්‍රික යුගයේ ද ජීවත් වෙන්න ඕනෑ? ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1977දී මොකක්ද කළේ? එදා 1970-77 කාලය ඇතුළත රටේ කෘෂි ආර්ථිකයක්, අපනයන ආර්ථිකයක්, නිෂ්පාදනයක් හදන්න සිරිමාවෝ මැතිනිය උත්සාහ කරනකොට, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා කිව්වා, "ඒ ඔක්කෝටම වඩා හොඳට අපි කන්න දෙන්නම්" කියලා. [බාධා කිරීමක්] ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ සභාවෙන් යනවා ද? අපරාදේ. හොඳ ටික කියනකොටයි ඔබතුමා යන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මිනිසුන්ගේ බඩටයි කථා කළේ; ඔළුවට නොවෙයි. එතුමා රටේ අනාගතයට නොවෙයි, බඩටයි කථා කළේ. බඩට කථා කරලා කිව්වා, මම ඇට වර්ග 8ක් දෙන්නම් කියලා. රටේ මිනිස්සු ඒ ඇට වර්ග 8 පස්සේ ගියා. ඒ ඇට 8 පස්සේ ගිහිල්ලා මොකක්ද සිද්ධ වුණේ? රටේ මිනිසුන්ට අවුරුදු 17කට පස්සේ හම්බ වුණේ විනාශ වෙන තත්ත්වයට පත් වෙච්ච රටක්. අවුරුදු 17ක් රට විනාශ වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කාලයේ මොකක්ද වුණේ? අපේ රටේ තිබිච්ච දේශීය නිෂ්පාදන, අපනයන ක්ෂේත්‍රය සහමුලින්ම විනාශ වුණා. දැන් කොවිඩ් වසංගතය තිබෙනවා කියලා අපේ සංවර්ධනය නවත්වන්න ඕනෑ ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයේත් මාර්ග ලක්ෂයක් කාපට් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. මිනිස්සු ආසා නැද්ද කාපට් පාරක යන්න? මිනිසුන්ට අවශ්‍යතාව නැද්ද තමන්ගේ ප්‍රදේශය දියුණු වෙලා එදාට වැඩිය වේලාව අඩු කරගෙන ඉක්මනට ගමනක් ගිහින් එන්න පුළුවන්කම දකින්න? සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාපිටිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඔබට ශක්තියක් නොවෙයි ද? හම්බන්තොට ජාත්‍යන්තර වරාය ඔබට ශක්තියක් නොවෙයි ද? එදා අපි කතරගම යනකොට ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ පාර දෙපැත්තේ කාටවත් වැඩක් නැති කටු අන්දර ගස් වර්ගය විතරයි දකින්න තිබුණේ. ගොඩක් තැන්වල තනි වාහනයකට විතරක් යන්න පුළුවන් පාරවල් තිබුණේ. එක වාහනයක් එනකොට අනෙක් වාහනය කැළෑවට ගන්න ඕනෑ. මේවා දියුණු විය යුතු නැද්ද? කොරියාව ගන්න, චීනය ගන්න. කොරියාවේ සෝල් අගනුවර වාගේම තමයි බූසාන් නගරයත්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට තවත් විනාඩි 3ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මට තව විනාඩි 5ක් දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අහගෙන හිටියා අනුර කුමාර දිසානායක මැතිතුමා දූෂණ, වංචා ගැන කථා කරපු ආකාරය. පාර්ලිමේන්තුවේ නැති කවුරු හෝ වැරදි කරලා තිබෙනවා නම් වැරදිකරුවන්ට දඬුවම් දෙන්න. හැබැයි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මේ කථා කරපු දූෂණ හා වංචා සියල්ලම සිද්ධ වුණා කියලා කිව්වේ කවදා ද? 2015ට පෙර මේවා සිද්ධ වුණා කියලායි එතුමා කිව්වේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015ට පෙර මේ කියන හොරකම් ටික සිද්ධ වුණා කියලා අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා. එතුමා පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කරපු හැන්සාඩ් වාර්තා අරගෙන බැලුවාම ඔළුවේ කෙස්වලට වැඩිය මේ කථාව දිගටම එතුමා කියලා තිබෙනවා. එතුමන්ලා විසින් හදා ගත්ත යහ පාලන ආණ්ඩුව තිබුණු කාලයේ එතුමන්ලා දූෂණ විරෝධී කඳවුරේ ඉඳගනිමින් FCID එක ඇති කරලා, ඒකේ නියෝජිතයෙක් වෙලාත් මේ හොරකම් ටික අල්ලා ගන්න බැරි වුණේ ඇයි? මේ හොරකම් ගැන FCID එකට ගිහිල්ලා කියන්න බැරි වුණේ ඇයි? මේ දවස්වල කරළියේ තිබෙන, විදේශ රටක මුදල් තිබෙන කෙනෙක් ගැන දැන් එතුමා කථා කළා. මම ඒ නමවත් කියන්න කැමති නැහැ. ඒ සම්බන්ධයෙන් දැන් අධිකරණයේ නඩුවක් යනවා. පක්ෂයක් හැටියට ඒ කියපු කාරණා ටික අධිකරණයට ගිහිල්ලා කියන්න තිබුණා. [බාධා කිරීමක්] නමුත්, ප්‍රශ්නය මේකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකක්ද ප්‍රශ්නය?

පැමිණිල්ලත් අනුර කුමාර දිසානායකගේ; අධිකරණයත් අනුර කුමාර දිසානායකගේ; තීන්දුවත් අනුර කුමාර දිසානායකගේ. එක්සත් ජාතික පක්ෂය විපක්ෂයේ හිටියත්, අපි ආණ්ඩුව පැත්තේ හිටියත් එහෙම ඉතිහාසයක් තිබෙන බව අපි දන්නවා. කොහොමද ඒ ඉතිහාසයේ කටයුතු සිදු වුණේ? 1988- 1989 කාලයේ ජනතා විමුක්ති පෙරමුණ ආයුධ අතට අරගෙන ක්‍රියාත්මක වන වේලාවේ ගමේ ඉන්න ග්‍රාම සේවක මහත්තයා, පොලිස් නිලධාරියා ගැන සැක මතු වෙනවා. එහෙම සැකයක් මතු වුණාම ග්‍රාම සේවක මහත්තයා ඔත්තුවක් දීලාය කියනවා. ඒක ආරංචි වෙනවා ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ අංශයේ නායකයන්ට. ඒ ගොල්ලන් ඇවිල්ලා ග්‍රාම සේවක මහත්තයා ගෙදරින් එළියට ගන්නවා. ඒ ගන්නේ කවුරු ඉස්සරහාද? ඔහුගේ අහිංසක දරු පැටව්, බිරිඳ ඉදිරිපිට. "මෙහේට එනවා ග්‍රාම සේවක මහත්තයා, තමුසේ අපිට විරුද්ධව කියා තිබෙනවා", එහෙම නැත්නම් "තමුසේ මේ වැරැද්ද කරලා තිබෙනවා" කියලා -වැරැද්දක් කර තිබෙනවා කියා කවුරු හෝ කියනවා. සැකයක් පිළිබඳ කාරණාවක් මේ තිබෙන්නේ.- අනේ! අර අහිංසක දරුවන්, බිරිඳ ඉස්සරහා ගල්කටස් එකෙන් "ටෝං" ගාලා ඔහුගේ ඔළුවට වෙඩි තියනවා. ග්‍රාම සේවක මහත්වරු කී දෙනෙක් නම් ඒ විධියට මැරුවාද? ඉතින් තවමත් ඒ කැලෑ නීතිය රජ කරවන්නද ඉල්ලන්නේ?

ඕනෑම කෙනෙකුට අයිතියක් තිබෙනවා, තමන්ට විරුද්ධව පැමිණිල්ලක් තිබෙනවා නම්, අධිකරණය මඟින් එය විසඳා ගන්න. අධිකරණ කීයක් තිබෙනවාද? මහෙස්ත්‍රාත් අධිකරණය, ඉහළ උසාවිය, ඇපිල් උසාවිය, ශ්‍රේෂ්ඨාධිකරණය තිබෙනවා. ඒවා මඟින් තමයි මේ රටේ නීතිය හරියට ඉටු වෙන්නේ. හැබැයි, නීතිය නෙවෙයි, මේ ඉල්ලන්නේ. මේ ඉල්ලන්නේ එදා -1988-89 කාලයේ- තුවක්කුවෙන් ඉල්ලපු දෙය. 1988-89 කාලයේ ගෙදරට ඇවිත් තුවක්කුව පෙන්වා ඔළුවට "ටෝං" ගාලා වෙඩි තියලා ගම්වල දහස් ගණනක් මිනිස්සු මරපු විධියට කටයුතු කරන්න ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ගැන වැරැද්දක් කිව්වා නම් ජනතා විමුක්ති පෙරමුණේ නීතිය තමයි, ඔතැනට ඇවිත් තමුන්නාන්සේට "ටෝං" ගාලා වෙඩි තියන එක. ඒක හරිද? කාගෙද ඒ නීතිය? දෙවි හාමුදුරුවනේ! කොහොමද එහෙම නීතියක් තිබෙන්නේ? ඒක කැලෑ නීතියක් බවට පරිවර්තනය වෙනවා. ඒ කැලෑ නීතිය ගෙන යන්න අපට ඉඩ දෙන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක ඒ කාලයේ අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණ කියන දේවල් මිනිස්සු අහලා තිබෙනවාද? අපි බලමු, ජනතාව ඒ අය කියන දේවල් අහගෙන ඉඳලා තිබෙන්නේ කොහොමද කියලා. 2004 දී ජනතා විමුක්ති පෙරමුණ අපිත් එක්ක

සන්ධානයක් ඇති කර ගත්තා. ජනතා විමුක්ති පෙරමුණයි, අපියි එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව, වෙනමම කඳවුරක් හදා ගත්තා. එක්සත් ජාතික පක්ෂය ඔවුන්ගේ ආණ්ඩුව 2001දී ස්ථාපිත කළා. ඒ ආණ්ඩුවට විරුද්ධව අපි වෙනමම කඳවුරක් හදා ගත්තා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය තමයි එදා ජනාධිපතිනිය. රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැතිවරයා. ඊට පස්සේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ජේවීපී එකයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි වෙනමම සන්ධානයක් හදා ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් එය මතක ඇති. මොකක්ද සිද්ධ වුණේ? අපිත් එක්ක සන්ධානගත වෙලා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු 39දෙනෙක් මේ පාර්ලිමේන්තුවට ආවා. පාර්ලිමේන්තුවේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු 39දෙනෙකු හිටියා. ඒක වාර්තාගතයි. ඒ අය මේ රටේ සුළු පක්ෂයක්, හර්ෂ ද සිල්වා ගරු මන්ත්‍රීතුමනි. ඒ, ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව. ජේවීපී එකේ මන්ත්‍රීවරු 39 දෙනෙකු ඉන්න ආණ්ඩුවේ අනුර කුමාර දිසානායක ගරු මන්ත්‍රීතුමාට මොකක්ද හම්බ වෙන්නේ? එතුමාට හම්බ වෙනවා කෘෂිකර්ම ඇමතිකම. එදා පුංචි කැබිනට් මණ්ඩලයක් තිබුණේ. කෘෂිකර්ම ඇමතිට භාර දුන්නා වැව් ටික හදන්න. මේ වෙලාවේ එතුමා සභාවේ හිටියා නම් හොඳයි. මට පෙන්වන්න, වැව් කෙසේ වෙතත් එතුමා අඩුම ගණනේ ගෙම්බන්ට ඉන්න පොඩි වළක්වත් හදලා තිබෙනවාද කියලා? අඩුම ගණනේ නෙළුම් පැළ ටිකක් දාලා ගෙම්බන්ට ඉන්න පුළුවන් වළක්වත් හදලා තිබෙනවාද? කියන්න පුළුවන්; ගොඩ ඉඳන් පීනන්න කියා දෙන්න පුළුවන්. හැබැයි, වතුරට බැහැලා බලන්න ඕනෑ කොහොමද පීනන්නේ කියලා.

2010දී එතුමන්ලාට මොකක්ද වුණේ? එතුමන්ලාගේ මන්ත්‍රීවරු සංඛ්‍යාව 4 දක්වා අඩු වුණා. 2015 දී මේ පාර්ලිමේන්තුවේ ජේවීපී මන්ත්‍රීවරු හයදෙනෙක් හිටියා. දැන් 2020 දී මන්ත්‍රීවරු තුන්දෙනායි ඉන්නේ. දෙවි හාමුදුරුවනේ! එහෙම වුණේ අපේ රටේ මිනිසුන්ගේ ඔළුවේ අමාරුවක් නිසාද? නැත්නම් ජනතා විමුක්ති පෙරමුණේ ඔළුවේ අමාරුවක් නිසා ද? මේ ගොල්ලන් අවුරුදු හැත්තෑ ගණනක් තිස්සේ කියන දේවල් ජනතාව ඇහුවා නම් දැන් මේ ගොල්ලන්ට රට භාර දෙන්න එපායැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 39ක් ලෙස හිටපු මන්ත්‍රීවරු සංඛ්‍යාව 79ක් දක්වා වැඩි වෙන්න එපායැ. දැන් ඒ පක්ෂයට මන්ත්‍රීවරු තුන්දෙනායි ඉන්නේ. මට ෂුවර් නැහැ ඊළඟ ඡන්දයේදී මේ තුන්දෙනාගෙනුත් දෙදෙනෙක් හැලෙයි ද කියලා. ඒ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. ඒ ඇයි? එතුමන්ලාගේ හැමදාම විවේචනය කරනවා විතරයි. නායකයෝ හදනවා කිව්වා. සරත් ෆොන්සේකා මහත්තයාව ගෙනාවා ජනාධිපති කරවන්න. මොකක්ද කළේ? එතුමාට ඇත්තටම ගැළපුණා හමුදාවේ ඇඳුම. නමුත්, එතුමාට ගැළපෙන්නේ නැති ජනාධිපති ඇඳුමක් මැහුවා. ඒක ලොකුයි. අන්තිමට මොකක්ද වුණේ? ඒ ඇඳුම නෙවෙයි, ජම්පරය ඇන්දුවා. කවුද, ඒකට මුල් වුණේ? ජනතා විමුක්ති පෙරමුණයි.

අපි අභියෝග භාරගන්න ලැහැස්තියි. ඒ අභියෝග භාරගෙන අපි මේ ආර්ථිකය කළමනාකරණය කරනවා. ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා කිව්වා, "මුදල් ඇමතිතුමාට මොළ 7ක් තිබෙනවා" කියලා. නැහැ, කවුරුත් එහෙම කියලා නැහැ. එතුමාට එක මොළයයි තිබෙන්නේ. මොළ 7ක් නැහැ. හැබැයි, ඒ මොළය මේ සිටින සියලුදෙනාගේම මොළවලට වඩා හොඳ මොළයක්. ඒ මොළය ඉතාම සාර්ථක මොළයක්. ඒ මොළයේ හොඳ දුර දක්නා නුවණක් තිබෙනවා. මේ නොවැම්බර් මාසයේ 02වන දාට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයට අවුරුදු පහක් පිරෙනවා. අද ලංකාවේ තිබෙන දැවැන්තම පක්ෂය හදන්න පුළුවන් වුණේ එතුමාටයි. ඒ වාගේම, අද මේ වාගේ අභියෝගයක් මධ්‍යයේ මුදල් අමාත්‍යාංශය මෙහෙයවන්නත් එතුමාට සිදු වෙලා තිබෙනවා. හැබැයි, විශ්මකර්ම වැඩක් විධියට එතුමා 2022 අවුරුද්දට ගෙනෙන අය වැය සාර්ථක අය වැයක් කියන එක බොහොම ගෞරවයෙන් මේ වෙලාවේ අපි මතක් කරනවා. ඒ ගෙනෙන අය වැය තුළින් මේ රටේ ආර්ථිකය ඉහළ මට්ටමකට ගෙනෙනවා; රට ස්ථාවරභාවයකට ගෙනෙනවා. ඒ වෙනුවෙන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ නායකත්වය යටතේ මුදල් ඇමතිතුමා නව ආර්ථිකයත් එක්ක නව ජීවනෝපාය වැඩ පිළිවෙළක් තුළ කටයුතු කරනවා.

ගම නියෝජනය කරන හැම මන්ත්‍රීවරයකුටම අද මුදල් ලබාදී තිබෙනවා. ඒ සියලු කටයුතු අපි ඉෂ්ට කරන තිබෙනවා. අපි බලාපොරොත්තු වන, ලෝකයේ වාසනාවන්ත රටක් බවට මේ රට පරිවර්තනය කිරීමට අවශ්‍ය වැඩ කටයුතු සියල්ල අපි කරනවාය කියන කාරණය මතක් කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නාලක ගොඩහේවා රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.05]

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා (නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா - நகர அபிவிருத்தி, கழிவுப்பொருட்களை அகற்றுதல் மற்றும் சமுதாயத் துப்புரவேற்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) Nalaka Godahewa - State Minister of Urban Development, Waste Disposal and Community Cleanliness)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් ඇමතිතුමා මේ සභාව අමතමින් කළ එතුමාගේ මංගල කථාවේදී අවංකවම පිළිගත්තා, වර්තමානයේ මේ රටේ ආර්ථික කළමනාකරණයේ දුෂ්කරතාවක් තිබෙන බව. එතුමා කිව්වා, මේ අවස්ථාවේ අපි ඉන්නේ හරියට "මරණ තුනක් ඇති මිනිහෙක් පැණි කනවා හා සමාන තත්ත්වයක" කියලා. ඒ යථාර්ථය පිළිගෙන තමයි මෙවර අය වැය අපි සකස් කරන්නේ. මේ ගැටලුවලට විසඳුම් සොයන ගමන්ම, අපි මේ කථා කරන වර්තමාන ආර්ථික අර්බුදය නිර්මාණය වුණේ කොහොමද කියන එක ගැනත් මේ රටේ ජනතාව දැනුවත් කරන්න අපිට වගකීමක් තිබෙනවා. එතකොට තමයි අපි මේ කරන දේවල හරය ජනතාවට වැටහෙන්නේ.

2019 වසරේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වරණයට ඉදිරිපත් වෙනකොට අපි හොඳින්ම දැනගෙන හිටියා, අපිට විශාල ආර්ථික අභියෝගයකට මුහුණ දෙන්න වෙනවා කියලා. ඒක දැනගෙන තමයි අපි රට භාරගත්තේ. ඒ වාගේම ඒ අවස්ථාවේ තිබුණු ආර්ථික ගැටලුවට නිශ්චිත විසඳුම් මාලාවක් රටට ඉදිරිපත් කරලායි ජනතාවගෙන් අපි බලය ඉල්ලුවේ. 2019 වසරේ මේ රට අපි භාර ගන්නකොට මේ රටේ තිබුණු ආර්ථික තත්ත්වය කොහොමද? ඒ වන විට මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 2.3ක් දක්වා පහළ වැටී තිබුණා. ඒ, මේ කලාපයේ අනෙක් රටවල් සියල්ලම දියුණු වන අවස්ථාවකයි. ඒ අවස්ථාවේ මාලදිවයිනේ ආර්ථික වර්ධන වේගය සියයට 7යි; බංග්ලාදේශයේ සියයට 8.3යි; නේපාලයේ සියයට 6.7යි; ඉන්දියාවේ සියයට 4යි; වියට්නාමයේ සියයට 7යි; පිලිපීනයේ සියයට 6යි. මේ වාගේ තත්ත්වයක් තියෙද්දි තමයි පසුගිය රජය යටතේ ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට 2.3 දක්වා පහළට වැටී තිබුණේ. මෙය ක්‍රමානුකූලව, අවුරුදු 5ක් තිස්සේ සිද්ධ වුණු දෙයක්. 2015 දී එතුමන්ලා යටතේ අපේ ආර්ථික වර්ධන වේගය සියයට 5 දක්වා අඩු වුණා; 2016 දී එය සියයට 4.5ක් දක්වා අඩු වුණා; 2017 දී

[ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා]

සියයට 3.6 දක්වා අඩු වුණා; 2018 දී සියයට 3.3 දක්වා අඩු වුණා; 2019 දී සියයට 2.3 දක්වා අඩු වුණා. මේ විධියට ගියා නම්, කොරෝනා වසංගතය ආවත් නැතත් 2020 වසරේ රටේ ආර්ථික වර්ධන වේගය ඉතාම අඩු මට්ටමකට වැටෙනවා.

මේ විධියට ආර්ථිකය ක්‍රම ක්‍රමයෙන් මන්දගාමී වුණාට ඒ රජය තිබුණු කාලයේ කිසිම ගෝලීය අර්බුදයක් තිබුණේ නැහැ. ඒ කාලයේ තෙල් අර්බුදයක් නැහැ. මූල්‍ය අර්බුදයක් තිබුණේ නැහැ. ආහාර අර්බුදයක් තිබුණේ නැහැ. ගෝලීය වසංගතයක් තිබුණේත් නැහැ. එවැනි කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. සාමාන්‍යයෙන් අපේ රටේ ආර්ථිකයට ලොකු බලපෑමක් එල්ල කරන තෙල් මිල දිහා බැලුවත්, ඒ වෙලාවේ රජයට ඉතාම වාසිදායක තත්ත්වයක් තිබුණේ. සාමාන්‍යයෙන් තෙල් බැරලයකට ඩොලර් 55ක, 65ක විතර පරාසයක් තුළ තමයි තෙල් මිල විචලනය වුණේ. නමුත්, 2011-2014 කාලය එක්ක සංසන්දනය කර බලනවිට තෙල් මිල ඊට වඩා හුඟක් ඉහළ අගයකයි තිබුණේ. තෙල් බැරලය ඩොලර් 110ක් වාගේ ඉහළ අගයක තිබුණේ. මෙවැනි තත්ත්වයක් තිබිලාත් පසුගිය රජයට අපේ විදේශ සංචිත වර්ධනය කර ගැනීමට නොහැකි වුණා. 2014 වසරේ අපි රට භාරදෙන විට මේ රටේ විදේශ සංචිතය ඩොලර් බිලියන 8.3ක් තිබුණා. නමුත්, මෙතුමන්ලා අවුරුදු පහකට පස්සේ ආපසු අපිට රට භාරදෙන විට ඩොලර් බිලියන 7.2ක විදේශ සංචිතයක් තමයි තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී අපේ රට කොතැනද ඉන්න ඕනෑ කියන එක ගැන බලන්න ඕනෑ. 2005දී ඩොලර් බිලියන 2.7න් පටන් අරගෙන, ඩොලර් බිලියන 8.3 දක්වා වැඩි වුණු විදේශ සංචිත ප්‍රමාණය ඒ විධියටම පවත්වා ගෙන ගියා නම්, 2019 වසර වෙනකොට අඩුම ගණනේ ඩොලර් බිලියන 13ක්, 14ක් විය යුතුව තිබුණා. එහෙම තිබිය යුතු ප්‍රමාණය තමයි, ඩොලර් බිලියන 7.2 දක්වා පහළ බස්සලා එතුමන්ලා අපිට රට භාරදුන්නේ. අඩුම ගණනේ සම්පූර්ණයෙන් හදලා තිබුණු හම්බන්තොට වරාය විකුණා ගත් සල්ලිවත් මේ සංචිතවලට එකතු වුණේ නැහැ. 2005-2014 කාලයේ මේ රටේ ආර්ථිකය ඩොලර් බිලියන 20 සිට 80 දක්වා වර්ධනය වුණා.

2014 වසරේදී මහ බැංකුව පුරෝකථනය කළා, 2019 වසර වන විට මේ රටේ ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 145 දක්වා වර්ධනය වෙනවා කියලා. නමුත්, ඇත්තටම මොකද වුණේ? 2015-2019 කාලයේ මේ රටේ දළ ජාතික නිෂ්පාදිතය වර්ධනය වුණේ ඩොලර් බිලියන 3කින් පමණයි. ඒ කියන්නේ, අපේ ඉලක්කයත් එක්ක සසඳන කොට අපි ඩොලර් බිලියන 60ක විතර පිටුපසින් සිටීමක්. 2014 වසරේ පමණක් අපේ රටේ ඒක පුද්ගල ආදායම ඩොලර් 287කින් වැඩි වුණා. 2014 වසරේ ඩොලර් 3,800ක් වුණු ඒක පුද්ගල ආදායම 2019 වන විට ඩොලර් 6,600 ඉක්මවනවා කියා අපි පුරෝකථනය කර තිබුණා. එම ඉලක්කය ඩොලර් 2,800ක විතර වර්ධනයක්. නමුත්, මොකක්ද වුණේ? ඒ අවුරුදු 5ටම ඒක පුද්ගල ආදායම වර්ධනය වුණේ ඩොලර් 50කටත් වඩා අඩු ප්‍රමාණයකින්. 2014දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,819යි. 2019දී ඇමෙරිකානු ඩොලර් 3,852යි. එය, බෙහෙවින් කනගාටුදායක තත්ත්වයක්. අද රුපියල අවප්‍රමාණය වීම ගැන කථා කරන හුඟක් අය අමතක කර තිබෙනවා, ඒ කාලය තුළ රුපියලේ අගය සියයට 40කින් කඩා වැටුණු බව. 2014දී ඩොලරය රුපියල් 131යි. 2019 වන විට එය රුපියල් 186 දක්වා ඉහළ ගිහින් තිබුණා. 2005-2014 කාලයේ වසරකට සියයට 2.8කින් විතර අවප්‍රමාණය වෙච්ච රුපියල ඊළඟ අවුරුදු 5 තුළ වසරකට සියයට 8කින් පමණ අවප්‍රමාණය වුණා. ඒ නිසා අප රජය භාර ගන්න කොට ආනයනික භාණ්ඩවල මිල විශාල වශයෙන් ඉහළ ගොස් තිබුණා.

පසු ගිය රජයේ මූල්‍ය කළමනාකරණයත් ඉතාම දුර්වල තත්ත්වයක තිබුණේ. අපි වසර ගණනාවක් තිස්සේ ක්‍රම ක්‍රමයෙන් අය වැය පරතරය අඩු කරගෙන ආවා. 2014 වන විට රුපියල් බිලියන 600 දක්වා අඩු කරගෙන තිබුණු අය වැය පරතරය ක්‍රම ක්‍රමයෙන් වැඩි කරලා 2019 වන විට රුපියල් බිලියන 1,000 දක්වා ගෙන ගොස් තිබුණා. මේ විධියට අය වැය පරතරය වැඩි වෙන කොට ඒ අය විසඳුම විධියට කළේ මේ රටේ ජනතාව මත පටවන බදු බර වැඩි කිරීමයි. ව්‍යාපාර මත, සාමාන්‍ය ජනතාව මත අසීමාන්තික විධියට බදු බර දැම්මා. ගෙයක් කුලියට දුන්නත් සියයට 20ක් බදු අය කළා. බැංකුවේ තිබෙන ස්ථාවර තැන්පතු ගිණුම්වල පොලියෙනුත් සියයට 5ක් අය කළා. නිවසක් විකුණුවා නම්, වාහනයක් විකුණුවා නම් ආණ්ඩුවට සියයට 10ක් බදු වශයෙන් ගෙවන්න වුණා. කොටස් වෙළෙඳ පොළේ ආයෝජනයක් කරලා ප්‍රතිලාභයක් ගත්තා නම්, ඒකෙනුත් බදු ගෙවන්න වුණා. දඹදිව වන්දනාවේ ගියත්, පිට රටකට ළමයෙකු යැව්වත් බදු ෆයිල් එකක් අරින්න වුණා. මේ වාගේ තත්ත්වයක් තමයි එදා තිබුණේ.

2014 වසරේ රුපියල් බිලියන 1,195ක් වූ රාජ්‍ය බදු ප්‍රමාණය 2019 වසර වන විට රුපියල් බිලියන 1,735 දක්වා වැඩි වෙලා තිබුණා. එය, සියයට 70ක විතර වර්ධනයක්. මෙය ප්‍රශ්නයක් නොවෙයි, ආර්ථිකයත් ඒ හා සමගාමීව වර්ධනය වුණා නම්. නමුත්, ආර්ථිකය ඒ විධියට වර්ධනය වුණේ නැහැ. ඒ නිසා ඒ කාලය තුළ රාජ්‍ය බදු රටේ දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට 9.5 ඉඳලා 11.5 දක්වා වැඩි වුණා. ව්‍යාපාර මත බදු වැඩි වුණා වාගේම පොලී අනුපාතයත් වැඩි වුණා. ඒ නිසා 2014 වසර වන විට තනි ඉලක්කමේ තිබුණු පොලී අනුපාතය 2019 විතර වන කොට දෙගුණයකටත් වඩා වැඩි වෙලා තිබුණා. බදු බර හා පොලී අනුපාතය වැඩි වීම නිසා මේ රටේ ව්‍යාපාරවලට විශාල බලපෑමක් එල්ල වුණා. විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර රාශියක් වසා දැම්මා; තවත් විශාල ප්‍රමාණයක් බංකොලොත් වුණා. රැකියා විරහිතභාවයටත් මෙය බරපතළ ලෙස බලපෑවා. 2015 වසරේ යහ පාලන රජය බලයට එන විට පොරොන්දු වෙලා තිබුණා, අලුතින් රැකියා දසලක්ෂයක් දෙනවා කියලා. නමුත්, ඇත්තටම වුණේ තිබුණු රැකියාත් අහිමි වීමයි. 2014 වර්ෂයේ මහ බැංකු වාර්තාවට අනුව රටේ රැකියා ලක්ෂ 84ක් තිබුණත් 2019 වසර වන විට ඒ ප්‍රමාණය ලක්ෂ 80ට අඩු වෙලා තිබුණා. වයස අවුරුදු 20ත්, 30ත් අතර ජනගහනයෙන් සියයට 17ක් පමණ ඒ වන විට රැකියා වියුක්තියෙන් පෙළුණා. ආර්ථික වර්ධනයක් නොවුණාට ඒ ආණ්ඩුව පුදුමාකාර විධියට ණය ගත්තා. 2014 වසරේදී අපි ආණ්ඩුව භාර දෙන කොට රටේ ණය බර රුපියල් බිලියන 7,400යි. එය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 71.3යි. නමුත් 2019 වසර අවසන් වන විට ණය බර රුපියල් බිලියන 13,000 දක්වා වැඩි වෙලා තිබුණා. එය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තාම සියයට 86 දක්වා වැඩි වීමක්.

2005-2014 කාලයේත් රජය ණය ගත්තා. එහි තර්කයක් නැහැ. එදා බිලියන 5,600ක ණය ගන්න කොට රටේ ආර්ථිකය ඩොලර් බිලියන 60කින් වැඩි වෙලා තිබුණා. නමුත්, ඊළඟ අවුරුදු 5 තුළ පැවැති ආණ්ඩුව බිලියන 5,600කින් ණය ගන්න කොට, රටේ ආර්ථිකය වර්ධනය වෙලා තිබුණේ ඩොලර් බිලියන 3කින් පමණයි. ඇත්ත වශයෙන්ම, බලාපොරොත්තු වූ විධියට ගියා නම් අවුරුදු 5ක් තුළ අඩුම ගණනේ ඩොලර් බිලියන 60කින් මේ රටේ ආර්ථිකය වර්ධනය වෙන්න ඉඩ තිබුණා. එහෙම වුණා නම්, මේ වන විට තිබෙන මේ ණය ප්‍රමාණය අපට ප්‍රශ්නයක් නොවෙයි; විදේශ සංචිත අඩුවීම අපට ප්‍රශ්නයක් නොවෙයි; ආර්ථිකයේ රාජ්‍ය ආදායම අඩුවීම අපට ප්‍රශ්නයක් නොවෙයි.

2019 වසරේ අපි මැතිවරණයට සූදානම් වන කොට කොරෝනා තත්ත්වයක් තිබුණේ නැහැ. අපි එදා සැලසුම් සකස් කළේ ගෝලීය ආර්ථිකය සියයට 5ක පමණ වේගයෙන් වර්ධනය වනවා කියා පුරෝකථනය කර තිබුණු තත්ත්වයක් යටතේයි. ඒ අවස්ථාවේ අපට අවශ්‍ය වෙලා තිබුණා, රටට ස්ථාවර ප්‍රතිපත්තියක් හදන්න. අපි යෝජනා කළා බදු අඩු, සරල බදු තිබෙන, පොලී

අනුපාතය අඩු බදු ප්‍රතිපත්තියක්. ඒකට තමයි ජනතාව ඡන්දය දුන්නේ. පොරොන්දු වෙච්ච ආකාරයටම අපි බදු අඩු කළා; පොලී අනුපාතය අඩු කළා. එය සාමාන්‍ය තත්ත්වය යටතේ සිදු වුණා නම් මේ රටේ ආර්ථිකයට එමඟින් පැහැදිලිවම උත්තේජනයක් ලැබෙන්න ඉඩ තිබුණා; ව්‍යාපාර යළි ආයෝජනයට පෙළඹීලා, ජනතාවගේ අත මිට සරු වෙලා, ආර්ථික ක්‍රියාවලිය සක්‍රිය වෙන්න ඉඩ තිබුණා. නමුත්, අවාසනාවකට වාගේ අප කිසි කෙනෙකු බලාපොරොත්තු නොවුණු විධියට ආපු කොවිඩ් වසංගත තත්ත්වය මේ සියල්ල උඩු යටිකුරු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2020 වසරේ අපි මුහුණ දුන් තත්ත්වය සමස්ත ලෝකයටම පොදුයි. පසු ගිය වසරේ ලෝක ආර්ථික වර්ධන වේගය සෘණ සියයට 3.6කින් සංකෝචනය වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වැඩිපුර විනාඩි 5ක් දෙනවා කියලා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම දෙන්න විධියක් නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් වෙලාව අඩු කරලා තිබෙන්නේ. ඔබතුමාට වැඩිපුර කාලයක් ලබා දුන් බව මම දන්නේ නැහැ. මට තවම එහෙම දැනුම් දීලා නැහැ.

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)
එතුමා කිව්වා. මට ඔබතුමාට අසත්‍ය කියන්න හේතුවක් නැහැ නේ.

සියයට 2.3ක පමණ සුළු වර්ධන වේගයක් පෙන්වූ චීනය හැරුණු විට ලෝකයේ අනෙකුත් සියලු රටවල ආර්ථිකයන් වාර්තා කළේ සෘණ වර්ධන වේගයක්. අපේ අසල්වැසි ඉන්දියාවේ ආර්ථික වර්ධන වේගය සෘණ 8 යි; සිංගප්පූරුවේ සෘණ 5.4 යි; මැලේසියාවේ සෘණ 5.6 යි; එක්සත් රාජධානියේ සෘණ 9.8 යි; ඇමෙරිකාවේ සෘණ 3.5 යි; ජපානයේ සෘණ 4.8 යි. මේ වාගේ තත්ත්වයක් යටතේ තමයි ලංකාවේ ආර්ථික වර්ධන වේගයත් ගෝලීය ආර්ථිකයට සමගාමීව සෘණ සියයට 3.6ක සංකෝචනයකට ලක් වුණේ.

ආර්ථිකයට සිදු වුණු ඒ අනපේක්ෂිත පසුබෑම නිසා අපට අපේක්ෂිත ආදායම ලැබුණේ නැහැ. 2020 වසරේදී අපට ලැබුණේ රුපියල් බිලියන 1,368ක පමණ ආදායමක්. එය අප බලාපොරොත්තු වූ ආදායමට වඩා රුපියල් බිලියන 500ක විතර අඩුවක්. නමුත්, එහෙම කියලා රජය ජනතාවගේ ප්‍රශ්න අමතක කළේ නැහැ. මේ කොවිඩ් වසංගතය කාලයේ කොවිඩ් ආසාදනයට ලක් වුණු සෑම පුරවැසියෙකුටම රජයේ වියදමින් ප්‍රතිකාර කළා; කොරෝනා ආශ්‍රිතයන් සඳහා රට පුරා නිරෝධායන මධ්‍යස්ථාන ඇතිකළා; විශේෂ කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථාන ඉදිකළා; රෝහල් පද්ධතියට අලුතින් ඇඳන් 35,000ක් එකතු කළා; රට පුරා Antigen හා PCR පරීක්ෂණ කළා; වෛද්‍ය උපකරණවලට ආයෝජනය කළා; පිට රටින් ඔක්සිජන් පවා ගෙන්වූවා. නිරෝධායනය වන පවුල්වලට රුපියල් 10,000ක බඩු මල්ලක් දුන්නා. රට වැසූ සෑම අවස්ථාවකම රුපියල් බිලියන 30ක් පමණ වියදම් කරමින්, දෛනික ආදායම් ලබන්නන්ට ආධාර ලබා දුන්නා. ඒ වාගේම ලෝකයේ සාර්ථක ලෙස එන්නත්කරණය සිදු කළ රටක් බවට අපේ රට පත් වුණා. මේ කටයුතු සඳහා පමණක් රුපියල් බිලියන 250කට වඩා රජය වැඩිපුර වියදම් කර තිබෙනවා. මීට අමතරව, අසීරුතාවට පත් වුණු ව්‍යාපාර ක්ෂේත්‍රයට සහන ලබා දෙන්නත් විශාල මුදලක් වැය කළා.

අපි දන්නවා, මේ වෙලාවේ අපට බරපතළ විදේශ විනිමය අර්බුදයක් තිබෙන බව. මගේ කථාව අවසන් කරන්න කලින් මා ඒ ගැනත් යමක් කියන්න ඕනෑ. අපි දන්නවා, යුද්ධයෙන් පසු අපේ අපනයනය ක්‍රමක්‍රමයෙන් වැඩි වූ බව. 2014 වර්ෂය වන විට අපේ රටේ වාර්ෂික අපනයන ආදායම ඩොලර් බිලියන 11.2ක් පමණ වෙලා තිබුණා. මේ ප්‍රමාණය වැඩි කර ගන්නට අපට ඉතාම පැහැදිලි සැලැස්මක් තිබුණා. නමුත්, පසු ගිය රජය ඒ සැලැස්ම ක්‍රියාත්මක කරන්න අසමත් වුණා. ඒ නිසා ඊට අවුරුදු 5කට පසුවත්, එනම් 2019 වසර වන විටත් අපේ රටේ අපනයන ආදායම වුණේ ඩොලර් බිලියන 11.9ක් පමණයි. මෙන්න මේ නිසා තමයි පසු ගිය කාලය තිස්සේම ආනයනය හා අපනයනය අතර තිබුණු ඩොලර් බිලියන 10ක පරතරය පියවා ගන්න අපට බැරි වුණේ. සාමාන්‍යයෙන් ඒ වාගේ පරතරයක් ඇති වුණාම එය පියවා ගන්න ප්‍රධාන වශයෙන්ම අප උපකාර කර ගත්තේ සංචාරක ව්‍යාපාරය සහ විදේශ ශ්‍රමිකයන්ගෙන් එන ආදායම. නමුත්, අපි හැමෝම දන්නවා, කොරෝනා වසංගතය නිසා සංචාරක ව්‍යාපාරයෙන් ඩොලර් බිලියන 4.5ක් පමණ අපට අහිමි වුණු බව. ඒ ආදායම සම්පූර්ණයෙන්ම අහිමි වෙලා ගියා. මේ තත්ත්වයට අමතරව පසු ගිය වසර දෙකේ -2020, 2021 වසරවල- විදේශ ණය වාරික වශයෙන් ඩොලර් බිලියන 11.2ක් පමණ ගෙවන්න අපට සිද්ධ වුණා. මෙන්න මේ නිසා තමයි, අද අපේ රටේ ඩොලර් සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 3කට පමණ අඩු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය යටතේ දැඩි ආනයන සීමා හරහා වෙළෙඳ පරතරය ඩොලර් බිලියන 6කට සීමා කරන්න පුළුවන් වුණත්, විදේශ විනිමය උපයන ප්‍රධාන මාර්ග ප්‍රතිෂ්ඨාපනය වනතුරු පරිස්සමින් වැඩ කරන්න තවමත් අපට සිදු වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් ආනයන සීමා කිරීම රටකට හොඳ දෙයක් නොවෙයි මේ ආකාරයේ ආනයන පාලනයකට මම කිසිසේත් කැමැති නැති වුණත්, අපට පිළිගන්න වෙනවා මේ අවස්ථාවේ අප යථාර්ථයට මුහුණ දෙන්න ඕනෑ කියලා.

අපේ රටට එන විදේශ ආයෝජන පසු ගිය කාලයේ විශාල වශයෙන් අඩු වුණා. කොරෝනා අර්බුදයෙන් එළියට එන මේ අවස්ථාවේ අපි මේ තත්ත්වය වෙනස් කර ගන්න ඕනෑ. අපට මේ අර්බුදයෙන් එළියට එන්න නම් අප කරන්න ඕනෑ බොහෝ දේ තිබෙනවා. ඒ ගැන සියලුදෙනා දන්නවා. පසු ගිය රජයත් දැනගෙන සිටියා; අපිත් දන්නවා. පසු ගිය රජයට ඒක කරන්න බැරි වුණා. නමුත්, අපි ඒක කරන්න බලාපොරොත්තු වෙනවා.

අපි සෑම අංශයකම නාස්තිය පිටු දකින්න ඕනෑ; ඵලදායිතාව වැඩි කරන්න ඕනෑ; අලුත් වෙළෙඳ පොළවල් සොයාගෙන අපනයනය වර්ධනය කරන්න ඕනෑ; ණය මත නොරැඳී දේශීය හා විදේශීය ආයෝජන උනන්දු කරවන්න ඕනෑ; ව්‍යාපාරවලට තිබෙන ණය බාධා ඉවත් කරන්න ඕනෑ. ඒ සඳහා අපට ඉතාම පැහැදිලි වැඩ පිළිවෙළක් තිබෙනවා. "සෞභාග්‍යයේ දැක්ම" ලෙස අප ඉදිරිපත් කළ ප්‍රතිපත්ති මාලාව අපි අදත් වෙනස් නොකර ඉදිරියට ගෙන යනවා. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි, මේ වසරේ පළමු මාස 6 තුළ සියයට 8ක පමණ වර්ධන වේගයක් පවත්වාගෙන යන්න අපට පුළුවන් වෙලා තිබෙන්නේ. අපි විශ්වාස කරනවා, අපේ ප්‍රතිපත්ති දිගටම අනුගමනය කරගෙන ගියොත්, ඒ ප්‍රමාණය ඉදිරියටත් පවත්වාගෙන යන්න අපට පුළුවන් වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නට ඕනෑ. ලෝකයේ අද දියුණු යැයි කියන සෑම රටක්ම වාගේ ඉතිහාසයේ යම්කිසි අවස්ථාවක බරපතළ

[ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා]

ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවා. ඒ රටවලට ඒ ප්‍රශ්නවලින් එළියට එන්න පුළුවන් වුණේ, ඒ රටවල ජනතාව ධනාත්මකව ඒ ප්‍රශ්න දිහා බලා විසඳුම් සෙවූ නිසායි. අප මේ වෙලාවේ කළ යුත්තේ ඍණාත්මකව මේ ප්‍රශ්න දිහා බලා දුක් වන එක නොවෙයි, ධනාත්මකව මේ ප්‍රශ්න දිහා බලා විසඳුම් සොයන එකයි. ඒ නිසා මම මේ රටේ බුද්ධිමත් ජනතාවට ආයාචනා කරනවා, 'අපි මේ වෙලාවේ අපේ රටේ ප්‍රශ්න දෙස ඍණාත්මකව බලන්නේ නැතිව ධනාත්මකව බලා ඒවාට විසඳුම් සොයමු' කියා. අප සියලුදෙනා එකට එකතු වෙලා විසඳුම් සෙව්වොත් අපට ඒ ප්‍රශ්නවලින් මිදෙන්න බැරිකමක් නැහැ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබ්දුල් හලීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.19]

**ගරු අබ්දුල් හලීම් මහතා**
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධයෙන් විනාඩි 4ක කාලය තුළ අදහස් ඉදිරිපත් කිරීම ඉතා අසීරු කාර්යයක් වුවත්, මා උත්සාහ කරනවා, පුළුවන් තරම් මගේ අදහස් ටික ඉදිරිපත් කරන්න.

අපි අද රටක් වශයෙන් අභියෝග රාශියකට මුහුණ දෙමින් සිටින අතර, ප්‍රශ්න රාශියක් රට තුළ නිර්මාණය වීමේ ඉඩකඩ සකස් වෙමින් පවතින කාලයක් තමයි දැන් උදා වෙලා තිබෙන්නේ. විශේෂයෙන් රට ආර්ථික වශයෙන් ගැටලු රාශියකට මුහුණ දෙමින් තිබෙනවා වාගේම, සමාජයීය වශයෙන් බලනවිටත් අනාගතයේ දී ගැටලුසහගත තත්ත්වයකට මුහුණ දීමට සිදු වෙන ප්‍රශ්න රාශියක් නිර්මාණය වෙමින් පවතිනවා. සෞභාග්‍යවත් ජීවිතයක් ගත කරන්න හීන දැකපු ජනතාව අද අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අද රජයට ප්‍රශ්න රාශියකට මුහුණ දීමට සිදු වී තිබෙනවා. ගුරු-විදුහල්පති වැටුප් විෂමතා ප්‍රශ්නය විසඳා ගන්න බැරුව දවසින් දවස එම ප්‍රශ්නය දිග්ගැස්සෙන බව අපට පෙනෙනවා. ඔවුන්ගේ උද්ඝෝෂණ මර්දනය කරන්න රජය නීතරීති පැනෙව්වාට, කොළඹට පමණක් සීමා වී තිබුණු උද්ඝෝෂණය අද හැම නගරයක් පාසාම ව්‍යාප්ත වෙමින් පවතිනවා. අනෙක් පැත්තෙන් බලන විට ගොවීන්ගේ පොහොර ප්‍රශ්නය විසඳිලා නැහැ. එම නිසා ඔවුන්ගේ විරෝධය හැම දාම අහන්නත්, දකින්නත් තිබෙනවා. ඒ වාගේම, එදිනෙදා යම් සොච්චමක් හම්බ කරපු, දෛනික ජීවිතයක් ගත කරපු අයට අද හම්බ කිරීමේ ඉඩ ඇහිරිලා තිබෙනවා. කුඩා කර්මාන්තශාලාවල වැඩ කරපු අයගේ රැකියා අද අහිමි වෙලා තිබෙනවා. ඊට අමතරව විවිධ ක්ෂේත්‍රවල නිරතව සිටි නිලධාරින්ගේ රැකියා අහිමි වෙලා තිබෙනවා. අත්‍යවශ්‍ය භාණ්ඩ ගන්න කඩවලට ගියාම, දරා ගන්න බැරි තැනට බඩු මිල ඉහළ ගොස් තිබෙනවා. රජයේ ගැසට් නිවේදනයේ තිබෙන මිලට නොවෙයි, අත්‍යවශ්‍ය භාණ්ඩ ගන්නට තිබෙන්නේ. කඩේ මුදලාලි කියන මිලටයි අද කඩවල අත්‍යවශ්‍ය භාණ්ඩ අළෙවි වෙන්නේ. රජය විටින් විට ගැසට් පළ කරන්නේත්, චක්‍රලේඛ නිකුත් කරන්නේත්, නීතිරීති පනවන්නේත් පාරිභෝගිකයා ආරක්ෂා කිරීමටයි. නමුත් අද පිට පිට ගැසට් නිවේදන පළ කරපු නිසාදෝ අද ඒ ගැසට් නිවේදනවලට ගරු කිරීමක් දකින්න නැහැ. මා හිතන හැටියට හාල් මිල පාලනය කිරීම සඳහා පමණක් ගැසට් නිවේදන 4ක් නිකුත් වුණා කියලායි. හාල් මිල තීරණය කරන්නේ රජය කියලා මා මිත්‍ර මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා පුන පුනා කිව්වත්, අද සහල් මිල තීරණය කරන්නේ ඩඩ්ලි සිරිසේන මහත්මයා කියලා අද මුළු රටම පිළිගෙන හමාරයි. සහල් මිල සම්පූර්ණයෙන්ම පෞද්ගලික වෙළෙඳුන්ගේ අතට පත් කිරීම රජයේ නොහැකියාව ප්‍රදර්ශනය කිරීමක් හා සමානයි. මේ සියල්ලටම හේතුව රජයේ නිසි කළමනාකරණයක් නොමැතිවීමයි.

අපි එදා 2015 ආණ්ඩුව පත් වුණු වහාම කළේ අත්‍යවශ්‍ය භාණ්ඩ සියල්ලේම මිල අඩු කිරීමයි. ජනතාවට සහන සැලසීමයි අපි කළේ. එපමණක් නොවෙයි, රජයේ නිලධාරින්ගේ වැටුප් වැඩි කළා. 2019 මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු අත්‍යවශ්‍ය භාණ්ඩ සියල්ලේම මිල තවත් අඩු වෙයි කියලා ජනතාව බලාපොරොත්තු වුණත්, එය හාත්පසින්ම වෙනස් වෙලා බඩු මිල වැඩි වුණා. මේ සියල්ලටම හේතුව කොවිඩ් - 19 වසංගතය කියලා ආණ්ඩුව හේතු දැක්වුවත්, හේතු වූ කොවිඩ් -19 වසංගතය ලෝකය පුරාම පැතිරුණත්, හැම රටක් වාගේම අප රටත් නොයෙකුත් පීඩාවන්ට පත් වුණත්, සමහර රටවල් ආර්ථික වශයෙන් දුර්වලතාවට පත් වුණත් සමහර රටවල් ආර්ථිකය නැවත ගොඩනැඟීමට සමත් වෙලා තිබෙනවා. නමුත් අපේ රටේ ආර්ථිකය තවම වැටීගෙන යන තත්ත්වයක් තමයි පෙනෙන්න තිබෙන්නේ. රජය මේවාට පිළියම හැටියට කළේ නෝට්ටු අච්චු ගැසීම පමණයි. එම නිසා ආර්ථිකය විශාල අවුල් ජාලයකට පත් වෙලා තිබෙනවා.

ඊළඟට, පොහොර ප්‍රශ්නය ගත්තොත්, අපි කාබනික පොහොර භාවිතයට විරුද්ධ නැහැ. කාබනික පොහොර භාවිතය ගෙනාවේ වකුගඩු රෝගය නැති කරන්න කියලා තමයි කිව්වේ. නමුත් දැන් බලනකොට චීනයෙන් ගෙන්වන මෙම කාබනික පොහොර නිසා ඊටත් වඩා භයානක රෝග ඇති වෙන්නත් ඉඩකඩ තිබෙන බව තමයි පෙනෙන්නේ. අපි කාබනික පොහොරවලට විරුද්ධ වන්නේ නැහැ. නමුත් කාබනික පොහොර භාවිතය සඳහා ගොවියා තුළ වාගේම, රට තුළත් නැඹුරුතාවක් ඇති කිරීම වැදගත්. ඒ වාගේම, ඒ වෙනුවෙන් යොමුවීමට අවශ්‍ය දැනුම, තාක්ෂණ පහසුකම්, කාලයට අනුගත සැලැස්මක් තුළින් ක්‍රම ක්‍රමයෙන් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළ යුතුයි.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රමේෂ් පතිරණ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.24]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந்தோட்ட அமைச்சர்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ වේලාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වැදගත් විවාදයේදී ඇත්තටම රජයේ පාර්ශ්වය හැටියට අපි ඉතාම සතුටට පත් වෙනවා, ඉතාම අර්බුද සහිත කාලසීමාවකින් පසු රට ක්‍රමානුකූලව ගොඩනැගෙන මොහොතක, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය යටතේ අපේ දැක්ම මේ රට වෙනුවෙන් ඉදිරිපත් කරන්න ලැබීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර 73ක නිදහස් ශ්‍රී ලංකාවේ අපි අර්බුද රාශියකට මුහුණ දීලා තිබෙනවා. අප මුහුණ පෑ ප්‍රධානතම අර්බුදය වසර 30ක් තිස්සේ මෙරට පැවති දීර්ඝ

කාලීන යුද්ධයයි. යුද්ධය අපේ ආර්ථිකය, සමාජ සංවර්ධනය විශාල පසුබෑමකට ලක් කළ බව අපි සැම කෙනෙක්ම දන්නා කාරණයක්. ඉන්පසුව විවිධ සමාජ ව්‍යසන, ආර්ථික අර්බුද ස්වාභාවික ව්‍යසන -සුනාමි, ගංවතුර වැනි ස්වාභාවික ව්‍යසන- විවිධ අර්බුද සහ යම් යම් හැළ හැප්පීම් මැද අද රට ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. 1948දී අපි නිදහස ලබා ගත් කාලයට සාපේක්ෂව සමාජ, ආර්ථික, සෞඛ්‍ය, අභ්‍යන්තර, භෞතික සංවර්ධනය ඇතුළු කරුණු රාශියකින් අපේ රට ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒ ඉදිරියට පැමිණීම, මේ කලාපයේ යටත් විජිත හැටියට පැවති රටවල් එක්ක සංසන්දනය කිරීමේදී අපේ මට්ටමට ආසන්න ප්‍රමාණයකට ළඟා වෙලා තිබෙන්නේ මැලේසියාව පමණක් ය කියන කාරණය අද අවට කලාපීය රටවල් දෙස බැලුවාටම අපට බොහොම පැහැදිලිව පෙනෙනවා.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට භාර ගන්නකොට නැවත වතාවක් අප සතුව බලාපොරොත්තු රැසක් රට වෙනුවෙන් තිබුණා. හැබැයි, එතුමා රට භාර අරගෙන මාස තුනක වාගේ කාලයක් ගත වෙද්දී, අපේ ජීවිත කාලයේ එක් වතාවක් පමණක් වෙළා ගන්නා, ලෝකයම වෙළාගත් මේ භයානක ව්‍යසනයට ගොදුරු වුණා. 1919 - 1920 කාලයේ ස්පාඤ්ඤ උණ - Spanish flu - රෝගී තත්ත්වයෙන් පස්සේ, ලෝක සෞඛ්‍ය සංවිධානය අර්ථ කථනය කරන හැටියට මෙවැනි භයානක අර්බුදයක් ලෝකයේ පැතිරිලා නැහැ. ශ්‍රී ලංකාව 1930 -1940 දශකවල මැලේරියා අර්බුදය නිසා උග්‍ර ලෙස බැට කෑවා. ඉන්පසුව ශ්‍රී ලංකාව ඉතා ප්‍රබල ලෙස සෞඛ්‍ය අර්බුදය හමුවේ බලපෑම් රැසකට නතු වුණා. හැබැයි, වගකිව යුතු රජයක් හැටියට, රජය පැත්තෙන් කැපකිරීම් කරමින්, ජනතාවගේ පැත්තෙන් කැපකිරීම් කරමින්, රාජ්‍ය වියදම් කළමනාකරණය කරමින් ජනතාවට සෞඛ්‍ය පහසුකම් උපරිමයෙන් ලබාදීමට මේ අර්බුද සහිත අවස්ථාවේදී අපේ රජය කටයුතු කළාය කියන කාරණය මම ඉතාම වගකීමෙන් ප්‍රකාශ කරනවා. ඒ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමාගේ පූර්ණ මැදිහත්වීමෙන් ලෝකයේ එන්නත් නිෂ්පාදනය කරන, එන්නත් ගෙන්වන්න පුළුවන් සෑම රටකින්ම උපරිම එන්නත් ප්‍රමාණය මේ රටට ගෙන්වා ගෙන ලෝකයේ ඉතාම සාර්ථක එන්නත්කරණ වැඩසටහනක් මේ රටේ දියත් කරන්න පුළුවන්කම ලැබුණේ. අපේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ඒක අගය කරන්නේ නැතිවීම කනගාටුවට කාරණයක්. අපි අද එන්නත්කරණය හරහා රෝගීන්ගේ ජීවිත බේරාගෙන තිබෙනවා. ඒ වාගේම අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන හදලා, ඔක්සිජන් මත යැපෙන රෝගීන්ගේ සංඛ්‍යාව අඩු කරගෙන, මේ රෝගය නිසා මරණයට පත් වන දහස් සංඛ්‍යාත ජීවිත බේරාගෙන තිබෙනවා. අදටත් අපට පෙනෙනවා, ලෝකයේ දියුණු යැයි සම්මත ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ජර්මනිය වාගේ රටවල දිනපතා අතිවිශාල ජනතාවක් කොවිඩ් රෝගය නිසා ජීවිතක්ෂයට පත් වෙන බව. ශ්‍රී ලංකාව එම රටවලට සාපේක්ෂව ඉතාම ඉහළ මට්ටමේ කොවිඩ් මර්දන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරලා තිබෙන බව ප්‍රකාශ කරන්නේ අපේ ආණ්ඩුව නොවෙයි, ලෝක සෞඛ්‍ය සංවිධානයයි. ලෝක සෞඛ්‍ය සංවිධානය ඒ බව බොහොම පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ සෞඛ්‍ය සම්පන්න ගමන රටට උරුම කර දෙමින් ආර්ථිකමය, සමාජමය වශයෙන් මේ රට නැවත නඟාසිටුවීමේ වගකීම අපි භාරගෙන තිබෙනවා කියන කාරණය බොහොම පැහැදිලිව සඳහන් කරනවා.

මැදි ආදායම් ලබන රටක් බවට අපේ රට ඉතිහාසයේ ප්‍රථම වතාවට පත් කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේදී. අපි ආපු ආර්ථික සංවර්ධන ගමන 2015න් පසුව ක්‍රමානුකූලව අතපසු වුණා. අප රට භාරදෙනකොට අපේ ආර්ථික වර්ධන වේගය සියයට 6.5ක්ව තිබුණා. එය එතැන් සිට 2016දී සියයට 5.3ට, 2017දී සියයට 4.7ආදී වශයෙන් පහළ බැහැලා එය සියයට 2.3 දක්වා අඩු වුණු බව සැම කෙනෙක්ම දන්නවා. ඒක මහ බැංකු වාර්තාවල සඳහන් වෙලා තිබෙනවා. අපේ ආර්ථික වර්ධන වේගය ගිය අවුරුද්දේ ඉතිහාසයේ අඩුම අගයක් බවට පරිවර්තනය වුණා, කොවිඩ් අර්බුදය නිසා. මේ අර්බුද හමුවේ එය කළමනාකරණය කරන්න උපරිම වෙහෙස ගත්තත් අවාසනාවකට අපේ ආර්ථික වර්ධන වේගය අඩු වුණා. හැබැයි, ඒ අඩුවෙලා තිබෙන්නේත් ගරු නාලක ගොඩහේවා රාජ්‍ය ඇමතිතුමා සඳහන් කළ පරිදි අවට කලාපයේ රටවලට සාපේක්ෂව අඩුම ඍණ අගයක් වාර්තා කරන රට වශයෙන්. මේ අර්බුදය ජය ගෙන නැවත ඉතාම හොඳින් අපට ගොඩනැගෙන්න පුළුවන් බව විද්‍යමාන වෙනවා. ඒ අනුව, 2021 වසරේ පළමු කාර්තු දෙකේදී අපේ ආර්ථික වර්ධන වේගය සියයට 8 ඉක්මවා ගොස් තිබෙනවා. අවාසනාවකට තුන්වන කාර්තුවේදී අපට නැවත මාස එකහමාරක කාලයක් රට වසා තබන්නට සිදු වුණා. ඒ නිසා තුන්වන කාර්තුවේදී අපේ ආර්ථික වර්ධන වේගය අඩු වෙයි. හැබැයි, බොහොම පැහැදිලිව අපට පෙනෙනවා, නැවත රට විවෘත කිරීමෙන් පසුව රට සාමාන්‍යකරණයට ලක්වෙමින් තිබෙන බව.

අපි විශාල ලෙස බලාපොරොත්තු තබා ගෙන ඉන්නවා, මේ රටේ සංචාරක ව්‍යාපාරය, විදේශ ආයෝජන, විවිධ අංශ සහ රටේ වෙළඳහෙළඳාම දියුණු වෙයි කියලා. එ් හරහා මේ වසර අවසන් වන විට අනිවාර්යයෙන්ම සියයට 6 ආර්ථික වර්ධන වේගයක් 2021 වසර වෙනුවෙන් වාර්තා කර ගන්න පුළුවන් වෙයි. ඒක පවතින තත්ත්වය යටතේ අපි ලබන සුවිශාල ජයග්‍රහණයක්. ඒ ජයග්‍රහණය ලබන්න මේ රටේ ජනතාව බොහෝ ඉවසීමෙන් කටයුතු කරමින් සහයෝගය දුන් බවත් අපි සිහිපත් කරන්න අවශ්‍යයි. ඔව්, ඔවුන්ට ගැටලු තිබෙනවා. බඩු මිල වැඩිවීම නිසා ඔවුන් අර්බුදයට ලක් වෙලා තිබෙනවා. ආදායම් අහිමි වීම නිසා ඔවුන්ට ගැටලු මතු වෙලා තිබෙනවා. ඔවුන්ගේ දරුවන්ගේ පාසල් අධ්‍යාපනය අහිමි වීම නිසා ඔවුන් පීඩාවට පත් වෙලා තිබෙනවා. හැබැයි, ඒ සියලු දුක් ගැහැට ඉවසා ගෙන ශ්‍රී ලංකාවේ ජනතාව ඉතා විශාල කැප කිරීමක් කළා. අපි ඒ කැපවීම අගය කරනවා. ඒ කැපවීම වෙනුවෙන් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඇතුළු ශ්‍රී ලංකා රජය හැටියට අපට කරන්න පුළුවන් උපරිම කැපවීම කරන්න අපි ලැහැස්ති වෙලා ඉන්නවා කියන කාරණයත් අපි ඉතා වගකීමෙන් ප්‍රකාශ කරනවා.

මේ අර්බුද සහිත කාල සීමාවේ බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිවරයා වශයෙන් වැඩ භාර ගැනීමෙන් පසු අප්‍රමාණ කැපවීමකින් කටයුතු කරමින් සිටිනවා. සාමාන්‍ය දේශපාලනයෙන් ඔබ්බට ගිය විශිෂ්ට භූමිකාවක් එතුමාගේ කැප කිරීම හරහාම එතුමා ලබා දෙනවා. මේ සියලු ක්ෂේත්‍ර අධ්‍යයනය කරමින්, පසු විපරම් කරමින්, මේ කරුණු පිළිබඳව නැවත නැවතත් සොයා බලමින් ඉතාම විශිෂ්ට ආර්ථික ඉදිරි ගමනක් එතුමාගේ කැපවීම තුළින් ලබා දෙනවා. පසුගිය 2020 වසරේදී අපේ වෙළෙඳ ශේෂය ලංකාවේ මෑත ඉතිහාසයේ අඩුම අගය වාර්තා කළා. ඒ අනුව, වෙළෙඳ හිඟය හැටියට ඩොලර් බිලියන 6ක ප්‍රමාණයක් තමයි වාර්තා වුණේ. අපේ අපනයන ආදායම් ක්‍රමානුකූලව ඉහළ යමින් තිබෙනවා. අපේ සමහර ආනයන වියදම් අපි පාලනය කරගෙන තිබෙනවා. ඒ නිසා ගිය අවුරුද්දටත් වඩා මේ අවුරුද්දේ අපේ ආනයන වියදම අඩු වෙලා එය ඩොලර් බිලියන 5 දක්වා අඩු වෙයි කියා අපි විශ්වාස කරනවා. ඒ සඳහා අපනයන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය වෙනුවෙන් කරන්න පුළුවන් කටයුතු රාශියක් අපි සිදු කරමින් තිබෙනවා.

පසු ගිය කාල සීමාව පුරාම අපේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රේෂණ අඩු වුණාට, අපේ අපනයන ක්ෂේත්‍රයට අදාළ ඇඟලුම් වේවා, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය වේවා ඒවායේ විශාල වර්ධනයක් පෙන්නුම් කරන බව අපි ඉතාම සතුටින් සඳහන් කරනවා. මා නියෝජනය කරන අමාත්‍යාංශයට අදාළ තේ, පොල්, රබර් ඇතුළු අංශවලින් අපි 2020 වසරේදී රුපියල් බිලියන 3.1ක ආදායමක් ලැබූ බවත් මා ඉතාම සතුටින් සඳහන් කරනවා. මේ වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස 8ක කාලය තුළ අපි ඩොලර් බිලියන 2.5කට අධික වත්කමක් උපයා ගෙන තිබෙනවා.

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

පුරෝකථන අනුව අපි අනිවාර්යයෙන්ම ඩොලර් බිලියන 4.3ක ආදායමක් තේ, පොල්, රබර් ක්ෂේත්‍රවලින් ලබා ගෙන තිබෙනවා. පොල් අපනයනයෙන් ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම වාර්තා කරන වර්ෂය 2021 වර්ෂයයි. රබර් ආශ්‍රිත නිෂ්පාදනවලින් ඉතිහාසයේ වැඩිම ආදායම වාර්තා කරන වර්ෂයත් 2021යි. කුරුඳු ඇතුළු අපනයන භෝග අංශයෙන් ලංකා ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම වාර්තා කරන වර්ෂය වන්නේත් 2021යි. ඒ නිසා අපි විශ්වාස කරන විධියට, 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී ශ්‍රී ලංකා වැවිලි ක්ෂේත්‍රයෙන් පමණක් ලබා තිබෙන අපනයන වර්ධනය සියයට 25කට ආසන්න වෙනවා. ඒ නිසා ඇඟලුම් ක්ෂේත්‍රයේ වර්ධනය, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනය වාගේම නැවත සංචාරක විනිමය ඉපැයීම්, නැවත අපේ ශ්‍රමිකයන් විදේශගත වීම හරහා ලැබෙන විදේශ ප්‍රේෂණ ඇතුළු කරුණු කාරණා ගණනාවක් හරහා අපේ රටට නැවත ආර්ථික වශයෙන් ශක්තිමත් යුගයක් උදා වෙන ලකුණු සෑම අතින්ම දැන් පහළ වෙලා තිබෙනවා. අපි 2022 වර්ෂයට පිය නඟන්නේ අලුත් බලාපොරොත්තුවක් සහිතවයි. එම බලාපොරොත්තුව 2022 අය වැය ලේඛනය තුළින් ප්‍රකටව විද්‍යමාන වනු ඇති බවත් ඉතාම ගෞරවයෙන් සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.32]

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් විවාදයක් පැවැත්වෙන අවස්ථාවේ මට මේ ගරු සභාව ආමන්ත්‍රණය කරන්න ලැබීම ඉතා සතුටට කාරණයක්. අපි දන්නවා, "අපි හොඳට කළා" කියන යහ පාලන නඩය කොහොමද කටයුතු කළේ කියලා. ඒ පිළිබඳව මට පෙර කථා කළ කථිකයන් සඳහන් කළ නිසා මාත් ඒ ගැන කථා කරන්නේ නැහැ. නමුත්, අවාසනාවකට අද විපක්ෂයේ සිටින තමුන්නාන්සේලා එදා කටයුතු කළ ආකාරයේ හොඳකම නිසා තිබෙන ප්‍රශ්න දෙගුණ, තෙගුණ වුණා කියන එක අමතක කරන්න නම් එපා. අද තමුන්නාන්සේලා කටයුතු කරමින් ඉන්නේ හරියට එළුවාගේ පසු පස ගිය එකා කටයුතු කළ විධියට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ අපට තිබෙන ප්‍රධාන අභියෝග මොනවාද, මේ රජය බලයට පත් කරන අවස්ථාවේ තිබුණු අභියෝගවලට අලුත් ඒවා එකතු වෙලා තිබෙනවාද කියලා අප හඳුනා ගත යුතුව තිබෙනවා. අපි රජය භාර ගත් වෙලාවේ මූලික අභියෝග තුනක් තිබුණා. ඒවා තමයි, මේ රටේ තරුණයන්ගේ අපේක්ෂා ඉෂ්ට කරන්නේ කොහොමද, මේ රටේ ආර්ථිකය සංවර්ධනය කරන්නේ මොන ආකාරයටද සහ පැවැති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබුණු විකෘති වෙනස් කරන්නේ කොහොමද කියන අභියෝග තුන.

නමුත්, අවාසනාවකට මුළු ලෝකයම මේ වසංගතයට ගොදුරු වීමත් සමඟ අවුරුදු දෙකකට ආසන්න කාලයක් ලෝකයම අකර්මණ්‍ය වෙලා තිබුණා. කුඩා ආර්ථිකයක් සහිත අපේ රට එවැනි අවස්ථාවක අභියෝගවලට මුහුණ දීම අලුත් දෙයක් නොවෙයි. මේ කොවිඩ් වසංගතයත් එක්ක එකතු වෙච්ච අලුත් අභියෝග ගණනාවක් තිබෙනවා. ඒකෙන් බොහෝ අභියෝග රටක් විධියට අපි මේ වෙනකොට ජයග්‍රහණය කර හමාරයි. අද අපේ රටේ මහජනතාව සුරක්ෂිතයි. වයස අවුරුදු 60ට වැඩි, වයස අවුරුදු 30ට වැඩි, වයස අවුරුදු 20ට වැඩි පිරිස්වලට එන්නත් ලබා දීම මේ වන විට අවසාන වෙමින් පවතින්නේ. අපි තමුන්නාන්සේට මේ කාරණය කියන්නේ ඉතාම සතුටින්. අවුරුදු 15ට වැඩි වයස් කාණ්ඩයටත් මේ සුරක්ෂිතතාව ලබා දීම සඳහා අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ඒ කණ්ඩායම සියලු කටයුතු සංවිධානය කරලා හමාරයි. ඒක නිසා මේ සියල්ල හමුවේ අපට තිබෙන ජයගත යුතු ප්‍රධානම අභියෝගය තමයි, අපේ ආර්ථිකය නිවැරදි මාවතකට ගන්නේ කොයි ආකාරයටද කියන එක. ඒ සඳහා කවර නම් වූ උපකරණ අපට පාවිච්චි කළ හැකිද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයක් පැවතිය යුත්තේ සියලු අංශ ධෛර්යවත් කිරීම සඳහා පමණයි කියා මා විශ්වාස කරනවා. පෞද්ගලික අංශය ධෛර්යවත් කරන ආකාරයට රජය කටයුතු කළ යුතුයි. පෞද්ගලික අංශය වැඩි වශයෙන් ආයෝජන කිරීම සඳහා පෙලඹෙන ආකාරයට කටයුතු කළ යුතුයි. පෞද්ගලික අංශය රටේ ආර්ථිකයේ ප්‍රධාන අංශය බවට පත්වන ආකාරයට කටයුතු කළ යුතුයි. ආණ්ඩුව මේ හැම එකකටම උත්තර හොයන්න යෑම අපි විශ්වාස කරන ආර්ථික න්‍යායට අනුව හොඳ දෙයක් කියා මා විශ්වාස කරන්නේ නැහැ. ඕනෑම දෙයකට ආණ්ඩුව මැදිහත් කර ගැනීම සඳහා විපක්ෂය දත කන්නේ මෙන්න මේ කියන යථාර්ථය තේරුම් නොගෙන. ඒ නිසා රජය සෑම වෙලාවකම වෙළෙඳ පොළ වෙත මැදිහත් විය යුත්තේ අවශ්‍ය අවස්ථාවක පමණයි. වෙළෙඳ පොළ වෙත මැදිහත් වීම සඳහා සාම්ප්‍රදායිකව පාවිච්චි කරන සමහර උපකරණ අදට වලංගු නොවන බව අපට පෙනෙනවා. ඒ නිසා අපට අලුත් උපකරණ කට්ටලයක් සොයා ගත යුතුව තිබෙනවා.

මිල පාලනය කිරීම සඳහා මිල සීමා පැනෙව්වාට නිෂ්පාදන අංශයේ කිසියම් ආකාරයක අභියෝගාත්මක තත්ත්වයක් තිබෙනවා නම්, මිල පාලනයෙන් ඒකට විසඳුම් සොයා ගැනීමට පුළුවන්කමක් නැහැ. ඒ නිසා රජය වෙළෙඳ පොළ වෙත මැදිහත් වීම සඳහා කටයුතු කළ යුත්තේ තීරණාත්මක අවස්ථාවක පමණයි. ඒ නිසා රජය තීන්දුවක් ගත්තා, "ඔව්, සියලු ගැසට් නිවේදන අපි අවලංගු කරනවා. වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වයේ හැසිරීමට අවශ්‍ය පහසුකම සලසනවා. හැබැයි, අවශ්‍ය අවස්ථාවලදී රජය වෙළෙඳ පොළ වෙත මැදිහත් වෙනවා" කියලා. එතකොට පෞද්ගලික අංශය ජාතික වගකීම තේරුම් අරගෙන කටයුතු කරනවා. ඒ නිසා රජයට පුළුවන්කම තිබෙනවා, අත්‍යවශ්‍ය අවස්ථාවල වෙළෙඳ පොළ වෙත මැදිහත් වන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටට අවශ්‍ය සියලු දේවල් එක ස්ථානයකින් නිෂ්පාදනය කරලා වෙළෙඳ පොළට ඉදිරිපත් කරන්න ආණ්ඩුවට පුළුවන් කියලා මා කිසි ලෙසකින් විශ්වාස කරන්නේ නැහැ. එහෙම යුග තිබුණා. ඒ යුගවල අත්දැකීම් අපි නැවත විචාරණය කළොත් අපට පෙනෙනවා, ඒවායේ අඩු පාඩු බොහොමයි කියලා. ඒක නිසා රජය ඊයේ තීන්දුවක් ගත්තා, සිමෙන්ති, කිරි පිටි වාගේ අත්‍යවශ්‍ය දේවල්වල මිල පාලනය සඳහා රජය මැදිහත් වන ප්‍රමාණය අවම කරන්න. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය මේ කටයුත්තෙන් ඈත් වෙලා ඉන්න බව එයින් කියන්නේ නැහැ. රජය උත්සාහ කරන්නේ වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වයේ යෙදෙන අතරවාරයේ අවශ්‍ය අවස්ථාවල වෙළෙඳ පොළට මැදිහත් වෙලා මේ කටයුත්ත සංවිධානය කරන්නයි. අපේ වැඩ පිළිවෙළ පිළිබඳව තමුන්නාන්සේලා දන්නවා. ඒක තීරණාත්මක වැඩ පිළිවෙළක් බව අතිගරු ජනාධිපතිතුමා තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේදී ඉදිරිපත් කළා. මුදල් ඇමතිතුමා දැන් එම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යමින් ඉන්නවා. රට තුළ විශාල විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා, නව මුදල් ඇමතිතුමා වැඩ භාර ගත්තාට පස්සේ මේ රටේ ආර්ථිකය කිසියම් ආකාරයක ඉදිරිගාමී වැඩ පිළිවෙළකට මෙහෙයවයි කියලා.

ඒක අපි දකිනවා. ඒක අපට පෙනෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අතීතයේ මීට වඩා තීරණාත්මක අවස්ථා අපි පසුකර තිබෙනවා. ඒ නිසා රටක් විධියට මේ අභියෝගය ජය ගැනීම සඳහා වන ප්‍රතිපත්තිදාමය අපි ක්‍රියාවට නංවමින් සිටින්නේ. රජයේ ආයතන ලාභදායී ආයතන බවට පත් කිරීමටත්, ඒවායින් රජයට ලැබෙන වාසිය වැඩි කර ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතිනවා. ඒ විතරක් නොවෙයි. සහන අවශ්‍ය අයට සහන සැලසීමේ වැඩ පිළිවෙළ අඛණ්ඩව සිදු වෙමින් පවතිනවා. ඊයේ ඉදිරිපත් කළ, 2022 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත මඟින් රජයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ අලුත් අත්දැකීමක් අපේ රටට ලබා දෙනවා ඔබතුමා දකින්නට ඇති.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන්ම මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. රජයේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ කථා කරනකොට මේ අවුරුද්ද පමණක් නොවෙයි, මේ අවුරුදු දෙකේම ආර්ථික තත්ත්වය ගැන අපි කථා කරන්න ඕනෑ. රජයේ වාර්තාව මොකක්ද? ඇත්තෙන්ම කියනවා නම්, මේ රජය ආර්ථිකය ඉතා දුර්වල තත්ත්වයකට තමයි පත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනතාව හිඟාකන තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඔවුන් ගෙදර තිබෙන රන් ආභරණ උගස් කරන තත්ත්වයට පත් කර තිබෙනවා. රජයේ ඇති ඇමතිවරු කියනවා, "තුන් වේල කන්නේ නැතිව දෙවේලක් කාලා මේ රටේ ජනතාව හිටියොත් ඇති" කියලා. අද ඒ තත්ත්වට රට පත් වෙලා තිබෙනවා. ඇත්තෙන්ම අපි මේ වාර්තාව මොකක්ද කියලා සංසන්දනය කර බලන්න ඕනෑ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දුන්න "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති මාලාවත් සමඟ සංසන්දනය කරනකොට ඇත්තෙන්ම කියපු දේද කරලා තිබෙන්නේ? පොරොන්දු වුණු දේද රටට අද මේ ආණ්ඩුවෙන් කරලා තිබෙන්නේ? එහෙම නැත්නම් අපි විශාල ආර්ථික ගැටලුවකට මුහුණ දීලා තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකය ගැන කථා කරනවා පමණක් නොවෙයි, පරිසර හානිය, කැලෑ කැපීම, මුහුදු පරිසරයට හානි සිදුවීම, මත්ස්‍ය ජීවීන්ට හානි සිදුවීම ගැනත් අපි කථා කළ යුතුයි. මේක කරුමයක්ද, නැද්ද කියන්න මම දන්නේ නැහැ, මේ වන විට නැව් දෙකක් හානියට පත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳ රජය තවමත් නිල ප්‍රකාශයක් කරලා නැහැ. ඒවායෙන් වන්දි ලබා ගන්නේ කොහොමද, වන්දි ලබා ගත්තාද කියන දේවල් පිළිබඳ මේ උත්තරීතර පාර්ලිමේන්තුව දැනුවත් කළොත් හොඳයි කියන එක මේ අවස්ථාවේදී ආණ්ඩුවට කියා සිටිනවා.

අධ්‍යාපනයත් ඒ වාගේමයි. ඒ වාගේම තමයි විරැකියාව. තරුණ තරුණියන්ට රැකියා ලබා දෙනවා කියලා පොරොන්දු රාශියක් දුන්නා. හැබැයි, මේ වනවිට ආණ්ඩුව ඒ ගැන කථා කරන්නේ නැහැ. කොපමණ රැකියා ප්‍රමාණයක් දීලා තිබෙනවාද, විරැකියාවෙන් සිටින තරුණ තරුණියන්ගේ තත්ත්වය මොකක්ද කියන එක පිළිබඳ මේ ආණ්ඩුව මේ උත්තරීතර සභාවට, මේ රටට හෙළි කළොත් හොඳයි කියලා මම මේ අවස්ථාවේ සඳහන් කරනවා.

අද මේ රජයෙන් පෝලිම් යුගයක් ආරම්භ කරලා තිබෙනවා. කිරිපිටි පෝලිම, ගෑස් පෝලම, සිමෙන්ති පෝලිම, බැංකුවල ඩොලර් පෝලිම අද ඇති වෙලා තිබෙනවා. අද පෝලිම් යුගයක් ආරම්භ කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය දවසකට රුපියල් බිලියන 14ක් පමණ වියදම් කරනවා. හැබැයි, දවසක ආදායම රුපියල් බිලියන 4යි. දවසට වැය වන මුදල පියවා ගැනීමටවත් මේ රජයට බැරි වෙලා තිබෙනවා. අපි යෝජනා කරන්නේ මීට වඩා හොඳ පාර්ලිමේන්තු කණ්ඩායමක්, පාර්ලිමේන්තු දේශපාලන නායකයන් කණ්ඩායමක් රජයත් සමඟ එකතු කරගෙන ආර්ථික සහ පරිසර හානිවලට පිළිතුරු ලබා දීමට යන්ත්‍රණයක් හදා ගන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුෂාන් ගුණවර්ධන මහත්මයාගේ ප්‍රකාශ දිහා බැලුවාම මට හිතෙන්නේ, වියත් මග නියෝජනය කරන පුද්ගලයකු හැටියට එතුමා අද කරන ප්‍රකාශ ගැන රජය මීට වඩා සැලකිල්ලක් යොමු කරන්නට ඕනෑ කියලායි.

විශේෂයෙන්ම අපි කථා කරන්න ඕනෑ GSP plus පිළිබඳව. 2017දී අපේ ආණ්ඩුව කාලයේ ඉතා අමාරුවෙන් තමයි රටට නැවත GSP plus සහනය ලබා ගත්තේ. හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටිනවා. ඉතා අමාරුවෙන් තමයි ඒ GSP plus සහනය නැවත වරක් ලබා ගත්තේ. 2010දී තමයි අපට ඒ GSP plus සහනය නැති වුණේ. නැවත වරක් GSP plus සහනය ලබා ගත්තාට පස්සේ, දැන් රජයේ පාර්ශ්වය කියනවා විපක්ෂය මේකට විරුද්ධයි කියලා. අපේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා යුරෝපා සංගමයෙන් ආපු මහත්වරුන් හමු වෙලා රට වෙනුවෙන් ඉල්ලීමක් කළා, මේ GSP plus සහනය තවදුරටත් ලංකාවට ලබා දෙන්න කියලා. එයින් ලබන සහනය, අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් මිලියන 400කට කිට්ටු වෙනවා. එය නතර කරන්න එපා කියන ඉල්ලීම තමයි එදා අපේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා කළේ. මේ ගැන තව කරුණු කාරණා රාශියක් කථා කරන්නට තිබුණත්, කාලය ප්‍රමාණවත් නොමැති නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.45]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදය පවත්වන්නේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව-2021 ගැනයි. විවාදයේදී කොයි තරම් දුරකට මේ කාරණාව පිළිබඳව කථා කළාද කියන එක ප්‍රශ්නයක් වුණත්, අපි පුළුල් සංවාදයක් බවට පත් කළ යුතු මාතෘකාවක් තමයි සාකච්ඡා වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නා ඉතිහාසයේ විතරක් නොවෙයි අපි නොදන්නා ඉතිහාසයේත් බරපතළම ආර්ථික අර්බුදයට දැන් මුහුණ දෙමින් සිටිනවාය කියන කාරණය අපි අමතක කරන්න හොඳ නැහැ. අපි දන්නවා පළමුවැනි ලෝක යුද්ධය, දෙවැනි ලෝක යුද්ධය, 1930 ගණන්වල තිබුණු මැලේරියා වසංගතය, 1971 සහ 1988-89 කාලවල ලංකාවේ

[ගරු වීරසුමන වීරසිංහ මහතා]

තිබුණු අභ්‍යන්තර අරගළ සහ තිස් අවුරුදු යුද්ධය කියන මේ කිසිවක් තිබුණු කාලවලත් අපේ රට මෙතරම් බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නේ නැති බව. බරපතළ ආර්ථික අර්බුදයකට රට ගොනු වෙලා, එහෙම නැත්නම් මුහුණ දීලා තිබෙනවාය කියන කාරණාව පිළිගත්තොත් තමයි අපට මේ ගමන් මඟ වෙනස් කරන්නට තීන්දු තීරණ ගන්න පුළුවන්කම ලැබෙන්නේ. හැබැයි, මම කියන්නේ නැහැ කොවිඩ් - 19 වසංගතය නිසා මේ සියල්ල සිද්ධ වුණාය කියලා. කොවිඩ් 19 වසංගතය මේ තත්ත්වය තීව්‍ර කරන්න, උග්‍ර කරන්න යම් තීරණාත්මක සාධකයක් බවට පත් වුණා. නමුත් සම්පූර්ණයෙන්ම කොවිඩ් 19 නිසා ආර්ථික අර්බුදය ඇති වුණා කියන කාරණය අපි විශ්වාස කරන්නේ නැහැ.

නමුත්, අපි අමතක නොකළ යුතු කාරණයක් තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය සඳහන් කරනවා අපි දැන් ගමන් කරමින් සිටින්නේ, ගත කරමින් සිටින්නේ කොවිඩ් -19 වසංගත තත්ත්වයේ මැද කාලය කියලා. ඒ කියන්නේ මේ ගත කළා වාගේ කාලයක් ඉස්සරහට තවත් යන්න වෙනවා. සරලව කියනවා නම්, තව අවුරුද්දක් හමාරක් අපට මේ විධියට ගත කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා ඒ සියල්ල උපකල්පනය කරමින් තමයි අපේ ආර්ථික ගමන් මඟ තීරණය කරන්න සිද්ධ වෙන්නේ. ඒ වෙනුවෙන් තමයි රජය ප්‍රතිපත්තිමය තීන්දු සියල්ල අරගෙන, එන්නත් කිරීම සඳහා බරපතළ තීන්දු සියල්ල අරගෙන අද වෙනකොට මේ අර්බුදයට මුහුණ දෙන්න කටයුතු කරලා තිබෙන්නේ.

මේ තීරණාත්මක වැදගත් සාකච්ඡාවට එකතු කිරීමට කාරණා රාශියක් තිබුණා වුණත් ලැබී ඇති වේලාව ඉතාම සීමිත බැවින්, තව කාරණා කිහිපයක් පමණක් කෙටියෙන් සඳහන් කරන්න මම බලාපොරොත්තු වෙනවා. 1948ට කලින් අපේ රටේ තිබුණේ වැවිලි ආර්ථිකයක්. එදා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අය වැය සඳහා ඉදිරිපත් කළේ පුනරාවර්තන වියදම් විතරයි. 1948න් පසුව තමයි අය වැය යෝජනාවලට ප්‍රාග්ධන වියදම් ඇතුළත් කරලා සාකච්ඡා කළේ. එදා ඒ බදු ප්‍රතිපත්ති පිළිබඳව, බදු ක්‍රම පිළිබඳව පැහැදිලිව සඳහන් වුණා. 1952දී පටන් ගත්ත, -එහෙම නැත්නම් 1948-56 කාල සීමාවේ- ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ රජය කාල සීමාවේ තමයි අපේ රටට විදේශ විනිමය ගෙනෙන්න, එහෙම නැත්නම් විදේශ ආධාර ව්‍යාපෘති ලබා ගන්න වැඩි අවධානයක් යොමු වුණේ. එතෙක් කාලයක් පැවතුණේ පෞද්ගලික අංශය මුල් කර ගත් වැවිලි ආර්ථිකයක්. 1956න් පසුව රටේ ආර්ථිකය වෙනස් වුණා, රාජ්‍ය භාගය ශක්තිමත් වුණා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාට සහ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට පින් සිදු වෙන්නට ඒ ආර්ථික උපක්‍රම තුළ අපේ රටේ රාජ්‍ය භාගය, රාජ්‍ය කොටස ඇඩී ලෙස ශක්තිමත් වුණා. මහජන බැංකුව ස්ථාපිත කිරීම, ලංකා බැංකුව ජනසතු කිරීම, ජාතික ඉතිරිකිරීමේ බැංකුව - NSB - ස්ථාපිත කිරීම සහ වරාය, ඛනිජ තෙල් සංස්ථාව සහ බස් සමාගම් ජනසතු කිරීමේ ව්‍යාපාරය තුළ දැවැන්ත රාජ්‍ය භාගයක් නිර්මාණය වුණා. ඒ කාල සීමාව තුළ අපේ රට යම් දිශානතියකට ගමන් කළා, 1970-77 ආණ්ඩුව යටතේ. 1970-77 ආණ්ඩුව යටතේ වූ ඒ ගමන 1977දී බලයට පත්වුණු ආණ්ඩුව සම්පූර්ණයෙන් වෙනත් track එකකට දැම්මා. එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා "ධර්මිෂ්ඨ සමාජයක්" කියන තේමා පාඨය යටතේ බලයට ඇවිල්ලා රට යොමු කළ track එකේ දැන් අපි අවුරුදු 43ක් තිස්සේ ගමන් කරනවා. මේ ඛේදනීය තත්ත්ව සියල්ලේම රහස, -මේ ආර්ථික ගමන් මඟ, නව ලිබරල්වාදී විවෘත ආර්ථික ගමන් මඟ- ඒ ගමන් මඟ වැරදි එකක් වීමයි.

ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගේ කථාවේදී ඒ ගැන වැඩි අවධානයක් යොමු නොවුණත්, 1977දී රොනී ද මැල් මැතිතුමා අය වැය ඉදිරිපත් කරමින් කළ කථාවෙන් උපුටාගත් කාරණා කිහිපයක් එතුමාගේ කථාවේදී සඳහන් කළා. රොනී ද මැල් මැතිතුමාගේ ආර්ථික ක්‍රමය මා පිළිගන්නේ නැති වුණත්, එතුමා නව ලිබරල්වාදී ආර්ථිකයක් කරා ගමන් කරමින් පළමු අය වැය ගෙනාපු වෙලාවේ, එතුමා සඳහන් කර තිබෙන කාරණයක් කෙරෙහි මගේ අවධානය යොමු කළා. ඒ අය වැය කථාවේ එක තැනක එතුමා මෙසේ සඳහන් කරනවා:

> "...මා ඉදිරිපත් කරන්නේ නිදහස් නිවහල් ආර්ථිකයක් ගොඩනැංවීමේ පවිත්‍ර චේතනාවකින් යුතුවයි."

අය වැය කථාවේ එසේ කියමින් තමයි එතුමා මේ අලුත් ආර්ථික ක්‍රමය හඳුන්වා දුන්නේ. දැන් අපි අවුරුදු 43ක් ආපස්සට හැරී බලනකොට ඒ ප්‍රකාශය කොයි තරම් සාධනීයද කියන එක කල්පනා කර බලන්න ඕනෑ. එතුමා ඒ අය වැය කථාවේදී විදේශ ණය ගැනත් සඳහන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රොනී ද මැල් මැතිතුමා එදා මෙසේ ප්‍රකාශ කර තිබෙනවා:

> "අපට සඳහටම අඳුරු මූලා ගුහාවක රැඳී සිටිය නොහැකිය. අපට ලොව පුරා මුදල් හිඟමනේ යෙදී සිටීමට බැරිය. අපට ජාත්‍යන්තර හිඟන්නන් වන්නට බැරිය. මෙම විෂම චක්‍රයෙන් ගැලවිය යුතුය. ගොඩ ගැසෙමින් තිබෙන ණය කන්දරාවකට යට වන්නට බැරිය. විදේශීය සහ දේශීය ණය කන්ද ඉහළට නගිමින් තිබේ".

මේ අඳෝනාව -ශෝකාලාපය- තමයි 1977දී රොනී ද මෙල් මැතිතුමා ඉදිරිපත් කරපු අය වැය කථාවේ තිබුණේ. හැබැයි අපි මතක තබා ගන්න ඕනෑ, එදා -1977දී- සිරිමාවෝ මැතිනිය රට භාර දෙනකොට මේ රටේ විදේශ ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 750ක් බව. අද මේ කථා කරන මොහොත වන විට, -මුදල් රාජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. එතුමා සාක්ෂි දරාවි.- අපි ඩොලර් බිලියන 48කට, 50කට ආසන්න විදේශ ණය ප්‍රමාණයකුත්, රුපියල් ට්‍රිලියන 15කට වැඩි දේශීය ණය ප්‍රමාණයකුත් එක්ක දැවැන්ත ණය කන්දරාවක හිර වෙලා ඉන්නවා, අවුරුදු 43ක් අර ආර්ථික උපක්‍රම එක්ක ගමන් කිරීම තුළ.

මේ ණය උගුලේ හිර වෙන්න හේතු ගණනාවක් තිබෙනවා. කාරණා වශයෙන් සඳහන් කරනවා නම්, අපේ විදේශ විනිමය සංචිතය ඩොලර් බිලියන 5ක, 6ක සීමාවට පහත වැටී තිබීම, ගෙවුම් ශේෂ හිඟය, ඒ වාගේම අපේක්ෂිත ආයෝජකයන් අප රටට නොපැමිණීම, රාජ්‍ය ආදායම පහත වැටී තිබීම එයට බලපා තිබෙනවා. 1978දී සියයට 24ක් වෙච්ච අපේ රාජ්‍ය ආදායම, 2014 වනකොට සියයට 14 දක්වා අඩු වෙලා, 2019දී සියයට 6ක් දක්වා අඩු වෙලා, අද මේ මොහොත වනකොට සියයට බින්දුව දක්වාම රාජ්‍ය ආදායම අඩු වෙලා තිබෙනවා. ඒ ආකාරයට, රාජ්‍ය ආදායමේ හිඟය මේ කාරණාවට බලපා තිබෙනවා.

අපේ රටේ ඉතුරුම්කරණයක් නොමැති වීමත් ප්‍රධාන කාරණාවක්. රටක් විධියට දියුණු වෙන්න නම්, පුද්ගලයකු විධියට දියුණු වෙන්න නම්, ආර්ථිකයක් හෝ ව්‍යාපාරයක් දියුණු වෙන්න නම් ඉතුරුම් සහ ආයෝජන තමයි ප්‍රධාන ශක්තිය බවට පත් වෙන්න ඕනෑ. අපට මේක ඉගැන්වූයේ බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනාවලින්. 1947දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මුදල් ඇමතිවරයා විධියටත්, මා කලින් කියූ පරිදි, රොනී ද මැල් ඇමතිතුමා 1977දී අය වැය ඉදිරිපත් කළ අවස්ථාවේදීත් මුදල් පරිහරණය කරන්න ඕනෑ කොහොමද කියන කාරණාව පැහැදිලි කර තිබෙනවා, බුදුරජාණන් වහන්සේ දේශනා කළ සිඟාලෝවාද සූත්‍රයේ මෙන්න මේ ගාථාව උපුටා දක්වමින්.

> "එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය - ද්විහි කම්මං පයොජයේ; චතුත්ථඤ්ච නිධාපෙය්‍ය - ආපදාසු භවිස්සති."

මේ කාරණාව එදා කිව්වාට, ඒ කාල පරිච්ඡේදයේම අපේ රටේ ඉතුරුම්කරණය අන්ත හිඟන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා වර්තමාන මුදල් අමාත්‍යතුමා ප්‍රමුඛ මුදල් අමාත්‍යාංශයට

ප්‍රධාන තීන්දුවක් ගැනීමට සිදු වේවි, මේ ඉතුරුම්කරණය ශක්තිමත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ මොහොතේ ප්‍රධාන අර්බුද තුනකට මුහුණ දෙනවා. පළමු අර්බුදය තමයි, බඩු මිල පිළිබඳ අර්බුදය. දෙවැනි අර්බුදය පොහොර ප්‍රශ්නය. අපි එය විවෘතව හා ස්වයං විවේචනාත්මකව පිළිගන්නවා. තුන්වන අර්බුදය තමයි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන අර්බුදය. මේ අර්බුද තුන විසඳන්නේ නැතුව අපට රටක් විධියට ඉස්සරහට යන්න බැහැ. බඩු මිල සම්බන්ධ අර්බුදය විසඳන්න නම් රාජ්‍ය අංශය, රාජ්‍ය භාගය ශක්තිමත් කරන්න ඕනෑ. සතොස, සමුපකාර වැනි ව්‍යාපාර දියුණු කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කතාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මට තව තත්පර 30ක පමණ කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක එක් අමාත්‍යාංශයකට පමණක් කළ හැකි දෙයක් නොවෙයි. මේ සඳහා සියලු අමාත්‍යාංශ එකතු වෙන්න ඕනෑ. වෙළෙඳ අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා ප්‍රවාහන අමාත්‍යාංශය කියන අමාත්‍යාංශ සියල්ල එක්ව මේ කටයුත්ත කරන්න ඕනෑ. ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රශ්න විසඳන්නත් මැදිහත් වෙන්න ඕනෑ. පොහොර ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ වනවිට යම් සාධනීය උත්තරයක් ලැබිලා තිබෙනවා. එය ඉතා හොඳ, වැදගත් සංකල්පයක්. පරිවර්තන කාලයකට නොයාම තුළ යම් අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා. පරිවර්තන කාලයකුත් එක්ක මේ අභියෝගය ජය ගන්න අපි කවුරුත් මැදිහත් වෙමු කියන ආරාධනය මා කරනවා.

2022 අය වැය පෙනෙන මානයේ ඉන්න මේ මොහොතේ අපි කවුරුත් එකතු වෙලා, 2022 අය වැය ශක්තිමත් අය වැයක් බවට පත් කරලා, මේ රට ශක්තිමත් ආර්ථිකයක් ඇති රටක් බවට පත් කරමු.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.53]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய சபை ஒத்திவைப்பு வேளையின்போதான விவாதத்திலே கலந்துகொண்டு, என்னுடைய கருத்துக்களைத் தெரிவிப்பதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இன்று இந்த அரசாங்கத்தின் சில செயற்பாடுகளைப் பார்க்கின்றபோது, அரசாங்கமானது மீண்டும் இனவாதத்தைக் கையிலெடுத்து, ஏதோவொரு திட்டத்தைத் தயாரிக்க முனைவதாகவே தோன்றுகின்றது.

இந்த அரசாங்கமானது, பெரும்பான்மைச் சமூகத்தின் பங்களிப்புடன் உருவாக்கப்பட்ட ஓர் அரசாங்கமாக இருந்தாலும், அரசியலமைப்புக்கான இருபதாவது திருத்தச் சட்டமூலத்தை நிறைவேற்றுவதற்குத் தேவையான மூன்றிலிரண்டு பெரும்பான்மையை சில முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களுடைய ஒத்துழைப்புடனேயே பெற்றது. இவ்வாறானதொரு நிலையில், இந்த அரசாங் கமானது மீண்டும் இனவாதத்தைத் தூண்டுகின்ற செயற் பாடுகளை முன்னெடுக்கின்றது. குறிப்பாக, அண்மையிலே சிங்கள - முஸ்லிம் உறவைச் சீர்குலைப்பதற்காக ஞானசார தேரர் அவர்களால் மேற்கொள்ளப்பட்டு வருகின்ற இனவாதத்தைத் தூண்டுகின்ற செயற்பாடானது, இன்னொரு season போன்று காணப்படுகின்றது. தேர்தலுக்கு முகங்கொடுக்கும் வகையில் ஒரு மாயையை ஏற்படுத் துவதற்காகவா? அல்லது இந்த நாட்டிலே காணப்படுகின்ற பொருளாதாரப் பிரச்சினையையும் பொருள் mafiaஇனையும் மறக்கடிப்பதற்காகவா? அரசாங்கம் மீண்டும் இனவாதத்தைக் கையிலெடுத்திருக்கின்றது என நாங்கள் கேட்க விரும்புகின் றோம்.

அதுமாத்திரமல்ல, இந்த அரசாங்கத்திலே இருக்கின்ற சில பாராளுமன்ற உறுப்பினர்களும் அமைச்சர்களும் இனவாதத் தைக் கக்கியவர்கள்! முஸ்லிம் மக்களுடைய கடைகளுக்குச் செல்ல வேண்டாம், அவர்களுடைய பொருளாதாரத்தை அழிக்க வேண்டும், அவர்களுடன் தொடர்பு வைத்துக் கொள்ளக் கூடாது என்று சொன்ன கௌரவ உதய கம்மன்பில, கௌரவ விமல் வீரவங்ஸ, கௌரவ சரத் வீரசேகர போன்ற அமைச்சர்கள் இன்று முஸ்லிம் நாடுகளிடம் கையேந் துகின்றார்கள். அந்நாடுகளிலிருக்கின்ற வளங்களைப் பெறுவதற்காகக் கெஞ்சுகின்ற ஒரு நிலைமையை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. சவூதி அரேபியாவுடன் பேச்சுவார்த்தை நடத்தப்படுகின்றது. அதேபோன்று, துபாய், ஓமான், கட்டார் போன்ற நாடுகளிடம் பேச்சுவார்த்தை நடத்தப்படுகின்றது. அதுமாத்திரமா? பங்களாதேஷிடமிருந்து கடன் பெறுகின்ற ஒரு நிலைக்கு இந்த அரசாங்கம் தள்ளப்பட்டிருக்கின்றது. கடந்த காலங்களில் முஸ்லிம் அமைச்சர்களும் பாராளுமன்ற உறுப்பினர்களும் இஸ்லாமிய நாடுகளுக்குச் சென்று வட்டியற்ற கடன்களை அரசாங் கத்துக்குப் பெற்றுக்கொடுத்த ஒரு நிலைப்பாடு காணப்பட்டது. ஆனால், இன்று சீனா கடனை வழங்கிவிட்டு, நாட்டை எழுதிக்கொள்கின்ற நிலைமை உருவாகி இருக்கின்றது. ஆகையால், எதற்கு இந்த இரட்டை முகம்? எதற்கு இந்த இனவாதம்? என்றுதான் நாங்கள் கேட்கின்றோம்.

அதுமாத்திரமல்ல, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கிண்ணியா பிரதேசத்திலே எல்லை சம்பந்தமான பிரச்சினை காணப்படுகின்றது. இதனால், அங்கிருக்கின்ற விவசாயிகள் மிகவும் பாதிக்கப்படுகின்றார்கள். அவர்கள் விவசாய நடவடிக்கைகளை முன்னெடுக்கின்றபோது, forestக்குச் சொந் தமான காணிக்குள் அத்துமீறுவதாக அவர்கள்மீது குற்றச்சாட்டு சுமத்தப்படுகின்றது. இதைப்போற்ற இன்னும் எத்தனையோ குற்றச்சாட்டுக்கள் அவர்கள்மீது சுமத்தப் படுகின்றன. இதே நடவடிக்கையை பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்த யாராவது மேற்கொண்டால், அதைக் கண்டுகொள்ளாத நிலைமையும் காணப்படுகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

இன்று முஸ்லிம் சகோதரர் ஒருவர் மண்வெட்டியுடன் விவசாய நிலத்துக்குச் சென்றால், அது forestஐ அழிக்கின்ற செயற்பாடாக இவர்களுக்குத் தெரிகின்றது. ஆனால், பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்தவர்கள் JCB motor graderஐப் பயன்படுத்திக் காடுகளை வெட்டுகின்றார்கள். இதனை யாரும் கண்டுகொள்வதில்லை. "ஒரே நாடு, ஒரே சட்டம்" என்று சொல்வது இதுதானா என்று மக்கள் கேட்கின்றார்கள். தயவுசெய்து இந்த விடயங்கள் தொடர்பில் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டு நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉසුරු දොඩන්ගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. AJITH RAJAPAKSE *left the Chair, and* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

[අ.භා. 2.58]

**ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා**
(மாண்புமிகு இசுரு தொடன்கொட)
(The Hon. Isuru Dodangoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව සම්බන්ධයෙන් අදහස් දක්වන්න මා වෙත කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන් කොරෝනා වසංගතයත් එක්ක පසුගිය කාල සීමාවේදී ගෝලීය ආර්ථිකයත් සියයට 3.3කින් සංකෝචනය වුණු බව අපි දන්නවා. කොරෝනා වසංගතයෙන් අපේ රටේ ආර්ථිකයටත් විශාල බලපෑමක් එල්ල වුණු බව රහසක් නොවෙයි. හැබැයි, අද වන විට අපේ රටේ ආර්ථිකය යළිත් ක්‍රමක්‍රමයෙන් වර්ධනය වන තැනට ඒමේ පෙරමග ලකුණු පසුගිය කාලයේ අපට දකින්න ලැබුණා. මෙම වාර්තාවේත් ඒ ගැන සඳහන් වෙනවා.

2020 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව, 2021 වසරේ පළමු මාස හතරේදී අපේ රටේ අපනයන ආදායම අරගෙන බැලුවොත්, එය ඇමෙරිකානු ඩොලර් මිලියන 2,931 සිට ඇමෙරිකානු ඩොලර් මිලියන 3,800 දක්වා සියයට 29.6කින් වැඩි කරන්න අපට හැකියාව ලැබී තිබෙනවා. එය ඩොලර් මිලියන 868ක වැඩිවීමක්. විශේෂයෙන් රෙදිපිළි සහ ඇඟලුම්, ඒ වාගේම රබර් ආශ්‍රිත නිෂ්පාදන, කුළු බඩු, තේ, පොල් වැනි කෘෂිකාර්මික අපනයන සහ ඛනිජ නිෂ්පාදනවල ඉහළ යෑම නිසා තමයි අපට එම ආදායම ලබන්නට හැකියාව ලැබුණේ. ඒ වාගේම, 2020 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතරේදී කාර්මික අපනයනවලින් ලද ආදායම සියයට 28.5කින් ද, රෙදිපිළි සහ ඇඟලුම්වලින් සියයට 28.7කින් ද, රබර් සහ යාන්ත්‍රික උපකරණවලින් සියයට 44.3කින් ද, සමස්තයක් විධියට ආසන්න වශයෙන් ඒ සියල්ලේම ආදායම සියයට 63.5කින් ක්‍රමානුකූලව වර්ධනය කර ගන්න අපට හැකියාව ලැබුණා. ඒ වාගේම, 2020 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතර වන විට කෘෂිකාර්මික අපනයනවල ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 626.8 සිට ඇමෙරිකානු ඩොලර් මිලියන 829.4ක් දක්වා සියයට 32.3කින් ඉහළ නංවන්න අපට හැකියාව ලැබුණා.

විශේෂයෙන් රටේ අපනයන ආදායම වැඩි කරනකොට, ඉන්ධන, යන්ත්‍රෝපකරණ, ගොඩනැඟිලි ද්‍රව්‍ය, ප්ලාස්ටික් උපකරණ, වෛද්‍ය උපකරණ, ඖෂධ නිෂ්පාදන මිලට ගැනීම වෙනුවෙන් මුදල් වියදම් කරන්නත් පසුගිය කාලයේ අපට සිදු වුණා. නමුත්, පසුගිය කාල සීමාව වන විට එළවලු, ධාන්‍ය වර්ග, කිරි නිෂ්පාදන, මුහුදු ආහාර, කුළු බඩු සහ අනෙකුත් ආනයන වියදම් අඩු කර ගන්න අපි සමත්වෙලා තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික වාහන සහ උපාංග ආනයනය අවම වීම නිසාත් ආහාර නොවන භාණ්ඩ සඳහා වන වියදමත් සියයට 8.2කින් අඩු කර ගන්න අපට හැකියාව ලැබුණා. අන්තර්ජාලය සහ මාර්ගගත ක්‍රමවේද හරහා ජනතාව තමන්ගේ වැඩ කටයුතුවලට යොමු වීම නිසා පසුගිය කාලයේ විදුලි සන්දේශ උපකරණ සඳහා වන වියදම සියයට 117කින් වැඩි වුණු ආකාරය අපි දැක්කා. මේ සියල්ල අතරතුර රජය විශේෂයෙන් ජනතාව වෙනුවෙන් ඉටු කළ හැකි උපරිමය ඉටු කරන්න කැප වුණු බවත්, එය ක්‍රියාවෙන් ඔප්පු කළ බවත් අපි සඳහන් කළ යුතුයි.

කොවිඩ්-19 මර්දනයට අදාළ උපකරණ වෙනුවෙන් අවශ්‍ය බදු සහන රජය ලබා දුන්නා. ඒ වාගේම වැඩිහිටියන්, වකුගඩු රෝගීන්, ගොවීන්, ජීවනෝපාය අහිමි වූ දෛනික වැටුප් ලබන්නන් වෙනුවෙන් රුපියල් 5,000 දීමනාව ලබා දීම, රුපියල් 2,000 දීමනාව ලබා දීම රජය සිදු කළා. ඒ වාගේම, අලුත් අවුරුද්ද වෙනුවෙන් සමෘද්ධි ප්‍රතිලාභීන් සහ අඩු ආදායම්ලාභීන් සඳහා අප්‍රේල් මාසයේදී රුපියල් 5,000ක දීමනාවක් ගෙවන්නත් රජය කටයුතු කළා.

නිරෝධායනය වූ පවුල් විශාල සංඛ්‍යාවක් සඳහා අඛණ්ඩව රුපියල් 10,000ක බඩු මල්ල ලබා දෙන්නත් රජය කටයුතු කළා. ඒ වාගේම, කොවිඩ්-19 මර්දන ක්‍රියාවලිය සඳහා 2020දී බිලියන 117.5කුත්, 2021 ජුනි මාසය දක්වා බිලියන 53ක වියදමකුත් දරන්න රජය කටයුතු කළ බව අපි දන්නවා. අඩු ආදායම්ලාභීන්ට සමෘද්ධි බැංකු හරහා රුපියල් 10,000ක පොලී රහිත අත්තිකාරම් මුදලක් ලබා දෙන්නත්, කොවිඩ්-19 නිසා පීඩාවට පත් වුණු සියලුම අංශවල ජනතාව සමඟ සාකච්ඡා කරලා ඒ අයට අවශ්‍ය සහාය ලබා දෙන්නත්, ණය හා වාරික ඇතුළු ජනතාවට සංවේදී මූල්‍ය ක්‍රියාවලින් කළමනාකරණය සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙමින් අදාළ ආයතන දැනුවත් කරමින් ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දෙන්නත් රජය කටයුතු කළා.

ඒ වාගේම අපි සඳහන් කළ යුතුයි එන්නත්කරණ වැඩසටහන අප ඉතාම සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යන බව. අපේ රටේ ජනගහනයෙන් එක්කෝටි විසිලක්ෂයකට අධික පිරිසකට මේ වන කොටත් එන්නත් ලබා දීලා, අද රට ක්‍රමක්‍රමයෙන් යථා තත්ත්වයට පත් කිරීමේ වැඩ කටයුතු සිදු කරනවා. අපි විශ්වාස කරනවා, වෛද්‍ය අංශවල උපදෙස් අනුගමනය කරමින් ඉදිරි

කාලයේදී විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, පාසල් ශිෂ්‍යයන් ඇතුළු අනෙකුත් අයටත් එන්නත් ලබා දෙන්න හැකි වෙයි කියලා. ප්‍රදානයන් ලෙස ලැබුණු ඒවාට අමතරව එන්නත් මිලදී ගැනීම සඳහා අවශ්‍ය ඇණවුම් ක්‍රමවත් ආකාරයට, ඉතාම ඉක්මනින් කරලා රටට එන්නත් ලබා ගැනීම සඳහා අපි කටයුතු කළා. ඒ නිසා මේ එන්නත්කරණ වැඩසටහන සාර්ථක කර ගන්න අපට හැකියාව ලැබුණා.

2021 වසරේ මුල් මාස හතරේ රජයේ සේවකයන්ගේ වැටුප් සඳහා රුපියල් බිලියන 274කුත්, විශ්‍රාම වැටුප් සඳහා රුපියල් බිලියන 87.3කුත් අපි වියදම් කළා. ඒ වාගේම සමෘද්ධි සහනාධාරය, වැඩිහිටි දීමනාව, ආබාධිත රණවිරු දීමනාව, ගැබිනි මව්වරුන්ගේ පෝෂණ මල්ල ආදිය ලබා දීම වෙනුවෙන්, ඒ ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් රජය රුපියල් බිලියන 172.1ක් අඛණ්ඩව වියදම් කළා. ඒ විතරක් නොවෙයි, රජයේ වැඩසටහන් පවා අඛණ්ඩව අපි කරගෙන යනවා. කටු මැටි ආශ්‍රිත නිවාසවල ජීවත් වන ජනතාව එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා ග්‍රාම නිලධාරි වසම් සියල්ල ආවරණය වන ආකාරයට කෙරෙන "ඔබට ගෙයක් - රටට හෙටක්" වැඩසටහනේ පළමුවැනි අදියර මේ වන කොටත් අඛණ්ඩව ක්‍රියාත්මකයි. ඒ වාගේම "සියක් නගර" වැඩසටහන, මා නියෝජනය කරන බද්දේගම ආසනයේ බද්දේගම නගරය ද ඇතුළුව රට පුරා නගරවල මේ වන කොටත් ක්‍රියාත්මකයි. ඒ වාගේම "උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන" යටතේ ගාල්ල නගරයත් ඇතුළුව නගර සංවර්ධනය කිරීමේ වැඩසටහනත් ක්‍රියාත්මකයි. රැකියා ලක්ෂයේ වැඩසටහනේත් අදියරක් ක්‍රියාත්මක කරන්න අපට හැකියාව ලැබුණා. "සැමට ජලය" වැඩසටහන යටතේ නළ ජලය සහ සුරක්ෂිත පානීය ජලය සැපයුම සියයට 51.9 සහ සියයට 92 සිට පිළිවෙළින් සියයට 53.7 සහ සියයට 93.8 දක්වා වැඩි කරන්න අපට හැකියාව ලැබුණා.

ඊළඟට, ගාල්ල දිස්ත්‍රික්කයේ පොරොත්තු ලේඛනයේ සිටි 14,000ක් වූ ජල පාරිභෝගිකයන් බලාපොරොත්තු වූ නළ ජල සබඳතා සැලකිය යුතු ප්‍රමාණයකින් ලබා දෙන්න අපි මේ වන විට කටයුතු කර තිබෙනවා. ගාල්ල, මාගාල්ල සහ බද්දේගම ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක වීමත් සමඟම අවශේෂ ප්‍රදේශවල සිටින ජනතාවටත් ජල පහසුකම් ලබා දීමේ කටයුත්ත ඉදිරියේදී සිදු කරන්න අපට හැකියාව ලැබෙයි කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශ්වාස කරනවා, ඉදිරි අය වැය මඟින්, අප බලාපොරොත්තු වූ ආකාරයේ ආර්ථික වර්ධන ඉලක්කය දක්වා රට රැගෙන යෑම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරමින්, කොවිඩ්-19 වසංගතයට මුහුණ දුන්නා හා සමානවම ආර්ථික ජයග්‍රහණ ලබා ගන්නටත් ඉදිරි කාල සීමාව තුළ අපට හැකියාව ලැබෙයි කියලා. එම පණිවිඩය ලබා දෙමින්, මාහට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිය පළ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මැතිතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ පියාගේ මිත්‍රයෙකු වූ ශ්‍රීමත් ගාමිණී දිසානායක මැතිතුමාගේ ආදරණීය පුතණු කෙනෙක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කල්‍යාණ මිත්‍රයෙක්.

[අ.භා. 3.05]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඔව්, කල්‍යාණ මිත්‍රයෙක්. මම සන්තෝෂ වෙනවා, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේ මට කථා කරන්න අවකාශය, අවස්ථාව ලැබීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ රටේ ආර්ථිකය ගැන කථා කරන මේ ආණ්ඩුවේ ගරු මන්ත්‍රීවරුන්, ගරු ඇමතිවරුන් ආණ්ඩුවේ දැක්ම කියන්නේ නැති බවකුයි, ආණ්ඩුවේ වැඩ පිළිවෙළ කියන්නේ නැති බවකුයි අපට පෙනෙන්නේ. නිදහසට කාරණා නම් කියනවා. අද මිනිසුන් බඩගින්නේ ඉන්නේ ඇයි? අද කිරි පිටි නැත්තේ ඇයි? හාල් නැත්තේ ඇයි? පොහොර නැත්තේ ඇයි? අද ගොවියා අසරණ වෙලා ඉන්නවා. පාරිභෝගිකයා අසරණ වෙලා ඉන්නවා. රටේ ඩොලර් නැහැ. මේ කිසිම ප්‍රශ්නයක් විසඳන, මේ රටේ ආර්ථිකය ගොඩ ගන්න දැක්මක්, වැඩ පිළිවෙළක් ගැන කියන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් හැටියට අපි ලජ්ජා වෙන්න ඕනෑ. මේ රටේ අහිංසක මිනිස්සු අද කිරි පිටි ගන්න මහ පාරේ පෝලිම්වල පට්ට අව්වේ වේළි වේළී, වැස්සේ තෙමී තෙමී පැය ගණන් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙක තමයි ඇත්ත. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආදරණීය මව්වරුන්, ආදරණීය පියවරුන් -දෙමව්පියන්- අද මොකක්ද කරන්නේ? ඒ අය තමන්ගේ දරුවාට කිරි පිටි ටිකක් දීම සඳහා අධික මුදලකට හෝ කිරි පිටි ටික ගන්න සූදානමින් සිටිනවා. හැබැයි, කිරි පිටි සමාගම්, සිමෙන්ති සමාගම්, ගෑස් සමාගම් අද ආණ්ඩුව හසුරුවන්න පටන් ගෙන තිබෙනවා. ආණ්ඩුවට අද සිදු වෙලා තිබෙන්නේ, ෆොන්ටෙරා ආයතනය වාගේ ප්‍රධාන පෙළේ ආයතන කියන පදයට නටන්නයි. මෙක තමයි ඇත්ත. අද මේ රජය මේ රටේ අහිංසක මිනිසුන්ට, දරුවන්ට කිරි ටිකක් දෙන්න බැරි රජයක් බවට පත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය අද ඒ තරමට අපොහොසත් වෙලා තිබෙනවා. අද මේ රටේ දරුවන්ගේ සියයට 17.3ක් මන්ද පෝෂණයෙන් පෙළෙනවා. මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සියයට 17.3ක් සිටින රටක ජනතාවට කිරි පිටි ටිකවත් දෙන්න බැරි -කිරි පිටි සල්ලි දීලා වත් ගන්න නැති- තත්ත්වයක් තමයි අද මේ රටේ තිබෙන්නේ.

නමුත්, රජය මොකක්ද කළේ? රජය දණ ගැහුවා. රජය දණ ගහලා කිව්වා, "හරි, අපි පාලන මිල ඉවත් කරනවා" කියලා. දැන් ආණ්ඩුවට කරන්න දෙයක් නැහැ. කිරි පිටි සමාගම්වලට, සිමෙන්ති සමාගම්වලට, ගෑස් සමාගම්වලට, සහල් ව්‍යාපාරික ආයතනවලට ඕනෑ විදියට තමයි අද මේ රටේ අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල නියම වෙන්නේ; මිල තීරණය කරන්නේ. Supermarket එකේ එක ගණනක්; කඩ මණ්ඩියේ තව ගණනක්; එහා පැත්තේ කඩේ තව ගණනක්. ඒ කියන කියන ගණන් දීලා අපට බඩු ගන්න සිද්ධ වෙනවා. මෙක තමයි ඇත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට මේ තරම් බංකොලොත් වෙලා තිබෙනවා කියා මේ ආණ්ඩුව පිළිගෙන තිබෙනවා. අපි ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා. මොකද, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට ලංකාවේ ආර්ථිකය කඩාගෙන වැටිලා රජය බංකොලොත් වුණා කියන එක ආණ්ඩුව පිළිගත්තා. මේ කියන්නේ මොකක්ද? මෙක තමයි ආර්ථිකයේ කඩා වැටීම. ගහෙන් ගෙඩි එන්නා වාගේ "ඩෝං!" ගාලා සද්දයක් ඇවිල්ලා එක

[ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

පාරට මේ රටේ ආර්ථිකය කඩා වැටුණා කියා අපි කියන්නේ නැහැ. මේ විධියට තමයි රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමගි ජන බලවේගය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපේ පක්ෂයේ නායකයා වන ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ගැන අපි සන්තෝෂ වෙනවා. යුරෝපා දූත පිරිස අපේ රටට ආ වෙලාවේ එතුමා ඒ අයට මොනවාද කිව්වේ? "මේ රටේ අහිංසක මිනිසුන්ගෙන් පළිගන්න එපා. මේ රටේ අහිංසක මිනිසුන්ට කරන්න දෙයක් නැහැ. වර්තමාන ආණ්ඩුව මානව හිමිකම් උල්ලංඝනය කරන එකට, සංහිඳියාව ගොඩ නඟන්න කටයුතු කරන්නේ නැති එකට මේ රටේ මිනිසුන්ට කරන්න දෙයක් නැහැ. මේ රටේ මිනිසුන්ගෙන් පළිගන්න එපා. කරුණාකර GSP Plus සහනය අහෝසි කරන්න එපා. GSP Plus සහනය ලබා දෙන්න" කියලා එතුමා කිව්වා. ඒ වාගේ, හෘදය සාක්ෂියට එකඟව කටයුතු කරන, පිට කොන්දක් තිබෙන නායකයෙක් තමයි, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා කියන්නේ, විපක්ෂයේ සිටියා වුණත්, ආණ්ඩුවට දැනෙන්න කියලා, ආණ්ඩුවට රිදෙන්න කියලා අපේ රටේ මිනිසුන් පාවා දෙන්නේ නැති නායකයෙක් කියන කාරණය මම මේ අවස්ථාවේ මතක් කරනවා.

ඒ විතරක් නොවෙයි, පාස්කු ඉරුදින එල්ල වෙච්ච ත්‍රස්ත ප්‍රහාරයෙන් පස්සේ අපේ මිනිස්සු මොනවාද කියන්නේ? "අපට යුක්තිය ලබා දෙන්න" කියනවා. "යුක්තිය වෙනුවෙන් අපි සටන් කරන්නේ" කියලා පැහැදිලිව අපේ මිනිස්සු කියනවා. ඒ යුක්තිය ඉල්ලන මිනිස්සු අද බිත්තියට හේත්තු කරලා, භය කරන්න කටයුතු කරනවා. ඒක තමයි ඇත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෞරවනීය ඥානසාර ස්වාමීන් වහන්සේ ශ්‍රීරංග කියන පුද්ගලයාත් එක්ක මන්නාරමට ගිහිල්ලා, මන්නරමේ මඩු පල්ලියේ නැවත වතාවක් ගැටුම් ඇති කරන්න කටයුතු කරමින් යනවා. ඔවුන් මඩු පල්ලියේ ඉඩකඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීමේ කටයුතුවල නියැලෙනවා. එදා මේ රටේ ද්‍රවිඩ, සිංහල ගැටුමක් ඇති කළා. ඊට පස්සේ මුස්ලිම්, සිංහල ගැටුමක් ඇති කරන්න උත්සාහ ගත්තා. දැන් කතෝලික ජනතාවත් ගැටුමකට තල්ලු කරන්න උත්සාහ ගන්නවා. මේ විධියටම මේ රටේ නැවත වතාවක් ගැටුමක් ඇති කරන්නයි වුවමනාව. ආණ්ඩු පක්ෂයේ ඉන්න ගරු මන්ත්‍රීවරුන්ට මම කියනවා, මේකට ඉඩ දෙන්න එපා කියලා. අහිංසක කතෝලික ජනතාව පීඩනයට පත් වෙලා ඉන්න මේ වෙලාවේ අපේ පල්ලියේ තිබෙන ඉඩකඩම් අනවසරයෙන් අල්ලා ගන්න හදන අයට, නීතිය අතට අරගෙන කටයුතු කරන අයට විරුද්ධව වහාම නීතිය ක්‍රියාත්මක කරන්න කියලා මම රජයෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

[අ.භා. 3.10]

**ගරු කංචන විජේසේකර මහතා (විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு கஞ்சன விஜேசேகர - அலங்கார மீன்கள், நன்னீர் மீன்கள், இறால்களை வளர்த்தல், கடற்றொழில் துறைமுகங்கள் அபிவிருத்தி, பலநாள் கடற்றொழில் அலுவல்கள் மற்றும் மீன் ஏற்றுமதி இராஜாங்க அமைச்சர்)

(The Hon. Kanchana Wijesekera - State Minister of Ornamental Fish, Inland Fish and Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මිත්‍ර කාවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. විශේෂයෙන්ම එතුමා අපේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ පිළිබඳව ඇහුවා. එතුමා අර්බුද ගණනාවක් ගැන කථා කළා. ඒ පිළිබඳව මම ඇත්තටම කනගාටු වෙනවා. එතුමන්ලා ආණ්ඩු පක්ෂය නියෝජනය කරන කාලයේ මේ ලෝකයේ වසංගතයක් තිබුණේ නැහැ. මේ රටේ කිසිම තැනක නියඟයක්, ගංවතුරක්, ස්වාභාවික උවදුරක් තිබුණේ නැහැ. ඒ කිසිම දෙයක් නැති අවස්ථාවක තමයි ඔබතුමන්ලාගේ ආණ්ඩුව කරගෙන ගියේ. විපක්ෂය ඉදිරිපත් කර තිබෙන, මහ බැංකුවට අදාළ මේ වාර්තා දෙස බැලුවොත් ඒ බව තේරුම් යයි. මම හිතන හැටියට එතුමා මේ වාර්තාව කියවන්නේ නැතිව ද දන්නේ නැහැ මේ කථාව පටන් ගත්තේ. මේ ආර්ථික අර්බුදය නිර්මාණය වෙන්නේ කොහේද කියන එක මහ බැංකුවේ වාර්තා ඇතුළේ පැහැදිලිව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කරුණු දෙක තුනක් විතරක් මතක් කරන්නම්. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා 2005දී, යුද සමයේ රට බාර ගන්න වෙලාවේ මේ රටේ දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 25යි. ඇමෙරිකානු ඩොලර් බිලියන 25ට තිබුණු දළ දේශීය නිෂ්පාදිතය 2015 අවුරුද්ද වෙනකොට ඩොලර් බිලියන 80 දක්වා වර්ධනය වෙනවා. ඒ කියන්නේ තුන් ගුණයකින් වැඩි වෙනවා, අවුරුදු 9කදී. ඔබතුමන්ලා ආර්ථික ඔස්තාර්ලා කියලා කිව්වාට, අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා ඇතුළු කණ්ඩායම හිටියාට ඒ අය පාවිච්චි කළේ නැහැ ආර්ථිකය හසුරුවන්න. ඔබතුමන්ලාගේ ඒ ආණ්ඩුව අපට නැවත රට බාරදෙනකොට මේ රටේ ආර්ථිකය වර්ධනය වෙලා තිබුණේ ඩොලර් බිලියන 3කින් විතරයි. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ඩොලර් බිලියන 55කින් දළ දේශීය නිෂ්පාදිතය වැඩි කරලා දුන්නා. නමුත්, ඔබතුමන්ලා ඔක්කෝම පහසුකම් තියාගෙන ඩොලර් බිලියන 3යි වැඩි කරන්න සමත් වුණේ.

ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ක්‍රියාකලාපය නිසා පළමුවැනි වතාවට අපේ රටේ ඒක පුද්ගල ආදායමට මොකක්ද වුණේ? සාමාන්‍යයෙන් ඕනෑම රටක, රජයක ඒකපුද්ගල ආදායම වර්ධනය වෙනවා. හැබැයි, පළමුවැනි වතාවට ඔබතුමන්ලාගේ 2018-2019 ආණ්ඩුව සමයේ ඒක පුද්ගල ආදායම ආපස්සට යනවා. 2018දී අපේ ඒකපුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,077 ඉඳලා ඩොලර් 4,057 වෙනකම් පහත වැටෙනවා. 2019දී ඒක 3,852ට බහිනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාල වකවානුව තුළ මේ රට ඔබතුමන්ලාට බාර දෙනකොට අපේ රටේ ඒකපුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,819යි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාත්, මහින්ද රාජපක්ෂ අගමැතිතුමාත් මේ බාර ගත්තේ ආර්ථික අභියෝග, අර්බුද ගණනාවක් පිරිච්ච රටක්. ඒක අපි පිළිගන්න ඕනෑ. ඒ අභියෝගත් එක්ක බාර දීපු ආර්ථිකයට තවත් අභියෝගයක් එකතු වෙනවා, ගෝලීය වශයෙන් සිදු වෙච්ච වසංගත තත්ත්වය නිසා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ වසංගත තත්ත්වයක් තිබුණා නම් බලාගන්න තිබුණා ඔබතුමන්ලාගේ හැකියාව. වසංගතයක් නැතිව නේ ඔබතුමන්ලාගේ කාලයේ ගෑස් පෝලිම තිබුණේ. වසංගතයක් නැතිව නේ ඔබතුමන්ලාගේ කාලයේ තෙල් පෝලිම තිබුණේ. ඔබතුමන්ලා දැන් පොහොර හිඟයක් ගැන කථා කරනවා; කෘෂි කර්මාන්තය ගැන කථා කරනවා. ඔබතුමන්ලාට මතක ඇති, 2105දී අපි ආණ්ඩුව බාර දෙන වෙලාවේ වී අතිරික්තයක් එක්කයි මේ රට බාර දුන්නේ කියලා. ඔබතුමන්ලා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වී ගබඩාවක් කළා. ඒක ඔබතුමන්ලාට මතක ඇති. හැබැයි, ඔබතුමන්ලාගේ අවුරුදු හතරහමාරක කාල වකවානුවේදී පිට පිට අවුරුදු දෙකක් කෘෂි කර්මාන්තයේ වර්ධන වේගය සෘණ තත්ත්වයට ගෙන ගියා. මේක තමයි, තමුන්නාන්සේලා අපට උරුම කරලා දුන්නේ.

දැන් තමුන්නාන්සේලා කිරි පිටි ගැන කථා කරනවා. තමුන්නාන්සේලා ගත්ත ප්‍රතිපත්තිමය තීන්දු-තීරණවලට මොකක්ද කළේ? මම කාවින්ද ජයවර්ධන ගරු මන්ත්‍රීතුමාට ඒ

ගැන මොකුත් කියන්නේ නැහැ. මොකද, ඔබතුමාට වගකීමක් තිබුණේ නැහැ, ඒ ආණ්ඩුවේ. ඔබතුමාට වගකීම් දුන්නේ නැහැ. වගකීම් තිබුණු අය අඩුම තරමින් ගයන්ත කරුණාතිලක හිටපු ඇමතිතුමාටවත් එහෙම වගකීමක් දුන්නේ නැහැ. වගකීම් දුන්න අය මොකද කළේ? ඒ අය තමයි ව්‍යාපාරිකයන්ට මේ රටේ ශක්තිය දුන්නේ. ඒ අය තමයි මාෆියාකාරයෝ හැදුවේ. ඒ අය තමයි වී මෝල්කරුවන් මාෆියාකාරයෝ කළේ; කුඩා වී මෝල් හිමියන් නැත්තටම නැති කළේ. මේ රටේ නිෂ්පාදනයේ කොඳු නාරටිය කැඩුවා. තමුන්නාන්සේලා දියර කිරි නිෂ්පාදනය කරන පිරිස්වලට ඉඩක් දුන්නේ නැහැ. තමුන්නාන්සේලා ආනයනය මත යැපුණා. ධීවර අපනයන ආදායමක් ලබන්න ඕනෑ රටේ පසු ගිය අවුරුදු පහ තුළ ආනයනවලට නේ වැඩියෙන්ම වියදම් කළේ. ආනයන - අපනයන පරතරය කීයද? පසු ගිය අවුරුදු පහ තුළ හැම ක්ෂේත්‍රයක්ම මේ ආකාරයට කඩා වැටුණා. එවැනි රටක් තමයි ඔබතුමන්ලා අපට භාර දුන්නේ

මේ වසංගත තත්ත්වයත් අපි තේරුම් ගන්න ඕනෑ. තමුන්නාන්සේලා තෙල් පෝලිම, ගෑස් පෝලිම ගැන කථා කරනවා. තමුන්නාන්සේම දන්නවා, බ්‍රිතාන්‍යය ඇතුළු යුරෝපීය රටවලට පහුවෙලා වුණත් -ඒ හැම රටකටම- මේකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන බව. අද ජාත්‍යන්තර වශයෙන් සැපයුම් ජාලය කැඩිලා තිබෙන්නේ. ඒක අපි යථා තත්ත්වයට පත් කර ගන්න ඕනෑ. තමුන්නාන්සේලා එක පැත්තකින් අපට චෝදනා කරන ගමන් අනෙක් පැත්තෙන් මේ රට විවෘත කරන්න දෙන්නේ නැහැ. රට විවෘත කරන්න හදනකොට උද්ඝෝෂණ කරනවා. රට විවෘත කරලා ආර්ථිකය දුවනකොට රට වහන්න කියනවා.

තමුන්නාන්සේලා පසු ගිය කාලයේ මොකක්ද කිව්වේ? මේ ආණ්ඩුවට එන්නත් ටික ගෙන්වා ගන්නවත් මුදල් නැහැ කිව්වානේ. අද එන්නත්කරණ වැඩ පිළිවෙළේදී මොන අභියෝගය තිබුණත් සෞඛ්‍ය අංශයේ මුදල් කප්පාදු කරලා නැහැ. ඒක කවුරුවත් අගය කරලා කථා කළේ නැහැ. ඒ ගැන විපක්ෂය අද වෙනකම්වත් කථා කරලා නැහැ. එන්නත්කරණ ක්‍රියාවලිය තුළ පළමුවෙනි රටවල් 30 ඇතුළේ අපි ඉන්නවා. අපි එන්නත් මිලදී ගත්තා. තමුන්නාන්සේලා කිව්වා, නිකම් ලැබෙන එන්නත් ටික විතරයි අපට ලැබෙන්නේ කියලා. නැහැ. ලෝකයේ තිබෙන හැම එන්නතක්ම අපි දුන්නා. තමුන්නාන්සේලා ඒවාත් විවේචනය කළා. තරුණ - තරුණියන්ට එන්නත් දෙනකොට මේක කොහොමද දුන්නේ, මේවාට කොහොමද දෙන්නේ කියලා තමුන්නාන්සේලා ඒකත් විවේචනය කළා. අපි අභියෝග මැද්දේ වුණත් සෞඛ්‍ය අංශය කඩා වැටෙන්න දුන්නේ නැහැ.

තමුන්නාන්සේලා තව කාරණයක් තේරුම් ගන්න. හර්ෂ ද සිල්වා ගරු මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න හින්දා මේවා පිළිගනියි. තමුන්නාන්සේලා මහ බැංකු වාර්තාව අරගෙන බලන්න. 2014 අවුරුද්දේ රජයේ ආදායම රුපියල් මිලියන 1,195,206යි. රජයේ වියදම රුපියල් මිලියන 1,795,885යි. හැම අවුරුද්දේම රජයේ වියදම රුපියල් මිලියන ලක්ෂයකින් තමයි වැඩි වුණේ. හැබැයි, 2015 - 2016ට වනකොට රුපියල් මිලියන ලක්ෂ 6කින් වියදම වැඩි වෙනකොට, ආදායම වැඩි වෙන්නේ නැහැ ඒ ප්‍රමාණයට. අපි මේක තේරුම් ගන්නට ඕනෑ. තමුන්නාන්සේලා ආදායම වැඩි කරන්නේ නැතුව මොනවාටද වියදම් කළේ කියන ප්‍රශ්නය තිබෙනවා. ණය ගත්ත ප්‍රශ්නය තිබෙනවා. මහින්ද රාජපක්ෂ යුගයේ රුපියල් මිලියන 7,300ක් ලෙස තිබුණු ණය ප්‍රමාණය තමුන්නාන්සේලා 14,000 දක්වා වැඩි කළා. අවුරුදු හතරහමාරකදී ඒක දෙගුණයකින් වැඩි කරලා. ආර්ථික වර්ධන වේගය මහින්ද රාජපක්ෂ යුගයේ සියයට 8 තිබුණා; සියයට 5 තිබුණා. තමුන්නාන්සේලා අන්තිමට ගෙනැල්ලා තිබුණ තත්ත්වය මොකක්ද? 2019දී අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 2.3යි. අපි ඇෆ්ගනිස්තානයට විතරයි දෙවැනි වුණේ. හර්ෂ ද සිල්වා ගරු මන්ත්‍රීතුමා අභියෝග කරනවා නම් මම ඔබතුමාට කියන්නම්, මේ මහ බැංකු වාර්තාවට අනුව 2010දී අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 8යි. 2014දී සියයට 5යි. 2015දීත් ඒක සියයට 5ම තිබුණා. 2016දී සියයට 4.5යි. 2017දී සියයට 3.6යි. 2018දී සියයට 3.3යි. 2019දී සියයට 2.3යි. ආසියාවේත්, ඇෆ්ගනිස්තානයටත් වඩා යටින් අපි හිටියේ. මේ තමුන්නාන්සේලා කරපු දේවල්. අද අතිගරු ජනාධිපතිතුමාත්, අග්‍රාමාත්‍යතුමාත්, මුදල් අමාත්‍යවරයා හැටියට බැසිල් රාජපක්ෂ මැතිතුමාත් රට වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. දේශීය ආර්ථිකය නඟාසිටුවීම සඳහා ඒ තීන්දු ගන්නවා. ආණ්ඩුවක් හැටියට අපි භය වෙන්නේ නැහැ. අපි යම්කිසි තීන්දුවක් අරගෙන ඒකෙන් ජනතාවට හානියක් වෙනවා නම්, ඒ තීන්දුව ආපස්සට අරගෙන කටයුතු කරන්නත් අපි කිසිම භයක් ඇති කර ගන්නේ නැහැ. ඒ තීන්දු ගන්න අපි බිය වන්නේ නැහැ. අපි ජනතාවට ඇහුම්කන් දෙන ආණ්ඩුවක්. අපි දන්නවා, අපට පාලනය කරන්න බැරි දේවල් තිබෙනවා කියලා. කිරි පිටි මිල, ගෑස් මිල අපට පාලනය කරන්න පුළුවන් දේවල් නොවෙයි. ඒවා අපේ රටේ නිෂ්පාදනය කරන දේවල් නොවෙයි. නමුත්, අපි සොයන්න ඕනෑ ඒවා නිෂ්පාදනය කිරීමේ හැකියාවක් තිබෙනවා ද කියලා. එහෙම තිබෙනවා නම්, ඒවාටත් අපි ගිවිසුම් ගතවෙනවා. අපට තෙල් මිල පාලනය කරන්න බැහැ. තෙල් නිෂ්පාදනය කරන රටවල් අපි නොවෙයි. අපට පාලනය කරන්න පුළුවන් දේවල් අපි පාලනය කරන්නත්, අපට පාලනය කරන්න බැරි දේවල් වෙනුවෙන් රජය ගන්න ඕනෑ තීන්දු ක්‍රියාත්මක කිරීම සඳහාත් අපි කටයුතු කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. State Minister, please wind up now.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලීමක් කරනවා. සාමාන්‍යයෙන් විපක්ෂයක කාර්යභාරය වෙන්න ඕනෑ, මේ ගෝලීය වසංගතයක් තිබෙන කාලයක නිවැරදිව කටයුතු කිරීම. තමුන්නාන්සේලා භය වෙන්න එපා, අපි වෙලාවට ඊළඟ මැතිවරණය පවත්වනවා. අපි ඔබතුමන්ලා වාගේ මැතිවරණ කල් දමන්නේ නැහැ. මැතිවරණය එන වෙලාවට ඒ තීන්දු-තීරණ ගන්න පුළුවන් වෙයි. අද මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළට තමුන්නාන්සේලා සහාය දක්වලා ඒ කටයුතු කරගෙන යනවා නම්, රටක් හැටියට අපට ඉදිරියට යන්න පුළුවන් වෙයි. රට විවෘත කරන වෙලාවේ උද්ඝෝෂණ කරලා, මිනිසුන් පාරට බස්සලා, කොවිඩ් - 19 වසංගතයේ තවත් අර්බුද ඇති කරන තත්ත්වයට ගියොත් තමයි රටක් හැටියට අපට ඉදිරියට යන්න බැරි වෙන්නේ. මේ යන ගමනේදී රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න ඇමතිවරුන්, රාජ්‍ය ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් හැටියට අපිට වගකීම් දීලා තිබෙනවා. ඒ වගකීම අරගෙන අපි ගමට යනවා. දිනලා හිටියත් තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන්ටත් -ඒ කොට්ඨාස මන්ත්‍රීවරුන්ටත්- පළමුවෙනි වතාවට මුදල් හම්බ වෙනවා. අඩුම තරමින් තමුන්නාන්සේලා අපේ ප්‍රාදේශීය සභා තිබෙන විට එහෙම මුදල් දුන්නේත් නැහැ. අද පළමුවෙනි වතාවට මුදල් ඇමතිවරයා කොට්ඨාසය ජයග්‍රහණය කරලා තිබෙන -දෙමළ ජාතික සන්ධානය වෙන්න පුළුවන්, එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්, ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්- හැම මන්ත්‍රීවරයාටම මුදල් ප්‍රතිපාදන ලබාදෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ දැක්මත් එක්ක අපි ඉදිරියට යන බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. G.G. Ponnambalam. You have nine minutes.

[3.21 p.m.]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Presiding Member, we are debating the mid-year fiscal position of the country with regard to 2021, which came out through this Report.

Sir, at this very time, we have a section of the country, the teachers' community and the principals, protesting on the roads and they have been doing that for the last several months. They are a part of the society which aspires to create individuals who succeed in life far better than they have done. Their goal is to create better individuals with a status than their own in life. That is the almost venerated angle in which we look at teachers and principals because of the sort of attitude they have. The measure of success is, their student must go far beyond them and their status in society, achieving a much greater status.

That is the section of the society which is protesting today and they have been protesting because of a disastrous decision taken 24 years ago by the B.C. Perera Salaries Commission, which chose to keep the teachers out. It is a fault that every consecutive Government has accepted. Even this Government, as soon as it came to power, with credit to them, appointed the Subodhini Commission. They allowed that Commission to have a fairly comprehensive study. Eventually, when the Subodhini Commission came out with its Report, the teachers' unions accepted that Report, but the Government has not implemented it. The unions have been asking that Report, which this Government itself called for, to be implemented and if that is done, they will give up the protests. The Government has said that for various reasons - because of the COVID-19 pandemic and the economic situation - they are unable to implement that Report.

The unions have come down even further, that recognizing the economic situation of the country, as an interim measure, they are prepared to consider the Ministerial Committee Report of 2018 - when the previous Government was in power, that Report came out with various suggestions - instead of the full implementation of the Subodhini Commission Report. Yet, the Government is not prepared to commit itself to that. Instead, what the Government says is that they will implement the 2018 Proposals in four stages, that they will divide it into four sections and implement it in four stages over four years. The Unions are saying, "Even that, you implement in one go and make the 2018 Proposals as part of the Subodhini Commission" and that they will give up the protests and go back to work. Surely, Sir, with that position taken up by the teachers' and principals' unions, you cannot possibly find a more reasonable one from a section of the society which has been victims for over 24 years. And what is more, every single Government has acknowledged that a great injustice has been done to them. You are not prepared to look into the interests of a section of the society which is so fundamental to the country's well-being, in creating individuals who can keep this country competitive in the global context. It is only if the teachers and the principals, our education sector, are looked after that we also can expect our children to be competitive. But, they are treated like outcasts today and for 24 years.

Sir, there was a commitment in 2012, where Rs. 3,000 million were allocated and the unions were told at that time, in 2012, that their issue would be settled. You ask the teachers' unions what happened to that Rs. 3,000 million and they will say that they do not know. How pathetic the situation these people have been kept in! This must stop; this must stop if this Government really wants to look into the interests of the citizens. On your infrastructure projects, you spend billions, apart from the unofficial, corrupt black money that you all inherit. But, these teachers who slave-drive themselves to create better individuals than themselves in the society are being left in the lurch. This country will be cursed, Sir, if we go on in this way.

And in this context, the Government is announcing that schools which have less than 200 children will be reopened on the 21st of October, 2021. Why are you doing this? When the teachers are protesting, when you are not prepared to come to a compromise, an agreement with them, you are reopening the schools. What are you trying to do? You are trying to set the larger society against those teachers. We urge the members of the society not to fall into this trap, to what this Government is trying to do - they are lining their pockets, but they are not willing to address the grave injustice that has been done to the teachers for over 24 years - and not to join the Government in penalizing and victimizing those already desperate sections of the society.

Sir, I do not wish to take much more time. The Question raised under Standing Order 27(2) by the Hon. Anura Dissanayaka was replied by the Minister of Education, the Hon. Dinesh Gunawardena. There again, he was good enough to say that on the 12th of November, 2021 when the Budget will be presented, the concerns of the teachers' unions will be addressed. But, how are you going to address it? You should have actually given those assurances today to this House. If you are saying that you will address it and you know that you are going to have it addressed in the Budget on the 12th of November, why can you not call the teachers right now, tell them that, give those assurances directly to them and come to an agreement with them? Why can you not be more specific when they have told you repeatedly that if you agree, as an interim measure, to make the 2018 Proposals as part of the Subodhini Commission measures, if you are prepared to implement the 2018 Proposals immediately in one go, they will get off the streets? So, when they have told you that, to be not specific in replying to that Question under Standing Order 27(2), to merely give a very vague Answer saying that by the 12th of November, 2021 this matter will be addressed, is once again utter humbug. Sir,

these people have suffered enough and because of their suffering, our children are suffering even worse. So, this must stop!

Thank you, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. (Mrs.) Diana Gamage.

[3.30 p.m.]

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
Hon. Presiding Member, although the subject matter is something else, I request for a few minutes to speak regarding a matter which I think is important. I do not know if you are aware of it, but it has been in the news and in the newspapers; since last night, it has been a big issue.

(12th Start) මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපේ සමඟි ජනබලවේගයේ මහ ලේකම්තුමා ගැන මට හරි පුදුමයි. ඊයේ රෑ මාධ්‍යයෙන් මට කථා කරලා අහනවා, "ඔබතුමියට මේ ගැන කියන්න තිබෙන්නේ මොකක්ද?" කියලා. මම ඇහුවා, මොකක් ගැන ද කියලා. ඒ අය කියනවා, "ආ, අපිට සජබේ මහ ලේකම්තුමා කථා කරලා කිව්වා, ඔබතුමියව පක්ෂයෙන් නෙරපලා" කියලා. මම කිව්වා, "ඇත්තද? එහෙම දෙයක් මම දන්නේ දැනුයි" කියලා. ඇත්ත වශයෙන්ම ලජ්ජයි. සමඟි ජනබලවේගයේ මහ ලේකම්තුමනි, ඔය පක්ෂයේ මහ ලේකම්තුමා හැටියට මට ඔබතුමා ගැන ලජ්ජයි. මොකද, මා ගැන තීන්දුවක් තීරණයක් ගන්නවා නම් ඒ ගැන මාව දැනුවත් කරන්න ඕනෑ. එහෙම නොකර මාධ්‍යයට කථා කර ඒ ගැන නියා තිබෙනවා. මහ ලේකම්තුමා, ඔය පක්ෂයේ කී දෙනෙක් මේ ගැන දන්නවාද? මම අද උදේ කථා කරලා අහද්දි කෘත්‍යාධිකාරි මණ්ඩලයේ සමහර අයත් මේ ගැන දන්නේ නැහැ. නමුත්, කෘත්‍යාධිකාරි මණ්ඩලය තීන්දුවක් අරගෙන තිබෙනවා ලු, මාව සමඟි ජනබලවේගය පක්ෂයෙන් නෙරපන්න. ඇත්තටම ලජ්ජයි, බබාලා වාගෙයි හැසිරෙන්නේ. [බාධා කිරීමක්] ඔව්, මම කියන්න කැමැතියි මේ පක්ෂය මගේ මහත්තයාගෙත්, මගෙත් පක්ෂයයි කියන එක. මම හොඳ උදාහරණයක් කියන්නම්. මහ වැස්සක් අතරතුර නන්නත්තාර වෙලා හිටපු කණ්ඩායමකට මගේ ගෙදර මම ඉඩ දෙනවා, ඒ වැස්සට ඇවිත් ඉන්න. එහෙම කණ්ඩායමක් මම එළියට ගිය වෙලාවේ මගේ ගෙදර යතුරු මාරු කරලා දැන් ඒක ඒ ගොල්ලන්ගේ ගෙදර කියනවා. හැබැයි, පක්ෂයේ මහ ලේකම්තුමා ඇතුළුව මේකට සම්බන්ධ වෙලා ඉන්න සමඟි ජනබලවේගයේ සියලු දෙනාටම මම මේ කාරණාව කියන්න කැමැතියි. මතක තියා ගන්න! මේකේ ඔප්පුව තිබෙන්නේ මගේ අතේ බව. අන්න ඒක හොඳට මතක තියා ගන්න. මේ කරන විහිළු නවත්වන්න. ඔබතුමන්ලාගේ මේ පක්ෂය -සමඟිජන බලවේගය- ඇතුළත ඇති වෙන්න ප්‍රශ්න තිබෙනවා. අද වන විට පක්ෂය කෑලිවලට කැඩිලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ පක්ෂයේ ඉන්න සමහර මන්ත්‍රීවරු පසුගිය දවස්වල කියනවා ඇහුණා, "නායකයාට කිසිම වැඩ පිළිවෙළක් නැහැ" කියලා. ඒ වාගේම තමයි රටේ ජනතාව දන්නවා, අද මේ පක්ෂය කෑලිවලට කැඩිලා කියලා. එක එක්කෙනා ඕනෑ ඕනෑ පැතිවලට ඕනෑ ඕනෑ විධියට කථා කරනවා. පක්ෂයේ කෑලි කඩා ගෙන ගිහිල්ලා; සේනාංක හදාගෙන ගිහිල්ලා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
There is no point of Order. I am sorry. Please let me speak. I do not think you are involved in this.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, what is your point of Order?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මෙතුමිය කථා කරන්නේ සමඟිජන බලවේගයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ ඊයේ සාකච්ඡා වුණු දේ ගැනයි. කෘත්‍යාධිකාරි මණ්ඩලයේ පැහැදිලිවම තීන්දුවක් ගත්තා,- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
That is not a point of Order.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
Sorry, it is not a point of Order. The issue is regarding this party and me. මෙතැන විපක්ෂයේ ඉන්න භාගෙට භාගයක් ම ඇවිල්ලා තිබෙන්නේ list එකෙනුයි. ඒ, සමඟි ජනබලවේගය; 'අපේ ජාතික පෙරමුණ' කියන ටෙලිෆෝනයේ සලකුණ දරන පක්ෂය මගෙන් මේ අයට ලැබුණු නිසායි. මමත්, මගේ ස්වාමි පුරුෂයාත් මේ පක්ෂය ඒ අයට දුන්න නිසායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
එහෙම නැත්නම් රනිල් වික්‍රමසිංහ මැතිතුමනි, අද මෙතැන ඉන්න භාගෙට භාගයක් අයට නාම යෝජනා ලැබෙන්නේ නැහැ, එහෙම වුණාම නම් list එකෙන් ඇවිල්ලා අද මෙතැන වාඩිවෙලා ඉන්න ගොඩාක් අයට අද මෙතැන ඉන්න වෙන්නේ නැහැ. ඒ නිසා කරුණාකර විහිළු සපයන්න එපා. මම සමඟි ජනබලවේගයේ පඹයෙක් නොවෙයි, මම අදටත් එහි සාමාජිකාවක්; යාවජීව සාමාජිකාවක්; මේ පක්ෂය අයිති සාමාජිකාවක් හැටියට මම සජබේ ඉන්නවා. අනෙක් අය වාගේ මාව පඹයෙක් වාගේ නටවන්න ලැහැස්ති වෙන්න එපා. මොකද, මම පඹයෙක් වාගේ හැසිරෙන්නේ නැහැ. මම ගත්ත තීන්දු-තීරණ ගත්තේ මගේ හිතට එකඟවයි. මම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඡන්දය දීලා මේ ආණ්ඩුවට සහයෝගය දැක්වූවා. නැවත නැවතත් ඒ දෙය කරන්න සිද්ධ වුණොත් මම ඉදිරියටත් එය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමා.

[අ.භා. 3.34]

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හිතුවේ නැහැ සජබේ පක්ෂයටත් හොර ඔප්පුවක් හදයි කියලා. Hon. (Dr.) Harsha de Silva අහගෙන ද හිටියේ, ඔබතුමා? අපි හිතුවේ නැහැ එතැනට වැටෙයි කියලා. හරි, කමක් නැහැ අපි මාතෘකාවට එමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ආර්ථිකය සම්බන්ධව අධිසංවේදී කලාප හතරක් මම මගේ කථාවේ දී හඳුන්වා දෙන්න කැමැතියි. පළමුවැන්න, රටේ දීර්ඝ කාලයක් තිස්සේ පවතින වෙළෙඳ ශේෂ අර්බුදය. දෙවැන්න, රාජ්‍ය ආදායම හා රාජ්‍ය වියදම අතර පවතින බරපතළ පරතරය. තුන්වැන්න, පසුගිය යහ පාලන ආණ්ඩුව විසින් නිර්මාණය කරන ලද ආර්ථික ව්‍යසනය. හතරවැන්න, මේ මොහොතේ මුළු ලොවම මුහුණ දෙන කොවිඩ් වසංගතය හේතුවෙන් මතු වුණු ආර්ථික ව්‍යසනය.

මෙන්න මේ කාරණා හතරට නිවැරදිව ආමන්ත්‍රණය කිරීම තුළ රටේ ආර්ථික වෙනසකට යන්න ආණ්ඩුවක් විධියට අපි සූදානම්. අපේ අලුත් මුදල් ඇමතිතුමා සූදානම්. වෙළෙඳ ශේෂය සම්බන්ධ මේ අවුල 1977දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ වැරදි ආර්ථික ප්‍රතිපත්තියකින් තමයි ආරම්භ වුණේ. මම විවෘත ආර්ථිකයට කැමැති කෙනෙනක්. නමුත්, ආකර්ෂණීය ආර්ථික ප්‍රතිපත්තියක් වැරදි මූලධර්ම මත ක්‍රියාත්මක කරන්නට යාම තුළ එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට වැරදුණා. එහෙම නැත්නම් ඒ හා සමාන කාලයකින් චීනයේ ඩෙං ෂියාඕපිං ජනාධිපතිතුමාට ඒ රට ගොඩනඟන්න පුළුවන් වෙද්දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට වරදින්න විධියක් නැහැ. ඔවුන්ට එදා තිබුණේ මැතිනියගේ ආණ්ඩුවට එරෙහි වීමක් මිස වෙනත් ආර්ථික ප්‍රතිපත්තියක් නොවෙයි.

නමුත් කියන්න සතුටුයි, 2012 සැප්තැම්බර් මාසයේ ඉඳලා ඒ ඉතිහාසය ගණනය කරද්දී අවම වෙළෙඳ ශේෂ හිඟය මේ වසරේ සැප්තැම්බර් මාසයේ වාර්තා වෙනවා. එය ඇමෙරිකානු ඩොලර් මිලියන 483ක වැනි ප්‍රශස්ත මට්ටමක රඳවා ගන්නට අපි ආණ්ඩුවක් විධියට සමත් වෙනවා. ඒ වාගේම රාජ්‍ය ආදායම හා වියදම අතර පවතින පරතරය රාජ්‍ය ආදායම් වර්ධනය කර ගැනීම වෙනුවෙන් වන නිර්මාණශීලී ප්‍රවේශයකට ගරු මුදල් ඇමතිතුමා, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව අද පිවිසෙමින් සිටිනවා. අපි ඒක සතුටින්, ආඩම්බරයෙන් මේ උත්තරීතර සභාවට කියනවා. එහිදී අප සඳහන් කළ යුතුයි, අනවශ්‍ය වියදම් කප්පාදු කර ගැනීමත් ආණ්ඩුවක යුතුකමක් බව. ඒ සඳහා වන ගෞරවනීය පරමාදර්ශය අතිගරු ජනාධිපතිතුමා ලබා දී තිබෙනවා.

මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා එක්ක මගේ පෞද්ගලික අමනාපයක් නැහැ. නමුත්, සරල ජනාධිපතිවරයෙක් විධියට එදා එතුමා මවපු ප්‍රතිරූපය; මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටත් වඩා ඉතා අවම තැනකට ජනාධිපති වැය ශීර්ෂය රැගෙන එන්නට අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට හැකියාව ලැබුණා. 2019 වර්ෂයේ රුපියල් බිලියන 13ක් වුණු ජනපති වැය ශීර්ෂය මේ වන විට රුපියල් බිලියන 2.7 වැනි ඉතාම ප්‍රශස්ත තැනකට කප්පාදු කරන්නට තරම් අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ජනතාවාදී වුණා. මේක වඩාත් කැපී පෙනෙන්නේ මේ සිද්ධියෙන්. සජබ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා මිනිසුන්ට ගෙවල් හදන්නට එක ගෙදරකට රුපියල් ලක්ෂ 5ක් බැගින් ණයක් දීලා, උදාගම්මානය විවෘත කරන සමරු ඵලකයට රුපියල් 6,400,000ක් වැය කළා. ඒ නිසා තමයි, රාජ්‍ය වියදම් කප්පාදුව සම්බන්ධව අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ චින්තනය තවත් දිලිසෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ආදායම් සහ වියදම් පාලනය කිරීම පරිස්සමින් කළ යුතු දෙයක්. හේතුව, රාජ්‍යයේ ආදායම් කියන්නේ මිනිසුන්ගේ වියදම්, ඒ වාගේම රාජ්‍යයේ වියදම් කියන්නේ මිනිසුන්ගේ ආදායම්. ඒ නිසා මේ ද්විත්වය තුලනය කිරීමේදී අපි ඉතාම පරිස්සමින් මේ තත්ත්වය කළමනාකරණය කළ යුතුයි. යහ පාලන සමය විසින් හසුරුවන ලද වැරදි ආර්ථික ප්‍රතිපත්ති විසින් රටේ ආර්ථිකය විනාශ කළා. අපේ ගරු මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යතුමා ජනාධිපති වශයෙන් සිටි යුගයේ රටේ සියයට 6ක, 7ක ආර්ථික වර්ධන වේගයක් අපි පවත්වාගෙන ආවා. නමුත්, ඒක සියයට 2.3 වැනි ඉතාම නරක තැනකට ඇද දැමුවා. 2004 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 20යි. ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒක ඇමෙරිකානු ඩොලර් බිලියන 80ක් බවට පරිවර්තනය කළා. යහ පාලන ආණ්ඩුවට පුළුවන් වුණේ ඒ 80, 84ක් දක්වා වැඩි කරන්න පමණයි. මේ තරම් ආර්ථික ඔස්තාර්ලා සිටි ආණ්ඩුවට මේක කරන්න බැරි වුණේ ඇයි? අපි ආණ්ඩුව භාර දුන්නේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,821දියි. ඒක 3,852 දක්වා ඉතාම පොඩි වැඩිවීමක් තමයි සිදු වුණේ. මේක දේශපාලන චෝදනාවක් විධියට භාරගන්න එපා. යහ පාලන ආණ්ඩුවේ සාමාජිකයන් මේ ප්‍රශ්නය තමන්ගෙන්ම විමසා උත්තරයක් දැනගත යුතුයි කියලායි මා යෝජනා කරන්නේ.

කොවිඩ් ව්‍යසනය හේතුවෙන් මතුවුණු ආර්ථික අර්බුදය නිසා රාජ්‍ය ආදායම් බරපතළ ලෙස පහළ ගියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම රෝගී සත්කාරක සේවා සඳහා කොවිඩ් ශුභසාධන ජාතික ව්‍යාපාරය වෙනුවෙන් අපට දැවැන්ත අතිරේක වියදමක් දරන්න සිදු වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නූතන ලෝකයේ නූතන මානව ශිෂ්ටාචාරයේ වැදගත්ම ආයෝජනය ලෙස අද ලෝකය පිළිගන්නේ කොවිඩ් මර්දනයට එරෙහි මානව ප්‍රතිශක්තිකරණ ආයෝජනයයි. අප එය ඉතාම මැනවින් ආයෝජනය කරලා රට නැවත ආරම්භ කිරීමට, රට restart කරන තැනකට ගෙනැල්ලා තිබෙනවා. එතැන ඉඳලා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා, මහින්ද රාජපක්ෂ අගමැතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවේ අලුත් මුදල් ඇමතිතුමා කොවිඩ් - 19 ව්‍යසනය විසින් මවලා තිබෙන ආර්ථික අඳුරු වලාව මැද රිදී රේඛාවක් අඳින්න සූදානම් කියන පණිවුඩය මේ වෙලාවේ ගරු සභාවේ සිටින ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා ඇතුළු සජබ යේ ආර්ථික ඔස්තාර්ලට ආදරයෙන් සිහිපත් කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

[අ.භා. 3.40]

**ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ විපක්ෂයේ කථා අහනකොට මට කල්පනා වුණේ අපේ සමහර අය ජීවත් වෙන්නේ අතීතයේ; අතීත ශ්‍රී විභූතියේ කියලායි. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථාවක් තිබෙනවා, "හැම දාම එකම දේ කරලා වෙනස් ප්‍රතිඵලයක් බලාපොරොත්තු වෙන්න එපා" කියලා. එකම විධියට හිතුවොත්, එකම විධියට වැඩ කළොත්, එකම දේ ක්‍රියාවෙන් කළොත් ලැබෙන ප්‍රතිඵලය එකමයි. ඒ නිසා යන්ත්‍රයකට දර දමලා අපිට වීස් බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ නිසා වීස් ඕනෑ නම්, යන්ත්‍රයට කිරි දමන්නම සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බලාපොරොත්තු වනවා, මේ රටේ ආර්ථිකයේ වෙනසක් ඇති කරන්න, රටේ ජනතාව ඉල්ලන වෙනස ඒ ජනතාවට දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගතානුගතික බවින් මිදුණේ නැත්නම් අපි එක තැන පල් වෙන රටක් බවට පත් වෙන එක නවත්වන්න පුළුවන් වෙන්නේ නැහැ. ඍතුවට අනුව තමයි දලු දමන්නේ. අපි මේ පසු

කරන්නේ බිහිසුණු, දරුණු ව්‍යසනකාරී සෘතුවක්. ඒ සෘතුවට ගැළපෙන්න තමයි මේ අලුත් දලු ලියලන්නේ කියන එක අපි මතක් කරන්න ඕනෑ. ඒ වාගේම සෘතුව තේරුම් අරගෙන, අපි සියලුදෙනාම වගකීමෙන් වැඩ කළ යුතුයි.

මම හිතන විධියට බිහිසුණු කොවිඩ් - 19 වසංගත සමයේ වැඩිම උද්ඝෝෂණ කරපු රට විධියට අපි ගිනස් වාර්තා පොතට යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ගැන මම ඔබතුමාට සංඛ්‍යාලේඛන එක්ක කියන්නම්. ජනතා විමුක්ති පෙරමුණ මේ කොවිඩ් lockdown එක සමයේ උද්ඝෝෂණ 230ක් රට පුරා සිදුකර තිබෙනවා. වෙනත් සංවිධාන උද්ඝෝෂණ 135ක් පමණ සිදු කර තිබෙනවා. පෙරටුගාමී සමාජවාදී පක්ෂය උද්ඝෝෂණ 45ක් හා සමගි ජන බලවේගය උද්ඝෝෂණ 185ක් සිදු කර තිබෙනවා. රටේ දැවෙන ප්‍රශ්නයක් තිබෙන මේ වෙලාවේ, ආර්ථික අර්බුදයක් තිබෙන වෙලාවේ අපේ රටේ අපිට එකතු වෙන්න බැරි වුණා. ලෝකයේ වෙන රටවල ආණ්ඩු සහ විපක්ෂ එකතු වෙලා රටේ ජනතාව බේරා ගන්න උත්සාහ කරද්දී, අපේ රටේ විපක්ෂය පාරට බැහැලා පඩි වැඩියෙන් ඉල්ලන්න මේ රටේ සමහරු උනන්දු කෙරෙව්වා කියන එක අපි මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය ප්‍රධාන වශයෙන් චෝදනා නඟපු කාරණාවක් තමයි භාණ්ඩ සම්බන්ධයෙන් ඊයේ කැබිනට් මණ්ඩලය ගත්ත තීන්දුව. අද ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,543යි. Saudi Aramco සමාගමේ මිල අනුව අරාබියෙන් ගත්තත්, ගෑස් ටොන් එකක මිල ඇමෙරිකානු ඩොලර් 800යි. ඒ ටොන් එකකින් කිලෝග්‍රෑම් 12.5 කෑන් 80ක් නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒ අනුව බලන විට අරාබියෙන් ගත්තත්, ගෑස් සිලින්ඩරයක් අපට ගන්න වෙන්නේ රුපියල් 2,030කටයි. නමුත්, අද වෙනකොට රජය මේ සඳහා වන සියලු පිරිවැය මේ රටේ ජනතාව වෙනුවෙන් දරා ගන්නවා කියන එක අපි මතක් කරන්න ඕනෑ. නමුත්, ඒ ආකාරයට රටකට ඉදිරියට යන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මෙතැනදී මතු වෙන බවත් අපි මතක් කරන්න ඕනෑ.

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ව්‍යසනකාරී තත්ත්වයේ දී ඇති වෙලා තිබෙන තවත් ප්‍රශ්නයක් තමයි නැව් ගාස්තු වැඩි වී තිබීම. චීනයේ ඉඳලා මේ රටට නැවක් එන්න වැය වුණු ඇමෙරිකානු ඩොලර් 800ක නැව් ගාස්තුව දැන් ඇමෙරිකානු ඩොලර් 5,500ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. එම නිසා අසාමාන්‍ය කාලයක සාමාන්‍ය ප්‍රතිඵල බලාපොරොත්තු වෙන්න එපා කියලා අපි ඔබ තමුන්නාන්සේලා සියලුදෙනාගෙන්ම ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මොනවා කරන්න ගියත් එයට විරෝධයක්, උද්ඝෝෂණයක් හැම දාම මේ රටේ පැවැත් වෙනවා. හැමෝම වාගේ වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවරයෙක්, පරිසරවේදියෙක්, නීතිඥයෙක් ජනමාධ්‍යවේදියෙක් වෙලා තිබෙනවා. පාරක් හදන්න බැහැ; බෝක්කුවක් හදන්න බැහැ; වැවක් හදන්න බැහැ; ආර්ථිකය හදන්න බැහැ; නීතියක් හදන්න බැහැ, ඒවායේදී මොනවා හෝ උද්ඝෝෂණයක්, විරෝධයක් එල්ල වීම අද විලාසිතාවක් බවට පත් වී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට වෙනස් වෙන්න ඕනෑ නම්, අපට සිංගප්පූරුව වාගේ වෙන්න ඕනෑ කියලා සිංගප්පූරුව දිහා බලලා හුල්ලනවා වෙනුවට සිංගප්පූරුව වෙනස් වුණේ කොහොමද කියන පාඩම අපට ඉගෙන ගන්න අවස්ථාව තිබෙනවා කියන එක මම මතක් කරන්න ඕනෑ. ඒ පාඩම් ඉගෙන ගත්තේ නැත්නම් අපේ රට හැම දාම එක තැන පල් වෙන රටක් බවට පත් වෙනවා.

අපි විපක්ෂයට ආරාධනා කරනවා, උද්ඝෝෂණ 225ක් කරනවා වෙනුවට රට ගොඩනඟන්න අපිත් එක්ක එකතු වෙන්න කියලා. අපේ ගරු සංජීව එදිරිමාන්න සහෝදර මන්ත්‍රීතුමා කිව්වා වාගේ මුදල් ඇමතිතුමා විසින් මේ රටේ වෙනසක් කරන අය වැයක් ගෙන ඒවි යන බලාපොරොත්තුව, විශ්වාසය ඇතිව අපි සියලුදෙනාම පසුවෙන බව මතක් කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

[අ.භා. 3.46]

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ගැන සාකච්ඡා කරන මේ වෙලාවේ ඒ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට මාහට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා.

අපි වසර මැද මූල්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන්නේ කොච්චර අභියෝගවලට මුහුණ දුන් රටක් වශයෙන්ද, අපි කොච්චර අභියෝග මැද්දෙන් ඉදිරියට ආපු රටක්ද කියන කාරණය ගැන පළමුව කල්පනා කර බලන්න ඕනෑ. විශේෂයෙන් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් වුණාට පස්සේ අපි විශාල බලාපොරොත්තුවකින් තමයි එතුමාත් එක්ක මේ ගමන ආරම්භ කළේ. යහ පාලන ආණ්ඩුව අපට රට භාර දෙනකොට ආර්ථිකය විශාල වශයෙන් පරිහාණියට පත් වෙලා තිබුණා. එහෙම පසුබෑමට ලක් වුණු රටක් එක්ක අපි මේ ගමන ආරම්භ කළේ විශාල බලාපොරොත්තුවකින්. නමුත්, අවාසනාවකට, මේ ඇති වූ ගෝලීය වසංගතයත් එක්ක වාගේම ඒ වැටුණු ආර්ථිකයත් එක්ක මේ රට ඉස්සරහට ගෙන යාමේදී විශාල අභියෝගයකට මුහුණ දෙන්න අපට සිදු වුණා. අපි සෑම විටම බලාපොරොත්තු වන්නේ මේ රටේ ජනතාවට ඒ අවශ්‍ය කරන පහසුකම් ලබා දීලා, ඔවුන්ගේ සිතුම් පැතුම් ඉෂ්ට කරන්නයි.

අපි තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. පසු ගිය කාලයේ, එනම් 2020 වර්ෂයේදී අපේ ආර්ථික වර්ධන වේගය යම් පහළ බැසීමක් සිදු වුණත් -සෘණ 3කට ආසන්න ප්‍රමාණයකට පහළ බැසීමක් සිදු වුණත්- 2021 වර්ෂයේ පළමු කාර්තුව සඳහා සියයට 4.3ක්, දෙවන කාර්තුව සඳහා සියයට 12.3ක් වශයෙන් ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන ගිහින් තිබෙනවා. මේ වසර අවසාන වෙද්දී සියයට 5ක ආර්ථික වර්ධන වේගයකට ළඟා වෙන්න අපට පුළුවන් කියන බලාපොරොත්තුවක්, පුරෝකථනයක් අපට තිබෙනවා. ඒ වෙනුවෙන් කටයුතු කරන ගමන් මේ මාස 7 තුළ අපේ අපනයන ආදායම වැඩි කර ගන්නත් අපි කටයුතු කර තිබෙනවා. 2020 පළමු මාස 7 තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 5.4ක්ව තිබුණු එම ආදායම 2021 පළමු මාස 7 තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 6.8කට ගෙනැවිත් සියයට 24ක සාර්ථක වර්ධනයක් ලබා ගන්න අපට හැකියාව ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊළඟට කථා කරන්න ඕනෑ, අපේ ආනයන වියදම ගැන. අපේ ආනයන වියදමත් වැඩි වෙලා තිබෙනවා. හැබැයි, පසු ගිය අවුරුදු 5ක, 10ක කාලයේ අපේ ආනයනය වැඩි වුණේ කුමන භාණ්ඩ සම්බන්ධයෙන්ද; එහෙම නැත්නම් ආනයනය සඳහා වැඩිපුර මුදල් වැය කළේ මොනවාටද? මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන්, එහෙම නැත්නම් දේශීය ව්‍යාපාරිකයාට මේ රටේ හදන්න පුළුවන් දේවල් ආනයනය කරන්න අපි මේ රටේ මුදල් විශාල වශයෙන් රටින් එළියට යැව්වා. ඒ නිසා අපේ ආනයන වියදම වැඩි වුණා. අපේ සංඛ්‍යා ලේඛනවල මේ පිළිබඳව සඳහන් වෙනවා. නමුත් අපි ආනයනය සීමා කිරීම නිසා අපේ කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම, කර්මාන්තශාලාවල ධාරිතාව වැඩි කිරීම වාගේ දේවල් සඳහා යන්ත්‍රෝපකරණ ගෙන්වන්න දේශීය ආයෝජකයෝ වැඩි වශයෙන් නැඹුරුවක් දැක්වූවා. ඒ නිසා අපට බලාපොරොත්තු

[ගරු නලින් ප්‍රනාන්දු මහතා]

වෙන්න පුළුවන්, ඉදිරියේදී මේ හරහා නැවත අපේ නිෂ්පාදනය වැඩි කරලා, අපේ රටේ ආර්ථිකයට යම් ශක්තියක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. අපි ඒ ගැන සතුටු වෙනවා.

ඊළඟට, අපේ විදේශ ශ්‍රමික ප්‍රේෂණ ප්‍රමාණය අරගෙන බලමු. 2020 වසරේ මාස 7ක් තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 3.6ක්ව තිබුණු ඒ ආදායම, 2021 වසරේ පළමු මාස 7 තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 3.8කට වර්ධනය කර ගන්න අපට හැකියාව ලැබුණා. අපි සංචාරක ව්‍යාපාරයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක ආදායමක් බලාපොරොත්තු වුණා. නමුත්, ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක ආදායමක් ඒ පළමුවන මාස 7 තුළ ලබා ගන්න අපට බැරිව ගියා. අපට ලබා ගන්න හැකි වුණේ මිලියන 26ක් වැනි ඉතාම සුළු මුදලක්. අපේ ඩොලර් සංචිතය කෙරෙහි මේවා බලපෑවා. මේ නිසා භාණ්ඩ ආනයනය කිරීමට තිබුණු ඩොලර් ප්‍රමාණය අපට මදි වුණා.

අපි අපේ ව්‍යාපාරිකයන්ට, අපේ ආයෝජකයන්ට, අපේ නිෂ්පාදකයන්ට බදු සහන දුන්නා කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා මම දැක්කා. බදු සහන දෙන්න ඕනෑ ජනතාවට මිසක් ව්‍යාපාරිකයන්ට නොවෙයි ලු. හැබැයි, ජනතාවට බදු සහන දෙන්න නම් අප ඉස්සෙල්ලාම කරන්න ඕනෑ අපේ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අපේ ව්‍යාපාරිකයන්ට සහන දීමයි. එහෙම නැතිව නිකි ගලා යෑමක් සිදු වන්නේ නැහැ. ඒ නිසා තමයි ඒ බදු සහන දීලා, ඒ බදු සහන හරහා ඒ ව්‍යාපාරිකයන් ආරක්ෂා කරන්න අප විශේෂයෙන් කටයුතු කළේ. විපක්ෂය පෙන්වනවා, බදු සහන ලබා දීම තුළින් අපට මෙච්චර ආදායමක් අඩු වුණා කියලා. හැබැයි, ඒ අය කවදාවත් ගණනය කළා ද, ඒ බදු සහන ලබා දීමෙන් අපේ කර්මාන්ත ඉස්සරහට අරගෙන යන්න අප කොච්චර සහයෝගයක් ලබා දුන්නාද කියන එක. අපි විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, අප ඒ බදු සහනය ලබා දුන්නේ අපේ දේශීය ආර්ථිකය නංවන්න ශක්තිය දෙන ව්‍යාපාරිකයාට බව. ඒක ආයෝජනයක්. ඒ නිසා ඉදිරියේදීත් ඒ සම්බන්ධව කටයුතු කිරීම කෙරෙහි අපි විශේෂයෙන්ම අවධානය යොමු කරනවා. ඒ සඳහා ඔබතුමන්ලා සියලු දෙනාගේ සහයෝගය අපට ලබා දෙයි කියා අපි විශ්වාස කරනවා.

භාණ්ඩ මිල සම්බන්ධවත් විශාල විරෝධයක් ආවා. "බඩු හිඟයි. බඩුවල මිල අධිකයි" කිව්වා. අපි පසු ගිය අවුරුද්ද තුළ යම් යම් තීන්දු ගත්තා. ඒ තීන්දු ගත්තේ ජනතාව ගැන හිතලා. බඩු මිල වැඩි කරන්න කියා සමාගම් ඉල්ලා සිටියත්, අපි ඒ සමාගම්වලට කිව්වා, මේ අවස්ථාවේදී මිල වැඩි කරන්න එපා කියලා. ඒ වාගේම, ඩොලරය සම්බන්ධව තිබුණු ප්‍රශ්නයේදීත් අපි පැහැදිලිව කිව්වා, ආනයන වැඩි කරන්න එපා කියලා. නමුත් දැන් අපට වැටහෙනවා, මේ ආර්ථිකය තුළ විවිධ සහන දෙන්න ඕනෑ, ජනතාව ගැන හිතන්න ඕනෑ බව. අපි යම් ලිහිල් ප්‍රතිපත්තියකට ඇවිත් තිබෙන නිසා අපේ ආර්ථිකයේ වර්ධන වේගය වැඩි වෙනවා. ඒ හරහා ඉදිරියේදී අඩු පාඩුවක් නැතිව ඒ භාණ්ඩ සපයා දෙන්න අපි කටයුතු කරනවා.

විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශය දැඩි පීඩනයකින් සිටින වෙලාවක්, මේක. ඒ නිසා මෙවැනි තත්ත්වයක් තුළ ඒ අය මේ රට වෙනුවෙන් කරන සේවයට මා විශේෂ ස්තුතියක් පුද කරන්න ඕනෑ. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත්, ගරු රාජ්‍ය ඇමතිතුමාත්, රජයත් ගෙන යන මේ වැඩ පිළිවෙළට අපගේ සහයෝගය ලබා දෙනවා කියා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සු. නෝගරාදලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.54]

**ගරු සු. නෝගරාදලිංගම් මහතා**
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, என்னுடைய உரையின் ஆரம்பத்தில் ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். நேற்றைய தினம் நடைபெற்ற தெற்காசிய கால்பந்து சம்பியன்ஷிப் தொடரில் சர்வதேச தரப்படுத்தலில் 107ஆவது இடத்தில் இருக்கின்ற இந்திய தேசிய அணியை எதிர்த்து இலங்கை தேசிய அணி போட்டியிட்டது. இறுதியில் அந்தப் போட்டி சமநிலையில் முடிவுற்றது. நீண்ட நாட்களுக்குப் பிறகு இவ்வாறானதொரு போட்டியில் வடக்கைச் சேர்ந்த குறிப்பாக மன்னாரைச் சேர்ந்த இரண்டு வீரர்கள் விளையாடியுள்ளனர். அதில் ஒரு வீரரான டக்சன் பியுஸ்லஸ் என்பவர் சிறந்த வீரருக்கான விருதைப் பெற்று, இந்த நாட்டுக்கும் வட மாகாணத்துக்கும் எங்களுடைய மன்னார் மாவட்டத்துக்கும் பெருமையைத் தேடித் தந்துள்ளார். அவருக்கு இந்த நேரத்திலே என்னுடைய பாராட்டுக்களையும் வாழ்த்துக்களையும் தெரிவித்துக்கொள்கின்றேன். மேலும், அதே அணியில் யாழ்ப்பாணத்தைச் சேர்ந்த ஜூட் சுபனும் மன்னாரைச் சேர்ந்த எடிசன் பிகுராடோவும் இணைத்துக் கொள்ளப்பட்டமை உண்மையிலேயே மகிழ்ச்சியான ஒரு விடயமாகும். இந்த வீரர்கள் உள்ளிட்ட இலங்கை தேசிய அணியின் வீரர்கள் அனைவருக்கும் எனது பாராட்டுக் களையும் வாழ்த்துக்களையும் தெரிவித்துக்கொள்கின்றேன்.

மிகப் பலம் பொருந்திய ஓர் அணிக்கு எதிராக விளையாடி, இன்று "Daily Mirror" பத்திரிகையில், டக்சன் பியுஸ்லஸ் அவர்கள் "நட்சத்திர வீரர்" என்று பாராட்டப்படுகின்ற அளவுக்கு உயர்ந்திருக்கிறார். இதேபோல், வடக்கு, கிழக்கு மாகாணங்களிலே பல்வேறு விளையாட்டுக்களிலும் திறமைவாய்ந்த வீரர்கள் "இலைமறை காய் போல" இருந்துகொண்டிருக்கிறார்கள். போதிய வாய்ப்புக்களும் சிறப்பான பயிற்சியும் இல்லாத காரணத்தினால், அவர்கள் ஒதுக்கப்படுகின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. இந்தப் போட்டியானது, இலங்கைத் தேசிய அணிக்கு வீரர்களைத் தேர்வு செய்கின்றவர்களுக்கு ஒரு முன்னுதாரணமான போட்டியாகக் காணப்படுகின்றது. அதாவது, வடக்கு, கிழக்கிலும் இப்படியான திறமைவாய்ந்த வீரர்கள் இருக்கிறார்கள்; அவர்களை இனங்கண்டு, அவர்களுக்கான வாய்ப்புக்களை வழங்க வேண்டுமென்ற நிலைமையை இப்போட்டி உருவாக்கி இருக்கின்றது.

அடுத்து, இந்த நாட்டின் நிதி நிலைமை சம்பந்தமாகவும் ஒருசில விடயங்களைச் சொல்ல வேண்டும். க.பொ.த சாதாரண தரத்தில் சித்தி பெறாத இளைஞர், யுவதிகளுக்கு ஓரிலட்சம் வேலைவாய்ப்புக்களை வழங்குகின்ற மேதகு சனாதிபதி அவர்களின் திட்டமானது கடந்த ஆண்டு நடைமுறைப்படுத்தப்பட்டது. வன்னி மாவட்டத்திலே ஒரு சதவீதமானோர்கூட, இந்த வேலைவாய்ப்புத் திட்டத்துக்குள் உள்வாங்கப்படவில்லை என்பதை நான் மிகவும் மனவருத்தத்துடன் தெரிவித்துக்கொள்கின்றேன். இத்திட்டத் திற்குள் உள்வாங்கப்பட்டவர்கள்கூட, அரசியல் ரீதியாகத் தெரிவு செய்யப்பட்டு, இராணுவ மயப்படுத்தப்பட்ட தேர்வினூடாகத்தான் தெரிவுசெய்யப்பட்டார்கள். குறிப்பாக,

வன்னி தேர்தல் மாவட்டத்தின் மன்னார், வவுனியா மற்றும் முல்லைத்தீவு ஆகிய இடங்களில் வழங்கப்பட்ட நியமனங்கள் அரசியல் அழுத்தங்களின் அடிப்படையிலேயே வழங்கப்பட்டன. இதன்போது, அப்பிரதேசங்களில் இருக்கின்ற அரசாங்கத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர்களால் கொடுக்கப்பட்ட பெயர்கள் மாத்திரமே உள்வாங்கப்பட்டன. இந்த விடயத்திலே இலஞ்சம் கொடுக்கப்பட்டிருப்பதாக வேலைவாய்ப்புக் கிடைத்த சிலர் எங்களிடம் முறையிட்டார்கள். அவர்கள் இதனை வெளியிலே சொல்வதற்குத் தயங்குகின்றார்கள். ஏனெனில், அரசியல் வாதிகள், இராணுவத்தினர் ஆகியோரின் மேற்பார்வையின்கீழ் இதற்கான நேர்முகப் பரீட்சை நடைபெற்ற காரணத்தினால், தற்போது தங்களுக்குக் கிடைத்துள்ள பதவியை இழந்து விடுவோமோ என்று அவர்கள் எண்ணுவதனாலாகும்.

ஊழல் செய்தவர்களை அல்லது சட்டத்திற்குப் புறம்பான முறையிலே சொத்துக்களைச் சேர்த்தவர்களை, நிதிக் கையாடல்களைச் செய்தவர்களை, வெளிநாடுகளிலே சொத்துக்களைச் சேர்த்தவர்களை Pandora Papers - ஆவணங்கள் வெளியிலே கொண்டுவந்ததன் அடிப்படையில் அப்படிப்பட்டவர்களை விசாரணை செய்ய முடியுமென்று சொன்னால், வடக்கு, கிழக்குப் பிரதேசங்களிலோ அல்லது இந்த நாட்டின் வேறு பிரதேசங்களிலோ இலஞ்சம் வழங்கி வேலைவாய்ப்புக்கள் பெறப்பட்டிருந்தால், அது தொடர்பில் ஆணைக்குழுவொன்றை அமைத்து, விசாரணை செய்து பாதிக்கப்பட்டவர்களுக்கு நீதியைப் பெற்றுக்கொடுக்க ஏன் முடியாது? என்று நான் இந்த அரசாங்கத்தைப் பார்த்துக் கேட்கின்றேன். நிச்சயமாக, இதில் பலர் சம்பந்தப் பட்டிருக்கின்றார்கள். மேன்மைதங்கிய சனாதிபதி அவர்கள்கூட, "ஒருவர் இலஞ்சம் கொடுத்து தொழில் ஒன்றைப் பெறுவாராகவிருந்தால், அவருடைய தொழில் பறிக்கப்படும்" என்று சொல்லியிருந்தார். எனினும், அவ்வாறு நடந்ததா? இதற்கு மேதகு சனாதிபதி அவர்கள் என்ன பதில் சொல்வார்? ஆகவே, இந்த அரசாங்கம் உடனடியாக இதற்கோர் ஆணைக்குழுவை நியமித்து அல்லது தற்பொழுது இயங்குகின்ற இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்தவற்கான ஆணைக் குழுவினூடாக விசாரணைகளை மேற்கொண்டு, இதிலே இடம்பெற்றிருக்கின்ற மோசடிகளைக் கண்டுபிடித்து, தகுதியற்றவர்களை விலக்கிப் பொருத்தமானவர்களை நியமிக்க வேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன்.

(13th Start)

பெண்கள் காப்பகங்களிலே இருக்கின்ற யுவதிகள், சிறுவர் இல்லங்களிலே இருக்கின்ற யுவதிகள் தேவையான தகுதியைக் கொண்டிருக்கின்றார்கள். அவர்கள் இந்த விடயம் தொடர்பாகத் தங்களுடைய பிரதேச அரசாங்க அதிபர்களூடாக அரசாங்கத்திடம் முறையிட்டிருக்கின்றார்கள். அந்த வகையில், வன்னித் தேர்தல் மாவட்டத்தில் அடங்குகின்ற முல்லைத்தீவு, மன்னார், வவுனியா ஆகிய மாவட்டங்களின் அரசாங்க அதிபர்கள், இந்த நியமனங்களை வழங்குகின்றபோது இவர்களுக்கு முன்னுரிமை கொடுக்குமாறு கேட்டிருக் கின்றார்கள். ஆனால், அரசாங்கத்திடமிருந்து எந்தவிதமான பதிலும் இல்லை. ஆகவே, இந்த விடயம் தொடர்பாக உரிய முறையில் விசாரணை செய்து, தகுதியானவர்களை இப்பதவிகளுக்கு நியமிக்க வேண்டுமென்று நான் இந்த நேரத்திலே கேட்டுக்கொள்கின்றேன்.

இறுதியாக, இன்று நடைபெற்றுக்கொண்டிருக்கின்ற ஆசிரியர்களின் போராட்டம் தொடர்பாகச் சில விடயங்களைக் குறிப்பிடலாம் என நினைக்கின்றேன். தற்போது, பாடசாலைகள் மூடப்பட்டிருக்கின்றன; மாணவர்கள் வீடுகளிலே முடங்கிக்கொண்டிருக்கின்றார்கள்; ஆசிரியர்கள் வீதிகளிலே போராடிக்கொண்டிருக்கின்றார்கள். எதிர்வரும் சில வாரங்களில் பாடசாலைகளைத் திறந்தால்கூட, "நாங்கள் வகுப்பறைக்களுக்குச் சென்று கற்பித்தல் நடவடிக்கைகளை மேற்கொள்ளமாட்டோம்" என்று ஆசிரியர்கள் கூறுகின்றார்கள். கௌரவ பாராளுமன்ற உறுப்பினர் கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்கள் ஏற்கெனவே இது தொடர்பாக விபரமாகக் கூறியிருந்தார். ஏன், இந்த அரசாங்கம் ஆசிரியர்களை அழைத்து, ஒரே மேசையிலேயிருந்து பேசி, ஒரு தீர்வை வழங்கக் கூடாது? ஏறக்குறைய 2 வருடங்களாக பாடசாலைகள் ஒழுங்காக நடைபெறவில்லை. மாணவர் களுடைய கல்விச் செயற்பாடுகள் முற்றாக ஸ்தம்பிதமடைந்து இருக்கின்றன. இந்த நிலையிலே, அரசாங்கமானது தீர்க்கமானதொரு நடவடிக்கையை எடுப்பதனூடாகத்தான் எதிர்காலச் சந்ததியினராகிய மாணவர்களுடைய கல்வித் தரத்தை முன்னேற்ற முடியும். எனவே, அரசாங்கம் பாடசாலைகளை ஆரம்பிப்பதற்கு முன்பாகவே அதற்கான நடவடிக்கைகளை உடன் ஆரம்பிக்க வேண்டும் என்று கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 4.03]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - கிராமிய வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை மற்றும் கட்டிடப்பொருள் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)

(The Hon. Indika Anuruddha Herath - State Minister of Rural Housing and Construction and Building Material Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, 2021 වසර මැද රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන අද දවසේ, අපි එතුමාට යම් දෙයක් පැහැදිලිව කියන්න ඕනෑ. පසු ගිය රජය කාලයේ එතුමාට යම්කිසි වගකීමක් තිබුණා. ඒ රජය පත් වෙන්න කලින් තිබුණු රජයේ දූෂණ සහ වංචා සෙවීම පිළිබඳව ඉදිරිපත් කළ කැබිනට් යෝජනාවක් අනුව, එතුමාට ඒවා ගැන සොයා බැලීම සඳහා යම්කිසි වගකීමක් වෙන් කර දී තිබුණා. හැබැයි, එතුමා අදටත් 2015ට කලින් පැවති රජයේ කටයුතුවල වංචා විමර්ශන ගැන තමයි කථා කරන්නේ. එතුමන්ලාට ඒවා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීමට අවුරුදු පහකට ආසන්න කාලයක් පැවැති පාලන කාලය තුළ ඕනෑ තරම් කාල වේලාව තිබුණා. නමුත්, ඒ පරණ තැටියම ආයෙත් ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ, එහෙම නැත්නම් වෙනත් වේදිකාවල එතුමන්ලා වාදනය කරනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා.

එතුමා අද සභාව කල්තබන අවස්ථාවේ මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන වේලාවේ, අපට අපේ ආර්ථික දැක්ම ගැන පැහැදිලිව කියන්න පුළුවන්. අපි හොඳ ආර්ථිකයක් සකස් කර තිබුණු නිසා තමයි, එතුමන්ලා 2015දී භාර ගත් -එතුමාත් එම ආණ්ඩුවේ සිටියා කිව්වාට වැරදි නැහැ.- රජය ඒ ආකාරයෙන් භාර ගන්න පුළුවන් වුණේ. ඒ වේලාවේ සියයට හතකට එහා ගිය ආර්ථික වර්ධන වේගයක් තිබුණා. ඒ වාගේම, ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල බොහොම අඩු අගයක තිබුණේ. ඊළඟට, රටේ කර්මාන්ත විශාල වශයෙන් ඇති වෙලා තිබුණා. ඒ වනවිට සංචාරකයන් ලක්ෂ විස්සකට වැඩි ප්‍රමාණයක් මේ රටට ආවා. ඒ වාගේම කෘෂිකර්මාන්තය අතින් අපේ රට ඉහළට ගිහින් තිබුණා. හැබැයි, අනුර දිසානායක විපක්ෂයේ මන්ත්‍රීතුමාට වාගේම, එදා හැදුණු කණ්ඩායමට වුවමනා වෙලා තිබුණේ එම තත්ත්වය ඉස්සරහට ගෙන යන්න නොවෙයි. එතුමන්ලා උත්සාහ කළේ 2015ට කලින් පැවති රජය කළ කටයුතු සම්බන්ධයෙන් ඒ

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

ගොල්ලන් ජනතාවට කියපු බොරුව, බොරුවක් නොවෙයි කියලා ඔප්පු කරන්නයි. ඒවා අධිකරණය, නීතිය හා නීතියට සම්බන්ධ ආයතන කියන සියලු අංශ යොදා ගනිමින් පළිගැනීම කේන්ද්‍ර කරගෙන ගොතපු දේවල් කියන එක අනාවරණ වෙද්දී, අනුර දිසානායක මන්ත්‍රීතුමන්ලාට එතැනින් අයින් වෙන්න සිද්ධ වුණා. ඒ රජයට යන්න සිද්ධ වුණේ ඒ ගොල්ලන් බලාපොරොත්තු වුණු ඉලක්කය වන පළිගැනීමේ ඉලක්කයට විතරයි. ඒ ගොල්ලන්ට සංවර්ධන ඉලක්කයක් තිබුණේ නැහැ.

2019න් පස්සේ, අද ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත්, ආණ්ඩුවටත් තිබෙනවා, වැඩ පිළිවෙළක්. රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච, "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළ මේ මහ පොළොවේ යථාර්ථයක් කරන එක තමයි එහි පළමුවැනි යුතුකම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට අවශ්‍ය සියලු පියවර අපි අරගෙන තිබෙනවා. හැබැයි, අපි හිතුවේ නැහැ, ලෝක වසංගතයක් මේ විධියට එයි කියලා; සංචාරකයන් එන එක බිංදුවේ අගයට වැටෙයි කියලා; අපේ කර්මාන්තශාලා, එහෙම නැත්නම් ඉදිකිරීම්, එහෙම නැත්නම් වෙනත් කටයුතු මේ විධියට අඩාළ වෙයි කියලා; රාජ්‍ය සේවකයන් සහ රාජ්‍ය ආයතන පවත්වාගෙන යෑමේ ගැටලු මේ විධියට ඇති වෙයි කියලා. හැබැයි, මොන දේ වුණත් අපේ ඒ ඉලක්ක කරා අපේ වැඩසටහන ගෙන යනවා. ඒ වැඩසටහන තුළ අපි නිවාස අමාත්‍යාංශය විධියට ඉහළ ප්‍රගතියක් අත් කරගෙන තිබෙනවා. අපි දුප්පත් මිනිහාට ගෙයක් හදලා දෙන එක, අවතැන් වෙච්ච මනුස්සයාට නිවසක් දෙන එක උතුරේවත්, දකුණේවත්, එහෙම නැත්නම් රටේ කිසිම තැනකවත් නවත්වලා නැහැ.

ඔබතුමන්ලාට අවුරුදු පහකදී කර ගන්න බැරුව ගිය දේවල් අපි අවුරුද්දක් ඇතුළත කරලා ජනතාවට එහි ප්‍රතිඵල ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, මාර්ග, මහා මාර්ග ඉදිකිරීම් කටයුතු සිදු කරනවා. රටේ දැවැන්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. අද සිමෙන්ති හිඟයක් ගැන කථා කරනවා. සිමෙන්ති, යකඩ වාගේ දේවල්වලට අද ලොකු ඉල්ලුමක් ඇවිල්ලා තිබෙනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් දියුණු වෙලා තිබෙනවා. ඒ වාගේම, අපි පිළිගන්න ඕනෑ දෙයක් තිබෙනවා. මේ රටේ ඩොලර් උත්පාදනය අඩු වෙලා තිබෙනවා. විදේශ විනිමය උත්පාදනය අඩු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කිරීමට කෙටි කාලයක් තිබුණත් පැහැදිලිවම කියන්න අවශ්‍යව තිබෙන කාරණාව මෙයයි. තමුන්නාන්සේලා මේවායෙන් දේශපාලන වාසි ගන්න කටයුතු කරන්න එපා. පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳ විමර්ශන කොමිසම පෙන්වලා දේශපාලන වාසි ගන්න කටයුතු කරනවා. ඒ වාගේම ගුරු, දෙමව්පියන් පෙන්වලා අද දේශපාලන වාසි ගන්න කටයුතු කරනවා. නුවුරු දිනයකදී දරුවන් 200ට අඩු පාසල් විවෘත කරන එක ගැන අද පාර්ලිමේන්තුවේ විපක්ෂයේ කිසිම කෙනෙකුගේ කට ඇරන්නේ නැහැ, පාසලට ඇවිල්ලා දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න කියලා ගුරුවරුන්ට කියන්න.

මූලාසනයේ කටයුතු කරන ඔබතුමන්ලා වුණත් ආදර්ශවත් වෙන්න ඕනෑ. පාසල් විවෘත කර ගැනීම හරහා ළමා මනස තුළ තිබෙන විකෘතිභාවය, එහෙම නැත්නම් දරුවන් ගෙදරට කොටු වෙලා ඉන්න එකෙන් මුදලා ඔවුන් පාසලට ගෙන ගොස් ඒ අධ්‍යාපනය ලබා දෙන වැඩ පිළිවෙළට මූලිකත්වය දෙන්න. රජය විධියට හොඳ ආර්ථික දැක්මක් ඇතුව අපි කටයුතු කරන බව වගකීමෙන් කියනවා. මුදල් අමාත්‍යවරයා 2022 වර්ෂයට අදාළව ඉදිරිපත් කරන අය වැය තුළින් විශාල ජයග්‍රහණයක් ගමට ලැබෙන විධියේ වැඩ කටයුත්තක් කරන බව කියමින්, මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. You have ten minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
No, it was increased to 14 minutes.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
First, you had 12 minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Then, I got two more minutes.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
No, it was reduced to ten minutes. Hon. Member, please start your speech.

[අ.භා. 4.09]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට කථා කරන්න තිබෙන්නේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ගැනයි. මේ අවුරුද්ද සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන වාර්තාව ගැන තමයි කථා කරන්න ඕනෑ. නමුත්, අද බොහෝ දෙනා කථා කළේ පරණ දේවල් ගැන. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ගැන කථා කළා. යහ පාලන ආණ්ඩුව කාලයේ දේවල් ගැන කථා කළා. නමුත්, කථා කළ යුතු දේ කථා කළේ නැහැ. ඒ නිසා මම කැමැතියි, කථා කළ යුතු දේ කථා කරන්න. ඒක තමයි මූලික කාරණාව; රාජ්‍ය මූල්‍යය. අද රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය මොකක්ද? මම මේ දැන් මහ බැංකුවෙන් ලබා ගත්ත වාර්තාව අනුව, 2021 ජනවාරි ඉඳලා ජූලි මාසය වෙන කල් රජයේ මුළු ආදායම තිබෙන්නේ රුපියල් බිලියන 798ක් පමණයි. ඒ කියන්නේ, රුපියල් කෝටි 79,800ක්. වියදම රුපියල් බිලියන 1,015ක්. එහෙමත් නැත්නම් රුපියල් කෝටි එක්ලක්ෂ එක්දහස් පන්සියයක්. අපි කොරෝනා හැදුණු අවුරුද්ද පැත්තකින් තියමු කෝ.

2009 ජනවාරි - ජූලි වෙන කොට තිබුණු අය වැය පරතරය බිලියන 522යි. එදාට වඩා මේ අවුරුද්දේ, මේ මාස අටට අය වැය පරතරය වැඩි වෙලා තිබෙනවා, සියයට 94කින්. ඒක ගැනයි කථා කරන්න ඕනෑ. ඒකයි මේ වාර්තාවේ තිබෙන්නේ. ඒක විසඳන්නේ කොහොමද කියන එක ගැන කථා කරයි කියලා තමයි අද මෙතැන බලාපොරොත්තු වුණේ. නමුත් අවාසනාවකට කිසිම කෙනෙක් ඒ සම්බන්ධයෙන් කථා කළේ නැහැ. මේ වාර්තාවේ තිබෙනවා, කොහොමද ඒ පරතරය පියෙව්වේ කියලා. ණය අරගෙන තිබෙනවා, විදේශීය වශයෙන්. ණය අරගෙන තිබෙනවා, දේශීය වශයෙන්. රුපියල් කෝටි එක්ලක්ෂ එක්දහස් පන්සියයක් වන වියදම් පියවන්න රුපියල් කෝටි 54,900ක මුදල් අච්චු ගහලා තිබෙනවා. මේවා black and whiteවලින් තිබෙනවා. ඒ එක්කම අපි කල්පනා කරන්න ඕනෑ මේ ලොකු ගණන් සාමාන්‍ය මිනිසුන්ට දැනෙන්නේ කොහොමද කියලා.

පසුගිය ආණ්ඩුව ගත් ණය ගැන කථා කළා. ඔව්, පසුගිය ආණ්ඩුව යම් ණය ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. රුපියල් බිලියන 5,400ක් මාස 60කට අරගෙන තිබෙනවා. හැබැයි, ජනාධිපති වශයෙන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පත් වූ දා සිට ජූලි මාසය වෙනකම් රුපියල් බිලියන 3,750ක් මේ ආණ්ඩුව ණය වශයෙන් අරගෙන තිබෙනවා. ඒ කියන්නේ අපි මාස 60ට ගත් රුපියල් බිලියන 5,400 ප්‍රමාණයට මෙතුමන්ලා මේ වනකොට - මාස 18කදී- කිට්ටු කරලා තිබෙනවා. ඒ කියන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේදී එක පුද්ගලයෙකුගේ ණය බර රුපියල් 187,500කින් වැඩි කරලා තිබෙනවා. හතර දෙනෙකුගෙන් යුත් පවුලක ණය බර මේ රජය මාස 18කදී රුපියල් 750,000ක් වැඩි කර තිබෙනවා. එහෙම නම්, ආණ්ඩුව මේ සම්බන්ධයෙන් දැන් මොකක්ද කරන්න බලාපොරොත්තු වෙන්නේ? ඒ, එක කාරණයක්.

මම තව කාරණයක් කියන්න ඕනෑ. දැන් ආදායම අඩු වෙලා තිබෙන එක ගැන නොයෙකුත් දේවල් කථා කරනවා. අපි කවුරුත් දන්නවා, 2019 නොවැම්බර් මාසයේ ලබා දුන් බදු සහන හරහා ගජ මිතුරන්ට ලොකු වාසියක් ලැබුණු බව. ජනතාව බලාපොරොත්තු වූ පරිදි බඩු මිල අඩු වීමක් නම් කිසිසේත්ම සිදු වුණේ නැහැ. බඩු මිල වැඩි වී තිබෙනවා. මම ඒ ගැන මේ වෙලාවේ කථා කරන්නේ නැහැ. ඒ ගැන කවුරුත් දන්නවා. නමුත්, කොරෝනා වසංගතයෙන් මේ දේවල්වලට යම් කිසි බලපෑමක් වුණා. ඒක අපි සද්භාවයෙන් පිළිගන්නවා. හැබැයි, එකතු නොකරපු බදු කොපමණ තිබෙනවාද? ගරු තිස්ස විතාරණ මැතිතුමා සභාගත කළ COPA වාර්තාවේ කියා තිබෙනවා, කැසිනෝවලින් රුපියල් බිලියන 2.67ක -රුපියල් කෝටි 267ක- බදු එකතු කරලා නැහැ කියලා. කිරිපිටි මිල අද ඉඳලා වැඩිවෙනවා; ගෑස් මිලත් හෙට අනිද්දාට වැඩි වෙයි. කෝටිපතියන් වැඩි වශයෙන් නියැලෙන කැසිනෝවලින් රුපියල් කෝටි 267ක බදු මුදලක් මේ අවුරුද්දට එකතු කර ගත්තේ නැහැ කියලා තිස්ස විතාරණ මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේ කියනකොට, ඒ ගැන කිසිම කෙනෙක් කථා නොකරන්නේ ඇයි? ඒ, එක කථාවක්.

මේ වාර්තාවේ තිබෙන අනෙක් දේ තමයි, විදේශ ණය සහ සංචිත පිළිබඳ ප්‍රශ්නය. මම මේ සම්බන්ධයෙන් ප්‍රථම වතාවට පාර්ලිමේන්තුව දැනුවත් කරන්නම්. මේ සම්බන්ධව කිසිම newsletter එකක් ගියේ නැහැ. මේක ඊයේ තමයි වාර්තා වුණේ. අපේ රටේ තිබෙන සංචිත ප්‍රමාණය ඊයේ වාර්තා කළා. සැප්තැම්බර් මාසයේ අවසානය වෙනකොට ඩොලර් බිලියන 2.58 වෙනකම් -කලින් මාසයට සාපේක්ෂව ශීඝ්‍රයෙන් සියයට 28කින්- අපේ සංචිත ප්‍රමාණය පහළ වැටී තිබෙනවා. අගෝස්තු මාසයේදී අපට විදේශ වත්කම්, එහෙම නැත්නම් විදේශ මූල්‍ය වත්කම් ඩොලර් මිලියන 2,954ක් තිබුණා. සැප්තැම්බර් මාසය වෙනකොට තිබෙන්නේ ඩොලර් මිලියන 2,006ක්. ඒ අනුව, සියයට 32ක පහත වැටීමක් තිබෙනවා. මේක මහ බැංකුව අද වාර්තා කරලා තිබෙනවා. මේ ඩොලර් අර්බුදය පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? පසුගිය ආණ්ඩුවට බැණ බැණ ඉඳලා වැඩක් නැහැ. මේ අය කියපු දේවල් මම අහගෙන හිටියා. "අපට විවේචන අවශ්‍ය නැහැ. ධනාත්මකව මේ රට ඉදිරියට ගෙන යන්න අපේ ක්‍රියාමාර්ග අනුගමනය කරනවා" කිව්වා. ප්‍රශ්නය තිබෙන්නේ, සිකුරාදා නිකුත් කළ මහ බැංකු වාර්තාව රාජ්‍ය මූල්‍ය වාර්තාවට සම්බන්ධවීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ මාස 12දී අපට ගෙවන්න තිබෙන ණය ප්‍රමාණය ඩොලර් මිලියන 7,242යි කියලා ඒ වාර්තාවේ තිබෙනවා. නමුත්, අතේ තිබෙන්නේ ඩොලර් මිලියන 2,581යි. ගෙවන්න තිබෙනවා, ඩොලර් මිලියන 7,242ක්. මේවාටයි මිනිස්සු පිළිතුරු බලාපොරොත්තු වෙන්නේ. ඒක ගැනයි මේ සභාවේ සාකච්ඡා වෙන්නේ. එහෙම නැතිව වෙන වෙන බහුබූත ගැන නොවෙයි. එහෙම නම්, මෙතුමන්ලාගේ උපක්‍රමය මොකක්ද කියලා අපි දැන් තේරුම් ගන්න ඕනෑ. ගරු උදය ගම්මන්පිල ඇමතිතුමා කියනවා ඇහුණා, "නැහැ, නැහැ, අපි තැන් තැන්වලින් ණය ගන්නවා" කියලා. අපි බංගලාදේශයෙන් ණය ගත්තා. ඒ වාගේම වෙන වෙන තැන්වලිනුත් ණය ගත්තා. ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියත් ලැබුණා කිව්වා. අපි කවුරුත් ගරු කරන, අපේ හිත මිත්‍ර වැදගත් අමාත්‍යවරයෙකු වන රමේෂ් පතිරණ මැතිතුමා ඉතාම පැහැදිලිව කිව්වා, ඩොලර් බිලියන දෙකහමාරක් ගන්නවා කියලා Concept Global කියන ආයතනයෙන්. ඒ, මම පෙන්වා දුන් ණය ගෙවන්න. අතේ තිබෙන්නේ ඩොලර් මිලියන දෙකහමාරයි. නමුත්, ඩොලර් මිලියන හතහමාරක් ගෙවන්න ඕනෑ. එම නිසා ඩොලර් බිලියන දෙකහමාරක ණයක් ගන්නවා කියනවා. ඒ ණය ගන්නේ කොහෙන්ද? Concept Global එකෙන්. මම ඒ ආයතනය ගැන සොයා බැලුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක රාජගිරිය පැත්තේ තිබෙන පොඩි ගෙයක්, nameboard එකක්වත් නැහැ. මම එතැනට ගියා, බලන්න. Kenneth de la Motte කියලා මනුස්සයෙක් ඉන්නවා. මම ඒ Kenneth de la Motte කියන මනුස්සයා ගැන සොයා බැලුවා. ඔහු කිසිම කොම්පැනියක කිසිම තනතුරක් දරන පුද්ගලයෙකු නොවෙයි. ඔහුට Burgher Union එකේ යම්කිසි තනතුරක් විතරයි තිබෙන්නේ. හැබැයි, ඔහුට ඩොලර් මිලියන 175ක කොමිස් එකක් දෙනවා කියලා කැබිනට් සන්දේශයේ තිබෙනවා. ඒ කියන්නේ ලබා ගන්නා ණය මුදලින් සියයට 7ක්. ඒකේ තව පැහැදිලි කිරීමක් හැටියට කියනවා, අපි ඩොලර් බිලියන දෙකහමාරක් ගත්තාම එ්කෙන් සියයට 93යි අපට ලැබෙන්නේ, සියයට 7ක් ඒ මනුස්සයාට දෙනවා කියලා. ඊට පස්සේ අපට කිව්වා, "අපි ඕමානයෙන් මුදල් ගේනවා" කියලා. ඒ, ඩොලර් බිලියන 3.6ක්. ඕමානයෙන් ඇහුවා ලු, "එහෙම ණය දෙන්න බැහැ, මොකක්ද ඔයගොල්ලන් අපට උගස් - mortgage - තියන්නේ?" කියලා. එතකොට ඒ ගොල්ලන් කියලා තිබෙනවා, මන්නාරමේ තෙල් නිධියෙන් කොටසක් උගස් තියන්න ඕනෑ කියලා. ඒ නිසා ඔබතුමන්ලාට පැහැදිලි දර්ශනයක් තිබෙනවා කියලා ඔබතුමන්ලා කොච්චර කිව්වත්, ඒක පෙනෙන්නේ නැහැ. අපි නම් දැක්කේ ගොනුන් දෙන්නෙක් බැඳපු කරත්තයක් වාගේයි.

අද ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ විශ්වසනීය උපදේශක ගරු මහාචාර්ය රංජිත් බණ්ඩාර මැතිතුමා නව ලිබරල්වාදය පිළිබඳව කොච්චර නම් දේවල් කිව්වාද? මිල පාලනය කරන්නේ නැහැ කිව්වා, ගැසට් ඔක්කොම අයින් කර ගන්නවා කිව්වා, කිරි පිටි මිල ඉහළ ගියාට කරන්න දෙයක් නැහැ කිව්වා, සහල් මිලේ ගැසට් එක අයින් කළා කිව්වා, මීට පස්සේ උපරිම මිලක් නියම කරන්නේ නැහැ කිව්වා. නව ලිබරල්වාදය පිළිබඳව එතුමා කොච්චර කථා කිව්වාද කියනවා නම්, මම කැන්ටීන් එකේ කෑම කමින් ඉන්නකොට ඒ කථාව ඇහිලා පුටුවෙනුත් වැටුණා. කතිපයාධිකාරයට සම්පූර්ණයෙන්ම අවස්ථාව දෙන බව තමයි එතුමා කිව්වේ.

කුඩා වී මෝල් හිමියන් ගැන කථා කරලා වැඩක් නැහැ, මට ඒ ගැන කථා කරන්න වෙලාව ප්‍රමාණවත් නැහැ. හැබැයි, ඊට හාත්පසින්ම වෙනස් දේවල් තමයි ගරු වීරසුමන වීරසිංහ මැතිතුමා සහ ගරු සංජීව එදිරිමාන්න මැතිතුමා කිව්වේ. ඒ වාගේම ගරු කංචන විජේසේකර රාජ්‍ය ඇමතිතුමාත් නොයෙකුත් දේවල් කිව්වා. එතුමන්ලා කියන්නේ මොකක්ද? මිල පාලනය සඳහා මේ රජය සම්පූර්ණයෙන් මැදිහත් වෙන්න ඕනෑ කිව්වා. ඒ කියන්නේ නව ලිබරල්වාදය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. ඉන් පසු අවසානයට කථා කළ මන්ත්‍රීතුමා අපට පැහැදිලි කරන්න උත්සාහ කළා, "එතුමන්ලාට පැහැදිලි මාර්ගයක් තිබෙනවා, ඒ මාර්ගයේ යනවා" කියලා. හැබැයි, අපට පෙනෙන විදියට නම් කිසිම පැහැදිලි මාර්ගයක් නැහැ, යන්නේ කොහේද කියලා මේ කවුරුවත් දන්නේත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, your time is up. I have already given you one minute more.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

යම්කිසි විධියකට වෙළෙඳ පොළේ තරගකාරිත්වයක් ඇතිකරලා ඒ හරහා මිල පාලනය කරන්න ඇත්ත වශයෙන්ම රජය මැදිහත් වෙන්න ඕනෑ. දැන් සම්පූර්ණයෙන්ම ඒක අතහැර තිබෙන්නේ. ගරු ලසන්ත අලගියවන්න රාජ්‍ය ඇමතිතුමා ඊයේ ජනතාවගෙන් සමාව ඉල්ලා තිබෙනවා. මේ බලන්න, “We apologize for the inconvenience caused to the consumers” කියලා සඳහන් වනවා. එතුමා කියනවා, "අපි උත්සාහ කළා, මිල පාලනය කර ගන්න. නමුත්, අපේ ආර්ථික වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම අසාර්ථක වුණා, අපට මේ දේ කර ගන්න බැරි වුණා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොඩක් දේවල් කියන්න තිබුණාට ඒ සඳහා කාලය ප්‍රමාණවත් නැහැ. අවසාන වශයෙන් මම තව එක දෙයක් කියන්නම්. අපේ සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය ඇමතිතුමාට මම ගරු කරනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා ඉදිරියේදී උත්සාහ කරන්න ඕනෑ රාජ්‍ය ආදායම වැඩි කර ගන්න. ඒ ප්‍රශ්නයට විසඳුම් හොයන්නේ කොහොමද, ඉදිරියේදී ඔබතුමන්ලා කුමක් කළ යුතුද කියලා කල්පනා කළ යුතුයි. රටේ සම්පත් විකුණලා විතරක් මේ දේ කරන්න බැහැ.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 4.22]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර මැද මූල්‍ය තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ විශේෂයෙන්ම හිටපු ඇමතිවරයෙක් වන හර්ෂ ද සිල්වා මැතිතුමාගේ කථාවෙන් පසුව කථා කිරීමට ලැබීම ගැන මම සතුටු වනවා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා ආණ්ඩු කරපු කාලයේ සමස්ත ලෝක ආර්ථිකය තුළ කිසිම අර්බුදයක් තිබුණේ නැහැ. නමුත්, ඔබතුමන්ලාට රටේ ආර්ථිකය කළමනාකරණය කර ගන්න බැරිව ආර්ථිකය පසුගාමී තත්ත්වයක් කරා ගියා. අපි මේ ආණ්ඩුව භාර අරගෙන ලෝක වසංගත තත්ත්වයක් වන COVID-19 වසංගතයත් පාලනය කරමින්, ආර්ථිකය කළමනාකරණය කිරීම ගැන මම හිතනවා ඔබතුමා අවංකවම සතුටු වනවා ඇති කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා විශේෂයෙන්ම රාජ්‍ය ආදායම සහ වියදම පිළිබඳව කථා කළා. මේ අවුරුද්දේ පළමු මාස 8ට -2021 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලයට- රාජ්‍ය ආදායම හැටියට රුපියල් බිලියන 942.5ක් ලැබී තිබෙනවා. ඒක 2020 වර්ෂයේ සමාන්තර කාලයට සාපේක්ෂව සියයට 4ක වැඩි වීමක්. අපි ජනතාවට බදු සහන ලබා දුන්නා. අපි ඒකෙන් බලාපොරොත්තු වුණේ, ජනතාව බදු බරින් නිදහස් කිරීම සහ විශේෂයෙන්ම බදු ගෙවන අනෙකුත් කණ්ඩායම් බදු සහන නිසා ඉතිරි වන මුදල් ආයෝජන සඳහා යොදවයි කියලා. "බදු අඩු කිරීම හරහා රාජ්‍ය ආදායම අඩු වුණා" කියලා විපක්ෂය අපට දිගින් දිගටම චෝදනා කළත්, මේ මාස 8 තුළ බදු ආදායමෙත් සියයට 6.5ක වැඩි වීමක් තිබෙනවා. බදු ආදායම වැඩි වීම එන්නේ, බදු ගෙවීමට සහනදායි ක්‍රමවේද හඳුන්වා දීම නිසායි. හැබැයි, බදු අඩු කිරීම සිදු නොකළා නම් සමහර විට බදු ආදායම වැඩි නොවෙන්න තිබුණා.

VAT බද්ද අඩු කිරීම, ආදායම් බද්ද අඩු කිරීම, ආදායම් බදු ගෙවන අවම සීමා වැඩි කිරීම, VAT registration එකේ සීමා වැඩි කිරීම ආදි දේවල්වලින් තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ ආර්ථිකය පවත්වාගෙන යන්නේ. හැබැයි, COVID-19 වසංගතය නිසා බදු අඩු කිරීමෙන් අපි බලාපොරොත්තු වෙච්ච ආදායම ලැබුණේ නැහැ. මේක ලෝක වසංගත තත්ත්වයක්. ලෝක වසංගත තත්ත්වයක් තුළ වුණත්, අපට ආර්ථිකය කළමනාකරණය කර ගන්න පුළුවන් වුණා. අසීරුතා තිබෙනවා. නමුත්, අපි ගත්ත තීන්දු නිසා තමයි අද ව්‍යාපාර ටික පවත්වාගෙන යන්නේ. ඒ නිසා තමයි අද රස්සාවලින් එළියට දාන්නේ නැතුව තිබෙන මුදල් වැය කරලා ඒ කණ්ඩායම් රැකියා පවත්වාගෙන යන්නේ. එහෙම නොවුණා නම් රැකියා අහිමිවී බරපතළ තත්ත්වයක් ඇති වනවා. අපි මේ තීන්දු ගනිද්දි COVID-19 වසංගතය තිබුණේ නැහැ. හැබැයි, COVID-19 නොතිබුණු කාලය තුළ අපි ආණ්ඩුවක් හැටියට ගත්ත තීන්දුවල ධනාත්මක බලපෑම නිසා තමයි, COVID-19 වසංගතය ඇති වෙලා තිබෙන අවස්ථාවේත් අපට ආර්ථිකය කළමනාකරණය කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

රට වහන්න කියලා අපට නිතර බලපෑම් තිබුණා. රට වැසිය යුතු මොහොතේ අපි වැහුවා. ජනාධිපතිතුමා ඉතා හොඳින් COVID-19 වසංගතය කළමනාකරණය කළා. ඒ තුළින් අපට ලැබුණු ශක්තිය තමයි, අපේ අපනයන ආදායම වැඩි වීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අතට එන ආදායම වැඩි වුණා. විශේෂයෙන්ම 2020 මුල් මාස 8ට සාපේක්ෂව 2021 මුල් මාස 8 තුළ අපේ අපනයන ආදායමේ සියයට 20ක විතර වර්ධනයක් තිබෙනවා. ඊළඟට, ආනයන ක්‍රමානුකූලව වැඩි වෙලා තිබෙනවා. අපට මුලදී චෝදනා කළා, "අපි ආනයන සීමා කළා, ආනයන තහනම් කළා. ඒ නිසා ආර්ථිකයට බලපෑමක් තිබෙනවා" කියලා. අපි එහෙම කළේ නැහැ. රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් නිෂ්පාදකයාට අපි හයිය දෙන අතරතුර, ඒ නිෂ්පාදකයාට අවශ්‍ය අමුද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ සියල්ල ආනයනය කිරීම සඳහා අවකාශ සලසා දුන්නා. ඒ නිසා විශේෂයෙන්ම 2020 අවුරුද්දට සාපේක්ෂව 2021 අවුරුද්දේ දී කොවිඩ් වසංගතයේ දැඩි බලපෑම තුළදීත් පළමු කාර්තුවේ සියයට 4.3ක ආර්ථික වර්ධන වේගයක් අපට ලබා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. දෙවැනි කාර්තුව තුළ සියයට 12.3ක ආර්ථික වර්ධන වේගයක් අපි ලබාගෙන තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙන්න ඕනෑ. හැබැයි, කිසිම ප්‍රශ්නයක් නොතිබුණු යහ පාලනය කාලය තුළ, සියයට 7ක්ව තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 2.3 දක්වා කඩා වැටෙන්න පටන් ගත්තා. ඒ කාලය තුළ හෙමින්ම ආර්ථිකය වර්ධනය වන රට වුණේ කුමන රටද? එක්කෝ අපේ රට පත්විය යුතුව තිබුණා, එහෙම නැත්නම් ඇෆ්ගනිස්ථානය පත්විය යුතුව තිබුණා. චීනයට නොදෙවෙනි ආර්ථික වර්ධන වේගයක් අරගෙන ගිය රටක් ඇෆ්ගනිස්ථානය වැනි රටක මට්ටමට පත් කිරීම ගැන හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායම කනගාටු වෙනවා ඇති.

ඊළඟට, 2020 දී සිදු වූ මේ කඩා වැටීමත් එක්ක ආර්ථිකයට ඇති වුණු බලපෑමට සාපේක්ෂව විශේෂයෙන්ම 2021 දෙවැනි කාර්තුව තුළ ඒ රටවල ආර්ථිකය හැසිරුණේ කොහොමද? ඉන්දියාවේ සියයට 20.1ක ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා. මැලේසියාවේ සියයට 16.1ක වර්ධන වේගයක් තිබෙනවා.

සිංගප්පූරුවේ සියයට 14.7ක වර්ධන වේගයක් තිබෙනවා. ශ්‍රී ලංකාවේ සියයට 12.3ක වර්ධන වේගයක් තිබෙනවා. හැබැයි, චීනයේ ආර්ථික වර්ධන වේගය සියයට 7.9යි, ජපානයේ ආර්ථික වර්ධන වේගය සියයට 7.6යි, තායිලන්තයේ ආර්ථික වර්ධන වේගය සියයට 7.5යි, ඉන්දුනීසියාවේ ආර්ථික වර්ධන වේගය සියයට 7.1යි, වියට්නාමයේ ආර්ථික වර්ධන වේගය සියයට 6.6යි. ඉතින්, අපි මේ ලබාගෙන තිබෙන්නේ ජයග්‍රහණයක් නොවෙයිද?

එන්නත්කරණය ගත්තොත්, අපේ සම්පූර්ණ ජනගහනයෙන් මේ වෙනකොට සියයට 60කට ආසන්න ජන කොට්ඨාසයක් එන්නත්කරණයට ලක්වෙලා තිබෙනවා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, කරුණාකර ජනාධිපතිතුමා ගත් මේ වැඩ පිළිවෙළ අගය කරන්න. එහෙම නොකර ඉන්න එපා. ලෝක වසංගත තත්ත්වය තුළ ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත ආරක්ෂා කරලා, ශ්‍රී ලාංකිකයන්ට ගෞරවයක් ගෙනැල්ලා දීලා ජනතාවගේ අනාගතය නැවත සකස් කර ගන්න පුළුවන් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද ගෙන එන්න ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට පුළුවන් වුණා. ඒ වාගේම, මේ වෙනකොට අවුරුදු 18යි, 19යි අතර පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් එන්නත් කිරීම කරන්න පටන් ගන්නවා. ආණ්ඩුව එය පටන් ගන්නේ කොහොමද? කිසිම කරදරයක් නැතුව පාසල තුළදීම ඔවුන්ට එන්නත ලබා දෙනවා. ඒ වයස් කාණ්ඩය තුළ පාසල් හැර ගිය ශිෂ්‍ය කණ්ඩායමක් ඉන්නවා නම්, ඒ කණ්ඩායමටත් ඒ අයට අදාළ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය තුළින් එන්නත ලබාදෙන්න අපි කටයුතු කරනවා. මේවා තමයි අපි ලැබූ ජයග්‍රහණ.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, රටේ ආර්ථික කළමනාකරණයක් තිබුණේ නැහැ කියලා. විශේෂයෙන්ම මම එක කාරණයක් නිවැරදි කරන්න ඕනෑ. කොවිඩ් තත්ත්වය තුළ රටේ ජනතාවට අපි සහන ලබාදීම් රාශියක් කළා. එහිදී අපේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ආරක්ෂා කර ගන්න සෞභාග්‍යා ප්‍රතිමූල්‍ය ණය පහසුකම යටතේ රුපියල් බිලියන 165.5ක් ලබා දීම කළා. ඊළඟට, තමුන්නාන්සේලා අරගෙන ගිය සියයට 18ත්, 20ත් අතර පොලී අනුපාතය අපේ ආණ්ඩුව ඇවිල්ලා සියයට 8ත්, 9ත් අතර අනුපාතයක් දක්වා අඩු කිරීම හරහා රටේ ජනතාවට රුපියල් බිලියන 365ක ඉතුරුවක් ඇති වුණා. එම පොලී අනුපාතය අඩු වීමත් සමඟ,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. State Minister, you have two more minutes.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
I was informed that I have 18 minutes, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Unfortunately, no. It has been cut down to about 10 minutes due to time constraints. You have to wind up at 4.30.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
All right.

එම නිසා පොලී අනුපාතය හරහා අපි රජයට රුපියල් බිලියන 313ක් ඉතුරු කළා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, "ලබා ගත් ණය වෙනුවෙන් 2021 අවුරුද්දේ අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක් ගෙවන්න තිබෙනවා" කියලා. මම දන්නේ නැහැ, ඔබතුමාට ඒ සංඛ්‍යාලේඛන ලබා දුන්නේ කවුද කියලා. අපට ඩොලර් බිලියන 3.7ක් ගෙවන්න තිබෙනවා. අපි ඒ මුදල ගෙවීමට අවශ්‍ය වැඩ කටයුතු කරනවා. ඒ වාගේම, ඊළඟ අවුරුදුවල ගෙවීමට තිබෙන ප්‍රමාණයත් අපි ගෙවනවා.

අනුර කුමාර දිසානායක මැතිතුමා ද්වේශ සහගතව මේ යෝජනාව අරගෙන ඇවිල්ලා ඒ තුළින් මඩ ගහන්න පටන් ගත්තාට මම එතුමාට ඉතාම ගෞරවයෙන් මතක් කරනවා,- [බාධා කිරීමක්] රනිල් වික්‍රමසිංහ මැතිතුමා දූෂණ විරෝධී කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ සාමාජිකත්වය ගත්තේ, විශේෂයෙන්ම ජාතික විධායක සභාවේ සාමාජිකත්වය ගත්තේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා, දිවංගත මංගල සමරවීර මැතිතුමා, පාඨලී චම්පික රණවක, ඊළඟට විජයදාස රාජපක්ෂ, රවුෆ් හකීම්, සරත් ෆොන්සේකා, ආර්. සම්පන්දන්, එම්.ඒ. සුමන්තිරන්, අනුර කුමාර දිසානායක, ජේ.සී. වැලිඅමුණ, ජයම්පති වික්‍රමරත්න, මලික් සමරවික්‍රම මැතිතුමන්ලා. කමිටුවේ ලේකම්වරයෙකුත් එතැන ඉන්නවා. ඊළඟට, අනුකමිටු පත් කරනවා. අනුකමිටු පත් කරනකොට ක්ෂණික ප්‍රතිචාර කමිටුවක් පත් කරනවා. දූෂණ විරෝධී කමිටුව තුළ, ක්ෂණික ප්‍රතිචාර කමිටුව කියලා අනුකමිටුවක් පත් වෙනවා.

අනුර කුමාර දිසානායක මැතිතුමාගේ හොඳම ගෝලයා වුණු ආනන්ද විජේපාල එහි අධ්‍යක්ෂවරයෙක්. එහි වගකීම සම්පූර්ණයෙන්ම භාර දෙන්නේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට. එහි සම්බන්ධීකාරක හැටියට පත් වන්නේ ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා. ඒ නිසා 2015-2019 කාලය තුළ -කාරණා ගොඩක් ගැන කිව්වා නේ.- මොනවාද කළේ කියන ප්‍රශ්නය අපට අහන්න වෙනවා. නඩු දැම්මා, ඕනෑ පොලිසි ඇති කළා, ඕනෑ නිලධාරින් ටික දැම්මා. ඒ සියල්ල කරලාත් අවසානයේ ඔවුන්ට ඒ දාපු නඩුවකට අදාළ කාරණාවක් ඔප්පු කර ගන්න බැරි වුණා. 2015 වසරට කලින් කියපු කාරණා 2015-2019 කාලය තුළත් කියලා, 2020 ඉඳලා මේ දක්වාත් ඒ කාරණාම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් හැටියට අපි ජනතාවට කියනවා, අපි ගැන විශ්වාසය තියන්න කියලා. අපි මේ අභියෝගය ජය ගන්නවා. අපි අනිවාර්යයෙන්ම අපේ රට ලෝකයත් එක්ක තරග කරන ආසියාවේ ප්‍රධාන රටක් බවට පරිවර්තනය කරනවා. 2022 අය වැය ලේඛනය එම පරිවර්තනය සඳහා ප්‍රධාන සාධකය බවට පත් වන බවත්, අපේ රට කොවිඩ් වසංගතයෙන් තොර රටක් බවට පරිවර්තනය කරන බවත් කියමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 4.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව, 2021 ඔක්තෝබර් 21 වන බ්‍රහස්පතින්දා පූ .භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது, பி.ப. 4.30 மணியாகிவிடவே, மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்தின்படி, 2021 ஒக்ரோபர் 21, வியாழக்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 4.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 10.00 a.m. on Thursday, 21st October, 2021, pursuant to the Resolution of Parliament of this Day.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත: විස්තර
## வனப் பாதுகாப்புத் திணைக்களத்துக்குச் சொந்தமான ஒதுக்கங்கள்: விபரம்
## FOREST RESERVES UNDER FOREST CONSERVATION DEPARTMENT: DETAILS

1902/2021

**1.** ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය-(3):

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය එසේ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வனசீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வனப் பாதுகாப்புத் திணைக்களத்தின்கீழ் காணப்படும் ஒதுக்கங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வோர் ஒதுக்கமும் அவ்வாறு ஒதுக்கமாகப் பிரகடனப்படுத்தப்பட்ட ஒவ்வொரு வர்த்தமானி அறிவித்தலினதும் இலக்கம் மற்றும் திகதி என்பன வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி வர்த்தமானி அறிவித்தல்களைச் சபாபீடத்திற்குச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) யாதேனுமொரு பிரதேசம், ஒதுக்கமாகப் பிரக டனப்படுத்தப்பட்டு வெளியிடப்பட்ட வர்த்த மானி அறிவித்தலை இரத்துச் செய்து வெளியிடப்பட்ட வர்த்தமானி அறிவித்தல்கள் உள்ளனவா என்பதையும்;

(v) ஆமெனில், அந்த ஒவ்வொரு வர்த்தமானி அறிவித்தலினதும் இலக்கம் மற்றும் திகதி என்பன வெவ்வேறாக யாவை என்பதையும்;

(vi) மேற்படி வர்த்தமானி அறிவித்தல்களைச் சபா பீடத்திற்குச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(vii) மேற்படி திணைக்களத்தின்கீழ் எதிர்வரும் காலத்தில் ஒதுக்கங்களாக அல்லது முகாமைத் துவப் பிரதேசங்களாகப் பிரகடனப்படுத்து வதற்குத் திட்டமிடப்பட்டுள்ள பிரதேசங்களின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Wildlife and Forest Conservation:

(a) Will he inform this House -

(i) the names of the forest reserves which come under the Forest Conservation Department;

(ii) the number and the date of the Gazette Notification that declared each reserve as a reserve;

(iii) whether those Gazette Notifications will be tabled;

(iv) whether there are Gazette Notifications which have been issued to abolish the Gazette Notifications issued to declare as forest reserves;

(v) if so, what the Gazette Notification number and date of each such Gazette Notification are, separately;

(vi) whether those Gazette Notifications will be tabled; and

(vii) the names of the areas that have been planned to be declared as reserves or management areas under the aforesaid Department?

(b) If not, why?

**ගරු සී.බී. රත්නායක මහතා (වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க - வனசீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Wildlife and Forest Conservation)

(අ) (i) විස්තර ඇමුණුම Iහි* සඳහන් වේ.

(ii) විස්තර ඇමුණුම Iහි සඳහන් වේ.

(iii) අවශ්‍ය නම් ගැසට් නිවේදන සභාගත කළ හැක.

(iv) තිබේ.

(v) විස්තර ඇමුණුම IIහි* සඳහන් වේ.

(vi) අවශ්‍ය නම් ගැසට් නිවේදන සභාගත කළ හැක.

(vii) විස්තර ඇමුණුම IIIහි* සඳහන් වේ.

(ආ) අදාළ නොවේ.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

(அ) (i) விபரம் இணைப்பு I இல் குறிப்பிடப்பட்டுள்ளது.

(ii) விபரம் இணைப்பு I இல் குறிப்பிடப்பட்டுள்ளது.

(iii) தேவையாயின் வர்த்தமானி அறிவித்தலைச் சபைக்குச் சமர்ப்பிக்க முடியும்.

(iv) உள்ளது.

(v) விபரம் இணைப்பு II* இல் குறிப்பிடப் பட்டுள்ளது.

(vi) தேவையாயின் வர்த்தமானி அறிவித்தலைச் சபைக்குச் சமர்ப்பிக்க முடியும்.

(vii) விபரம் இணைப்பு III* இல் குறிப்பிடப் பட்டுள்ளது.

(ஆ) பொருத்தமற்றது.

(a) (i) Details are given in Annex I*.

(ii) Details are given in Annex I.

(iii) Gazette notifications can be tabled, if required.

(iv) Yes, there are.

(v) Details are given in Annex II*.

(vi) Gazette notifications can be tabled, if required.

(vii) Details are given in Annex III*.

(b) Does not arise.

## වනජීවී දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිත: විස්තර

වனசீவராசிகள் திணைக்களத்தின் கீழுள்ள ஒதுக்கங்கள்: விபரம்

FOREST RESERVES UNDER DEPARTMENT OF WILDLIFE: DETAILS

1903/2021

**2.** ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) වනජීවී දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය එසේ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

வனசீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வனசீவராசிகள் திணைக்களத்தின்கீழ் காணப் படும் ஒதுக்கங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வோர் ஒதுக்கமும் அவ்வாறு ஒதுக்கமாகப் பிரகடனப்படுத்தப்பட்ட ஒவ்வொரு வர்த்தமானி அறிவித்தலினதும் இலக்கம் மற்றும் திகதி என்பன வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி வர்த்தமானி அறிவித்தல்களைச் சபாபீடத்திற்குச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) யாதேனுமொரு பிரதேசம், ஒதுக்கமாகப் பிரகட னப்படுத்தப்பட்டு வெளியிடப்பட்ட வர்த்தமானி அறிவித்தலை இரத்துச் செய்து வெளியிடப்பட்ட வர்த்தமானி அறிவித்தல்கள் உள்ளனவா என்பதையும்;

(v) ஆமெனில், அந்த ஒவ்வொரு வர்த்தமானி அறிவித்தலினதும் இலக்கம் மற்றும் திகதி என்பன வெவ்வேறாக யாவை என்பதையும்;

(vi) மேற்படி வர்த்தமானி அறிவித்தல்களைச் சபாபீடத்திற்குச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(vii) மேற்படி திணைக்களத்தின்கீழ் எதிர்வரும் காலத்தில் ஒதுக்கங்களாக அல்லது முகாமைத் துவப் பிரதேசங்களாகப் பிரகடனப்படுத்து வதற்குத் திட்டமிடப்பட்டுள்ள பிரதேசங்களின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Wildlife and Forest Conservation:

(a) Will he inform this House -

(i) the names of the forest reserves which come under the Department of Wildlife;

(ii) the number and the date of the Gazette Notification that declared each reserve as a reserve;

(iii) whether those Gazette Notifications will be tabled;

(iv) whether there are Gazette Notifications that have been issued to abolish the Gazette Notifications issued to declare as forest reserves;

(v) if so, what the Gazette Notification number and date of each such Gazette Notification are, separately;

(vi) whether those Gazette Notifications will be tabled; and

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අනුර දිසානායක මහතා]

(vii) the names of the areas that have been planned to be declared as reserves or management areas under the aforesaid Department?

(b) If not, why?

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon.C.B. Rathnayake)

(අ) (i) ඇමුණුම 01* මඟින් දක්වා ඇත.

(ii) ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

(iii) අවශ්‍ය නම් ගැසට් නිවේදන සභාගත කළ හැක.

(iv) ඔව්.

(v) ඇතැම් ගැසට් නිවේදනවල මුල් ගැසට් නිවේදනය අහෝසි කිරීම, අහෝසි කර සංශෝධනය කිරීම, තත්ත්වය ඉහළ දැමීම, නව කොටස් එකතු කිරීම හෝ මායිම් වෙනස් කිරීම් සිදු වී ඇති අතර, එම ගැසට් නිවේදන සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| | රක්ෂිතයේ නම | ගැසට් අංකය | දිනය |
|---|---|---|---|
| 1 | වස්ගමුව ජාතික උද්‍යානය | 1446/27 | 2006.05.25 |
| 2 | ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය | 900/19 | 1995.12.08 |
| 3 | චුන්ඩිකුලම් අභයභූමිය | 8356 | 1938.02.25 |
| 4 | මඩුපාර අභයභූමිය | - | 1968.06.28 |
| 5 | මින්නේරිය ගිරිතලේ අභයභූමිය | 492/32 | 1988.02.12 |
| 6 | වැටහිර කන්ද ස්වභාව රක්ෂිතය | 1239/28 | 2002.06.07 |
| 7 | ගැල්වෙස්ට්ලෑන්ඩ් අභයභූමිය | 8870 | 1938.05.27 |
| 8 | සමනළ අඩවිය අභයභූමිය | 1783 | 1940.10.25 |
| 9 | ත්‍රිකුණාමලය නාවික වැඩබිම් අභයභූමිය | 1610/6 | 1963.06.21 |
| 10 | කුඩුම්බිගල පානම අභයභූමිය | 79 | 1973.09.23 |
| 11 | සෙල්ලක්කාඔය | - | - |
| 12 | නිල්ගල වන පිවිසුම | - | - |
| 13 | විල්පත්තු බටහිර අභයභූමිය | 8356 | 1938.02.25 |
| 14 | රිදියගම අභයභූමිය | 8356 | 1938.02.25 |
| 15 | හික්කඩුව අභයභූමිය | 1040/26 | 1998.08.14 |
| 16 | පොළොන්නරුව අභයභූමිය | 8356 | 1938.02.25 |
| 17 | කුමන අභයභූමිය | 8356 | 1938.02.25 |
| 18 | පිජන් අයිලන්ඩ් අභයභූමිය | - | 1974.10.11 |
| 19 | විල්පත්තුව උතුර අභයභූමිය | 8356 | 1938.02.25 |
| 20 | තෙල්වත්ත අභයභූමිය | 8356 | 1938.02.25 |
| 21 | උඩවත්ත කැලේ අභයභූමිය | 8356 | 1938.02.25 |
| 22 | කෑගල්ල අභයභූමිය | 8356 | 1938.02.25 |
| 23 | ගල්ඔය නිම්න අභයභූමිය | 14808 | 1968.06.28 |
| 24 | මහකනදරාවැව අභයභූමිය | 14808 | 1968.06.28 |
| 25 | ගල්ඔය නිම්න (නිරිතදිග) අභයභූමිය | 10640 | 1954.02.12 |
| 26 | කරගම්ලේවාය අභයභූමිය | 1258/7 | 2002.10.15 |
| 27 | හොරගොල්ල අභයභූමිය | 80 | 1973.10.05 |
| 28 | හෝර්ටන්තැන්න ස්වභාව රක්ෂිතය | 14883 | 1969.12.05 |
| 29 | නෙළුගල වන අලි පිවිසුම | 14889 | 1970.01.16 |
| 30 | ලාහුගල කිතුලාන අභයස්ථානය | 14702 | 1966.07.01 |

(vi) අවශ්‍ය නම් ගැසට් නිවේදන සභාගත කළ හැක.

(vii) ඇමුණුම 02* මඟින් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

(அ) (i) இணைப்பு 01* இல் காட்டப்பட்டுள்ளது.

(ii) இணைப்பு 01இல் காட்டப்பட்டுள்ளது.

(iii) தேவையாயின் வர்த்தமானி அறிவித்தலைச் சபைக்குச் சமர்ப்பிக்க முடியும்.

(iv) ஆம்.

(v) சில வர்த்தமானி அறிவித்தல்கள்மூலம் முதல் வர்த்தமானியை இரத்துச் செய்தல், இரத்துச் செய்து திருத்தியமைத்தல், நிலைமையை உயர்த் துதல், புதிய பகுதிகளை இணைத்தல் அல்லது எல்லை மாற்றம் இடம்பெற்றுள்ளதுடன் அந்த வர்த்தமானி அறிவித்தல் பற்றிய தகவல்கள் கீழே காட்டப்பட்டுள்ளன.

| | **வன ஒதுக்கத்தின் பெயர்** | **வர்த்த மானி இலக்கம்** | **திகதி** |
|---|---|---|---|
| 1 | வஸ்கமுவ தேசிய பூங்கா | 1446/27 | 2006.05.25 |
| 2 | லுணுகம்வெஹெர தேசிய பூங்கா | 900/19 | 1995.12.08 |
| 3 | சுண்டிக்குளம் சரணாலயம் | 8356 | 1938.02.25 |
| 4 | மடுபார சரணாலயம் | - | 1968.06.28 |
| 5 | மின்னேரிய கிரிதலே சரணாலயம் | 492/32 | 1988.02.12 |
| 6 | வெடஹிர கந்த இயற்கை வன ஒதுக்கம் | 1239/28 | 2002.06.07 |
| 7 | கெல்வெஸ்லேன்ட் சரணாலயம் | 8870 | 1938.05.27 |
| 8 | சமனல தள சரணாலயம் | 1783 | 1940.10.25 |
| 9 | திருகோணமலை கடற்படை வேலைத்தள சரணாலயம் | 1610/6 | 1963.06.21 |
| 10 | குடும்பிகல பானம சரணாலயம் | 79 | 1973.09.23 |
| 11 | செல்லக்காஓய | - | - |
| 12 | நில்கல வன நுழைவு | - | - |
| 13 | வில்பத்து மேற்கு சரணாலயம் | 8356 | 1938.02.25 |

*** ඇමුණුම පුස්තකාලයේ තබා ඇත.**
** இணைப்பு நூல்நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Annex placed in the Library.*

*** ඇමුණුම පුස්තකාලයේ තබා ඇත.**
** இணைப்பு நூல்நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Annex placed in the Library.*

| | வன ஒதுக்கத்தின் பெயர் | வர்த்தமானி இலக்கம் | திகதி |
|---|---|---|---|
| 14 | ரிதியகம சரணாலயம் | 8356 | 1938.02.25 |
| 15 | ஹிக்கடுவ சரணாலயம் | 1040/26 | 1998.08.14 |
| 16 | பொலன்னறுவை சரணாலயம் | 8356 | 1938.02.25 |
| 17 | குமண சரணாலயம் | 8356 | 1938.02.25 |
| 18 | பிஜன் அய்லன்ட் சரணாலயம் | - | 1974.10.11 |
| 19 | வில்பத்து வடக்கு சரணாலயம் | 8356 | 1938.02.25 |
| 20 | தெல்வத்த சரணாலயம் | 8356 | 1938.02.25 |
| 21 | உடவத்த கெலே சரணாலயம் | 8356 | 1938.02.25 |
| 22 | கேகாலை சரணாலயம் | 8356 | 1938.02.25 |
| 23 | கல்ஓய நிம்ன சரணாலயம் | 14808 | 1968.06.28 |
| 24 | மஹகனதருவெவ சரணாலயம் | 14808 | 1968.06.28 |
| 25 | கல்ஓய நிம்ன (தென்மேற்கு) சரணாலயம் | 10640 | 1954.02.12 |
| 26 | கரகம்லேவாய சரணாலயம் | 1258/7 | 2002.10.15 |
| 27 | ஹொரகொல்ல சரணாலயம் | 80 | 1973.10.05 |
| 28 | ஹோடன்தென்ன இயற்கை வன ஒதுக்கம் | 14883 | 1969.12.05 |
| 29 | நெலுகல காட்டு யானைகள் நுழைவு | 14889 | 1970.01.16 |
| 30 | லாகுகல கித்துலான சரணாலயம் | 14702 | 1966.07.01 |

(vi) தேவையாயின் வர்த்தமானி அறிவித்தலைச் சபைக்குச் சமர்ப்பிக்க முடியும்.

(vii) இணைப்பு 02* இல் காட்டப்பட்டுள்ளது.

(ஆ) பொருத்தமற்றது.

(a) (i) Given in Annex 01*.

(ii) Given in Annex 01.

(iii) Gazette Notifications can be tabled, if required.

(iv) Yes.

(v) Revocations, revocation and revisions, upgrading, addition or changing of boundaries have been introduced to some of the Gazette Notifications and the details of those Gazette Notifications are given below:

| | Name of the Reserve | Gazette No. | Date |
|---|---|---|---|
| 1 | Wasgamuwa National Park | 1446/27 | 25.05.2006 |
| 2 | Lunugamvehera National Park | 900/19 | 08.12.1995 |
| 3 | Chundikulam Sanctuary | 8356 | 25.02.1938 |
| 4 | Madupara Sanctuary | - | 28.06.1968 |
| 5 | Minneriya Giritale Sanctuary | 492/32 | 12.02.1988 |
| 6 | Watahira Kanda Nature Reserve | 1239/28 | 07.06.2002 |
| 7 | Galvesland Sanctuary | 8870 | 27.05.1938 |
| 8 | Samanala Range Sanctuary | 1783 | 25.10.1940 |
| 9 | Trincomalee Naval Site Sanctuary | 1610/6 | 21.06.1963 |
| 10 | Kudumbigala Panama Sanctuary | 79 | 23.09.1973 |
| 11 | Sellakka Oya | - | - |
| 12 | Nilgala Forest entrance | - | - |
| 13 | Wilpattu West Sanctuary | 8356 | 25.02.1938 |
| 14 | Ridiyagama Sanctuary | 8356 | 25.02.1938 |
| 15 | Hikkaduwa Sanctuary | 1040/26 | 14.08.1998 |
| 16 | Polonnaruwa Sanctuary | 8356 | 25.02.1938 |
| 17 | Kumana Sanctuary | 8356 | 25.02.1938 |
| 18 | Pigeon Island Sanctuary | - | 11.10.1974 |
| 19 | Wilpattu North Sanctuary | 8356 | 25.02.1938 |
| 20 | Thelwatta Sanctuary | 8356 | 25.02.1938 |
| 21 | Udawatte Forest Sanctuary | 8356 | 25.02.1938 |
| 22 | Kegalle Sanctuary | 8356 | 25.02.1938 |
| 23 | Galoya Valley Sanctuary | 14808 | 28.06.1968 |
| 24 | Mahakanadarawewa Sanctuary | 14808 | 28.06.1968 |
| 25 | Galoya Valley (South-west) Sanctuary | 10640 | 12.02.1954 |
| 26 | Karagamlewaya Sanctuary | 1258/7 | 15.10.2002 |
| 27 | Horagolla Sanctuary | 80 | 05.10.1973 |
| 28 | Horton Plains Nature Reserve | 14883 | 05.12.1969 |
| 29 | Nelugala Wild Elephant Gate | 14889 | 16.01.1970 |
| 30 | Lahugala Kitulana Sanctuary | 14702 | 01.07.1966 |

(vi) Gazette Notifications can be tabled, if required.

(vii) Given in Annex 02*.

(b) Does not arise.

---

** ඇමුණුම පුස්තකාලයේ තබා ඇත.*
** இணைப்பு நூல்நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Annex placed in the Library.*

** ඇමුණුම පුස්තකාලයේ තබා ඇත.*
** இணைப்பு நூல்நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Annex placed in the Library.*

## 2013/01 චක්‍රලේඛය යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන්: අම්පාර දිස්ත්‍රික්කය
## 2013/01ஆம் இலக்க சுற்றறிக்கையின் பிரகாரம் நடைமுறைப்படுத்தப்பட்ட நிகழ்ச்சித்திட்டங்கள்: அம்பாறை மாவட்டம்
## PROGRAMMES CONDUCTED UNDER CIRCULAR NO. 2013/01: AMPARA DISTRICT

2110/2021

**3. ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "கற்றுக்கொண்ட பாடங்கள் மற்றும் நல்லிணக்க ஆணைக்குழு அறிக்கையின் பரிந்துரைகளை நடைமுறைப்படுத்தல் மற்றும் வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் காணி முகாமைத்துவ நடவடிக்கைகளை முறைப்படுத்தல்" எனும் தலைப்பிலான 11/0737/533/015ஆம் இலக்க மற்றும் 2011.05.04ஆம் திகதிய அமைச்சரவை கொள்கைத் தீர்மானத்தினை நடைமுறைப் படுத்தும் வகையில் "வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் யுத்தத்திற்குப் பின்னரான காலப்பகுதியில் அரச காணிகள் தொடர்பான பிணக்குகளைத் தீர்க்கும் துரித நிகழ்ச்சித் திட்டம்" எனும் தலைப்பில் காணி ஆணையாளர் நாயகத்தினால் 2013/01ஆம் இலக்க மற்றும் 2013.01.31ஆம் திகதிய சுற்றறிக்கை வெளியிடப்பட்டது என்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி சுற்றறிக்கையின் 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 மற்றும் 3.5ஆம் பிரிவுகளின் பிரகாரம் அம்பாறை மாவட்டத்தின் ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிலும் நடைமுறைப்படுத்தப் பட்ட நிகழ்ச்சித்திட்டங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி நிகழ்ச்சித்திட்டங்களின்போது வழங்கப் பட்ட தீர்வுகள் யாவை என்பதையும்;

(iv) பிணக்குகளுக்கான தீர்வுகள் வழங்கப்பட்ட ஒவ்வொரு நபரின் பெயர் மற்றும் முகவரி ஒவ்வொரு கிராம அலுவலர் பிரிவு ரீதியாக வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Will he inform this House -

